පළාත් සභා ක්‍රමය සම්බන්ධ ආයතනයේ අනෙකුත් ප්‍රකාශන

මිල රු. 325/-

පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග පරිපාලන, මූල්‍ය, නෛතික අංශවලින් මෙන් ම සංවර්ධන වැඩසටහන් සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම වැනි සියලු අංශවලින් වෙනසකට ලක් වූ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා පළාත් සභා දායකත්වය කෙසේ සිදුවන්නේ ද? පළාත් සභා ක්‍රමය තුළින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි කිසියම් ආකාරයක ගැටලු, ව්‍යාකූලතා උද්ගත කරනු ලැබුවේ ද? එසේ උද්ගත වූ ගැටලු සහ ව්‍යාකූලතා නිරාකරණය කරගත යුත්තේ කෙසේ ද? ආදිය පිළිබඳ ව ක්ෂේත්‍රයේ හසල අත්දැකීම් සහිත නිලධාරීන් සහ විද්වතුන් වෙතින් ලබාගත් තොරතුරු මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ.

එමෙන් ම 1928 සිට 1987 දක්වා ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ ක්‍රියාවලියේ පසුබිම, කෘෂිකර්ම සහ සත්ත්ව පාලන විෂයයන් සඳහා වන ආයතනික ව්‍යුහය සහ ඒවායේ ක්‍රියාකාරීත්වය, කෘෂිකාර්මික අංශයේ කටයුතු ඉටු කිරීමේ දි පළාත් සභා මුහුණ දෙනු ලබන ගැටලු සහ අභියෝග. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෙළඳපොල අභියෝග ජය ගැනීම සඳහා පළාත් සභා කාර්ය භාරය. පළාත් සභා ක්‍රමය යටතේ කෘෂි ව්‍යාප්තියට අදාළ වන පුහුණුවීම්වල සිදු වූ වෙනස්කම්. කෘෂිකාර්මික අංශයේ ගොවිජන සේවා ආශ්‍රිත ගැටලු, කෘෂිකාර්මික අංශයේ ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් ගේ වෘත්තිමය පහසුකම් සහ ගැටලු. පළාත් සභා ක්‍රමය තුළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය. සත්ත්ව නිෂ්පාදන අංශය වැඩි දියුණු කිරීමේ ඉඩ ප්‍රස්ථා සහ පශු සම්පත් සංවර්ධන කටයුතුවල සාර්ථක අත්දැකීම් සහ ගැටලු පිළිබඳ ඒ ඒ විෂයයන් හි ප්‍රවීණයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ පත්‍රිකා රැසක් ද වාර්තාව තුළ අඩංගු වේ.



මිල රු. 225/-

පළාත් සභා ක්‍රමය තුළ ඉඩම් විෂයයේ බලතල සහ වගකීම් ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? එහිදී මතු ව ඇති ගැටලු සහ අභියෝග කවරේ ද? 1992 දි සිදු කරන ලද ප්‍රාදේශිය ලේකම්වරුන්ට බලතල පැවරීම මෙම ක්ෂේත්‍රයට බලපා ඇත්තේ කුමන ආකාරයට ද? පවතින ගැටලු මඟ හරවා ගනිමින් ජනතාවට කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් ලබා දිය හැක්කේ කෙසේ ද? ආදිය පිළිබඳව මෙම ක්ෂේත්‍රයේ නියුතු හසල අත්දැකීම් සහිත නිලධාරීන් සහ විද්වතුන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මෙම වාර්තාවෙහි අඩංගු වේ.

ඉඩම් හිමිකමේ දේශපාලනය සහ දහතුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය, ඉඩම් විෂයය සම්බන්ධ පළාත් සභා බලතලවල ප්‍රායෝගිකත්වය සහ ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම්, ප්‍රාදේශිය ලේකම් සතු බලතල සහ ඒවායෙහි ප්‍රායෝගිකත්වය රජයේ ඉඩම් සම්බන්ධ ව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය, ඉඩම් විෂයය සම්බන්ධ ව ජාතික රජයේ සහ පළාත් සභා මට්ටමේ ආයතනික ව්‍යුහය සහ සම්පත් බෙදියාම, ඉඩම් විෂයය සම්බන්ධ ව පළාත් සභා මුහුණ දෙන ගැටලු සහ අභියෝග ආදිය පිළිබඳ ව විෂයයේ ප්‍රවීණයින් විසින් ඉදිරිපත් කරනු ලැබූ ලිපි ගණනාවක් ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

පිටපත් සඳහා විමසීම්:
අංශ ප්‍රධාන,
ප්‍රකාශන ඒකකය,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත.
කොළඹ 07.

දුරකථන: 011-2696981 011-2698539 011-2698540
වෙබ් අඩවිය: www.harti.slt.lk

ISBN No. 978-955-612-079-0

පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව 2007 පෙබරවාරි 20

21608
631-67:
353.2
(5L)
හෙක්ට

පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව

2007 පෙබරවාරි 20

සංස්කරණය
එම්.කේ. නදීකා දමයන්ති
එම්.ඩී. සුසිලා ලූර්දු

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114 විජේරාම මාවත
කොළඹ 07

2009/06
2010/04

පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව

2007 පෙබරවාරි 20

සංස්කරණය
එම්.කේ. නදීකා දමයන්ති
එම්.ඩී. සුසිලා ලුර්දු

MFN 107/4

සිංහල වාර ප්‍රකාශන අංක: 22

2007 නොවැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත
කොළඹ 07.

21608
21608
පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

විද්වත් වැඩමුළු වාර්තාව: පළාත් සහා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව-2007 පෙබරවාරි 20
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 07.

මුද්‍රණ අයිතිය ©: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.
සියලු හිමිකම් ඇවිරිණි.

ප්‍රථම මුද්‍රණය: 2007 නොවැම්බර්

ISBN: 978-955-612-079-0

පෙරවදන

1987 දී පළාත් සභා ක්‍රමය පිහිටු වීමට පෙරාතුව වාරිමාර්ග විෂයය ජනතාවට වඩා සමීප ව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ඒකකයට පරිපාලන බලතල විමධ්‍යගත කිරීම යොදා ගන්නා ලදී. දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනු ව එතෙක් රජය විසින් ඉටු කරන ලද කාර්ය භාරය සහ දරනු ලැබූ වගකීම් වෙනසකට බඳුන් වූ අතර ඒ අනු ව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළින් ම වාරිමාර්ග විෂයයට අදාළ කරුණු පළාත් සභා, රජය සහ එම ආයතන දෙකට ම මැදිහත් විය හැකි අංශ වශයෙන් පැහැදිලි ව බෙදා වෙන් කරනු ලැබිණි.

"වාරිමාර්ග" යනු මෙරට ජනගහනයෙන් මිලියන 2.3 කට ආසන්න පිරිසක ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන කෘෂිකර්මය සමඟ අත්‍යන්තයෙන් බැඳී පවතින්නකි. එම නිසා කෘෂිකාර්මික සහ ගොවි ජනතාව සම්බන්ධ පර්යේෂණයන් හි දී "වාරිමාර්ග" විෂයය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති, නීතිරීති සහ කාර්යයන් ඉමහත් වැදගත්කමක් උසුලනු ලබන්නේ ය. පළාත් සභා ක්‍රමය ස්ථාපිත කොට ගත වූ දශක දෙකක කාලය තුළ, පළාත් සභා ක්‍රමය නිසා වාරිමාර්ග විෂයය ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම්, මතු වී ඇති ගැටලු සහ අභියෝග, නව ප්‍රවණතා සහ ශක්‍යතා පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම, මෙම අංශයේ ක්‍රියාකාරීන්ට මෙන් ම ඒ පිළිබඳ උනන්දුවක් දක්වන්නන්ට ද වඩා වැදගත් වනු ඇත.

පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ බලතල සහ වගකීම් ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? එහි දී මතු ව ඇති ගැටලු සහ අභියෝග කවරේ ද? පවතින ගැටලු මග හරවා ගනිමින් ජනතාවට කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දිය හැක්කේ කෙසේ ද? ආදිය පිළිබඳ ව මෙම ක්ෂේත්‍රයේ නියුතු හසල අත්දැකීම් සහිත නිලධාරීන්ගෙන් සහ විද්වතුන්ගෙන් ලබා ගත් තොරතුරු මෙම වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ. මෙම වාර්තාව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ විෂයයන් කිහිපයක් සම්බන්ධ ව පළාත් සභා ක්‍රමයේ බලපෑම පිළිබඳ ව වසරේ මුල් කාර්තුව තුළ පැවැත් වූ වැඩමුළු මාලාවේ තෙ වැනි වැඩමුළුවේ එක් ප්‍රතිඵලයකි. පවතින ක්‍රමය වඩා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ තීරණ ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් හට සහ දේශපාලන අධිකාරියට උපයෝගී කර ගත හැකි විවිධ මාර්ග සහ දිශාවන් මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත. මෙවැනි කාලීන මාතෘකාවක් පිළිබඳ විද්වත් වැඩමුළුවක් සංවිධානය කොට වාර්තාව මුද්‍රණය කොට පළ කිරීමට කටයුතු කළ සියලු දෙනාට ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කොට ගනිමි.

වී.කේ. නානායක්කාර
අධ්‍යක්ෂ

ස්තුතිය

මෙම විද්වත් වැඩමුළුව සංවිධානය කිරීම සඳහා අප ධෛර්යමත් කරමින් ද, අවශ්‍ය පරිපාලන සහාය නො අඩු ව ලබා දෙමින් ද සහයෝගය දැක් වූ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ වී.කේ. නානායක්කාර මහතාට අප ගේ කෘතඥ පූර්වක ස්තුතිය පිරිනැමේ. එමෙන් ම "ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විමධ්‍යගත කිරීම කෘෂිකාර්මික අංශය කෙරෙහි බලපා ඇති ආකාරය" පිළිබඳ ව අප විසින් සිදු කරනු ලබන අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීමේ ඵලදායී ක්‍රමවේදයක් ලෙස මෙවැනි විද්වත් වැඩමුළු මාලාවක් පැවැත්වීමේ අවශ්‍යතාව පිළිබඳ දැනුවත් කරමින් ඒ සඳහා අවශ්‍ය සහාය නිරතුරු ව ලබා දුන් ආයතනයේ අධිපර්යේෂක ආචාර්ය ධනවර්ධන ගමගේ මහතාට අප ගේ ස්තුතිය පිරිනැමේ.

වැඩමුළුව සංවිධානය කිරීමේ දී ඒ සඳහා ඇවැසි යම් යම් සහායන් ලබා දෙමින් මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා දායක වූ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයුම් අංශයේ අංශ ප්‍රධාන ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කොට ගනිමු. වාර්තාවේ පරිගණක කටයුතු නිසි වේලාවට ඉටු කරදීමෙන් තරංගා ද සිල්වා මෙනෙවිය දැක් වූ සහයෝගයට අප ගේ ස්තුතිය පිරිනැමේ.

අධික රාජකාරි මධ්‍යයේ වුව ද නිසි වේලාවට තම ලිපි සහ පත්‍රිකා අප වෙත ලබා දෙමින් සහයෝගය දැක් වූ සම්පත්දායක මහත්ම මහත්මීන් නො වන්නට මෙම කාල ඇතුළත වාර්තාව මුද්‍රණයෙන් පළ කිරීමට ඉඩ ප්‍රස්ථාව නො ලැබෙනු ඇත. එබැවින්, මෙම විද්වත් වැඩමුළුව සඳහා පත්‍රිකා ඉදිරිපත් කරමින්, සාකච්ඡාවල දී සක්‍රිය සහභාගීත්වයක් ලබාදෙමින් සහ මූලසුන හොබවමින් වැඩමුළුව සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය දැක් වූ සියලු ම සම්පත්දායක මහත්ම මහත්මීන්ට ස්තුතිය පිරිනැමේ. එමෙන් ම මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා සහාය වූ පරිපාලන, මුද්‍රණ සහ ප්‍රකාශන සහ තාක්ෂණික අංශ ඇතුළත් ආයතනයේ කාර්ය මණ්ඩලයට ද අප ගේ ස්තුතිය පිරිනැමේ.

එම්.කේ. නදීකා දමයන්ති

එම්.ඩී. සුසිලා ලුර්දු

පටුන

සමාරම්භක සැසිය

ගැදින්වීම 01
එම්.කේ. නදීකා දමයන්ති මෙනෙවිය
පර්යේෂණ නිලධාරිණී, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
පිළිගැනීමේ කථාව සහ වැඩමුළුවේ අරමුණු පැහැදිලි කිරීම 05
වී.කේ. නානායක්කාර මයා
අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටුයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
ආරාධිත අමුත්තා ගේ කථාව 06
ගරු හේම කුමාර නානායක්කාර මයා
කෘෂිකර්ම අමාත්‍ය

පළමු සැසිය

වාරිමාර්ග, ජල කළමනාකරණ හා ඉඩම් බලතල ව්‍යවස්ථානුකූලව බෙදා වෙන් කිරීම 09
වී.කේ. නානායක්කාර මයා
අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටුයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග සම්බන්ධව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ කාර්ය භාරය 15
ජයන්තා බුළුමුල්ල මිය
දිස්ත්‍රික් ලේකම්, කුරුණෑගල
පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය 20
භද්‍රා කමලදාස මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව
ගම්බද වාරිමාර්ග ආශ්‍රිත ජල කළමනාකරණ විෂයයෙහි ලා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය: පරිණාමය, වර්තමාන තත්ත්වය සහ අනාගත සැලසුම් 30
ද.දි. ප්‍රභාත් විතාරණ මයා
ඉංජිනේරු (ජල කළමනාකරණ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
පළමු සැසියේ සාකච්ඡාව 48

දෙ වැනි සැසිය

බලතල විමධ්‍යගතකරණය, පළාත් වාරිමාර්ග ක්ෂේත්‍රය කෙරෙහි බලපාන ආකාරය: ඌව පළාත ඇසුරින් 51
ඩබ්.එම්.සී. බණ්ඩාර මයා
ලේකම්, ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග සහ සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාවේ වාරි කෘෂිකර්මාන්තය: අතීත කාර්ය සාධනයන්, වර්තමාන තත්ත්වයන් සහ අනාගත අභියෝග 62
එම්.වයි. සෙයිනුදීන් මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වයඹ පළාත් සභාව
සුළු හා මධ්‍ය පරිමාණ වාරි කර්මාන්ත ඉදිකිරීම සහ නඩත්තු කාර්යයන් හි දී පළාත් සභා මුහුණ දෙන ගැටලු සහ දුෂ්කරතා 73
ජානක විජේකෝන් මයා
ඉංජිනේරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය, ඌව පළාත් සභාව
පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සහ ක්‍රියාකාරිත්වය: දකුණු පළාත් අත්දැකීම් 77
ඩඩ්ලි සිල්වා මයා
දිස්ත්‍රික් වාරි ඉංජිනේරු (මාතර) දකුණු පළාත් සභාව
දෙ වැනි සැසියේ සාකච්ඡාව 83
නිගමන සහ යෝජනා 88
සහභාගී වූවන් ගේ නාමලේඛනය 92

සමාරම්භක සැසිය

හැඳින්වීම

එම්.කේ. නදීකා දමයන්ති
පර්යේෂණ නිලධාරී,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ශ්‍රී ලංකාව අනාදිමත් කාලයක් තිස්සේ වාරි කෘෂිකර්මානත්යේ නියැලෙන, වාරි ශිෂ්ටාචාරයකට උරුමකම් කියනු ලබන රටක් වුව ද විවිධ යුගයන් හි දී එය නොයෙකුත් වෙනස්කම්වලට බඳුන් වී ඇත. බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත්කර ගැනීමෙන් පසු ව ඔවුන් විසින් මෙරට ක්‍රියාත්මක කළ අක්‍රමවත් ඉඩම් පරිහරණ රටාව සහ ඒ හා බැඳුණු නීති රීති වාරිමාර්ග පද්ධතියට සේ ම වාරි කෘෂිකර්මාන්තය කෙරෙහි ද ඉතා අහිතකර අන්දමින් බලපෑම් කරනු ලැබිණි. කෙසේ වුව ද 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනත මගින් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු පිහිටු වීම තුළින්, වාරි කෘෂිකර්මාන්තයට අදාළ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කරමින්, මනා ව පවත්වා ගෙන යාමට උත්සාහ දරණු ලැබිණි.

නිදහසින් පසු යුගය සලකා බලන විට වාරිමාර්ග ක්ෂේත්‍රය කැපී පෙනෙන වෙනස්කම්වලට බඳුන් වූ අවස්ථා හතරක් හඳුනා ගත හැක. එනම්,

i. 1958 අංක 01 දරණ "කුඹුරු පනත" හඳුන්වා දීම ත් සමග එතෙක් වෙල් විදානේ විසින් ඉටු කළ කාර්ය භාරය අහෝසි කොට එම බලතල ගොවි කාරක සභා වෙත පැවරීම.
ii. 1979 අංක 23 දරණ "මහවැලි සංවර්ධන අධිකාරී පනත" මගින් මහවැලි සංවර්ධන අධිකාරිය පිහිටුවා මහවැලි ව්‍යාපාරය යටතේ වන අන්තර් පළාත් සංවර්ධන ව්‍යාපෘති එම ආයතනය වෙත පැවරීම.
iii. 1979 අංක 58 දරණ "ගොවිජන සේවා පනත" මගින් වාරිමාර්ග යටතේ වන මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගේ මැදිහත් වීමක් සිදු කිරීම.
iv. 1987 දී සම්මත කරනු ලැබූ දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළින් සුළු වාරිමාර්ග සම්බන්ධ කටයුතු පළාත් සභාවට ද අන්තර් පළාත් වාරිමාර්ග ව්‍යාපෘති මධ්‍ය රජයට ද අයත් වන ලෙස වාරිමාර්ග විෂයයට සම්බන්ධ බලතල සහ කාර්යයන් පැවරීම වශයෙනි.

ඉහත කී අණ පනත් සියල්ල තුළින් විමධ්‍යගතකරණයේ භාවිතාවන් කිහිපයක් වාරිමාර්ග විෂයය සම්බන්ධයෙන් ක්‍රියාවට නංවා ඇත.

ඉඩම් සහ වාරිමාර්ග විෂයයන් එකිනෙක හා ඉතා සමීප ව බැඳී ඇති විෂයයන් වේ. "වාරිමාර්ග ජල කළමනාකරණ සහ ඉඩම් බලතල ව්‍යවස්ථානුකූල ව බෙදා වෙන් කිරීම" නම් වූ ලිපිය යටතේ වී.කේ. නානායක්කාර මහතා විසින් ඉඩම් සහ වාරිමරග විෂයයන් හි බලතල රජය සහ පළාත් සභා අතර බෙදා ඇති ආකාරය පිළිබඳ ව මෙන් ම එම බලතල බෙදීමේ අතාර්කික භාවය නිසා මතු වී ඇති ව්‍යාකූලතා පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලබයි.

1987 පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමට පෙරාතුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග විෂයයට අයත් කාර්යයන් සහ බලතල අනුකලනය වූ විභේදනයක් ඔස්සේ ක්‍රියාවට නංවන ලදී. 1987 පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනයේ නව වැනි උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ සඳහන් වන "කෘෂිකර්ම සහ ගොවිජන සේවා" විෂයය යටතේ සුළු වාරිමාර්ග සම්බන්ධ කටයුතු පළාත් සභා වෙත පවරා ඇත. මෙයට අමතර ව පළාත් සභා ලැයිස්තුවේ දහ නව වැනි වගන්තිය අනු ව පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන

යෝජනා ක්‍රම හැර සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම පළාත් සභා විෂයයන් වේ.

පළාත් සභා සහ රජය යන දෙපාර්ශවයටම මැදිහත් විය හැකි විෂයය කරුණු සඳහන් කර ඇති සමගාමී ලැයිස්තුවේ 17.1 වගන්තිය තුළින් ජල සම්පත් සැලසුම් කිරීම, ගංවතුරින් ආරක්ෂාව, ජලය රැස් කර තැබීම සහ පාලනය, ජලාපවාහනය සහ වේලි පිළිබඳ මැදිහත් වීමට ද අදාළ විෂයය කරුණු ද, 17.2 වගන්තිය තුළින් අන්තර් පළාත් ඉඩම් හා වාරිමාර්ග යෝජනා ක්‍රමවලට සලසනු ලබන සේවා සහ පහසුකම් සැලසීම සම්බන්ධ ව වූ විෂයය කරුණු ද ඉදිරිපත් කර ඇත.

දැන තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළින් වාරිමාර්ග සම්බන්ධ විෂයයන් සහ බලතල පැවරීමේ අපැහැදිලි බවක් නො වූ ව ද, ගොවිජන සේවා විෂයය සම්බන්ධයෙන් 1991 දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුව මත 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනත ඔස්සේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ද සුළු (ග්‍රාමීය) වාරිමාර්ග සම්බන්ධයෙන් මැදිහත් වේ. මෙම තත්ත්වය තුළ ආයතන ගණනාවක් වාරිමාර්ග විෂයය සම්බන්ධයෙන් මැදිහත් වීම නිසා ප්‍රායෝගික ව ගැටලු රාශියකට මුහුණ දීමට ඒ සම්බන්ධ වගකීම් දරණ ආයතනවලට, නිලධාරීන්ට මෙන් ම ගොවි ජනතාවට ද සිදු වී ඇත.

ආයතන ගණනාවක් වාරිමාර්ග විෂයය සම්බන්ධයෙන් මැදිහත් වන නිසා එම කටයුතු නිසි සම්බන්ධීකරණයකට ලක් වීම අත්‍යවශ්‍ය ය. දැනට මෙම කාර්යය ඉටු කරනු ලබන්නේ 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනතින් පිහිටු වනු ලැබූ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව මගිනි. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සංයුතිය, කාර්ය භාරය සහ වගකීම්, මුහුණ දෙන ගැටලු සහ ඒ සඳහා යෝජිත පිළියම් ද ජයන්තා බුළුමුල්ල මහත්මිය තම "පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග සම්බන්ධ ව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ කාර්ය භාරය" නම් ලිපියෙන් (පිටු 16-20) ඉදිරිපත් කරනු ලබයි. එම ලිපිය තුළින් මහා වාරි ව්‍යාපාර නො වන වාරි ව්‍යාපාරවල ගොවි සංවිධාන සහ ධීවර සංවිධාන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව තුළ නියෝජනය නො වීම, වාරිමාර්ග නඩත්තු කටයුතු සඳහා නිසි අවස්ථාවේ මුදල් නො ලැබීම, මාර්ග නඩත්තු ව සඳහා මුදල් වෙන් නො වීම නිසා ගොවීන් මුහුණ දෙන ගැටලු ආදිය පිළිබඳ විශේෂයෙන් අවධාරණය කර ඇත.

සිය වසකට අධික කාලයක් තිස්සේ මෙරට වාරිමාර්ග විෂයය සම්බන්ධ වගකීම් උසුලනු ලබන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය, වගකීම් සහ බලතල, එම කාර්යය භාරය ක්‍රියාවට නැංවීම සඳහා වන ආයතනික ව්‍යුහය, වාරිමාර්ග විෂයයට අදාළ ව විමධ්‍යගතකරණය ක්‍රියාවට නංවා ඇති ආකාරය, පළාත් සභා පිහිටු වීමෙන් පසු ව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු සම්පත් සහ වාරි ව්‍යාපාර පළාත් සභාවට භාරදීම නිසා පැන නැගුණු තත්ත්වයන් පිළිබඳ භද්‍රා කමලදාස මහත්මිය විසින් තම "පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය" නම් ලිපියෙන් කරුණු ඉදිරිපත් කරනු ලබයි (පිටු 21-29). එමෙන් ම වාරිමාර්ග සම්බන්ධ බලතල විමධ්‍යගත කිරීම නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මුහුණ දෙන ගැටලු වශයෙන් පළාත් සභාව විසින් සිදු කරනු ලබන නව ජල සම්පත් සංවර්ධන කටයුතු හේතුවෙන් පවතින ව්‍යාපාරවල ජල කළමනාකරණයට යම් යම් අහිතකර බලපෑම්වලට මුහුණ දීමට සිදු වීම, ගංවතුර පාලන, කරදිය වැළැක්වීමේ සහ ජල බස්නා ව්‍යාපාරවලට බාධා ඇති වීම සහ වාරිමාර්ග ව්‍යාපාරවල ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් බාධා පැන නැගීම විශේෂයෙන් ම අවධාරණය කරනු ලබයි (පිටු 26-28). මහා වාරි ව්‍යාපාරවල කළමනාකරණ කමිටුව නියෝජනය කිරීමට පළාත් සභාවලට අවකාශ සැලසීම, ජලාශවල ආරක්ෂාව සම්බන්ධ ව දේශීය ප්‍රමිතීන් සැකසීම, ජල කළමනාකරණ ඒකකය ලෙස ගංගා ද්‍රෝණිය සැලකීම (පිටු 28-29) වැනි ක්‍රියා මාර්ග තුළින් මෙම ගැටලුවලින් බොහොමයක් නිරාකරණය කර ගැනීමට හැකියාව පවතින බව ද එම ලිපියෙන් පෙන්වා දෙනු ලබයි.

දැදි. ප්‍රභාත් විතාරණ මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ "ගම්බද වාරිමාර්ග ආශ්‍රිත ජල කළමනාකරණ විෂයයෙහි ලා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය: පරිණාමය, වර්තමාන තත්ත්වය සහ

අනාගත සැලසුම්" නම් ලිපියෙන් මෙරට වාරි ශිෂ්ටාචාරයේ පරිණාමය, පළාත් සභා ස්ථාපිත කිරීමෙන් පසු ව මතු වී තිබෙන ගැටලු සහ වාරි ක්ෂේත්‍රයේ අනාගත සැලසුම් කෙසේ විය යුතු ද? යන්න පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලබයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සේ ම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ද පළාත් සභා ස්ථාපිත කිරීමත් සමග තම සම්පත් බොහොමයක් පළාත් සභා වෙත පවරා දුන් ආකාරය ත් ඒවා අවභාවිතයට ලක්වීම නිසා වාරිමාර්ග ක්ෂේත්‍රය ගැටලුවලට මුහුණ දුන් ආකාරය ත් ඔහු ගේ ලිපියෙන් අවධාරණය කරනු ලබයි (පිටු 31-45). වර්තමානයේ ගම්බද වාරිමාර්ග මුහුණපාන ගැටලු වශයෙන් වාරි ජලය සැපයිය හැකි වගා බිම් ප්‍රමාණයට වඩා වැඩි බිම් ප්‍රමාණයක් එම වාරි ව්‍යාපාර යටතේ අස්වද්දා තිබීම, සාම්ප්‍රදායික වගා නීති ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක නො වීම සහ වලංගු නො වීම, ධාරා ප්‍රදේශවල වනාන්තර ප්‍රතිශතය අඩුවීම සහ අක්‍රමවත් සංවර්ධනය නිසා සිදු වන හානි පිළිබඳ ව ඔහු ගේ ලිපියෙන් කරුණු ඉදිරිපත් කෙරේ (පිටු 41). මෙම ගැටලු විසඳීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෘ.ප.නි.ස.වරුන් හරහා ජල සංරක්ෂණ උපාය මාර්ග හඳුන්වා දීම, ගංගා ද්‍රෝණි, උප ද්‍රෝණි සහ එල්ලංගා පද්ධති දැක්වෙන ජලපෝෂක සිතියමක් එළිදැක්වීම, ජල විද්‍යාත්මක දත්ත පාදම් බිහිකිරීම, පරිසර සංවේදීතාව ආරක්ෂා කරවීම ආදී ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන බව ඔහු ගේ ලිපියෙන් ඉදිරිපත් කෙරේ.

ඩබ්.එම්.සී. බණ්ඩාර මහතා ගේ "බලතල විමධ්‍යගතකරණය පළාත් වාරිමාර්ග ක්ෂේත්‍රය කෙරෙහි බලපාන ආකාරය: ඌව පළාත ඇසුරින් " ලිපියෙන් සහ ජානක විජේකෝන් මහතා ගේ "සුළු හා මධ්‍ය පරිමාණ වාරි කර්මාන්ත ඉදිකිරීම් සහ නඩත්තු කාර්යයන් හි දී පළාත් සභා මුහුණ දෙන ගැටලු සහ දුෂ්කරතා" පිළිබඳ ව වූ ලිපියෙන් ද වාරිමාර්ග ක්ෂේත්‍රයේ බලතල ක්‍රියාවට නැංවීමේ දී පළාත් සභා මුහුණ දෙන ගැටලු බොහොමයක් ඉදිරිපත් කරනු ලබයි. පළාත් සභාවේ විෂයයන් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නීතිමය අධිකාරීත්වය ප්‍රඥප්ති සම්මත කරගැනීමෙන් ස්ථාපිත කර නො ගැනීම (පිටු 55), කාර්ය මණ්ඩල හිඟය (පිටු 56-58), පළාත් සභා පාලනය යටතේ පැවතිය යුතු වාරිමාර්ග, පළාත් සභාව යටතට නො පැවරීම (පිටු 61-62), වාරි ක්‍රම හා පෝෂිත ප්‍රදේශ පිළිබඳ පළාත් සභාවට දත්ත පද්ධතියක් නොමැතිකම (පිටු 61) වාරිමාර්ග සම්බන්ධයෙන් පළාත් සභා මුහුණ දෙන ප්‍රධාන ගැටලු වශයෙන් ඩබ්.එම්.සී. බණ්ඩාර මහතා සඳහන් කරනු ලබයි. ඉදිකිරීම් කටයුතුවල දී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය නිසා විවිධ ගැටලුවලට මුහුණ දීමට පළාත් සභාවලට සිදු වේ. විශේෂයෙන් ම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ගොවි සංවිධාන අතර පැහැදිලි සහ සෘජු සම්බන්ධතාවක් නො වීම, මූලික විමර්ශන සඳහා අරමුදල් වෙන් කිරීමේ ගැටලුව, ප්‍රවාහන පහසුකම් සහ ගමනාගමන දුෂ්කරතා, අවශ්‍ය දත්ත හිඟකම, ගොවීන් ගේ සහභාගීත්වය අවම වීම, ඉල්ලීම් රාශියක් සඳහා ප්‍රතිචාර දැක්වීමට සිදුවන හෙයින් බොහෝ විට ලැබෙන ප්‍රතිපාදනවලින් කර්මාන්තයක සුළු කොටසක් පමණක් ඉටු කිරීමට සිදුවීම, හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පළාත් සභාවට අරමුදල් නොමැති වීම මේ සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ගැටලු වශයෙන් ජානක විජේකෝන් මහතා තම ලිපියෙන් ඉදිරිපත් කරනු ලබයි.

එම්.වයි. සෙයිනුදීන් මහතා ගේ "ශ්‍රී ලංකාවේ වාරි කෘෂිකර්මාන්තය අතීත කාර්ය සාධනයන්, වර්තමාන තත්ත්වයන් සහ අනාගත අභියෝග" නම් ලිපියෙන් ශ්‍රී ලංකාවේ ජල සම්පතෙ හි සංවර්ධනය, ප්‍රතිපත්තිමය අරමුණු, වාරිමාර්ග කටයුතු කළමනාකරණය සහ ඒ සඳහා පනවා ඇති අණපනත්, අතීත කාර්ය සාධනය සහ වාරි කෘෂිකර්මාන්තයේ අනාගතය පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලබයි (පිටු 64-75). එමෙන් ම දැනට වාරිමාර්ග ක්ෂේත්‍රය මුහුණ දෙමින් පවතින ජාතික මට්ටමේ මෙන් ම පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ ගැටලු පිළිබඳ ව ද එම ලිපියෙන් කරුණු ඉදිරිපත් කෙරේ. යෝජිත වැඩසටහන් සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදයන් (පිටු 73), ආයතනික සංවර්ධනය සහ ප්‍රතිලාභී සහභාගීත්වයේ ගැටලු (පිටු 74), ඉතා කෙටි කාලයක් තුළ කර්මාන්ත රාශියක් සඳහා යෝජනා සහ ඇස්තමේන්තු සකස් කිරීමට පළාත් කාර්ය මණ්ඩලයට සිදුවීම (පිටු 73), වැව් රක්ෂිත සහ ජල මූලාශ්‍ර ආරක්ෂා කරගැනීමේ දී පළාත් සභා මුහුණ දෙන ගැටලු මෙන් ම දේශපාලන මැදිහත්වීම් නිසා මතු වන ගැටලු පිළිබඳ ව ද එම ලිපියේ සඳහන් කෙරේ (පිටු 74).

ඩබ්ලි සිල්වා මහතා ගේ "පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සහ ක්‍රියාකාරිත්වය: දකුණු පළාත් අත්දැකීම්" පිළිබඳ ලිපියෙන් මූලික වශයෙන් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නෛතික බලය සහ පරිපාලන කටයුතු, ක්‍රියාකාරිත්වය සහ ක්‍රියාකාරිත්වයේ දී මුහුණ දෙන ගැටලු සහ අභියෝග පිළිබඳ කරුණු ඉදිරිපත් කෙරේ. පසු විපරම් කටයුතු සිදු නො කිරීම (පිටු 83), නිසි පරිදි මූලික විමර්ශන සහ අධීක්ෂණ කටයුතු සිදු කිරීමට පවතින බාධා (පිටු 83), විවිධ ආයතන මැදිහත් වීම නිසා කාර්යයන් අතිපිහිත වීම සහ අනිවාර්යයෙන් කළ යුතු කාර්යයන් මගහැරී යාම, මුහුදු මට්ටමෙන් පහළ කුඹුරුවල ඵලදායීතාව සහ දරිද්‍රතාව කෙරෙහි එය බලපාන ආකාරය (පිටු 83-84), ආර්ථිකමය වශයෙන් ඵලදායී වගාවකට යොමු වීමේ ඉඩකඩ ඇහිරීම (පිටු 85), පළාත් සභා සහ ගොවි සංවිධාන අතර සෘජු සම්බන්ධයක් නො වීම නිසා පැන නගින ගැටලු (පිටු 84) ආදිය පිළිබඳ කරුණු ඉදිරිපත් කෙරේ.

වාර්තාවේ නිගමන සහ යෝජනා තුළින් වාරිමාර්ග සම්බන්ධයෙන් පැන නැගී ඇති නෛතික, පරිපාලන, සම්බන්ධීකරණ, සැලසුම් සහ සංවර්ධන සහ සම්පත් පිළිබඳ ගැටලු මෙන් ම ඒ සඳහා වැඩමුළුව තුළින් ඉදිරිපත් වූ විසඳුම් යෝජනාවන් සඳහන් කර ඇත.

පිළිගැනීමේ කථාව සහ වැඩමුළුවේ අරමුණු පැහැදිලි කිරීම

වී.කේ. නානායක්කාර
අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සුබ උදෑසනක් වේවා!
කෘෂිකර්ම අමාත්‍ය ගරු හේමකුමාර නානායක්කාර මැතිතුමනි,
නෝනාවරුනි, මහත්වරුනි,

"ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරිත්වය සඳහා බලපාන ආකාරය" පිළිබඳ ව වූ විද්වත් වැඩමුළුව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පැමිණි කෘෂිකර්ම අමාත්‍ය ගරු හේමකුමාර නානායක්කාර මැතිතුමා ඉතා ගෞරවයෙන් සහ සාදරයෙන් පිළිගනිමි. මෙම වැඩමුළුව, සාර්ථක කර ගැනීමේ අපේක්ෂාවෙන් පළාත් කිහිපයක ම වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරුන් සහ අධ්‍යක්ෂකවරුන්ට ආරාධනා කළෙමු. පැමිණ සිටින ඒ සියලු දෙනා ඉතාමත් සාදරයෙන් පිළිගනිමි.

එමෙන් ම මෙම අවස්ථාවට සහභාගී වන පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් සහ වාරිමාර්ග ඉඩම් හා ජල කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ ඉඹුලාන මහතා ඉතා ගෞරවයෙන් පිළිගනිමි.

මෙම වැඩමුළුව කෘෂිකර්ම, සත්ත්ව පාලන, ඉඩම් සහ වාරිමාර්ග යන විෂයයන් කෙරෙහි පළාත් සභා ක්‍රමය විසින් සිදු කරනු ලැබූ බලපෑම පිළිබඳ කරුණු විමර්ශනය කිරීමේ අරමුණින් අප ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ වැඩමුළු මාලාවේ තෙ වැනි වැඩමුළුව ය. මෙයට ප්‍රථම අප විසින් පවත්වනු ලැබූ වැඩමුළු ද්වයෙන්, පළාත් සභා ක්‍රමය සමස්ත කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනයට දායක වන්නේ කෙසේද? යන්න ත්, පළාත් සභා ක්‍රමය ඉඩම් විෂයය කෙරෙහි බලපාන ආකාරය ත් පිළිබඳ කරුණු සාකච්ඡාවට බඳුන් කෙරිණි. අද දින, ඉතාමත් වැදගත් ක්ෂේත්‍රයක් වන වාරිමාර්ග විෂයය සම්බන්ධ ව කරුණු සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය. බලතල බෙදීම, මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනයට රුකුලක් වී ද? බාධාවක් වී ද? එසේ රුකුලක් හෝ බාධාවක් වූ වේ නම් එය සිදු වූයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හේතුවෙන් ද? නැතහොත් ජාතික මට්ටමේ, පළාත් මට්ටමේ, බහුවිධ ආයතන පැවතීමෙන් ද? එමෙන් ම පරිපාලනමය වශයෙන් ජාතික තලය ත්, පළාත් මට්ටම ත් අතර යම් යම් ගැටලු ඇති වූයේ ද? එවැනි ගැටලු ඇති වූයේ නම්, ඒවා මගහැර වාරිමාර්ග ක්ෂේත්‍රයේ කටයුතු වඩා ත් පහසු කිරීමට, කාර්යක්ෂම කිරීමට යම් යම් වෙනස්කම් කළ යුතු ද? එසේ නම් එම සංශෝධන මොනවා ද? ආදිය පිළිබඳ කරුණු, අත්දැකීම් සහිත විද්වත් ඔබෙන් අනාවරණය කරගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම කරුණු පිළිබඳ ලබාගන්නා අවබෝධය තුළින් ප්‍රතිපත්ති සම්පාදකයින් හට වාරිමාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධනය සම්බන්ධයෙන් යම් යම් නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වේ.

පළාත් සභාවල වාරිමාර්ග විෂයය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්, ලේකම්වරුන් සහ ඉංජිනේරු නිලධාරීන් මෙන් ම වාරිමාර්ග විෂයය සම්බන්ධ වෙනත් නිලධාරීන් ද සහභාගී වන බැවින්, ඔවුන්ගේ ගැටලු, සාර්ථක අසාර්ථක අවස්ථාවන් ආදී නොයෙකුත් අත්දැකීම් අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කරගැනීමට මෙය දුර්ලභ අවස්ථාවක් වනු ඇත.

මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන වාරිමාර්ග විෂයයේ පවතින ව්‍යාකූල තත්ත්වයන් මෙන් ම ගැටලු මගහරවා ගනිමින් පවතින ක්‍රමය සාර්ථක කරගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමට අවැසි සක්‍රීය දායකත්වය සියල්ලන් තුළින් ම ලැබෙනු ඇතැ යි මම අපේක්ෂා කරන අතර, වැඩමුළුවේ සාර්ථකත්වයට සුබ ප්‍රාර්ථනා කරමි.

ආරාධිත අමුත්තා ගේ කථාව

කෘෂිකර්ම අමාත්‍ය
ගරු හේමකුමාර නානායක්කාර මැතිතුමා

සුබ උදෑසනක් වේවා!

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ
අධ්‍යක්ෂ තැන්පත් වී.කේ. නානායක්කාර මැතිතුමණි,
රජයේ සහ පළාත් සභාවල උසස් නිලධාරී මහත්ම/මහත්මාවණි, මිත්‍රවරුණි,

"පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරිත්වය" පිළිබඳ ව අද දිනයේ පැවැත්වෙන විද්වත් වැඩමුළුවට ආරාධනා කිරීම සම්බන්ධයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂතුමා ඇතුළු සංවිධායක මණ්ඩලයට ප්‍රථමයෙන් ම මාගේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

මා විසින් "රජයේ සහ පළාත් සභා" යැයි කීවාට, කිසිවෙකු අභිතක් නො සිතන්නේ නම් මැනවි. "මධ්‍යම රජය" යනුවෙන් මා භාවිතා නො කරන්නේ, මධ්‍යම රජය යැයි කී විට, එයට ප්‍රාන්ත රාජ්‍යයන් තිබිය යුතු බැවිනි. If there is a Central Government, there will be Provincial Governments. There are no Provincial Governments. We will have Provincial Councils at maximum devolution for the Northern area.

මීළඟ කාරණය වන්නේ, අද දින පැවැත්වීමට යෙදුණු ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම වාරිමාර්ග ක්ෂේත්‍රයට බලපාන ආකාරය පිළිබඳ විද්වත් වැඩමුළුව ආරම්භ කිරීමට සූදානම් වීම යි. මාගේ දැනීමේ ආකාරයට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් දීර්ඝ කාලයක් පුරා මෙවැනි අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වනු ලබන්නේ ය. විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ, මගේ කල්‍යාණ මිත්‍ර, හිටපු කෘෂිකර්ම අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමා ගේ කාලයේ පටන් ම මෙම ආයතනයේ ගතික ස්වභාවය දිනෙන් දින වැඩි වීමේ ප්‍රවණතාවක් පැවතීම ය. එමෙන් ම පුවත්පත් වාර්තාවල සඳහන් වන ආකාරයට ත් අප හට ලැබෙන තොරතුරුවලට අනු ව ත් ආයතනය සතු සම්පත් ප්‍රයෝජනයට ගෙන එක කණ්ඩායමක් ලෙසින් කටයුතු කරන විශාල බුද්ධි මණ්ඩලයක්, බුද්ධි සංචිතයක් මෙම ආයතනය තුළ සිටින බව සඳහන් කළ යුතු වේ. එම සියලුදෙනා ද, රජයේ සහ පළාත් සභාවල ඉහළ මට්ටමේ නිලධාරී මහත්ම, මහත්මීන් ද ඒකරාශී කොටගෙන කිසියම් විෂයය පථයක් මුල් කොටගෙන පවත්වනු ලබන මෙවැනි වැඩමුළු තුළින්, රටට අවශ්‍ය සැලසුම් සම්පාදනයට මනස සකස් කර ගැනීමට ත් ඒ සඳහා උනන්දුවක් ඇති කරගැනීමට ත් අවශ්‍ය පදනම සකස් කෙරේ.

මෙයට ප්‍රථම පවත්වනු ලැබු වැඩමුළු දෙක සේ ම බලය විමධ්‍යගත කිරීම වාරිමාර්ග ක්ෂේත්‍රය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කෙරෙන මෙම වැඩමුළුව ද කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ඉතා වැදගත් වන බව මාගේ හැඟීම යි. මන්ද, වාරිමාර්ග ක්‍රියාවලිය නිවැරදි ව සිදු නො වන්නේ නම්, නිෂ්පාදන ක්‍රියාවලියේ දී ගොවියාගේ සක්‍රිය දායකත්වය අඩපණ විය හැකි හෙයිනි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ වීමට නම් පස, ජලය, වාතය සහ හිරුඑළිය යන ප්‍රධාන කරුණු සම්පූර්ණ විය යුතු ය. පස, හිරුඑළිය සහ වාතය පිළිබඳ ප්‍රශ්නයක් නොමැති වුව ද බොහෝ අවස්ථාවල දී ගැටලු මතුවන්නේ වාරි ජල සැපයුම සම්බන්ධයෙනි.

නුදුරු දිනෙක, මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොළ, කොළඹගම නම් ගම්මානයට ගියෙමි. එහි දී කොළඹගම අලුත්වැව සහ ඇටම්පිටිය වැව ත්, මගේ මතකයේ ආකාරයට තවත් වැව් කිහිපයකුත්

ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව තිබෙන බව පෙනුණි. එමෙන් ම එම වැව් ආශ්‍රිත වගා බිම්වල මෙවර අස්වැන්න දෙකෙන් පංගුවකට ත් වඩා අඩු වී ඇත. මෙයට හේතු වී ඇත්තේ, ගොයම හිං බංඩි, මහ බංඩි, අවස්ථාවේ දී ජලය හිඟවීම ය. මෙම තත්ත්වය ගොවීන් හට විශාල අර්බුදයක් නිර්මාණය කර තිබේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හෝ වාරිමාර්ග, ජල කළමනාකරණ අමාත්‍යාංශයට හෝ මෙම අර්බුදය සඳහා ක්ෂණික විසඳුම් දිය නො හැකි ය.

නමුත් මෙවැනි තත්ත්වයන්ට මුහුණ දීමට මේ රටේ පහළ වූ ශ්‍රේෂ්ඨ නායකයින් වූ මහාමාන්‍ය ඩී.ඇස්. සේනානායක වැන්නන් සමත් වූහ. 1931 දී කෘෂිකර්ම ඇමතිවරයා ලෙස ඔහු කළ ප්‍රථම කටයුත්ත වූයේ, ලංකාවේ සියලු ම වැව්, අමුණු සහ ජල මාර්ග මිණිතය කර, ලේඛනගත කරන ලෙස එවකට මිණුම්පති ව කටයුතු කළ ආර්.එල්. බ්‍රෝහියර් මැතිතුමාට නියෝග කිරීම ය.

එතුමා ගේ උපදෙස් පරිදි "Ancient Irrigation Works of Ceylon'' නම් ග්‍රන්ථයේ, ශ්‍රී ලංකාවේ සියලු ම වැව්, අමුණු සහ ජල මාර්ගයන් හි මිණිතයන් අඩංගු කළ අතර, ඉන් අනතුරුව මේවා සියල්ල සංවර්ධනය කළ යුතු බව ත්, යෝධ කෘෂිකාර්මික සංවර්ධනයක් කරා යැමට නම් යෝධ වාරිමාර්ග ජල කළමනාකරණයක් අවශ්‍ය බව ත්, මෙතුමා තේරුම් ගනු ලැබුවේ, නටබුන් වූ වැව් අමුණු තමා විසින් ම පිරික්සා බැලීම තුළිනි.

අප ගේ ගම්මානවල තිබෙන වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ඒවායින් නිසි ප්‍රයෝජන ගත යුතු ය. ඇතැමුන් විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් ගේ, ඉංජිනේරුවරුන් ගේ මතයන් අභිබවා යමින් යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් වැව් තැනීමේ ක්‍රියාවලියට යොමුවීම නිසා වැවේ පවතින මතුපිට මැටි ස්ථරය (Impervious layer) විනාශ වී ගොස් ඇත. "It protects and prevents surface water from getting down to the ground water". නවීන නො වුව ද ඉතාමත් දියුණු, තාක්ෂණයක් එකල වැව් ආශ්‍රිත ක්‍රියාවලිය තුළ අන්තර්ගත වී තිබිණ. ඉපැරණි රජදරුවන් ගේ යුගයේ අලි ඇතුන් ලවා මඩ සොරොව්ව කළඹා රොන් මඩ ඉවත් කර වැව යථා තත්ත්වයට පත් කළ අතර පසුකාලීන ව එය මී ගවයින් යොදා සිදු කිරීමට ගමේ ගමරාල වගකීමෙන් බැඳී සිටියේ ය. වර්තමානයේ පවතින නවීන තාක්ෂණය සමග ඉදිරියට යාමට නම් යන්ත්‍ර සූත්‍ර භාවිතා කළ යුතු ය. නමුත් එසේ කළ යුත්තේ, මෙම වාරි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉංජිනේරුවරුන් සහ උසස් නිලධාරීන් ගේ මතයට ද ගරු කරමින් ඔවුන් ගේ සහාය ද සමගිනි. Government Servants are the people who run the Government Machinery. රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක වන්නේ රාජ්‍ය සේවකයින් ගේ ක්‍රියාකාරීත්වය මත ය. ඔවුන්ට තමන් ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර නො තිබේ. රාජ්‍ය නිලධාරීන් මුදලට ගැනීමට උත්සුක වන මෙවන් සමාජයක, එවැනි දේට නො පෙළඹෙන නිලධාරීන් ද බොහෝමයක් අප රට තුළ සිටිති. ඔවුහු මෙම රටට වාසනාවකි.

මා විසින් වාරිමාර්ග ආශ්‍රිත ව හඳුනාගත් ප්‍රශ්නයක් තිබේ. එනම්, එක්තරා කණ්ඩායමක් විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කළ යුතු බවට හඳුනාගෙන ඇති වැව්වල තිබෙන්නා වූ මඩ සහ පස් ඉවත් කර සෝදා, සමාගමක් හරහා වැලි අලෙවි කිරීමේ කටයුත්තක්, සිදු කරනු ලබයි. අලෙවි කරනු ලබන වැලි සඳහා ලැබෙන මුදල, ගොවියා ගේ යහපත සඳහා යොදවන බවත් මෙම පිරිස පවසති. පිටතින් පෙනෙන පරිදි මෙම කටයුත්ත වඩාත් රමණීය, සුන්දර, නිස්සාරණාධ්‍යාසයෙන් ජනතා සේවයට කැපවෙන වගන්ති සඳහන් ලියවිල්ලක් ද සහිත වූවකි. මෙ තුළින් රාජ්‍ය වියදම ද අවම වේ. නමුත් මෙහි යථා ස්වභාවය අප විසින් පරීක්ෂා කළ යුතු ය. මෙම කටයුත්ත දෙස සෘණාත්මක ව නො බැලිය යුතු අතර, සිදු වන්නේ යහපත් ක්‍රියාවක් යැයි සිතා අපරීක්ෂාකාරී ව සිටී ම ද නො කළ යුතු ය.

In order to regulate the affairs of government, all government servents are formed into different regulatory bodies. For an example, a private sector company may say that they are keen in developing an area for a playground. The area they suggest for this purpose may have valuable timber trees. Ueterior motive behind would be to get the valuable timber trees free of charge. At a time like this, the government regulatory body should take prompt action. I am not opposed to the private sector. I am fully with the private sector.

පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය සමග මම සම්පූර්ණයෙන් ම එකග වෙමි. මෙම අංශයේ දායකත්වයෙන් තොර ව රාජ්‍ය අංශයට තනි ව ව්‍යාපාර කළ නො හැකි ය. නමුත් එය පාලනයක් සහිත විය යුතු අතර පාලන අංශය, රාජ්‍යය විය යුතු ය. රාජ්‍ය නිලධාරියෙකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ ඇමතිවරයෙකු යම් වරදක් කළ විට ජනමාධ්‍ය හරහා ඔවුන් හට විශාල පහර දීමක් සිදු කරනු ලබයි. මෙම තත්ත්වයන්ට මුහුණ දීමේ ශක්තිය අප විසින් ඇති කර ගත යුතු ය. නිලධාරීන් නිවැරදි දේ සිදු කරන විට සමාගමක්. පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ පුවත්පත් විසින් එල්ල කරන චෝදනා සඳහා මුහුණ දීමට රාජ්‍ය නිලධාරීන් ශක්තිමත් විය යුතු ය. එවැනි ශක්තිමත් භාවයක් ගොඩනගා ගැනීම තුළින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ කටයුතු කාර්යක්ෂම ව හා ඵලදායී ලෙස ත් ගොවි ගැටලු නිරාකරණය වන ආකාරයට ත් මෙහෙය වීමට නිලධාරීන් තුළ දැනට ත් පවතින හැකියාවන් වැඩි දියුණු වේවා' යි පතමි.

පළමු සැසිය

වාරිමාර්ග, ජල කළමනාකරණ හා ඉඩම් බලතල ව්‍යවස්ථානුකූල ව බෙදා වෙන් කිරීම

වී.කේ. නානායක්කාර
අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සංක්ෂේපය

1987 දී පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමට පෙරාතුව ඉඩම්, වාරිමාර්ග සහ ජල කළමනාකරණ විෂයයන් පරිපාලන විමධ්‍යගතකරණය ඔස්සේ ක්‍රියාවට නගන ලදී. පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමේ දී මෙම විෂයයන් සම්බන්ධ කරුණු (Subject Matters) පළාත් සභා සහ සංවෘත ලැයිස්තු ඔස්සේ පළාත් සභා සහ රජය වෙත පවරන ලදී. එයට අමතර ව සමගාමී ලැයිස්තුව යටතේ එකී දෙපාර්ශවයට ම මැදිහත් විය හැකි බලතල ද සඳහන් කර ඇත.

මෙම ලිපිය තුළින් වැඩමුළුවට ප්‍රවේශයක් වශයෙන්, දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනයේ නව වැනි උපලේඛනය මගින් පළාත් සභා සහ රජය අතර බලතල බෙදා ඇති ආකාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කෙරේ.

1.0 හැඳින්වීම

1987 නොවැම්බර් 14 දින සිදු කරන ලද දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙරාතුව ශ්‍රී ලංකාවේ බලතල විමධ්‍යගත කිරීම සිදු කරන ලද්දේ පරිපාලනමය වශයෙනි. එමගින් සිදු වූයේ ජාතික මට්ටමේ පිහිටි දෙපාර්තමේන්තු බලතල, ක්ෂේත්‍රයේ පිහිටි ශාඛා කාර්යාලවල නිලධාරීන්ට පැවරීම මගින්, තීරණ ගැනීම වඩාත් මහජනතාවට සමීප මට්ටමකට දියත් කිරීම ය. එසේ වුව ද, දහ තුන් වැනි සංශෝධනය මගින් බලතල පවරාදීම සිදු කරන ලද්දේ මහජනතාව විසින් තෝරා පත් කරනු ලබන උප ජාතික තලයක පිහිටි පළාත් සභා වෙත ය. එසේ බෙදා දෙනු ලබන බලතල නැවතත් රජය වෙත පවරා ගත නො හැක්කේ ය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ තුන් වැනි සංශෝධනයේ නව වැනි උපලේඛනය මගින් ව්‍යවස්ථාදායක කාර්යය පළාත් සභා ලැයිස්තුව, සංවෘත ලැයිස්තුව හා සමගාමී ලැයිස්තුව යනුවෙන් කොටස් තුනකට බෙදා ඇත. පළාත් සභා ලැයිස්තුවට අයත් කාරණා සම්බන්ධයෙන් අසීමිත ලෙස ව්‍යවස්ථා පැනවීමට බලය පළාත් සභාව වෙත පවරා ඇත. සංවෘත ලැයිස්තුවේ සඳහන් කාරණා පිළිබඳව නීති සම්පාදන බලය හුදෙක් පාර්ලිමේන්තුව සතු වේ. සමගාමී ලැයිස්තුවේ සඳහන් කාරණා පිළිබඳව පළාත් සභා විසින් ප්‍රඥප්ති පැනවීමට පෙර පාර්ලිමේන්තුව විමසා බැලිය යුතු ය.

මෙසේ විෂයය කරුණු බෙදා වෙන් කිරීමේ දී එකිනෙකා ගේ විෂය පථයට අයත් වන කරුණු ලැයිස්තු කිහිපයක ම අඩංගුවීම නිසා ව්‍යාකූලතාවක් මතු වී ඇත.

2.0 විෂයය කරුණු බෙදා ලැයිස්තු අතර බෙදා වෙන් කිරීමේ දී මතුවී ඇති ගැටලු

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව "ඉඩම් පරිහරණ" විෂය පළාත් සභාවට අයත් බලතලයක් වේ. "පස සංරක්ෂණය" විෂයය සමගාමී ලැයිස්තුවට අයත් බලතලයකි. මධ්‍යම කඳුකරයේ අධික බෑවුම් ඉඩමක අර්තාපල් වගා කිරීම හේතුවෙන් නිරතුරු ව බුරුල් වන පස, මී.මී. 4000 ක පමණ වාර්ෂික වර්ෂාපතනයකට භාජනය වීමෙන් දැඩි පාංශු ඛාදනයක් සිදු වේ. මෙය මගහැරවීමට ක්‍රියාමාර්ග ගත යුත්තේ ජාතික මට්ටමේ රාජ්‍ය ආයතනයක් විසින් ද? නැතහොත් පළාත් සභා ආයතනයක් විසින් ද? ඉඩම් පරිහරණ සැලැස්මක් මගින් යම් ඉඩමක වගා කරන භෝගයන් සීමා කළ හැකි ය. එය පළාත් සභාව සතු වගකීමකි. අනෙක් අතට පාංශු සංරක්ෂණ බලධාරියා එම පනත යටතේ කෘෂිකර්ම

අධ්‍යක්ෂවරයා ය. ඒ අනු ව, රජයේ දෙපාර්තමේන්තුවකට එම කාර්යය අයත් ය. විවිධ අර්ථ නිරූපන යටතේ එක ම ක්‍රියාවලියක් පාලනය කිරීමට ජාතික හා පළාත් සභාවලට අයත් බහු විධ ආයතනවලට බලය පැවරේ. මෙහි අවසාන ප්‍රතිඵලය වනුයේ වගකීම එකිනෙකා කෙරෙහි යොමු කිරීමෙන් කිසිදු ප්‍රයෝජනවත් ක්‍රියාමාර්ගයක් කිසිවකු විසින් අනුගමනය නො කිරීම ය. දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනයේ නව වන උප ලේඛනයේ ලැයිස්තු තුන අතර විෂයයන් පැවරීමේ අතාර්කිකභාවය නිසා මෙබඳු ව්‍යාකූලතා ඇති වේ.

දහ තුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉදිරිපත් කරන ලද පළාත් සභා ක්‍රමය නිසා සේවක සංඛ්‍යා හා අනෙකුත් පරිපාලනමය වියදම් වැඩිවීමක් අපේක්ෂා නො කරන ලදී. ඇතැම් නිශ්චිත කරුණු හා විෂයයන් රජයේ සිට පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත පැවරීමත් සමඟ, රජයේ එම විෂයයන් භාර නිලධාරීන් ද පළාත් සභා වෙත පවරාදීමක් සිදු නො විණි. බලතල පැවරීමට පෙරාතුව ද, රේඛීය අමාත්‍යාංශවල පරිපාලන ව්‍යුහයන් තරමක් දුරට විමධ්‍යගත කොට තිබුණි. පවරා දෙන බලතල හා විෂයයන් සම්බන්ධයෙන් එකී විමධ්‍යගත ඒකක සහ වගකීම් පළාත් සභා වෙත පැවරීමක් අපේක්ෂා විය. මේ අනු ව ඉඩම් හා වාරි-ජල කළමනාකරණ විෂයයන් සම්බන්ධ සේවක සංඛ්‍යා ද්විකරණයක් සිදු වූයේ ද ? යන්න විමසා බැලීම වටී.

දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ(1) අනු ව්‍යවස්ථාව පරිදි පළාත් සභා ලැයිස්තුව ද 154 උ(5) යන අනු ව්‍යවස්ථාව පරිදි සමගාමී ලැයිස්තුව ද,. 154 උ(7) අනු ව්‍යවස්ථාව පරිදි සංවෘත (පාර්ලිමේන්තුවට පමණක් සීමා වූ) ලැයිස්තුව ද යනුවෙන් ජනරජයේ ව්‍යවස්ථා සම්පාදන බලය විස්තර කර ඇත. පළාත් සභා ලැයිස්තුවේ විෂයයන් සම්බන්ධ ව ප්‍රඥප්ති සම්මත කිරීමට පළාත් සභාවට සෘජු ව බලතල පැවරෙන නමුත් සමගාමී ලැයිස්තුවේ විෂයයන් සම්බන්ධ ප්‍රඥප්ති සකස් කිරීමේ දී ඒ පිළිබඳ ව පාර්ලිමේන්තුව විමසිය යුතු වේ.

3.0 රජයේ ඉඩම් අයිතිය, භුක්තිය හා පරිපාලනය පිළිබඳ විධි විධාන

3.1 ඉඩම් අයිතිය

දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධි විධාන අනු ව රජයේ ඉඩම්වල අයිතිය ජනරජය සතුව දිගට ම පැවතිය යුතු ය. ඒවාට අදාළ ලිඛිත නීතිය අනු ව ජනාධිපතිවරයා විසින් රාජ්‍ය මුද්‍රාව තබා බැහැර කිරීම හා ප්‍රදානය සිදු කෙරේ.

3.2 ඉඩම් භුක්ති විඳීම

යම් පළාතක පිහිටි රජයේ ඉඩම්, සංවෘත ලැයිස්තුවේ හෝ සමගාමී ලැයිස්තුවේ දැක්වෙන විෂයයක් සම්බන්ධ කාර්යයක් සඳහා රජයට අවශ්‍යවන්නා වූ අවස්ථාවක ආණ්ඩුව විසින් එම ඉඩම් ප්‍රයෝජනයට ලබා ගත හැකි ය. එසේ ප්‍රයෝජනයට ලබා ගත යුත්තේ එම කාරණය පාලනය කෙරෙන නීතිවලට අනුකූල ව ය. තවද, එම ඉඩම් එම විෂයය පිළිබඳ ව ප්‍රයෝජනයට ලබා ගැනීම සම්බන්ධයෙන් පළාත් සභාව විමසා බැලිය යුතු ය.

පළාත් සභා ලැයිස්තුවේ ඇතුළත් විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය වන්නා වූ ද පළාත් සභා සීමාව තුළ පිහිටි රජයේ ඉඩම් රජය විසින් ඒ ඒ පළාත් සභාවලට ලබා දිය යුතු ය.

3.3 ඉඩම් පාලනය කිරීම සහ කළමනාකරණය

ඒ ඒ පළාත් සභා විසින් තම පළාත් සභා ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම් පාලනය සහ පරිපාලනය කරනු ලැබිය යුතු ය. එසේ කරනු ලැබිය යුත්තේ එම කාරණය පාලනය කෙරෙන නීති සහ ප්‍රඥප්තිවලට අනුකූල ව ය.

3.4 ඉඩම් පවරාදීම සහ නියාදනය කිරීම (බැහැර කිරීම)

පළාත් ඇතුළත ඇති රජයේ ඉඩම් යම් පුරවැසියෙකුට හෝ සංවිධානයට පවරාදීමේ බලය ඇත්තේ ජනාධිපතිවරයාට වේ. එම බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ඒ සම්බන්ධ ව බලපාන නීතිවලට අනුකූල ව සහ අදාළ ඉඩම් පිහිටි පළාත් සභාවේ උපදෙස් මත ය.

3.5 අන්තර් පළාත් ව්‍යාපෘතිවලින් බිහි වූ කෘෂිකාර්මික ඉඩම් හා නිවාසස්ථාන ඉඩම්

මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය වැනි පළාත් දෙකකට හෝ ඊට වැඩි ගණනකට අයත් වන ව්‍යාපෘතිවලින් බිහි වූ කෘෂිකාර්මික ඉඩම් හා නිවාසස්ථාන ඉඩම් දැරිය හැකි ප්‍රමාණය පිළිබඳ ප්‍රතිපත්ති හා උපමාන නිශ්චය කිරීම මධ්‍යම ආණ්ඩුවේ වගකීම වේ. එහෙත් රජයේ වගකීම ක්‍රියාත්මක කළ යුත්තේ පළාත් සභා විමසීමෙන් පසු ව ය. එම ඉඩම් කොටස් ලබන තැනැත්තන් තෝරා ගැනීමේ උපමාන නිශ්චය කිරීම පළාත් සභා සතු බලතලයකි.

එම ඉඩම් කොටස් ලබන තැනැත්තන් තෝරා ගත යුත්තේ ජාතික ජනවාර්ගික අනුපාතය අනු ව ය. තවද, එම ව්‍යාපෘතිවල ඉඩම් කොටස් බෙදා දීම හැකිතාක් දුරට ඒ පළාතේ ජන විකාශන රටාව සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් නො වන පරිදි ද, මනුෂ්‍ය ජනාවාසවල ප්‍රජාවේ ඒකාග්‍රතාව සහතික කිරීමේ ප්‍රතිපත්තියට අනුකූල ව ද සිදු කළ යුතු ය. එබඳු අන්තර් පළාත් ව්‍යාපෘති පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම රජය සතු බලතලයකි. ජාතික ඉඩම් ප්‍රතිපත්තිය සකස් කිරීම ජාතික ඉඩම් කොමිෂන් සභාවේ වගකීමකි. එම කොමිෂන් සභාව රජය විසින් පිහිටුවිය යුතු ය.

4.0 වාරිමාර්ග සහ ජල කළමනාකරණය පිළිබඳ විධි විධාන

වාරිමාර්ග හා ජල කළමනාකරණ විෂයයන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූල ව පළාත් සභා, රජය සහ සමගාමී ලෙස බෙදී ගොස් ඇති ආකාරය පළමු වැනි වගුවෙ හි දැක්වේ. දෙ වැනි වගුවෙන් ඉදිරිපත් කර ඇත්තේ එම ලැයිස්තු තුන අතර ඉඩම් බලතල බෙදී ගොස් ඇති ආකාරයයි.

දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනයේ නව වැනි උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ කෘෂිකර්ම සහ ගොවිජන සේවා විෂයය යටතේ සුළු වාරිමාර්ග නඩත්තු සහ පුනරුත්ථාපන කටයුතු පළාත් සභාවලට පැවරේ. එමෙන් ම පළාත් සභා ලැයිස්තුවේ දහ නව වැනි ව්‍යවස්ථාව යටතේ අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති හැර සියලු වාරිමාර්ග හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම සම්බන්ධ බලතල පළාත් සභා වෙත පැවරී ඇත.

මෙහි දී ඉස්මතු වන වැදගත් කරුණ වනුයේ පළාත් සභා ලැයිස්තුව යටතේ 11 වන පරිශිෂ්ටයෙන් වාරිමාර්ග හා ඉඩම් සම්බන්ධ සෑහෙන බලතල ප්‍රමාණයක් මධ්‍යම ආණ්ඩුවට පැවරී ඇති බවකි.

ඉහත කරුණුවලට අමතර ව සමගාමී ලැයිස්තුවේ 17.1 සහ 17.2 ව්‍යවස්ථා යටතේ වාරිමාර්ග හා ජල කළමනාකරණය සම්බන්ධ බලතල පළාත් සභා සහ රජය යන ආයතන දෙකට ම පැවරී ඇත. ඒ යටතේ ගංවතුරින් ආරක්ෂාව, ජලාපවාහනය, වේලි, ජල සම්පත් සැලසුම් කිරීම දෙ පාර්ශවයට ම පැවරී ඇත.

දහ තුන් වැනි සංශෝධනයේ පළාත් සභා ලැයිස්තුව යටතේ සුළු වාරිමාර්ග සම්බන්ධ බලතල පළාත් සභා වෙත පැවරී ඇති නමුත් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අනු ව රජයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව "ග්‍රාමීය වාරිමාර්ග" යටතේ සුළු වාරිමාර්ග සම්බන්ධ කටයුතුවලට මැදිහත් වේ. එයට අමතර ව වාරිමාර්ග ආඥා පනතේ 62(1) වගන්ති ප්‍රකාර ව ගොවි සංවිධාන විසින් සුළු වාරිමාර්ග ව්‍යාපාර ක්‍රමවත් ව නඩත්තු නො කිරීමනිසා මහා වාරිමාර්ග ව්‍යාපාරයක පැවැත්මට අහිතකර ප්‍රතිඵල උදාවන බවට (රජයේ) වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒත්තු ගැන්වෙන අවස්ථාවක ඒ සඳහා මැදිහත්වී එහි නඩත්තු නියමානුකූල ව සිදු කිරීමට බලය පැවරී ඇත.

වගු සටහන් අංක 01: දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වාරිමාර්ග ජල කළමනාකරණ හා ඉඩම් විෂයයන් පැවරීම

පළාත් සභා බලතල	රජයේ බලතල	සමගාමී බලතල
පළාත් සභා ලැයිස්තුව 9. කෘෂිකර්මය සහ ගොවිජන සේවා 9.1 පළාත් බද කාර්ය සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය ද (අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම්වල පදිංචි කිරීමේ යෝජනා ක්‍රම, රජයේ ඉඩම් හා වැවිලි කෘෂිකර්මය හැර) කෘෂිකාර්මික සේවා ද ඇතුළු ව කෘෂිකර්මය 9.2 සුළු වාරිමාර්ග වැඩ කටයුතු පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම 19. වාරිමාර්ග පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම. **පරිශිෂ්ටය 11** **2. අන්තර් පළාත් වාරිමාර්ග කටයුතු සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති** 2.1 ඒ ව්‍යාපෘති, (අ) රජය විසින් පළාත ඇතුළත ආරම්භ කරනු ලැබුවා වූ ද, පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගාවල ජලය යොදා ගනු ලබන්නා වූ ද, වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය. එසේ වුව ද පළාත් සභාවක් විසින් ඒ ගංගාවල ජලය යොදා ගනිමින් ඒ පළාත ඇතුළත වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය ද ආරම්භ කරනු ලැබිය හැකි ය. (ආ) පළාතෙන් පිටත සිට හරවන ලද ජලය යොදා ගනු ලබන සහ පළාත් ඇතුළත වූ වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය. (ඇ) මහවැලි සංවර්ධන ව්‍යාපෘති වැනි, පාලන ප්‍රදේශය පළාත් දෙකකට හෝ වැඩි ගණනකට අයත්වන, සියලු යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය.	**සංචිත ලැයිස්තුව** ගංගා සහ ජල මාර්ග නැව් ගමනාගමනය සහ මුහුදු තරණය, ඓතිහාසික ජලය, දේශීය ජල තීරය, අනන්‍ය ආර්ථික කලාපය සහ මහාද්වීපික තටාකය සහ අභ්‍යන්තර ජලය ඇතුළුව සමුද්‍රීය කලාප 1 වන ලැයිස්තුවේ 18 වන විෂයය යටත් නිශ්චිත ව දක්වා ඇති ප්‍රමාණයට හැර රජයේ ඉඩම් සහ අක්. වෙරළ. (ඉ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ, අන්තර් පළාත් ගංගා සහ ගංගා නිම්න විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම මහජන හිත පිණිස අවස්ථාවෝචිත යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රමාණයට අන්තර් පළාත් ගංගා සහ නිම්න විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම (ර) දේශීය ජල තීරයෙන් ඔබ්බෙහි මසුන් ඇල්ලීම හා ධීවර කටයුතු **පළාත් සභා ලැයිස්තුව** **පරිශිෂ්ටය 11** **2. අන්තර් පළාත් වාරිමාර්ග සම්බන්ධ ව්‍යාපෘති** 2.2 මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් වගකීම ශ්‍රී ලංකා ආණ්ඩුව සතු විය යුතුය. 2.3 මේ ව්‍යාපෘති නිසා, ඇතිවන කෘෂිකාර්මික ඉඩම්වල සහ නිවාසස්ථාන ඉඩම් දැරිය හැකි ප්‍රමාණය පිළිබඳ ප්‍රතිපත්ති සහ උපමාන පළාත් සභා විමසා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. 2.8 ඒ ව්‍යාපෘති පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කළ යුතු ය.	17. වාරිමාර්ග 17.1 ජලය රැස් කර තැබීම සහ පාලනය කිරීම ජලාපවහනය සහ වේලි, ගංවතුරින් ආරක්ෂාව, ජල සම්පත් සැලසුම් කිරීම 17.2 ග්‍රාම සංවර්ධනය, සෞඛ්‍යය අධ්‍යාපනය, වෘත්තීය සහ කාර්මික පුහුණුව, සමූපකාර වැනි අන්තර් පළාත් ඉඩම් හා වාරිමාර්ග යෝජනා ක්‍රමවලට සලසනු ලබන සේවා සහ වෙනත් පහසුකම්.

වගු සටහන් අංක 02: දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉඩම් විෂයය පැවරීම

පළාත් සභා බලතල	රජයේ බලතල	සමගාමී බලතල
පළාත් සභා ලැයිස්තුව **18. ඉඩම්** ඉඩම්, එනම් 11 වන පරිශිෂ්ටයෙහි දක්වා ඇති ප්‍රමාණයට ඉඩම් කෙරෙහි හෝ ඉඩම් විෂයයෙහි ඇති අයිතිවාසිකම්, ඉඩම් භුක්තිය, ඉඩම් විකිණීම හා අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම්වල පදිංචි කරවීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම. **පරිශිෂ්ටය 11** **1. රජයේ ඉඩම්** 1.1 සංචෘත හෝ සමගාමී විෂයයක් සම්බන්ධයෙන් ආණ්ඩුවේ කාර්ය සඳහා අවශ්‍ය රජයේ ඉඩම්, ආණ්ඩුව විසින් එම කාරණය පාලනය කෙරෙන නීතිවල අනුකූල ව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය. එම ඉඩම් එම විෂයය සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ ව ආණ්ඩුව විසින් අදාළ පළාත් සභාව විමසිය යුතු ය. 1.2 සෑම පළාත් සභාවකටම පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය වී ඇති එම පළාත් ඇතුළත ඇති, රජයේ ඉඩම් ආණ්ඩුව විසින් ලබාදිය යුතු ය. පළාත් සභාව විසින් එම රජයේ ඉඩම්, එම කාරණය පාලනය කෙරෙන නීති හා ප්‍රඥප්තිවලට අනුකූලව පරිපාලනය කිරීම, පාලනය කිරීම හා ප්‍රයෝජනයට ගැනීම කළ යුතු ය. 1.3 පළාතක් ඇතුළත ඇති රජයේ ඉඩම් යම් පුරවැසියෙකුට හෝ සංවිධානයට පවරාදීම හෝ නියාදනය කිරීම, අදාළ පළාත් සභාවේ උපදේශය මත එම කාරණය පාලනය කෙරෙන නීතිවලට අනුකූල ව, ජනාධිපතිවරයා විසින් සිදු කළ යුතු ය. 36:13 ඉඩම් සංවර්ධන ආඥා පනත සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සම්බන්ධයෙන් ගාස්තු :	**සංචෘත ලැයිස්තුව** **ඛණිජ ද්‍රව්‍ය හා පතල්** මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ. (අ) තෙල් බිම් සහ ඛනිජ තෙල් සම්පත් විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම, පෙට්‍රෝලියම් සහ පෙට්‍රෝලියම් නිෂ්පාදනය භයානක අන්දමින් ගිනි ගන්නා සුළු යයි පාර්ලිමේන්තුව විසින් නීති මගින් ප්‍රකාශයට පත් කරනු ලබන වෙනත් ද්‍රව හා ද්‍රව්‍ය, සහ (ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ පතල් හා ඛණිජ සම්පත් සංවර්ධනය විධිමත් කිරීම මහජන හිත පිණිස වන්නේ යයි පාර්ලිමේන්තුව විසින් නීති මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රමාණයට, පතල් හා ඛණිජ සම්පත් සංවර්ධනය විධිමත් කිරීම.	
පරිශිෂ්ටය 11 **ඉඩම් සහ ඉඩම්වල පදිංචි කරවීම** **2. අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති** 2.4 එම ඉඩම් කොටස් ලබන තැනැත්තන් තෝරා ගැනීම, පිළිවෙළ, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඉල්ලුම්කරුවන් ගේ ඉඩම් නොමැතිකමේ ප්‍රමාණය, ඔවුන්ගේ ආදායම් තත්ත්වය, පවුලේ සංඛ්‍යාව, කෘෂිකාර්මික පසුබිම ආදිය ඇතුළු පදිංචිකරුවන් තෝරාගැනීමේ උපමාන කෙරෙහි සැලකිලිමත්ව නිශ්චය කරනු ලැබිය යුතු ය. මේ ප්‍රතිපත්ති නියම වශයෙන් අදාළ කර ගැනීම, කොටස් ලබන තැනැත්තන් තෝරා ගැනීම සහ ඒ හා සම්බන්ධ වෙනත් ආනුෂංගික කාරණා පළාත් සභාවල බලතලවලට ඇතුළත් විය යුතු ය.	**පළාත් සභා ලැයිස්තුව** **පරිශිෂ්ටය 11** **අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති** 2.2 මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් වගකීම ශ්‍රී ලංකා ආණ්ඩුව සතු විය යුතු ය. 2.3 මේ ව්‍යාපෘති නිසා, ඇතිවන කෘෂිකාර්මික ඉඩම්වල සහ නිවාසස්ථාන ඉඩම් දැරිය හැකි ප්‍රමාණය පිළිබඳ ප්‍රතිපත්ති සහ උපමාන පළාත් සභා විමසා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. 2.8 ඒ ව්‍යාපෘති පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කළ යුතු ය.	

21608

පුස්තකාලය
LIBRARY

පළාත් සභා ලැයිස්තුව **පරිශිෂ්ටය** 11 3. **ජාතික ඉඩම් කොමිෂන් සභාව** 3.4 පළාත් සභා වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා, ඒ පළාත් සභා විසින් ජාතික ඉඩම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය කෙරෙහි නිසි පරිදි සැලකිලිමත් ව ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.	**පළාත් සභා ලැයිස්තුව** **පරිශිෂ්ටය** 11 3. **ජාතික ඉඩම් කොමිෂන් සභාව** 3.1 ශ්‍රී ලංකා ආණ්ඩුව විසින්, ජාතික ඉඩම් කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු අතර ඒ කොමිෂන් සභාව රජයේ ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳ ව වගකිව යුතුය. මේ කොමිෂන් සභාවට දිවයිනේ සියලු ම පළාත් සභාවල නියෝජිතයන් ඇතුළත් විය යුතු ය. 3.2 ජාතික ඉඩම් කොමිෂන් සභාවට, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ සමාජ-ආර්ථික සාධක මෙන් ම භෞතික සාධක ඇගයීම සඳහා අවශ්‍ය, අදාළ සියළු විෂයයන් නියෝජනය වන තාක්ෂණික ලේකම් කාර්යාලයක් තිබිය යුතු ය. 3.3 ඉඩම් පාවිච්චිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (දේශපාලනික හෝ ජන වාර්ගික වශයෙන් නොව) කාර්මික සාධක මත පදනම් විය යුතු අතර, කොමිෂන් සභාව විසින් පස, දේශගුණය, වර්ෂාපතනය, පස සේදී යාම, වන ආවරණය, පාරිසරික සාධක, ආර්ථික යෝග්‍යතාව ආදී කරුණු කෙරෙහි සැලකිලිමත් ව ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ පොදු න්‍යාය නියම කළ යුතු ය.	

5.0 සමාප්තිය

පළාත් සභා පිහිටුවීමට පෙර පරිපාලනමය වශයෙන් වගකීම් සහ කාර්යයන් විමධ්‍යගත කර වාරිමාර්ග සම්බන්ධ කාර්යයන් ඉටු කෙරුණු නමුත් පළාත් සභා ක්‍රමයත් සමග දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් එම බලතල රජය සහ පළාත් සභා අතර පැහැදිලි ව බෙදා වෙන් කරන ලදී. කෙසේ වුව ද පළාත් සභා ලැයිස්තුවේ 11 වැනි පරිශිෂ්ටය මගින් ඉඩම් සහ වාරිමාර්ග සම්බන්ධ සැලකිය යුතු මට්ටමේ බලතල ප්‍රමාණයක් රජය වෙත පවරා ඇත.

පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග සම්බන්ධව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ කාර්යභාරය

ජයන්තා බුළුමුල්ල
දිස්ත්‍රික් ලේකම්
කුරුණෑගල

සංක්ෂේපය

1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනතින් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු ස්ථාපිත කර ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කටයුතු කරන ආයතන සහ පුද්ගලයින් සම්බන්ධීකරණය කරමින් කෘෂිකාර්මික ගැටලු නිරාකරණය කිරීම ඔස්සේ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය අපේක්ෂාවෙන් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු ස්ථාපිත කරනු ලැබිණි. මෙම කමිටුවේ සභාපතිත්වය දිස්ත්‍රික් ලේකම් (දිසාපති) වෙත පැවරේ. කෘෂිකාර්මික ගැටලු විසඳීමට දායක වීම මෙන් ම, එම ගැටලු විසඳීමට උත්සාහ දැරීමේ දී නිලධාරීන් මුහුණ දෙන ගැටලු සඳහා පිළියම් යෙදීම ද මෙම කමිටුව ඔස්සේ සිදු වේ.

1987 වන තෙක් වාරිමාර්ග සම්බන්ධ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැවරී තිබූ අතර ඒවායේ පරිපාලනය විමධ්‍යගතකරණය තුළින් ප්‍රාදේශීය මට්ටමේ දී අදාළ කටයුතු ඉටු කෙරිණි. පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග සුළු වාරිමාර්ග සම්බන්ධ වගකීම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ම පළාත් සභා වෙත පැවරිණි. මේ සියලු ආයතන සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ක්‍රියාත්මක වන අතර, මෙම ලිපිය තුළින් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සංයුතිය, කාර්ය භාරය සහ ක්‍රියාකාරීත්වයේ දී මුහුණ දෙන ගැටලු පිළිබඳ සාකච්ඡා කෙරේ.

1.0 හැඳින්වීම

1987 පළාත් සභා ස්ථාපිත කිරීමත් සමග සුළු වාරිමාර්ග පරිපාලනය සහ නඩත්තුව පිළිබඳ බලය පළාත් සභා වෙත පැවරිණි. එසේ වුව ද ගොවිජන සේවා විෂයය සම්බන්ධ ව 1991 දී ශ්‍රේෂ්ඨාධිකරණ ලබා දුන් තීන්දුව අනු ව මෙම තත්ත්වය වෙනසකට භාජනය වී ඇත. වර්තමානයේ වාරිමාර්ග නඩත්තුව සහ පරිපාලනය සම්බන්ධ ව පළාත් සභා, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන තුන ප්‍රධාන වශයෙන් ම මැදිහත් වන අතර, මෙම ආයතනවලට අමතර ව සමෘද්ධි අධිකාරිය, ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය, දේශීය විදේශීය ව්‍යාපෘති සහ රාජ්‍ය නො වන සංවිධාන ද වාරිමාර්ග නඩත්තු කටයුතු ඉටු කරනු ලබයි. මෙම හේතුව මත වගකීම් පැවරීම පිළිබඳ ව්‍යාකූලතාවක් පවතී.

පෝෂිත භූමි ප්‍රමාණයේ විශාලත්වය අනු ව වාරිමාර්ග, කොටස් තුනකට බෙදා වෙන් කෙරේ. එනම්,

1. සුළු වාරිමාර්ග (අක්කර 200 ට අඩු)
2. මධ්‍ය පරිමාණයේ වාරිමාර්ග (අක්කර 200–1000)
3. මහා වාරිමාර්ග (අක්කර 1000 ට වැඩි) වශයෙනි.

මේ සියලු වාරිමාර්ගවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව හරහා සිදු වේ.

2.0 දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව

2.1 දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ වාරි අංශයට අදාළ සහභාගීත්වය

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ වාරි අංශයට අදාළ නියෝජිතත්වය පිළිබඳ රූ සටහන් අංක 01 න් පෙන්නුම් කෙරේ.

රූ සටහන් අංක 01: දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ, වාරි අංශයට අදාළ සහභාගීත්වය.

දිස්ත්‍රික් ලේකම්/දිසාපති
(සභාපති)

රජය

1. ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව. (දිස්ත්‍රික් සහකාර කොමසාරිස්)
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3. වාරිමාර්ග කළමනාකරණ අංශය
4. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
5. ප්‍රාදේශීය ලේකම්වරුන්

ගොවි නියෝජිතයින්

1. මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවි සංවිධාන නියෝජිතයින්
2. දිස්ත්‍රික් ගොවි සංවිධානවල බල මණ්ඩල සභාපති
3. අවශ්‍ය පරිදි වෙනත් ගොවි නියෝජිතයින්

පළාත් සභාව

1. පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය (අමාත්‍යාංශ ලේකම්, දිස්ත්‍රික් කෘෂි අධ්‍යක්ෂ)
2. පළාත් වාරිමාර්ග අංශයට අදාළ නිලධාරීන්

වාරිමාර්ග පනත යටතේ ආරම්භ වූ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු දිස්ත්‍රික් ලේකම්/දිසාපති ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය මට්ටමේ දී මෙම කමිටු ප්‍රාදේශීය ලේකම් ගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මක වන අතර එහි සංයුතිය ද දිස්ත්‍රික් කෘෂි කමිටුවේ සංයුතිය හා සමාන වේ. දිස්ත්‍රික් කෘෂි කමිටුවලට සහභාගී වන දෙපාර්තමේන්තුවල, ප්‍රාදේශීය නිලධාරීන් ප්‍රාදේශීය කෘෂි කමිටුවලට සහභාගී වන අතර, දිස්ත්‍රික් කමිටුව පැවැත්වීමට පෙර ප්‍රාදේශීය කමිටු පවත්වා, ප්‍රාදේශීය ව පැන නගින ගැටලු සාකච්ඡා කෙරේ. මේ අනු ව ප්‍රාදේශීය ලේකම්වරුන් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට සහභාගි වන්නේ ප්‍රාදේශීය ගැටලු හඳුනා ගනිමින් වන හෙයින් දිස්ත්‍රික් මට්ටමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කෙරෙහි යොමු කිරීම වඩා පහසු වේ.

ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට ඇතැම් ආයතනවල නිලධාරීන් ගේ සහභාගීත්වය නො ලැබෙන බවට නිරන්තර කරුණු ඉදිරිපත් වේ. ඇතැම් ස්ථානවල ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් පවා සහභාගී නො වීමේ ප්‍රවණතාවක් පවතී. කෙසේ වුව ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා අදාළ නිලධාරීන් ගේ සහභාගීත්වය සම්බන්ධ ව දැඩි පිළිවෙතක් අනුගමනය කරනු ලබන අතර, මේ නිසා නිලධාරීන් ගේ සහභාගීත්වයේ අඩුවක් සිදු නො වේ.

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දී සාකච්ඡාවට භාජනය කරනු ලබන්නේ, තීරණ ගනු ලබන්නේ ගොවීන්ට අදාළ කරුණු සම්බන්ධ ව හෙයින් ගොවි නියෝජිතයින් ගේ සහභාගීත්වය ඉතා ම වැදගත් වේ. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට මහා ව්‍යාපාරවල නියෝජිතයින් සහභාගී වන නමුත් මහා ව්‍යාපාර නො වන ගොවි සංවිධානවල නියෝජනයක් සිදු නො වේ. අනෙක් අතට සහභාගි වන නිලධාරි පිරිසට සාපේක්ෂ ව ගොවි නියෝජිත සංඛ්‍යාව ප්‍රමාණවත් නො වන හෙයින් ධීවරයින් ද ඇතුළත් ව ප්‍රමාණවත් ගොවි නියෝජිත පිරිසක් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ නියෝජනය විය යුතු ය.

2.2 දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ කාර්ය භාරය

වාරිමාර්ග සම්බන්ධයෙන් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ කාර්ය භාරය බොහෝ විට සම්බන්ධීකරණ කාර්යයක් වේ. වසර ආරම්භයේ දී යොදා ගනු ලබන දිනයන් අනු ව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව මාසික ව රැස් වේ. මේ හේතුව නිසා ම කල් ගත නො වී අදාළ අංශවල අවධානයට ගැටලු යොමු කිරීමට මෙන් ම කඩිනමින් ක්‍රියාත්මක වීමට ද අවකාශ සැලසේ. ගොවි සංවිධාන රැස්වීම් හෝ කන්න රැස්වීම්වල දී ගොවි සංවිධාන නියෝජිතයින් වෙතින් ඉදිරිපත් වන ගැටලු, ප්‍රාදේශීය කමිටුවට ඉදිරිපත් කෙරේ. එහි දී නිරාකරණය කිරීමට නො හැකි හෝ වඩාත් පුළුල් මට්ටමින් සාකච්ඡා කර තීරණ ගත යුතු ගැටලු දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ඉදිරිපත් කෙරේ. අදාළ සියලු නිලධාරීන් දිස්ත්‍රික් කමිටුවට සහභාගි වන හෙයින් වගකීම් දරණ ආයතන සමග සෘජු ව සාකච්ඡා කොට විසඳුම් ලබා ගැනීමට අවස්ථාව සැලසේ. එමෙන් ම ප්‍රමුඛතාව ලබා දිය යුතු වැඩසටහන් වහා අවධානයට යොමු කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. එසේ ම වඩා සංකීර්ණ ගැටලු අනු කමිටු හෝ විශේෂිත සාකච්ඡා මගින් විසඳා ගැනීමට කටයුතු කරනු ලබයි.

කන්න රැස්වීම්වල දී ගනු ලබන තීරණ සහ ඉදිරි කෘෂිකාර්මික වැඩසටහන් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සමාලෝචනයට භාජනය වන බැවින්, ඒ අනු ව ගලපා වාරි කර්මාන්තවල නඩත්තු සහ ඉදි කිරීම් කටයුතු සිදු කළ හැකි වේ.

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවෙන් වාරිමාර්ග සම්බන්ධ ව ඉටු වන තවත් වැදගත් කාර්ය භාරයක් වන්නේ වැව් තාවුලු සහ වාරිමාර්ග රක්ෂිත අල්ලා ගැනීම්වල දී නීතිය ක්‍රියාත්මක කිරීම ය. මෙය ප්‍රාදේශීය මට්ටමේ දී බරපතල සහ සංකීර්ණ ගැටලුවක් බවට පත්ව ඇත. වැව් තාවුලු සහ වැව් රක්ෂිත අනවසරයෙන් අල්ලා ගෙන ඒවායෙහි නොයෙකුත් ඉදි කිරීම් සහ වගා කටයුතු කිරීම නිසා වාරිමාර්ග පද්ධතියට හානි පැමිණීම නිරන්තරයෙන් සිදු වේ. මෙය ඇතැම් ස්ථානවල ඔඩු දුවා ඇති සංකීර්ණ ප්‍රශ්නයක් බවට පත් ව ඇත. උදාහරණ වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කිඹුල්වාන වැව් තාවුල්ලේ අක්කර දහසක පමණ ප්‍රදේශයක අනවසර පදිංචිකරුවන් සිටී. මෙය දීර්ඝ කාලීන ගැටලුවක් වී ඇත. මෙවැනි ගැටලු සම්බන්ධ ව ගොවීන් හෝ ප්‍රාදේශීය කමිටුවෙන් හෝ දේශපාලනඥයෙකුගෙන් හෝ වෙනත් මාර්ගයකින් හෝ දිස්ත්‍රික් කමිටුව වෙත ඉදිරිපත් වුවහොත් එය සාකච්ඡාවට භාජනය කෙරෙන අතර, මෙවැනි ක්‍රියාමාර්ග නැවැත්වීමට අවශ්‍ය පියවර ගනු ලබයි. කෙසේ වුව ද මෙවැනි ගැටලු නිරාකරණය කිරීමට දැඩි වෙහෙසක් දැරීමට සිදු වේ.

වාරිමාර්ග විෂයයේ දී ගොවීන් කෙරෙහි බලපානු ලබන තවත් ප්‍රධාන කාරණයක් වන්නේ කෘෂි මාර්ග නිසි පරිදි නඩත්තු නො කිරීම සහ ඉක්මණින් අබලන් තත්ත්වයට පත් වීම ය. විශාල වාරිමාර්ග යෝජනා ක්‍රමවල ගොවියා ගේ කොඳු නාරටිය වන කෘෂිකාර්මික මාර්ග නඩත්තුව සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කිසිදු අරමුදලක් නො ලැබෙන හෙයින් පැරණි ව්‍යාපාරවල මාර්ග ඉතා අබලන් තත්ත්වයක පවතී. ගොවියාට සහ කෘෂිකර්මයට බලපාන වැව, ඇල, සොරොව්ව ආදී සියලු දේ පිළිබඳ සලකා බැලුව ද, කෘෂිකාර්මික මාර්ග නොමැති නම්, ගොවියා ගේ දියුණුව බොහෝ දුරට අඩපණ වේ. මන්ද යත් කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල තීරණය වීම කෙරෙහි කෘෂි මාර්ග දැඩි ව බලපානු ලබන හෙයිනි. කෙසේ වුව ද පවතින තත්ත්වය අනු ව පෙනී යන්නේ මෙම මාර්ග කෙරෙහි අවධානය යොමු නො වන බව ය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිදු වන වැලි මංකොල්ලය මේ ආකාරයට කෘෂිකාර්මික පාරවල් අබලන් වීමට බලපා ඇති මූලික ම හේතුවක් වී ඇත. මේ වන විට දැදුරු ඔය සහ මා ඔය ගංගාවල වැලි ප්‍රවාහනය තහනම් කර ඇති හෙයින් සෑම ස්ථානයක ම පාහේ පවතින කුඩා වැව්, ඇල, දොළ, ගංගාවල වැලි කෘෂිකාර්මික මාර්ග සහ වැව් බැම් ඔස්සේ ප්‍රවාහනය කිරීම සිදු වන හෙයින් තත්ත්වය වඩාත් උග්‍ර වී ඇත.

මෙම කරුණු දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සාකච්ඡාවට භාජනය වන අතර, එය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කර, ප්‍රාදේශීය සභා සහ අදාළ අනෙකුත් අංශ මගින් ඒවා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සලසා ගැනීම වැනි ක්‍රියා මාර්ගයන්ට එළඹීමට හැකි වී ඇත. මේ වන විට

ප්‍රදේශයේ මෙවැනි කෘෂිකාර්මික මාර්ග ඔස්සේ ප්‍රවාහනය කළ හැකි උපරිම බර ප්‍රමාණය කියුබ් දෙකකට සීමා කිරීම මෙයට උදාහරණ වේ.

දැනට ක්‍රියාත්මක වන "දහසක් වැව් වැඩසටහන" පිළිබඳ සමාලෝචනය ද මාසික ව/ද්වි මාසික ව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දී හෝ එම දිනයේ ම වෙන ම රැස්වී හෝ සාකච්ඡා කිරීම සිදු වීම ද එම වැඩසටහන විධිමත් ව සහ කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීමට උපකාරී වී ඇත.

මහා වාරි ව්‍යාපාරවල කන්න රැස්වීම්වල දී, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ඉදි කිරීම් සහ නඩත්තු කටයුතුවල ප්‍රගතිය, කාලය ආදී බොහෝ ගැටලු දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ඉදිරිපත් වේ. කමිටුවේ දී මෙම කරුණු දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ගැනෙන අතර වාරි කළමනාකරණ අංශයේ නිලධාරීන් ගේ මෙන් ම ගොවි සංවිධාන නියෝජිතයින් ගේ ද අදහස් සැලකිල්ලට ගනිමින් තීරණවලට එළඹීමට ත්, ඒ අනු ව ක්‍රියාත්මක වීමට ත් අවස්ථාව සැලසේ. උදාහරණ වශයෙන් සියඹලංගමුව වැවේ ප්‍රධාන ඉදි කිරීම් කටයුතු සම්බන්ධ ව යම් යම් තාක්ෂණික සහ මූල්‍ය ගැටලු මතු වූ අතර, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට මෙම කරුණු ඉදිරිපත් වූ පසු ව එහි සාකච්ඡාවට ගෙන කෘෂිකර්ම කමිටුවේ සභාපති වශයෙන් දිස්ත්‍රික් ලේකම් විසින් එම කරුණු අදාළ අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කරනු ලැබිණි. මෙවැනි අවස්ථාවල අදාළ අමාත්‍යාංශ වෙතින් ගැටලුව සඳහා විසඳුම් ලබා ගැනීමට කටයුතු කරන අතර අවශ්‍ය අවස්ථාවල දී එම ආයතනවල නිලධාරීන් සහභාගී කර ගැනීමට ද කටයුතු කරනු ලබයි.

දහතුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් සුළු වාරිමාර්ග සම්බන්ධ ව බලතල හිමි වී ඇත්තේ පළාත් සභාවට ය. එම නිසා පළාතේ වාරිමාර්ග සම්බන්ධ කටයුතුවල දී දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ පළාත් සභාව අතර පවතින සබඳතාව වැදගත් වේ. පළාත් සභාව සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අතර පවතින සුහද සබඳතාව මේ අනු ව පළාතේ වාරි සහ කෘෂිකාර්මික සංවර්ධනයට සෘජු ව ම ඉවහල් වේ.

3.0 වාරිමාර්ග සම්බන්ධයෙන් වන ගැටලු

1987 පළාත් සභා ස්ථාපිත කිරීමත් සමග සුළු වාරිමාර්ග කටයුතු පරිපාලනය සහ නඩත්තු කිරීම පිළිබඳ බලය පළාත් සභා වෙත පැවරිණි. එසේ වුව ද ගොවිජන සේවා විෂයය සම්බන්ධ ව 1991 දී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නඩු තීන්දුව සමග මෙම තත්ත්වය වෙනසකට භාජනය විය. මේ වන විට පළාත් සභා, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යන ආයතන තුන ම වාරිමාර්ග නඩත්තු කටයුතු සඳහා මැදිහත් වේ. මෙම තත්ත්වය තුළ වගකීම් පැවරීම පිළිබඳ ව්‍යාකූලතාවක් මතු වන අතර ඇතැම් වාරිමාර්ග පිළිබඳ කිසිවෙකු ගේ අවධානයක් යොමු නො වේ.

වාරිමාර්ග සම්බන්ධයෙන් තව දුරටත් බලපානු ලබන කාරණයක් වන්නේ නඩත්තු සඳහා ප්‍රමාණවත් තරම් අරමුදල් නො ලැබීම ය. විශේෂයෙන් ම අනෙකුත් දෙපාර්තමේන්තුවලට සාපේක්ෂ ව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මුදල් ලැබීමේ ප්‍රමාදයක් පවතී. වාරිමාර්ග කටයුතුවල නඩත්තු සහ මෙහෙයුම් කටයුතු කරන නිලධාරීන්ට ඒ සඳහා පවතින්නේ ඉතා ම සීමිත කාල පරාසයකි. එනම්, වර්ෂා කාලය මඟ හැර, කන්නය ආරම්භ වීමට ප්‍රථම වාරිමාර්ග කටයුතුවල මෙහෙයුම් සහ නඩත්තු කළ යුතු හෙයින් අවශ්‍ය මුදල් නිසි අවස්ථාවට ලබා දීමට කටයුතු නො කළහොත් එම කටයුතු නිසි පරිදි ඉටු කිරීමට නො හැකි වේ. එමෙන් ම නිරන්තරයෙන් කුඩා වැව් සඳහා මුදල් යෙදවීම නිසා අක්කර 100–200 අතර සුළු වාරිමාර්ග සඳහා මුදල් යෙදවීමේ අඩුවක් පවතී. මෙම තත්ත්වය තුළ පැරණි නිර්මිතයන් ආරක්ෂා කර ගැනීම පිළිබඳ ගැටලු මතු වී ඇත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සමෘද්ධි අධිකාරිය වැනි රාජ්‍ය ආයතන, පළාත් සභා ව මෙන් ම PEACE Project (නිවත්කම් දනන් වත්කම් ගැන්වීම සඳහා වූ ව්‍යාපෘතිය), IFARD ආදී බොහෝ විදේශීය ව්‍යාපෘති ද වාරි මාර්ග සම්බන්ධ කටයුතුවලට මැදිහත් වීම සිදු වේ. මෙම මැදිහත් වීම තුළ කාර්යයන්

ගේ ද්විත්වකරණයක් සහ අරමුදල් නාස්තියක් සිදු වන බව ද පෙනේ. මේ සියලු ආකාරයන්ගෙන් බොහෝ විට අවධානය යොමු වන්නේ එක ම වාරිමාර්ග කිහිපයකට බව ද පසු ගිය අත්දැකීම් අනු ව පැහැදිලි වේ. මෙම තත්ත්වය මත අවධානය යොමු විය යුතු නමුත් කිසිදු ව්‍යාපෘතියක හෝ වැඩසටහනක අවධානයට යොමු නො වන වාරි කර්මාන්ත රාශියක් ද වේ.

වැව් තාවුළු සහ පෝෂක ප්‍රදේශ රැක ගැනීම ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ප්‍රධාන ගැටලුවක් වී ඇති අතර, මෙම ප්‍රදේශ රැක ගැනීම සඳහා නිලධාරීන්ට විශාල අරගලයක් කිරීමට සිදු වී ඇත. මෙවැනි ප්‍රදේශවල අනවසර වගාවන් සේ ම ඉදිකිරීම් ද සිදු කරනු ලබයි. මෙම තත්ත්වය කෘෂිකර්ම, වාරිමාර්ග මෙන් ම පාරිසරික පද්ධතියට ද දැඩි අහිතකර බලපෑම් එල්ල කරනු ලබයි.

4.0 සමාප්තිය

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර ආදී ක්ෂේත්‍රවල සම්බන්ධීකරණ කාර්යයක් ඉටු කරන අතර ප්‍රාදේශීය මට්ටමේ නො විසඳුණු ගැටලු දිස්ත්‍රික් මට්ටමේ දී සාකච්ඡා කර කඩිනමින් තීරණ ගෙන ක්‍රියාත්මක වීම සඳහා අවකාශ සලසනු ලබයි. එසේ නැතහොත් අදාළ අංශ වෙත යොමු කර ගැටලු විසඳීමට උත්සාහ දරණු ලබයි. වැව් රක්ෂිතවල සිදු කරන අනවසර ඉදි කිරීම් සහ වගාවන් ආදී ගැටලු මෙන් ම කෘෂි මාර්ග අබලන් වීම සහ ඒවා නඩත්තුව සඳහා විධිමත් ක්‍රියා මාර්ගයක් අනුගමනය නො කිරීම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය කෙරෙහි අහිතකර ව බලපා ඇති, දිස්ත්‍රික් කෘෂි කමිටුව වෙත බොහෝ විට ඉදිරිපත් වන ගැටලු අතර වේ. එමෙන් ම වාරි නඩත්තුව සහ මෙහෙයුම් පිළිබඳ ගැටලු ද ගොවි සංවිධාන වෙතින් නිරන්තර ව ඉදිරිපත් වේ.

වාරිමාර්ග ක්ෂේත්‍රයේ කටයුතු කාර්යක්ෂම ව සහ විධිමත් ව සිදු කිරීම සඳහා වගකීම් පැවරීම පිළිබඳ පවතින ව්‍යාකූලත්වය මග හැරීමටත්, කාර්යයන් ද්විත්වකරණය වීම වැළැක්වීම සඳහා කිසියම් ක්‍රියා මාර්ගයක් ගැනීමත් නො පමා ව කළ යුතු ව ඇත.

පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

භද්‍රා කමලදාස
නියෝජ්‍ය අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ)
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

සංක්ෂේපය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ව්‍යාපාර නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු පැවරී ඇති ආයතන අතුරින් ප්‍රමුඛතම ආයතනයකි. මෙම දෙපාර්තමේන්තුව 1900 දී පිහිටු වනු ලැබූ අතර පරිපාලන විමධ්‍යගතකරණය තුළින් එහි කටයුතු දිවයින පුරා මෙහෙය වනු ලබයි. පරිපාලන පහසුව තකා සමස්ත දිවයින වාරිමාර්ග කලාප දහ හතරකට බෙදා ඇති අතර, වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාස 54ක් එයට ඇතුළත් වේ. 1987 දී මෙරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද දහ තුන් වැනි සංශෝධනය තුළින් එක් එක් පළාත් සභා සීමාව තුළ පිහිටි සුළු වාරිමාර්ග ව්‍යාපාරවල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු පළාත් සභා වෙත පැවරිණි. කෙසේ වුව ද එවකට සිටි වාරිමාර්ග අමාත්‍යතුමා ගේ තීරණයක් අනු ව අක්කර දහසට (1000) අඩු වගා බිම් සහිත අන්තර් පළාත් වාරි ව්‍යාපෘතීන් ද පළාත් සභා වෙත පවරා දෙන ලදී. ගොවීන් ගේ සහ දේශපාලන අධිකාරියේ ප්‍රබල ඉල්ලීම් හමුවේ 1991-1995 කාලය තුළ එම ව්‍යාපාරවලින් බොහොමයක් පළාත් සභා විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත නැවත භාර දෙනු ලැබිණි.

මෙම ලිපිය තුළින්, ආරම්භයේ පටන් මේ දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විකාශය, ආයතනික ව්‍යුහය සහ වාරිමාර්ග කළමනාකරණය පිළිබඳ කෙටියෙන් සාකච්ඡා කරනු ලබයි. පළාත් සභා ක්‍රමය තුළ මෙන් ම වෙනත් අවස්ථාවල දී ද වාරිමාර්ග විෂයයේ බලතල විමධ්‍යගත කළ ආකාරය, ඒ තුළින් පැන නැගී ඇති ගැටලු සහ එම ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා වන යෝජනාවන් ද තව දුරටත් ලිපියෙන් ඉදිරිපත් කෙරේ.

1.0 හැඳින්වීම

වර්තමානයේ ක්‍රියාත්මක වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවා මේ වන විට සිය වසකට අධික කාලයක් ගත වී ඇත. 1900 දී මෙම දෙපාර්තමේන්තුව පිහිටු වීමට පෙර එනම්, 1856–1900 කාලය තුළ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව, මධ්‍යම වාරිමාර්ග මණ්ඩලය සහ ප්‍රාදේශීය වාරිමාර්ග මණ්ඩල යන ආයතන මගින් පැරණි වාරිමාර්ග ප්‍රතිස්ථාපන කටයුතු සිදු කරනු ලැබිණි. 1856 දී සම්මත කරනු ලැබූ ප්‍රථම වාරිමාර්ග පනත (කුඹුරු ඉඩම් පනත) තුළින් ඒ සඳහා අවශ්‍ය නෛතික බලය සැපයිණි. මෙම පනතට අනු ව, පැරණි වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ආණ්ඩුවේ ඒජන්තවරුන් මගින් ඉදිරිපත් වන ඉල්ලීම් ගොවීන් ගේ ශ්‍රම/මුදල් දායකත්වය ලබා ගනිමින් ඉටු කෙරිණි. දිස්ත්‍රික් ඒජන්තවරුන් ගේ කාර්යාලවලට අනුයුක්ත තාක්ෂණ නිලධාරීන් ගේ මාර්ගයෙන් එකී ඉදි කිරීම් සිදු කරනු ලැබිණි.

1900 දී වාරිමාර්ග කටයුතු පිළිබඳ විශේෂිත තාක්ෂණික දැනුමක් සහිත නිලධාරීන්ගෙන් සමන්විත මූලික ආයතනයක් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටු වීම මෙම ක්ෂේත්‍රයේ සන්ධිස්ථානයක් විය. ඉන් පසු ව 1946 දී දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු පිහිටු වීම පරිපාලනය විමධ්‍යගත කිරීමේ ක්‍රියාදාමයේ වැදගත් පියවරක් ලෙස සටහන් කළ හැක. ප්‍රාදේශීය පරිපාලනයෙන් සහ මහජන නියෝජිතයින් මගින් ඉදිරිපත් වන ප්‍රාදේශීය ඉල්ලීම් සලකා බලා ඒ සඳහා අනුමැතිය ලබා දීම මේ හරහා සිදු විය. 1957 දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ 1970 දී මහවැලි සංවර්ධන මණ්ඩලය පිහිටු වීම වාරිමාර්ග ක්ෂේත්‍රයේ ඊළඟ වැදගත් සිදුවීම් විය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට සිදු කළ වාරිමාර්ග නඩත්තු කටයුතු 1971 දී පිහිට වූ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධාන වෙත පවරණු ලැබිණි. ඒ අනු ව වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගංගා

ද්‍රෝණිවල ජල සම්පත් සංවර්ධන සැලසුම් පිළියෙල කරන සහ විශේෂඥ සේවා සපයන ආයතනයක් පමණක් බවට සීමා විය. කෙසේ වුව ද 1977 දී ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය විසුරුවා හැරීම නිසා සියලු වාරිමාර්ග ව්‍යාපාර නැවතත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරිණි.

1987 දී පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග සුළු වාරිමාර්ග නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු පළාත් සභා වෙත පැවරුණු නමුත් එවකට වාරිමාර්ග විෂයය භාර ව සිටි අමාත්‍යවරයා ගේ තීරණය පරිදි අක්කර දහසට අඩු වගා බිම් සහිත අන්තර් පළාත් වාරි ව්‍යාපෘති ද පළාත් සභා වෙත පැවරිණි. කෙසේ වුව ද පළාත් සභාවලට පවරණු ලැබූ අන්තර් පළාත් වාරි ව්‍යාපාර 1991 දී නැවත වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාර දෙනු ලැබිණි.

වාරිමාර්ග ව්‍යාපාර කළමනාකරණ කටයුතු විමධ්‍යගත කිරීමේ තවත් වැදගත් පියවරක් වන්නේ 1994 අංක 13 දරණ වාරිමාර්ග සංශෝධන පනත මගින් ව්‍යාපාර කළමනාකරණ කමිටු පිහිටුවීම ය. රජයේ නිලධාරීන් සහ ගොවි නියෝජිතයන් එක්ව ව්‍යාපෘති කළමනාකරණය සඳහා සාමූහික තීරණ ගනු ලබන ආකාරය මෙම ලිපියේ 3.2 ඡේදයෙන් තවදුරටත් සාකච්ඡා කෙරේ.

2.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සහ ආයතනික ව්‍යුහය

2.1 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

වාරිමාර්ග යටිතල පහසුකම් සැපයීම, ගංවතුර පාලනය, කරදිය පාලනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම සහ අදාළ ඉදි කිරීම් සිදු කිරීම ආදී විශාල කාර්ය භාරයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරී ඇත. පරිපාලනය විමධ්‍යගත කිරීම තුළින් මෙම කාර්ය භාරය ඉටු කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය පහත සඳහන් පරිදි වේ.

- වාරිමාර්ග යටිතල පහසුකම් සැපයීම සඳහා ජල ද්‍රෝණි තුළ ශක්‍යතා වාර්තා සකස් කිරීම, නිර්මාණ සහ සැලසුම් පිළියෙළ කිරීම, ඇස්තමේන්තු සැකසීම සහ අදාළ ඉදි කිරීම් සිදු කිරීම.
- ගංවතුර සහ කරදිය පාලනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම සහ අදාළ ඉදි කිරීම් සිදු කිරීම.
- ඉහත කටයුතු සඳහා අවශ්‍ය ජල විද්‍යා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ යාවත්කාලීන කිරීම.
- වාරි හා ගංවතුර පාලන, කරදිය පාලන ව්‍යාපාර මෙහෙයුම් සහ නඩත්තු කිරීම.
- ජල ශක්ති, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූ විද්‍යා, (කෘෂිකාර්මික) පාංශු පරිශීලන අංශයන් හි පර්යේෂණ පැවැත්වීම.
- අවශ්‍ය අනෙකුත් ආයතනවලට එම සේවා හා උපදෙස් ලබා දීම.
- ජලය සහ ඉඩම්වල උපරිම ඵලදායිතාව ලබාගැනීම සඳහා නව තාක්ෂණය සමග සබැඳි ජල කළමනාකරණය.
- සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණය සහ ආදායම් වර්ධනය සඳහා ගොවි සංවිධාන ගොඩනැගීම සහ බල ගැන්වීම, ව්‍යාපාර කලමනාකරණ කටයුතු සඳහා සක්‍රීය ව දායක වීම.

මෙම කරුණුවලට අමතර ව වාරිමාර්ග ආඥා පනතෙහි 62 (1) වගන්තියේ සඳහන් විධි විධාන අනු ව මහා වාරිමාර්ග ව්‍යාපාරවල ආරක්ෂාවට තර්ජනයක් විය හැකි යැයි අනුමත කෙරෙන ඕනෑ ම සුළු වාරිමාර්ග ව්‍යාපාරයක් නිසි නඩත්තු ක්‍රියා පිළිවෙතකට යොමු කිරීමේ බලය වාරිමාර්ග විෂය භාර අමාත්‍යවරයාට ඇත.

එම වගන්තිය පහත සඳහන් පරිදි වේ.

> "සුළු වාරිමාර්ග ව්‍යාපාර, ගොවි සංවිධාන විසින් ක්‍රමවත් ව නඩත්තු නො කිරීමේ හේතුවෙන් මහා වාරිමාර්ග ව්‍යාපාරයක පැවැත්මට අහිතකර ප්‍රතිඵල උදා වන බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා හට ඒත්තු ගැන්වෙන අවස්ථාවන් හි දී එහි නියමානුකූල නඩත්තු සඳහා නියෝග ලබා දීමට වාරිමාර්ග අමාත්‍යතුමාට බලය ඇත".

වාරිමාර්ග පහසුකම් පමණක් නො ව, ජල සම්පතින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි පරිදි බහුවිධ කාර්යයන් සඳහා ගංගා ද්‍රෝණියක ජල සම්පත් සංවර්ධනය සඳහා සැලසුම් පිළියෙළ කිරීම පසු ගිය දශක කිහිපයක කාලය තුළ ජාතික වගකීමක් ලෙස සලකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

1917 ගංවතුර පාලන පනත මගින් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත බලය පවරා ඇති කෘෂිකාර්මික ඉඩම් මෙන් ම නාගරික ප්‍රදේශ සඳහා ද ගංවතුර පාලනය සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රමෝපායන් සැපයීම මෙතෙක් ක්‍රියාත්මක කර ඇති ගංවතුර පාලන ව්‍යාපාර මගින් සිදු කර ඇත.

මෙම කාර්ය භාරය ක්‍රියාවට නැංවීම සඳහා කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අනුබද්ධ ව ඇති ආයතනික ව්‍යුහය මෙන් ම ශ්‍රී ලංකාව ප්‍රධාන කොටස් 14 කට බෙදා කාර්යයන් සහ වගකීම් විමධ්‍යගත කරනු ලැබූ කලාප කාර්යාල දායක වේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආයතනික ව්‍යුහය (තාක්ෂණික විෂයයන් සම්බන්ධ ව) පහත දැක්වෙන රූප සටහන මගින් දැක්විය හැකි ය.

රූ සටහන් අංක 01: වාරිමාර්ග ව්‍යාපාර කළමනාකරණය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා ඇති ආයතනික ව්‍යුහය.



LIBRARY
HARTI

3.0 වාරිමාර්ග විෂයයේ බලය විමධ්‍යගත කිරීම

3.1 පළාත් සභා පිහිටුවීම සහ වාරිමාර්ග විෂයය විමධ්‍යගත කිරීම

1987 දී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද දහ තුන් වැනි සංශෝධනය අනු ව වාරිමාර්ග විෂයය විමධ්‍යගත කෙරිණි. එම සංශෝධනය අනු ව පළාත් සභා සඳහා වාරිමාර්ග විෂයයේ බලතල ලබා දුන්නේ පහත සඳහන් අයුරිනි.

> පළාත් සභා එකකට වැඩි ගණනක් හරහා දිවෙන ගංගා ද්‍රෝණියක වාරි ව්‍යාපාර හෝ පළාත් සභා එකකට වැඩි ගණනක පැතිරෙන වාරි ව්‍යාපාර සහ ගංවතුර පාලන කටයුතු සිදු කෙරෙන ව්‍යාපාර හැර වෙනත් වාරි ව්‍යාපාර සහ ඉඩම් සංවර්ධන ව්‍යාපාර සඳහා සැලසුම් පිළියෙළ කිරීම, නිර්මාණ ක්‍රම සම්පාදනය, අධීක්ෂණ සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සහ එයට අවශ්‍ය යෙනතික රාමුවක් පිළියෙළ කර ගැනීමේ බලය පළාත් සභා සතු වේ.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දහ තුන් වැනි සංශෝධනය අනු ව පළාත් සභාවලට භාර දීමට නියමිත ව තිබුණේ ඉහත සඳහන් වර්ගීකරණය යටතට ගැනෙන වාරිමාර්ග ව්‍යාපාර පමණි. එසේ වුව ද එවකට වාරිමාර්ග විෂයය භාර ව සිටි අමාත්‍ය ගරු ගාමිණී දිසානායක මහතා විසින් අදාළ වාරි ව්‍යාපාරවලට අමතර ව අක්කර දහසට අඩු වගා බිම් ප්‍රදේශ සහිත අන්තර් පළාත් වාරිමාර්ග ව්‍යාපාර ද එම පළාත් සභාවල ඉංජිනේරු ආයතන වෙත භාර දීමට තීරණය කරන ලදී. මේ අනු ව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කර නඩත්තු කළ ව්‍යාපාර, ගොඩනැගිලි, වාහන, නිලධාරීන් ඇතුළු බොහෝ සම්පත් ඇතුළත් ව එකී පළාත් සභාවන්ට භාර දීම සිදු විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් එසේ භාර දුන් වාරි ව්‍යාපාරවල දත්ත වගු සටහන් අංක 01 හි සංක්ෂිප්ත ව දක්වා ඇත.

වගු සටහන් අංක 01: මධ්‍යම රජය භාරයේ තිබී පළාත් සභාවලට භාර දුන් වාරි ව්‍යාපාර

පළාත	ගුරුත්ව වාරිමාර්ග		උස්සාන වාරිමාර්ග		ගංවතුර වැළැක්වීමේ ව්‍යාපාර	
	පළාත් සභා සීමාව තුළ	අන්තර් පළාත් හරහා අක්කර 1000 ට අඩු	පළාත් සභා සීමාව තුළ	අන්තර් පළාත් හරහා අක්කර 1000 ට අඩු	පළාත් සභා සීමාව තුළ	අන්තර් පළාත් හරහා අක්කර 1000 ට අඩු
මධ්‍යම	0	17	0	1	0	0
උතුරු මැද	0	61	0	2	0	0
වයඹ	43	2	2	2	0	0
උතුරු-නැගෙනහිර	89	17	6	0	2	0
සබරගමුව	0	7	0	0	51	0
දකුණ	21	5	0	0	0	0
ඌව	0	30	0	0	21	0
බස්නාහිර	4	0	0	0	12	0
එකතුව	**157**	**139**	**8**	**5**	**86**	**0**
වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ආපසු භාර දුන් ව්‍යාපාර	0	79	0	0	17	0

මූලාශ්‍රය: වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1986 වන විට මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් සහ ජල විදුලි ජනක ව්‍යාපාර ලෙස ඉදි කළ ජලාශ හැර ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ වාරි ව්‍යාපාර ඇමුණුම් අංක 01 හි දැක්වෙන සිතියමෙන් පෙන්නුම්

කෙරේ. ගංගා ද්‍රෝණි සහ 1987 ඇති කළ පළාත් සභා මායිම් ද මෙම සිතියමේ ලකුණු කර ඇති බැවින්, පළාත් සභාවලට භාර දීමට නියමිත වූ ව්‍යාපාර පිළිබඳ වැටහීමක් ඒ තුළින් ලබා ගත හැක.

පළාත් ගංගා ද්‍රෝණි තුළ පිහිටි ගංවතුර ආරක්ෂණ ව්‍යාපාර සහ අක්කර දහසට වැඩි වගා බිම් සහිත අන්තර් පළාත් වාරි ව්‍යාපාර හැර සියලු ව්‍යාපාර පළාත් සභා වෙත පවරනු ලැබුව ද මෙම ව්‍යාපාර නඩත්තු කටයුතු නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය සම්පත් පළාත් සභාවලට නොමැති බව 1991 පමණ වන විට ඒත්තු ගැන්විණි. මූල්‍යමය සම්පත් පමණක් නො ව ඒ සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම ද එම ආයතනවලට නොමැති වීම මෙහි දී විශේෂයෙන් කැපී පෙනුනු කරුණක් විය. එබැවින් එම ව්‍යාපාර නැවත වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාර දෙන ලෙස විශේෂයෙන් ම ගොවි ප්‍රජාවගෙන් සහ දේශපාලන අධිකාරියෙන් බලපෑම් එල්ල වන්නට විය. මේ නිසා අන්තර් පළාත්වලට අයත් අක්කර දහසට වැඩි නො වන වාරි ව්‍යාපාර නැවත වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ක්‍රම ක්‍රමයෙන් භාර දීම සිදු විය. මේ අනු ව මධ්‍ය රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තු පාලනය යටතේ මේ වන විට පවතින වාරි ව්‍යාපෘති වන්නේ,

- අන්තර් පළාත් මහා වාරිමාර්ග
- අන්තර් ද්‍රෝණි වාරිමාර්ග (මහවැලි බල ප්‍රදේශය/වලවේ විශේෂ බල ප්‍රදේශය හැර)

මේ හැර අන්තර් පළාත් ගංගා ද්‍රෝණිවල දැනට ඉදි කර ඇති වාරිමාර්ග නො වන, විදුලි බල මණ්ඩලය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉදි කළ සහ ඉදි කරන ජලාශ ද මධ්‍ය රජය සතු වන අතර, ඒවා පාලනය කරන ඉහත ආයතන ද මධ්‍ය රජයේ ආයතන වේ.

මෙයට පෙර 1971 දී ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානවලට වාරිමාර්ග නඩත්තු කටයුතු භාර දී නැවතත් ආපසු භාර ගැනීමේ දී ද වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදු වූ සංසිද්ධියට ම නැවත මුහුණ දීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සිදු විය. පළාත් සභා සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව අතර ඇති වූ මෙම හුවමාරුව නිසා නඩත්තු සහ මෙහෙයුම් කටයුතු අඛණ්ඩ ව සිදු නො වීමෙන් වාරිමාර්ග පද්ධති සහ මූලස්ථායි නිර්මිතවලට දිගු කාලීන ව අහිතකර බලපෑම් එල්ල විය. එයට අමතර ව සිදු වූ තවත් විශාල හානියක් වන්නේ, එම ව්‍යාපාරවල ඉංජිනේරුමය දත්ත අඩංගු සැලසුම්, මෙහෙයුම් සහ නඩත්තුවලට අදාළ ලිපි ලේඛන ආදිය අස්ථානගත වීම ය.

3.2 1994 අංක 13 (වාරිමාර්ග සංශෝධන) පනත මගින් ව්‍යාපාර කළමනාකරණ කමිටු පිහිටු වීම

වාරි ව්‍යාපාරවල බලය බෙදාහැරීම පිළිබඳ ඊළඟ වැදගත් පියවර ලෙස සනිටුහන් වන්නේ 1994 අංක 13 දරණ වාරිමාර්ග සංශෝධන පනත ය. එහි දැක්වෙන විධි විධාන කෙටියෙන් මෙසේ දැක්විය හැකි ය.

> "සෑම මහා වාරිමාර්ග ව්‍යාපාරයක ම ව්‍යාපාර කළමණාකරණ කමිටුවක් ස්ථාපනය කළ යුතු ය. එම කමිටුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්/වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලැබූ ව්‍යාපාර කළමනාකාරවරයකුගෙන් ද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන සහ ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරනු ලැබූ නියෝජිතවරුන්ගෙන් ද සමන්විත වේ. මොවුන් සියලු දෙනා රජය නියෝජනය කරන අතර එයට අමතර ව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට අවශ්‍ය යැයි හැගෙන වෙනත් දෙපාර්තමේන්තු/ආයතන නිලධාරීන්ගෙන් ද මෙම කමිටුව සමන්විත වේ.
>
> මෙම කමිටුවල බහුතරය ගොවි නියෝජිතයින් විය යුතු ය. ඒ සඳහා ගොවි නියෝජිතයින් නම් කරනු ලබන්නේ ගොවි සංවිධාන විසිනි".

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ ප්‍රතිපත්තිමය සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන කරුණු වන්නේ,

- ව්‍යාපාරයේ භෝග රටාව/ජල කළමනාකරණ මෙහෙයුම් සැලැස්ම (පෙර කන්න රැස්වීම/විශේෂ කන්න රැස්වීම)
- වාර්ෂික නඩත්තු පද්ධති සැලැස්ම
- පද්ධති වැඩි දියුණු කිරීම, පුනරුත්ථාපන අවශ්‍යතා ප්‍රමුඛතා ලේඛනය
- ගොවි සංවිධාන ආයතනික ක්‍රියාවලිය
- පද්ධති සහභාගීත්ව කළමනාකරණ තුළ වෙනත් ආයතන සතු කාර්ය භාරය
- ගැටලු, දුෂ්කරතා

ආදිය වන බව පෙනී යයි.

දැනට ලංකාවේ ක්‍රියාත්මක වන බොහෝ අන්තර් පළාත් වාරි ව්‍යාපාර සඳහා මෙම කමිටු ස්ථාපනය කර ඇත. පළාත් සභා ප්‍රදේශවල නව වාරි ව්‍යාපාර ඉදි කිරීම් හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේ කටයුතු විටෙක මහා වාරි ව්‍යාපාරවලට බලපෑම් ඇති වන පරිදි සිදු වන බව පෙනී යයි. මධ්‍ය රජයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන ඉහත ව්‍යාපාර සහ ව්‍යාපාර කළමනාකරණ කමිටු පිළිබඳ පැහැදිලි අවබෝධයක් නො මැති බැවින් මෙය සිදුවේ. මේ මගින් මහා වාරිමාර්ග ව්‍යාපාරවලට සිදු වන බලපෑම් පිළිබඳ උදාහරණ රාශියක් දැක්විය හැක.

4.0 වාරිමාර්ග විෂයය විමධ්‍යගත වීම නිසා ඇති වී තිබෙන ගැටලු

පළාත් සභාවලට වාරිමාර්ග විෂයය පිළිබඳ බලය බෙදා හැරීම නිසා අන්තර් පළාත් වාරිමාර්ග ව්‍යාපාරවලට සිදු වී ඇති බලපෑම් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැක. එනම්,

(i) නව ජල සම්පත් සංවර්ධන කටයුතු හේතුවෙන් පවතින ව්‍යාපාරවල ජල කළමනාකරණයට ඇති වන අහිතකර බලපෑම්.

(ii) ගංවතුර පාලන සහ තිරසාර පරිසර සංවර්ධන කටයුතුවලට ඇති බාධා.

(iii) වාරිමාර්ග ව්‍යාපාරවල ආරක්ෂාව තහවුරු කිරීමට ඇති බාධාවන් වශයෙනි.

(i) නව ජල සම්පත් සංවර්ධන කටයුතු හේතුවෙන් පවතින ව්‍යාපාරවල ජල කළමනාකරණයට ඇති වන අහිතකර බලපෑම්

මහා වාරිමාර්ග ව්‍යාපාරයක් සමහර විටෙක දිස්ත්‍රික්ක එකකට වැඩි ගණනක්, පළාත් සභා එකකට වැඩි ගණනක් හරහා විහිද යන වපසරියක පිහිටා තිබිය හැක. එම ව්‍යාපාරයක ජල මූලාශ්‍රය, ජලය බෙදා හැරීමේ පද්ධති පිහිටා ඇති ආකාරය ආදිය පිළිබඳ ව බොහෝ විට අවබෝධයක් ඇත්තේ ඒවා නඩත්තු සහ මෙහෙයුම් කරන ආයතන සහ ඉහත දැක්වූ ගොවි සංවිධානවලට පමණක් විය හැකි ය.

යම්කිසි කුඩා ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ප්‍රදේශවාසීන් ගේ ඉල්ලීමක් ඉටු කරලීම සඳහා පළාත් සභාවක් ක්‍රියාත්මක වීමේ දී මෙම මහා පරිමාණ ව්‍යාපාරවලට බලපෑමක් ඇති නො වන අයුරින් ඒවා ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද? යන්න පිළිබඳ සාකච්ඡාවට බඳුන් නො වන බව, පළාත් සභා මගින් සංවර්ධනය කර ඇති බොහෝ නව ව්‍යාපාර පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි.

මේ සඳහා උදාහරණ බොහෝ ඇති අතර, එක් උදාහරණයක් පමණක් පහත දැක් වේ.

උමා ඇල ව්‍යාපාරය

වැලිමඩ මැතිවරණ කොට්ඨාසයේ බෝමුරැල්ල වැව, එයට කිලෝ මීටර 9 ක් පහළින් උමා ඔය හරහා ඉදි කර ඇති අමුණකින් අක්කර 2005 කට ජලය සපයන ව්‍යාපාරයකි. බෝමුරැල්ල ජලාශය, උමා ඔය අමුණ ව්‍යාපෘතිය යටතේ පෝෂණය වන, වගා බිම්වලට දෙකන්නයට ම සෑහෙන ජලය ලබා දීමේ අපහසුතාව මගහැරීම සඳහා පසු ව ඉදි කළ ජලාශයකි. බෝමුරැල්ල සහ උමා ඔය අමුණ අතර වගා බිම් ප්‍රමාණයක් ඇති බවට මෙම ව්‍යාපාරයේ මූලික සැලසුම්වල හඳුනාගෙන නො තිබිණ.

නමුත් බෝමුරැල්ල ජලාශය සහ උමා ඔය අමුණ අතර උමා ඔය හරහා පළාත් සභාව විසින් ඉදි කර ඇති දෙහිපොල සහ පේරවැල්ල අමුණුවලින් අමතර අක්කර 75කට ජලය ලබා ගනී. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් දෙහිපොල අමුණ (අක්කර 40 ක්) සඳහා ද පේරවැල්ල අමුණ අක්කර 30ක් සඳහා ද ජලය ලබා ගනී. බෝමුරැල්ල වැවේ සොරොව් විවෘත කිරීමෙන් මෙම පද්ධතීන් සඳහා ජලය ලබා ගැනීම සිදු කෙරේ (රූප සටහන් අංක 01). මේ හේතුවෙන් උමා ඇල පද්ධතියේ ජල කළමනාකරණයට බාධක උදා වේ. ඉහත කුඩා ව්‍යාපාරවල ගොවි සංවිධාන කිසිවක් උමා ඇල ව්‍යාපාර කමිටුව නියෝජනය නො කරනු ලබයි.

මෙම අන්තර් පළාත් ව්‍යාපාරය තුළ, එහි ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ අනුදැනුමින් තොර ව මෙසේ අමතර පද්ධතීන් සඳහා ජලය ලබා ගැනීම හේතුවෙන්, ජලය හිඟ අවස්ථාවල දී ගැටලු රාශියකට මුහුණ දීමට උමා ඔය ජලය භාවිතා කළ මුල් ගොවීන්ට සිදු වී ඇත. ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ බලතල ද මෙමගින් හෑල්ලුවට ලක් වී ඇත්තේ ඔවුන් ගේ තීරණ නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට මෙම තත්ත්වයන් යටතේ හැකියාවක් නොමැති බැවිනි.

රූප සටහන් අංක 02: උමා ඔයේ ජලය බෙදී යන ආකාරය



(ii) ගංවතුර පාලන, කරදිය වැලැක්වීමේ සහ ජල බස්නා ව්‍යාපාරවලට ඇති බාධා

ගංවතුර පාලන ව්‍යාපාර සහ කරදිය වැලැක්වීමේ ව්‍යාපාර 40ක් රජය යටතේ දැනට ක්‍රියාත්මක වේ. කැළණි, ගිං, කළු සහ නිල්වලා ගංගාවන් හි ගංවතුර වැලැක්වීමේ ව්‍යාපාර හැර අනෙකුත් ව්‍යාපාර බොහොමයක් පිහිටා ඇත්තේ යම් පළාත් සභා මායිමක් තුළ පවතින ගංගා ද්‍රෝණියක් ආශ්‍රිත ව විය හැක. මෙම ව්‍යාපාර සැලසුම් කිරීමේ දී මුළු ගංගා ද්‍රෝණිය පිළිබඳ ව ම අධ්‍යයනයක් සිදු කරන අතර, ජල විද්‍යාත්මක හැසිරීම් රටාව පිළිබඳ අධ්‍යයනයකින් පසු ව සැලසුම් පිළියෙල කර ඇත.

ගංවතුර පාලන ව්‍යාපාර ක්‍රියාත්මක වන ගංගා ද්‍රෝණියක සැකසෙන ඉඩම් හා ජල සම්පත් සංවර්ධන නව ව්‍යාපෘති අනිවාර්යයෙන් ම මෙම ගංවතුර ගලන නිර්මිතවලට බාධාවක් නො වන අන්දමින් සැකසිය

යුතු වේ. නමුත් පළාත් සභා හෝ වෙනත් පළාත් පාලන ආයතනවලින් අළුතින් පිළියෙල කරන සැලසුම්වල දී මේවා සැලකිල්ලට නො ගැනීමෙන් දැනට ක්‍රියාත්මක ගංවතුර පාලන ව්‍යාපාරවල මූලික පරමාර්ථය ඉෂ්ඨ නො වීමේ තත්ත්වයන් බොහෝවිට උදා වී ඇත.

(iii) වාරිමාර්ග ව්‍යාපාරවල ආරක්ෂාව තහවුරු කිරීමට ඇති බාධා

නිසි පරිදි නඩත්තු නො වන, මහ වැව්වල ඉහත්තාවේ පිහිටි කුඩා ජලාශ, නිරන්තර ව ම විශාල ජලාශවල ආරක්ෂාවට තර්ජනයකි. ලංකාවේ වැඩි ම වේලි ගණනාවක් බිඳී ගිය අවස්ථාවක් ලෙස සඳහන් වන්නේ 1957–දෙසැම්බර්, 58–ජනවාරි කාලයේ දී ඇති වූ ගංවතුර ය. මෙහි දී උතුරු මැද, උතුරු හා නැගෙනහිර පළාත්වල මහා පරිමාණ වේලි 35ක්, මධ්‍ය පරිමාණ වේලි 53ක් හා කුඩා පරිමාණ ජලාශ 1500ක් කැඩී නටබුන් ව ගොස් ඇත. මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ වේලි බිඳී යාමට හේතුව ඒවායේ තිබූ දුර්වලතා නො ව, පිරී තිබූ එම ජලාශවලට, ඉහත්තාවේ තිබූ කුඩා ජලාශ බිඳී එක වර ගලා ආ ජල කඳ දරා ගැනීමට හැකියාවක් නොමැති වීම බව පරීක්ෂණවල දී අනාවරණය විය.

කුඩා ජලාශ නඩත්තුව හා මෙහෙයුම් කිරීමේ දී ද විශාල වැව් සඳහා අවශ්‍ය වන්නාක් මෙන් ම තාක්ෂණ දැනුම, අත්දැකීම්, ආයතනික ක්‍රමවේදයන් සහ මුදල් සම්පත් ද අවශ්‍ය වේ. පළාත් සභා ව්‍යුහය තුළ මෙම අංශ දුර්වල බැවින්, නිසි කළමනාකරණයක් සිදු නො වේ. එබැවින් අනපේක්ෂිත වැසි සමයක දී හෝ වෙනත් ස්වභාවික ආපදාවක දී, විශාල ජලාශවල ආරක්ෂාව සම්බන්ධ ව, ඇති අවදානම ඉහළ යයි. එය එක් ආයතනයක බල සීමාවන් ඉක්මවා ඉන් ඔබ්බට පැතුරුණු කරුණක් වන බැවිනි.

5.0 විසඳුම්/යෝජනා

සමස්තයක් වශයෙන් සලකන කල වාරිමාර්ග විෂයය විමධ්‍යගත කිරීම බොහෝ ගැටලුවලට මූලික වී ඇත. මධ්‍ය රජයේ ආයතනවලට පමණක් නො ව පළාත් සභාවලට ද මේ නිසා බොහෝ කළමනාකරණ ගැටලු මතු වී ඇත. මෙම ගැටලු සහගත තත්ත්වය මගහැරීමට පහත ක්‍රමවේදයන් භාවිතා කළ හැක.

- පළාත් සභාවලට, ව්‍යාපාර කළමනාකරණ කමිටුව නියෝජනය කිරීම සඳහා අවකාශ සැලසීම. 1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනත අනු ව අදාළ මහා වාරිමාර්ග ව්‍යාපාර කළමනාකරණ කමිටුව වෙත අනුබද්ධ සියලු පාර්ශවයන් නියෝජනය වීම සිදුවිය යුතු ය.

- අවශ්‍ය සම්පත් ලබා දීම මගින් සුළු වාරිමාර්ග පිළිබඳ වාරිමාර්ග අධ්‍යක්ෂවරයා හට බලතල ක්‍රියාත්මක කිරීමට හැකි පසුබිම සැකසීම.

- ගංගා ද්‍රෝණියක ජල සම්පත් (බහුකාර්ය) සංවර්ධනය (ගංවතුර, පරිසර පාලනය සහ ජලය වෙනත් ද්‍රෝණි වෙත හැරවුම) සඳහා සැලසුම් රජය වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරීම. පළාත් සභාවලින් සැලසුම් කෙරෙන නව ව්‍යාපාර රජයේ ද අනුදැනුම ඇති ව සිදු කිරීමට කටයුතු කිරීම.

- ජලාශවල ආරක්ෂාව සම්බන්ධ ව දේශීය ප්‍රමිතීන් සැකසීම. මේ අනු ව කුඩා ජලාශ සහ විශාල ජලාශ නඩත්තු සහ මෙහෙයුම් සිදු කෙරෙන සියලු ආයතනවල කළමනාකරණ සහ තාක්ෂණික ප්‍රවේශයන් පිළිගත් තාක්ෂණික ප්‍රමිතියකට අනු ව සිදු කිරීම.

- ජල කළමනාකරණ ඒකකය ලෙස ගංගා ද්‍රෝණිය සැලකීම. දිස්ත්‍රික්ක, පළාත් සහා හෝ මැතිවරණ කොට්ඨාස වැනි පරිපාලන සීමාවලින් බැහැර ව සියලු ජල සම්පත් සංවර්ධන සහ කළමනාකරණ කටයුතු ගංගා ද්‍රෝණි වෙන ම ඒකකයක් ලෙස සලකා ක්‍රියා කිරීම ඉතාමත් උචිත ක්‍රියා මාර්ගය

වේ. මූලික ජල විද්‍යා හා පරිසර සිද්ධාන්තවලට අනුකූල වන්නේ එම ක්‍රමවේදය බැවින්, ඉහත දැක් වූ සියලු ගැටලු එමගින් අවම කරගැනීමට හැකි වනු ඇත.

6.0 සමාප්තිය

රජය සතු ව තිබූ වාරිමාර්ග ක්ෂේත්‍රයේ බලතල සහ කාර්යයන් මේ වන විට දෙයාකාරයකට විමධ්‍යගතකරණය කර ඇත. එනම්, දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් යම් යම් කාර්යයන් පළාත් සභා වෙත පැවරීම හා ව්‍යාපාර කළමනාකරණ කමිටුවලට බලතල පැවරීම වශයෙනි. පළාත් සභාවලට වාරි ක්ෂේත්‍රයේ කටයුතු පවරා ඇතත් ඒ සඳහා අවශ්‍ය ශිල්පීය විශේෂඥතාව, මූල්‍ය, භෞතික සම්පත් සහ දත්ත හිඟය ආදී ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වීම නිසා එම කාර්යය නිසි පරිදි ඉටු කිරීමට බාධා පැමිණ ඇත. කුඩා වාරි පද්ධති නිසි පරිදි නඩත්තු නො කිරීම එම වාරි ව්‍යාපෘතිය යටතේ වගා කරන ගොවීන්ට ගැටලු මතු කරවන්නක් සේ ම මහා වාරි පද්ධතියට ද ගැටලු මතු කරවන්නක් වී ඇත. අනෙක් අතට මහා වාරි ව්‍යාපාරවල කළමනාකරණ කමිටුවට පළාත් සභා ඇතුළත් කර නොමැත. මේ නිසා ප්‍රායෝගික මට්ටමේ දී වාරි ජලය සහ වාරි පද්ධතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු වේ. මෙම ගැටලු නිරාකරණය කිරීමට නිසි ක්‍රියාමාර්ග ගැනීම සමස්ත වාරි මාර්ග ක්ෂේත්‍රයේ ම උන්නතිය සහ යහ පැවැත්ම සඳහා අනිවාර්යයෙන් ම කළ යුතු කාර්යයක් බවට පත් ව ඇත.

ඇමුණුම අංක 01: ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි සහ පළාත් මායිම්



ගම්බද වාරිමාර්ග ආශ්‍රිත ජල කළමනාකරණ විෂයයෙහි ලා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය: පරිණාමය, වර්තමාන තත්ත්වය සහ අනාගත සැලසුම්

දු.දි. ප්‍රභාත් විතාරණ
ඉංජිනේරු (ජල කළමනාකරණ)
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

සංක්ෂේපය

ශ්‍රී ලංකාව සියවස් ගණනාවක් තිස්සේ පටන් වාරි ශිෂ්ටාචාරයකට උරුමකම් කියන රටකි. ප්‍රාග් බෞද්ධ යුගයේ ඇරඹි මෙරට වාරි ශිෂ්ටාචාරය පොළොන්නරු රාජධානිය බිඳ වැටීමත් සමග වෙනසකට ලක් විය. යටත් විජිත සමයේ දී ඉංග්‍රීසීන් විසින් හඳුන්වා දෙනු ලැබූ අක්‍රමවත් සහ අසමතුලිත ඉඩම් පරිහරණ රටාවේ වෙනස්කම් මෙරට ස්වභාවික පරිසර පද්ධතිය අසමතුලිත කිරීමට මෙන් ම වාරි ජල කළමනාකරණය දුර්වල කිරීමට ද සෘජුව ම ඉවහල් විය. 1958 අංක 01 දරණ කුඹුරු පනත හඳුන්වා දීම ග්‍රාමීය වාරි ක්ෂේත්‍රයේ වෙනසක් සනිටුහන් කරන කඩඉමක් වන අතර, ඒ තුළින් සාම්ප්‍රදායික වෙල් විදානේ ඉටු කළ කාර්ය භාරය අහෝසි කොට එම බලතල ගොවි කාරක සභා වෙත පැවරීම සිදු විය. 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත මගින් වාරිමාර්ග යටතේ වන මෙහෙයුම් සහ නඩත්තු කටයුතු විධිමත් ව පවත්වා ගෙන යාම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගනු ලැබිණි.

මේ ආකාරයට විකාශනය වූ මෙරට ගම්බද වාරි කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ පැහැදිලි මංසන්ධියක් ලෙස 1987 ස්ථාපිත කරන ලද පළාත් සභා ක්‍රමය හඳුන්වා දිය හැකි ය. වාරිමාර්ග නඩත්තුව සහ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් එතෙක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව (වර්තමාන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව) තුළ වර්ධනය වෙමින් පැවති යාන්ත්‍රණය සහ රටාව දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග අඩපණ වූ අතර එම කටයුත්ත පළාත් සභා වෙත විමධ්‍යගත වූ විෂයයක් බවට පත් විය.

මෙම ලිපිය ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. එනම් මෙරට වාරි ශිෂ්ටාචාරයේ පරිණාමය, පළාත් සභා පිහිටු වීමෙන් පසු මතු ව තිබෙන ගැටලු සහ මෙම ක්ෂේත්‍රයේ අනාගත සැලසුම් කෙසේ විය යුතු ද? යන්න ඇතුළත් වේ. මෙහිදී පුරාණ ශ්‍රී ලංකාවේ වාරිමාර්ග කළමනාකරණ රටාව, නිදහසට පෙර සහ පසු අවධීන් හි වාරි ජල කළමනාකරණයේ අභිවෘද්ධිය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග සහ රාජ්‍ය ප්‍රතිපත්ති, පළාත් සභා ක්‍රමයේ ආරම්භය සමග මෙම ක්ෂේත්‍රය මුහුණ පා ඇති ගැටලු පිළිබඳ ව සාකච්ඡා කෙරේ. එමෙන් ම එම ගැටලුවලට විසඳුම් වශයෙන් යෝජනා ඉදිරිපත් කරන අතර ම ඒ ආශ්‍රිත ව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පිළිබඳ ව ද අනාවරණය කෙරේ.

1.0 හැඳින්වීම

ශ්‍රී ලංකාව ජලාශ්‍රිත ශිෂ්ටාචාරයකට නො ව වාරි ශිෂ්ටාචාරයක ට උරුමකම් කියන රටකි. යුප්‍රටිස් ටයිග්‍රිස් (ක්‍රි.පූ. 1500) හෝ හුවැංහෝ (ක්‍රි.පූ. 1000) ශිෂ්ටාචාරය සමග අප රටේ ලිඛිත ඓතිහාසික කථාන්තරය සැසඳිය නො හැක්කේ එහෙයිනි. ස්වාභාවික ලෙස පොළොව මත වැසි ජලය නො රඳන ස්ථානයක මිනිස් ක්‍රියාවන් මගින් එම ජලය රඳවා, තබා ගනිමින්, එය මිනිසා ඇතුළු මුළු මහත් පරිසර පද්ධතියේ ම යහපත උදෙසා යොදා ගැනීමේ තාක්ෂණය දැන කියා ගැනීම, මානව ශිෂ්ටාචාරය තුළ මිනිසා ලැබූ අතිමහත් ජයග්‍රහණයක් විය. වාරි සැලසුම්කරණයේ දී මෙන් ම ඉදි කිරීම් තාක්ෂණයේ දී පුරාණ ලක්දිව වැසියන් දක්වා ඇති ප්‍රවීණතාව සහ පුළුල් දැක්ම මැනවින් සනාථ වන්නේ මෙයට වසර 2600කට පෙර බිහි වූ බව විශ්වාස කරන මෙම වාරි පරිසර පද්ධති අද දවසේ ද ජීවමාන ව පවතින බැවිනි. ආදී ලාංකිකයින් පරිසරය ජය ගනිමින් සිදු කළ මෙම විශ්මිත හපන්කම පිළිබඳ තොරතුරු සොයා බැලීම

වැදගත් වන්නේ එයින් වර්තමානයට මෙන් ම අනාගතයට බොහෝ දේ ඉගෙනීම සහ උපුටා ගැනීම සිදු කළ හැකි හෙයිනි.

2.0 ඓතිහාසික පසුබිම

2.1 ප්‍රාග් බෞද්ධ යුගය

ශ්‍රී ලංකාවේ වාරි ඉතිහාසය, මෙරටට බුදු දහම රැගෙන ආ වකවානුවට ත් වඩා පැරණි වේ. ක්‍රි.පූ. 6 වැනි සිය වසේ දී ශ්‍රී ලංකාවේ වයඹ දෙසින් සිදු වූ ආර්ය සංක්‍රමණයත් සමග ම ආර්ය ජනයා මෙරට ප්‍රධාන ජල මාර්ග ඔස්සේ රට අභ්‍යන්තරයට ප්‍රවේශ වූ බව ත්, එහි දී වඩා සාරවත් බිම් සහිත ස්ථානවල ඔවුන් සිය ජනාවාස පිහිටුවා ගත් බව ත්, මෙරට පුරාණ කථාන්තරය පිළිබඳ ව ලියැවුණු ප්‍රධාන ත ම ඓතිහාසික ග්‍රන්ථය වන මහාවංශයේ සඳහන් වේ. ඒ අනු ව විජය රජු ගේ අමාත්‍යවරයෙකු වූ අනුරාධ නම් ඇමතිවරයා විසින් අනුරාධ නම් ග්‍රාමයක් (වර්තමාන අනුරාධපුර) පිහිට වූ බව ත්, ඒ අවස්ථාවේ දී වැවක් ද තැනූ බව ත් කියැ වේ.

ආර්යයන් බිහි කළ ප්‍රථම නගරය වූ තම්මැන්නා නුවරට පසු බිහි වූ ප්‍රථම නගරය ලෙස පුරාණ පඩුවස් නුවර හැඳින්වෙන අතර, එහි දැදුරු ඔය මිටියාවතේ "පාණ්ඩ වැව" නම් වැවක් කර වූ බව ද ඉතිහාසයේ සඳහන් වේ.

භූ විෂමතාව, පාංශු ගරස්කඩ, වර්ෂාපතන රටාව ආදිය පිළිබඳ නිවැරදි අදහසක් නොමැති ව වැවක් නිර්මාණය කළ නො හැකි බව සහ එසේ නිර්මාණය කළ ද, එම වැව දිගු කලක් ප්‍රයෝජනවත් ලෙස පවත්වා ගැනීම කිසිසේත් කළ නො හැකි බව පසක් වන විට, පණ්ඩුකාභය රජ දවස (ක්‍රි.පූ. 4 වන සියවස) ඉදි වූ අභය වැව (වර්තමාන බසවක්කුලම) වර්තමානයේ දී ද ක්‍රියාකාරී තත්ත්වයේ පැවතීමෙන් පැරණි ලාංකිකයින් සතු ව ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ ව තිබූ තියුණු දැනුම සහ අවබෝධය මැනවින් පැහැදිළි වේ. ශ්‍රී ලංකාවේ ඇතැම් වැව්, පන්සල් සහ ආරණ්‍ය සේනාසනවල වැඩ විසූ භික්ෂූන් ගේ ප්‍රයෝජනය සඳහා නිම කර තිබුණ ද, සාමාන්‍ය තත්ත්වය අනු ව වැව් ආශ්‍රිත ව බිහි ව තිබූ ගම්මානවල ජීවත් වූ ගැමියන්ට අවශ්‍ය දාර්ශනික මග පෙන්වීම සඳහා වැව් ආශ්‍රිත ව පන්සල් සහ දාගැබ් බිහි වූ බවත් පැහැදිලි ය.

2.2 ජල විද්‍යාත්මක මායිම් සහ ගංගා ද්‍රෝණි සංකල්පය

ශ්‍රී ලංකාවේ ග්‍රාම නිර්මාණකරණය සහ වාරි සංස්කෘතිය පිළිබඳ තීරණාත්මක මංසන්ධිය ලෙස සැලකෙන්නේ පණ්ඩුකාභය රජු දවස බිහි වූ ගම් මායිම් සලකුණු කිරීම පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ය.

මෙරට ගම් මායිම් ජල විද්‍යාත්මක පදනමක් මත පිහිටා තීරණය කළ යුතු බැව් එකල රාජ්‍ය ප්‍රතිපත්තිය බවට පත් වූ අතර, ඉන් අනතුරු ව ස්වාභාවික සම්පත් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කිරීමේ උපාය මාර්ග ගම් මට්ටමින් හඳුන්වා දී තිබූ බව කොන්ඩවටුවාන සෙල් ලිපියෙන් (4 වන දප්පුල රජු--ක්‍රි.ව. 827) පැහැදිළි වේ.

ගංගා ද්‍රෝණි සංකල්පය මත පිහිටා ක්‍රියාත්මක වුණු මෙරට වාරි තාක්ෂණය සහ ග්‍රාම නිර්මාණකරණය අනු ව ක්‍රි.ව. 3 වැනි සියවසේ රජ කළ මහසෙන් රජු ගේ කාලය වන විට ශ්‍රී ලංකාවේ සියලු ම ගංගා ද්‍රෝණි ආශ්‍රිත ජල විභවය සහ සංවර්ධන යෝජනා ඉතා පැහැදිලි ව හඳුනා ගෙන තිබිණි. ඉන් අනතුරු ව 13 වැනි සිය වසේ පොළොන්නරු රාජධානිය බිඳ වැටෙන තුරු ම ක්‍රියාත්මක වූයේ ක්‍රි.ව. 3 වැනි සියවසේ හඳුනා ගත් ගංගා ද්‍රෝණි සංවර්ධන වැඩසටහන් බැව් පැහැදිලි ය.

ඇවැසි දේ පමණක් රඳවා ගෙන අනවශ්‍ය දේ ක්‍රමානුකූල ව බැහැර කිරීම වැවක් නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රධාන ත ම මූල ධර්මය වේ. මෙම තත්ත්වයට ගැළපෙන සමාජ සහ මානසික

පරිවර්තනයක් ලාංකීය ජන සමාජය තුළ ඇති කිරීමට සමත් වූ ක්‍රි.පූ. 3 වැනි සියවසේ දේවානම්පියතිස්ස රජු දවස මෙරටට ප්‍රවේශ වූ බුදු දහම, මෙරට වාරි ශිෂ්ටාචාරයට නව පණක් මෙන් ම සමාජමය අර්ථයක් ලබා දුන් බව අවිවාදයෙන් පිළි ගත යුතු ව තිබේ. අතීතයේ පුරාණ රජ දරුවන් විසින් මහා වැව් මෙන් ම දහස් ගණනින් වූ කුඩා වැව් ද එක වර නිර්මාණය කළ බවට ත්, මහ වැව් සහ කුඩා වැව් අතර සහජීවන සම්බන්ධතාවක් පැවති බවට ත් මහාවංශය සාක්ෂි දරයි.

දහ තුන් වැනි සියවසේ පොළොන්නරු රාජධානිය බිඳ වැටීම ත් සමග ම මහා වැව් සඳහා වූ රාජ්‍ය අනුග්‍රහය අහෝසි වී ගිය අතර, මහා වැව් සංස්කෘතිය වන ගත වන්නට විය. එහෙත් ගැමියන් ගේ තුරුලේ බිහි වූ "ගම්ක වව්" නොහොත් ගම්බද වැව් තව දුරටත් අඛණ්ඩ ව ඉදිරියට ඇදී යාමේ රහස කුමක් ද?

2.3 යටත් විජිත යුගය

ආර්ය සංක්‍රමණයෙන් ඇරඹි ශ්‍රී ලංකාවේ රාජ වංශය, ක්‍රි.ව. 1815 (බු.ව. 2358) දී මෙරට රාජ්‍ය ප්‍රධානීන් විසින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ආක්‍රමණික ඉංග්‍රීසි හමුදාවට පාවා දීමෙන් නිම විය. ඒ සමග ම මෙරට වාරි ඉතිහාසයේ ද නව පරිච්ඡේදයක් බිහි වූ බව පෙනේ.

වැවිලි ආර්ථිකය හඳුන්වා දීම සහ මිනිසුන්ගෙන් බදු එකතු කිරීම මගින් තම ආදායම් තත්ත්වය වර්ධනය කර ගැනීම ප්‍රධාන පරමාර්ථය කොට ගත් ඉංග්‍රීසි පාලනය විසින් ඒ සඳහා ප්‍රථමයෙන් ම සිදු කරන ලද්දේ පුරාණ සින්නක්කර ලෙස හඳුනා ගත් මෙරට ගැමියන් භාවිතා කළ සුළු ඉඩම් ප්‍රමාණයක් හැර අන් සියලු ඉඩම් මුඩු ඉඩම් ආඥා පනත මගින් රජයට පවරා ගැනීම ය. එහෙත් වාරි කර්මාන්ත මෙන් ම ඒ හා බැඳුණු ඉඩම් පරිහරණ සහ බුක්ති ක්‍රම පිළිබඳ කිසිදු නිරවුල් අදහසක් ලබා ගැනීමට අපොහොසත් වූ ඉංග්‍රීසි පාලකයින් සිය පාලන කාලයේ අවසාන භාගය වන තුරු ම වාරි ක්ෂේත්‍රයේ වැඩදායී වූ වෙනස්කම් සිදු කිරීමට අපොහොසත් වූ බව පෙනේ. එසේ ම මෙරට වාරි සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ඒකීය සහ පොදු ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කිරීමට ද ඔවුන් අපොහොසත් විය. උදාහරණයක් වශයෙන් 1815 දී ඉංග්‍රීසීන් සමග ඇති කර ගත් ගිවිසුමේ සඳහන් කොන්දේසි ඉංග්‍රීසීන් විසින් ආරම්භයේ සිට ම කිසිදු චකිතයකින් තොර ව කඩ කරන බව දුටු ඌව වෙල්ලස්ස වැසියන් මෙරට ඉංග්‍රීසි පාලනයට විරුද්ධ ව මෙහෙය වූ කැරැල්ලෙන් දැඩි ලෙස තැති ගත් ඉංග්‍රීසීන්, ඔවුන් ගේ පාලන කාලය අවසාන වන තුරු ම ඌව වෙල්ලස්ස නැවතත් සශ්‍රීක ප්‍රදේශයක් වීම වැළැක්වීම සඳහා සහාසික ලෙස ක්‍රියාකර ඇති බවට සාක්ෂි පවතී. එහෙත් වයඹ සහ උතුරු මැද පළාත්වල එවැනි තත්ත්වයක් දක්නට නො වූ අතර, එහි විසූ සාමාන්‍ය ජනතාව ගේ පහසුව පිණිස යැයි සිතමින් ඉංග්‍රීසි පාලකයින් විසින් සිය නො දැනුවත්කම නිසා සිදු කරන ලද හානි ඌව වෙල්ලස්සට ත් වඩා භයානක වූ බව පෙනේ. ඉංග්‍රීසීන්ට පක්ෂපාත වූවන් සඳහා තෑගි ලෙස විශාල වශයෙන් වගා බිම් ලබා දීම මෙන් ම ඔවුන්ට රාජකාරී ඉටු කළ සාමාන්‍ය ජනතාව ගේ ඉල්ලීම මත වැව් යටතේ අළුතින් වගා බිම් අස්වැද්දීමට අවසර ලබා දීම ද එම හානිවලින් සමහරකි. මෙම ඉඩම්, රාජ්‍ය ප්‍රදාන (Crown Grants) ලෙස හෝ රජයෙන් විකුණූ ඉඩම් ලෙස හෝ දිගු කාලීන බදු ඉඩම් ලෙස හෝ ලබා දීමට ඉංග්‍රීසීන් කටයුතු කළේ, එම වගා බිම්වලට වාරි ජලය සපයා වැව්වල ධාරිතාව හෝ ඒවායේ ධාරා ප්‍රදේශවලින් ගලා එන ජල ප්‍රමාණය පිළිබඳ ව කිසිදු දැනීමකින් හෝ සොයා බැලීමකින් තොර ව ය. එසේ ම 80%ක් ව පැවති ශ්‍රී ලංකාවේ ධාරා ප්‍රදේශවල ස්වාභාවික වනාන්තර ප්‍රතිශතය 40% දක්වා පහත බසින තුරු (වර්තමානයේ 20%) ඉංග්‍රීසි පාලකයින් විසින් හඳුන්වා දෙන ලද අක්‍රමවත් සහ අසමතුලිත ඉඩම් පරිහරණ රටාවේ වෙනස්කම් මෙරට ස්වාභාවික පරිසර පද්ධති අසමතුලිත කිරීමට මෙන් ම වාරි කළමනාකරණය දුර්වල කිරීමට සෘජු ව ම හේතු වූ බව නො රහසකි.

පුස්...
LIB...
HARTI

2.4 වාරිමාර්ග ආශ්‍රිත ඉඩම් බුක්ති ක්‍රමය

මෙරට සාම්ප්‍රදායික ඉඩම් අයිතිය පැවරුණු ක්‍රමය "පරවේණි ක්‍රමය" ලෙස හැඳින්වේ. වියලි කලාපයේ වැවක් යටතේ වූ යාය ප්‍රධාන කොටස් දෙකකට බෙදා වැව ආසන්නයේ පිහිටි කොටස "ඉහළ බාග" නොහොත් "ඉහළ වෙල" ලෙස ත්, වැවට දුරින් පිහිටි කොටස "පහළ බාග" නොහොත් "පහළ වෙල" ලෙස ත් නම් කෙරිණි. ඉන් අනතුරු ව වැ කන්දට සමාන්තර ව පංගු (කුඹුරු තීර) වෙන් කරනු ලැබූ අතර, වැ කන්දට ආසන්නයේ ම වූ පංගුව ගමේ නායකයාට වෙන් කොට ගම් වසම ලෙස ත්, ඊළඟ පංගුව වැවේ නායකයා වූ වෙල් විදානේට වෙන් කොට විදානෙ පංගුව ලෙස ත් නම් කෙරුණි. ඉන් අනතුරු ව සෑම ගොවි මහතෙකුට ම ඉහළ යායේ මෙන් ම පහළ යායේ ද ඉඩම් පංගුව බැගින් වෙන් කර දීම සිදු වූ අතර, ඔහුගෙන් පසු එම ඉඩම් අයිතිය පවුලේ වැඩිමහල් පිරිමි දරුවාට හිමි විය යුතු ව තිබිණි.

තෙත් කලාපීය ප්‍රදේශයේ එක් ඉඩමක් කොටස් දෙකකට බෙදා ඉහළින් පිහිටි කොටස ඉහළ කට්ටිය ලෙස ත්, පහළින් පිහිටි ඉඩම පහළ කට්ටිය ලෙස ත් නම් කරන ලදී. මෙම කැබලි දෙක පිරිමි දරුවන් දෙදෙනෙකුට භාර දී සෑම වගා කන්න දෙකක් අවසානයේ දී ම ඉඩම් බුක්තිය හුවමාරු කර ගැනීමට කටයුතු කරන ලදී. මෙම ක්‍රමය "තට්ටු මාරු" ක්‍රමය ලෙස හැඳින්වෙන අතර එක ම බිම් කැබැල්ලක අයිතිකරුවන් වාර්ෂික ව මාරු වීම "කට්ටි මාරු" නම් විය. වගා බිම් අයිතිය කුඩා කැබලිවලට කැඩී යාම වැළැක්වීම මෙම සියලු ක්‍රමවල යටි අරමුණ වූ අතර, ඉහළ මට්ටමේ සමානාත්මතාවක් පවත්වා ගෙන යෑම එහි මූලික හරය වී තිබුණි.

ලන්දේසීන් විසින් මෙරටට හඳුන්වා දී තිබූ (1664) රෝමානු ලන්දේසි නීතියේ මූල ධර්ම තව දුරටත් ස්ථාපිත කිරීමට ඉංග්‍රීසීන් කටයුතු කළ අතර, ඉඩම් හිමියන්ගෙන් පසු ව ඔවුන්ට අයත් ව තිබූ කුඹුරු ඉඩම් අයිතීන් සමාන ව දරුවන් අතර බෙදී යා යුතු ය යන නීතිය හඳුන්වා දීම ත් සමඟ ම මෙරට කුඹුරු ඉඩම් ඉතා කුඩා කැබලිවලට කැඩී විසිරී යාම ආරම්භ විය. වර්තමානයේ ගම්බද වාරිමාර්ග යටතේ බොහොමයක් පුරාණ සින්නක්කර හෝ පරවේණි ඉඩම් භාවිතා කළ නො හැකි තරම් කුඩා කොටස් හෝ පංගුවලට කැඩී පැවතීම නිසා පුරන් වීමට පටන් ගෙන තිබේ.

එසේ ම කුඩා වැව් යටතේ වූ වගා බිම් පුරාණ සින්නක්කර ඉඩම් ලෙස හඳුනා ගෙන තිබූ බැවින් ඒවායින් බදු අය කිරීමට ඉංග්‍රීසි පාලකයින්ට නො හැකි වූ නිසා ම, මෙම වගා බිම් පිළිබඳ ව ඔවුන් දැක් වූ උනන්දුව ඉතා අල්ප වූ අතර, බදු අය කළ හැකි හේන් (උස් බිම්) පිළිබඳ ව වැඩි සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ. එවකට ඌව පළාත භාර ව කටයුතු කළ සුදු දිසාපතිවරයා වූ ලෙනාඩ් වුල්ෆ් මහතා විසින් සත්‍ය කථාවක් පාදක කර ගනිමින් රචිත ප්‍රබන්ධයක් වූ "බැද්දේගම" (The Village in the Jungle, 1913) නවකතාවේ පුංචි මැණිකා ජලය ගත් වැව, අවසානයේ දී වැසි කාලයට ජලය පිරෙන වලක් බවට පත් වූ බව ප්‍රකාශ කෙරේ. මෙම ගම්බද වැව එම ජන සමාජය මත ඇති කළ බලපෑම පැහැදිලි කිරීමට ඉහත කතුවරයා සමත් නො වූයේ, වැව පිළිබඳ ඌව පළාතේ සුදු නිලධාරීන් දැක්වූ අල්ප උනන්දුව නිසා ම විය යුතු ය. කෙසේ නමුත් බැද්දේගම ගම ත්, වැව ත් කැලෑවට ගොදුරු වූයේ බ්‍රිතාන්‍ය පාලකයින් ගේ සිත් පිත් නැති පාලන රෙගුලාසි නිසා බව නම් එම නවකතාව මඟින් ලොවට හඬ ගා කියැවිණි.

2.5 අමුණු ව්‍යාපාර

ක්‍රිස්තු පූර්ව යුගවල දී 'අවරන' යන හෙළ වදනින් අර්ථවත් වූ මෙරට අමුණු ව්‍යාපාර තෙත් හා අන්තර් කලාප ප්‍රදේශවල වාරිගත කෘෂිකර්මයේ කොඳු නාරටිය බඳු විය. ජලය රැස්කර තබා ගැනීමක් සිදු නො කළ ද, ගංගා ජලය මනා ලෙස කළමනාකරණය කර ගනිමින් කෙත් බිම් කරා ජලය සැපයීමට පුරාණ අමුණු පද්ධති සමත් වූ බව පෙනේ. 13 වැනි ශත වර්ෂයේ කාලිංග මාඝ ආක්‍රමණයෙන් පසු මෙරට

රජරට රාජධානිය බිඳ වැටුණු අතර, කෙත් බිම් සාරවත් කළ මහ වැව් සංස්කෘතිය වනගත වන්නට විය. එහෙත් ඉන් අනතුරු ව උදා වු දඹදෙනිය, කෝට්ටේ සහ උඩරට රාජධානිය තුළ ලාංකිකයින් පෝෂණය කරනු ලැබුවේ මෙම අමුණු ව්‍යාපාර මගින් සපයා දුන් වී අස්වනුවලින් බවට ඉතිහාසය සාක්ෂි දරණු ලබයි. අහිමි වු රජරට වෙනුවට පෘතුගීසීන්, ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් සමග යුධ වැදීමට අවැසි ආර්ථික ශක්තිය සහ ස්වයංපෝෂිත භාවය ලාංකිකයන්ට ළඟා කර ගත හැකි වුයේ මධ්‍යම සහ සබරගමු පළාත්වල පිහිටි අමුණු ව්‍යාපාර සහ ඌව පළාතේ පිහිටි කුඩා වැව් පාදක කරගනිමින් බව අප අමතක නො කළ යුතු ය. එවකට ලොව ප්‍රධාන ත ම ආක්‍රමණිකයින් ති දෙනා සමග වසර 300කට ආසන්න කාලයක් සටන් කිරීම සඳහා අවශ්‍ය ආහාර මෙරට වැසියන් සපයා ගනු ලැබුවේ "අමුණු" නම් වු මෙම කුඩා වාරි පද්ධති මගිනි.

2.6 පුරාණ වාරිමාර්ග ගවේෂණය

මෙරට භූමියෙන් තමන් ගේ ආර්ථිකය පෝෂණය කිරීමට ගත හැකි ප්‍රයෝජන පිළිබඳ උනන්දුවක් දැක් වු ඉංග්‍රීසීන් ඒ සඳහා පිහිට වු ප්‍රථම රාජ්‍ය දෙපාර්තමේන්තුව වුයේ 1800 පිහිට වු මිනුම් දෙපාර්තමේන්තුවයි. භූමි නිර්මාණකරණ මැනුම් සිදු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගේ ප්‍රධාන රාජකාරියක් ව පැවති අතර 1879-1924 කාල පරිච්ඡේදය තුළ ලංකාවේ භූ විෂමතා ලක්ෂණ පැහැදිලි කරන අඟලේ සිතියම් 72ක් මෙරට මිනුම් දෙපාර්තමේන්තුව විසින් බිහි කරන ලදී. මේ සඳහා සිදු කෙරුණු භූමි නිර්මාණකරණ මැනුම්වල දී මිනින්දෝරු මහතුන් ක්ෂේත්‍රයට ගොස් ඇසින් දකින තොරතුරු "ප්ලෑන් ටේබල්" නම් උපකරණයක් අනුසාරයෙන් ද්විමාන සිතියමකට පරිවර්තනය කිරීම සිදු විය. මෙම වකවානුව තුළ අපේ පුරාණ ඓතිහාසික ග්‍රන්ථ වන මහා වංශය, පූජාවලිය ආදී පොත් කට පාඩම් කරමින් ඒවායේ සඳහන් ව ඇති පුරාණ වාරි නිර්මාණ ගවේෂණය කිරීමේ යෙදුණ මිනුම් නිලධාරීන් විසින් මෙරට වාරිමාර්ග ක්ෂේත්‍රයට ඉටු කර ඇති මෙහෙය දෙ වැනි වන්නේ, ආරම්භයේ දී මෙම වැව් නිර්මාණය කළ පුරාණ රජ දරුවන්ට පමණි.

මෙම වකවානුව තුළ පරාක්‍රම සමුද්‍රයට අයත් දුඹුටුලු වැව, තෝපා වැව ආදියෙහි නටබුන් ඝන කැලය තුළින් සොයා ගන්නා තෙක් ම පරාක්‍රම සමුද්‍රය රැඳී තිබුණේ මහාවංශ ග්‍රන්ථයේ පිටු අතර පමණී. එදා උතුරු මැද ප්‍රදේශය භාර මිනුම් අධිකාරී ලෙස ක්‍රියා කළ, ලන්දේසී සම්භවයක් සහිත ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකිකයෙකු වු ආර්.එල්. බ්‍රෝහියර් මහතා විසින් 1945 දී රචිත "ලක්දිව පුරාතන වාරි මාර්ග" (Ancient Irrigation Works in Ceylon) නැමැති ග්‍රන්ථය මෙයට කදිම නිදසුනකි. මෙම වාරි ගවේෂණ ක්‍රියාදාමය කොපමණ සෙමින් සිදු වුයේ ද? යත් පරාක්‍රම සමුද්‍රයේ අවසාන වැව ලෙස සැලකූ අගු වැව (පසු ව මෙම වැව සිතියම්වල "බු වැව" ලෙස සඳහන් විය) සොයා ගැනීම මෑත කාලයේ දී සිදු විය. මෙසේ වනගත ව නටබුන් ව තිබු පුරාණ මහා වැව් සොයා ගැනීමත් සමඟ ම දහ නව වැනි ශත වර්ෂයේ අග භාගයේ දී සහ විසි වැනි ශත වර්ෂයේ මුල් භාගයේ දී මෙම වැව් නැවත ප්‍රතිසංස්කරණය කර වීමට ඉංග්‍රීසි ආණ්ඩුව විසින් කටයුතු යොදන ලදී.

ගම්බද වැව් (ග්‍රාමික වැව්) පිළිබඳ පරිණාමය එයට වඩා තරමක් වෙනස් වේ. රාජ්‍ය අනුග්‍රහය අහිමි වීම නිසා මෙම ගම්බද වැව් සංස්කෘතිය බිඳ නො වැටුණු අතර, ගැමියන් මෙම වැව් ආශ්‍රිත ව සිය ජීවිතය ගත කරන්නට විය. 1922-23 වර්ෂවල දී පොල්ගහවෙල, මන්නාරම සහ යාපනය අතර පිහිටි දුම්රිය මාර්ගයට හානි පැමිණ විය හැකි ගම්බද වැව් පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. 1932 දී වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අනුබද්ධ ව "ගම්බද වාරිමාර්ග කටයුතු අංශය" නමින් අංශයක් බිහි වු අතර එහි මූලස්ථානය අනුරාධපුරයේ ස්ථාපිත කරන ලදී. එසේ ම 1932 දී රු.200,000 ක මුදලක් ගම්බද වාරිමාර්ග අලුත්වැඩියාව සඳහා වෙන්කර දීමට රජය විසින් කටයුතු කරන ලද අතර, 1933 දී එවකට වාරිමාර්ග අධ්‍යක්ෂ ධුරය දැරූ අභාවප්‍රාප්ත ජේ.එස්. කෙනඩි මහතා විසින් ලංකා ඉංජිනේරු ශිල්පීන් ගේ සංගමයේ වාර්ෂික සම්මේලනයේ දී "ගම්බද වාරිමාර්ග කටයුතු සංවර්ධනයේ විද්‍යාත්මක පරිණාමය" යන මැයෙන් ඉදිරිපත් කළ ලිපිය අනෙකුත් ඉංජිනේරුවරුන් අතර ප්‍රසිද්ධ වීමෙන් පසු මෙම විෂයය කෙරෙහි

ඉංජිනේරුවන් ගේ වැඩි අවධානයක් යොමු වීමට පටන් ගත් බව පෙනේ. 1939 දී වාරිමාර්ග කටයුතු පිළිබඳව සැකසූ ව්‍යවස්ථා මාලාවේ සාමාන්‍ය රීතියක් වශයෙන් "ඉඩම් හිමියන් විසින් කිසියම් බද්දක් නො ගෙවන, එහෙත් නිර්මාණය සහ නඩත්තුව සඳහා අවශ්‍ය වන පස් කැපීමේ වැඩ සහ එළිපෙහෙළි කිරීමේ වැඩ ද කරනු ලබන වැව්, අමුණු, ඇළ, දොළ ආදිය" ගම්බද වාරිමාර්ග ලෙස අර්ථ දැක්විණි. මෙම වකවානුව වන තෙක් ගම්බද වාරිමාර්ග සංවර්ධනය සඳහා රේඛීය රාජ්‍ය දායකත්වයක් වාර්තා නො වුව ද, මෙම වැව් යටතේ වන මෙහෙයුම් සහ නඩත්තු කටයුතු මනා තත්ත්වයෙන් පවත්වා ගෙන යෑම සඳහා සෘජු මැදිහත් වීමක් බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ආරම්භයේ සිට ම සිදු කරන ලද බවට ලිඛිත සාක්ෂි ඇත.

2.7 මෙහෙයුම් සහ නඩත්තු

ගම්බද වාරිමාර්ග යටතේ මෙහෙයුම් සහ නඩත්තු රාජකාරි පිළිබඳ ආරම්භක ස්ථානය ලෙස කන්න රැස්වීම හැඳින්විය හැකි ය. කන්න රැස්වීම යනු හඳුනාගත් යායේ පංගුකරුවන් ගේ රැස්වීමයි. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ඔවුන් සතු රෙගුලාසි පැනවීමේ බලතල යටතේ මෙම රැස්වීම පැවැත්වීමේ බලතල දිසාපතිවරයා සතු වූ අතර බොහෝ අවස්ථාවල දී දිසාපතිවරයා නියෝජනය කරමින් රටේ මහත්තයා (පසු කලෙක DRO සහ උපදිසාපති) මෙම රැස්වීමේ මූලාසනාරූඪ නිලධාරියා විය. එසේ වුව ද, රැස්වීමේ දී ගනු ලබන තීරණය සම්බන්ධයෙන් අවසන් අනුමැතිය දිසාපතිවරයා විසින් පෞද්ගලික ව ම ලබා දී ඇති බව පෙනේ. මෙසේ ගනු ලැබූ තීරණ පිළිබඳ තොරතුරු කාර්යාල ලිපි ගොනුවල සඳහන් ව නැත ත් වෙල් විදානේ පත් කිරීම පිළිබඳ තොරතුරු ලිපි ගොනු ගත කොට ඇත. කන්න රැස්වීමේ දී ගනු ලබන තීරණ මෙන් ම ඉහත රෙගුලාසි යටතේ දිසාපතිවරයා විසින් නිකුත් කරනු ලබන නියෝග ක්‍රියාත්මක කර වීමට වෙල් විදානේ (VV) බැඳී සිටි අතර පසු කලෙක මේ සඳහා ඔවුන්ට මග පෙන්වීම සඳහා දිසාපතිවරුන් යටතේ ගම් වගා නිලධාරීන් (VCO) සේවයට බඳවා ගන්නා ලදී.

මේ පිළිබඳ ව විවිධ මතවාද ඇත ත් ගම්බද වාරිමාර්ග පිළිබඳ ස්වර්ණමය යුගය වෙල් විදානේ සහ ගම් වගා නිලධාරී සේවය කළ යුගය ලෙස අර්ථ දැක්වීම, එම කාලයේ දී සිදු වී ඇති ස්වයං කළමනාකරණ ක්‍රියාකාරකම් දෙස බලන විට සාධාරණ බැව් පෙනේ. වියලි කලාපයේ "වැව් මහත්තයා" යන ආදරණීය නාමයෙන් හැඳින්වූ මෙම පිරිස තාක්ෂණික පුහුණුවක් සහිත ව වාරිමාර්ග අලුත්වැඩියාවට, ගම්බද වාරිමාර්ග ආශ්‍රිත ව ගොවීන් මෙහෙය වීමට සහ ඔවුන් ගේ ආයතනික කටයුතු ඉටු කර දීමට රජයෙන් පත්කළ පිරිසකි.

වෙල් විදානේවරුන් සඳහා රජයෙන් වැටුපක් නො ලැබුන ද 1874 පැන වූ රාජ්‍ය රෙගුලාසි සහ 1946 වාරිමාර්ග ආඥා පනත යටතේ බලතල හිමි, දිසාපතිවරයා ගේ පත්වීම් ලිපියක් ලද, මෙම පිරිසට එක් වගා කන්නයක් සඳහා එක් කුඹුරු අක්කරයකින් වී බුසල් 1/2 ක පාරිශ්‍රමිකයක් ලෙස ලබා ගැනීමට අවසර තිබුණි. ඇමුණුම් අංක 01 යටතේ 1874 දී පැන වූ රාජ්‍ය රෙගුලාසි යටතේ සුදු දිසාපතිවරුන් විසින් කරන ලද නියෝගයක පිටපතක් දැක් වේ.

2.8 සාම්ප්‍රදායික නීති

ගැමියන් විසින් ම පාලනය කරන ලද ගම්බද වාරිමාර්ග ආශ්‍රිත සාමූහික වගකීම් සහ සම්ප්‍රදායික නීති අදාළ වගා කන්නය සඳහා ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වූ අතර, මෙම කටයුත්ත ඉටු කරනු ලැබුවේ වගා කන්නය ආරම්භයේ දී කැඳවනු ලැබූ කන්න රැස්වීමේ දී ය. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ දී මෙම සම්ප්‍රදායයන් සහ සාමූහික වගකීම් තදබල රීති ලෙස වෙල් මුලාදෑනීන් (වෙල් විදානේ) හරහා ක්‍රියාත්මක කර වීමට සුදු දිසාපතිවරුන් කටයුතු කළ බවට පැහැදිලි සාක්ෂි තිබේ. දහ නව වැනි ශත වර්ෂයේ දී පටන් ගම්බද වාරිමාර්ග නඩත්තුව සම්බන්ධයෙන් නිකුත් කළ රීති, ආඥාවලින් මේ බව පැහැදිලි වේ. වාරිමාර්ග අලුත්වැඩියාව, නඩත්තු සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන වගකීම, කුඹුරු ඉඩම් අයිතිය

(සංගුව) සහ සමානාත්මතාව මත පදනම් වූ බව පෙනේ. අදාළ වගා කන්නය තුළ වැව් ජලයට ඇති අයිතිය තහවුරු කරනු ලබන්නේ වාරිමාර්ග සම්බන්ධයෙන් වන රාජකාරිය (Social Responsibility) ඉටු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

රූ සටහන් අංක 01: ගම්බද වාරි මාර්ග පාලන මූලධර්ම අනුපිළිවෙල



මෙරටේ සාම්ප්‍රදායික නීති, ලිඛිත නීති පද්ධතියට එකතු කිරීමට බ්‍රිතාන්‍යයෙන් ඇතැම් අවස්ථාවල කටයුතු කර ඇත. උදාහරණයක් ලෙස මලබා සම්භවයක් සහිත යාපන අර්ධද්වීපයේ පදිංචිකරුවන් ගේ ඉඩම් අයිතිය පිළිබඳව සැකසුණු "තේසවලම නීතිය" සැලකිය හැකි ය. එහෙත් ගම්බද වාරිමාර්ග විෂයයෙ හි එවැනි උත්සාහයක් ගනු නො ලැබුවේ, වාරි සංස්කෘතිය පිළිබඳ ව ඔවුන් ගේ අවබෝධය සහ අත්දැකීම් සීමා සහිත වූ බැවින් විය හැකි ය. මෙරට සාමාන්‍ය ජනතාවට රීති සම්පාදනය කිරීමට ඉඩකඩ සැලසූ එක ම අවස්ථාව ලෙස කන්න රැස්වීම වාර්තා ගත වන්නේ එහෙයිනි.

3.0 වර්තමාන යුගය

3.1 ගොවිජන සේවා කාල පරිච්ඡේදය

අධිරාජ්‍යවාදී යුගය තුළ තම පක්ෂපාතීන් හට වැඩි වැඩියෙන් ඉඩම් ලබා දීමට පාලකයින් ක්‍රියා කිරීම හේතුවෙන් බොහොමයක් රටවල ඉඩම් අයිතිය පිළිබඳ දැඩි සමාජ අසමතුලිතාවක් සහ අසාධාරණයක් දක්නට ලැබුණු අතර, එම රටවල ඉඩම් හිමියන් සහ කෘෂිකාර්මික කම්කරුවන් අතර අරගල බිහි වන කාලයක් උදා වී තිබුණි. ස්වාභාවික සම්පත් අසමාකාර ලෙස බෙදී යාම ජාතික නිෂ්පාදනයට මෙන් ම ඒක පුද්ගල ආදායම අඩු වීමට සහ දුප්පත්කම පැතිර යාමට තදින් බලපෑ අතර, මෙම වකවානුව වන විට මෙම ගැටලුව සඳහා විප්ලවීය විසඳුමක් අපේක්ෂා කරන පිරිස් බිහි වෙමින් පැවතිණි.

මේ සඳහා වඩාත් සුදුසු කාල වකවානුවක් උදා වූයේ දෙ වැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසු ව ය. අධිරාජ්‍යවාදී යටත් විජිත පද්ධතිය බිඳ වැටුන අතර, රාජ්‍ය පාලනය ස්වදේශිකයන් වෙත මාරු වීමට එනිසා ඉඩකඩ ලැබුණි. මෙම අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් බොහෝ රටවල් නව කෘෂිකාර්මික ඉඩම් නීති සම්පාදනය කරමින් කෘෂිකාර්මික කුලී කම්කරුවන් ඉඩම් හිමි ගොවීන් බවට පත් කරන ලදී. මෙවැනි උත්සාහයක් ශ්‍රී ලංකාවේ සිදු කරනු ලැබුයේ 1958 අංක 01 දරණ කුඹුරු පනත මඟිනි. කුඹුරු පනත බිහි කිරීමේ දී පහත සඳහන් පරමාර්ථ එහි ගැබ්ව තිබුණි. මෙම කුඹුරු පනත ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීම සඳහා 1957.10.01 දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව බිහි කරන ලදී.

3.1.1 කුඹුරු පනතේ ප්‍රධාන පරමාර්ථ

i. අඳ ගොවීන් ගේ සහ කෘෂිකාර්මික කම්කරුවන් ගේ අඳය සුරක්ෂිත කිරීම සහ ඉඩම් හිමියන්ට හිමි ප්‍රවේණි බද්ද තහවුරු කිරීම
ii. ගොවි කාරක සභා පිහිටු වීම සහ 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනතේ විධි විධාන මත වෙල් මුලාදෑනිවරුන් (විදානේ) සතු බලතල ගොවි කාරක සභා වෙත පැවරීම
iii. කුඹුරු ඉඩම් ආරක්ෂා කිරීම සහ කාර්යක්ෂම ලෙස වගා කරවීම

මෙහි දී ඇති වූ ප්‍රධාන ත ම වෙනස නම් වාරිමාර්ග ආඥා පනතින් කුඹුරු ඉඩම් හිමියන් වෙත ලබා දී තිබූ බලතල සහ වගකීම් ඉඩම් හිමි ගොවීන් සහ බුක්තිකරුවන් (සත්‍ය ගොවීන්) වෙත පැවරීම ය. මෙම කුඹුරු පනත 1958, 1961, 1964 සහ 1967 යන වසරවල දී සංශෝධනය වූ අතර, එමගින් සාම්ප්‍රදායික නායකත්වය වූ වෙල් විදානේවරුන් සතු බලතල, ගොවීන් සඳහා මෙරට හඳුන්වා දුන් ප්‍රථම නීත්‍යනුකූල ආයතනික ව්‍යුහය වූ "ගොවි කාරක සභා" වෙත පවරාගන්නා ලද අතර, වෙල් විදානේවරුන් සඳහා හිමි පාරිතෝෂිකය (සුභංදිරම, සලාරිස් ආදී) වූ එක් කුඹුරු අක්කරයක් සඳහා වී බුසල් 1/2 සඳහා වන මූල්‍ය වටිනාකම රු.6/- ක් ලෙස සලකා අක්කර බදු ක්‍රමය ක්‍රියාත්මක කෙරිණි. මෙහි දී විශේෂත්වය වන්නේ වාරි ඉඩම් සඳහා පමණක් නො ව ගොඩ සහ මඩ සියලු කෘෂිකාර්මික ඉඩම්වලින් ඉහත බද්ද අයකර ගැනීමට නීතිමය ප්‍රතිපාදන සලසා තිබීම ය. අර්ධ රාජ්‍ය සංවිධානයක් වූ ගොවි කාරක සභා පවත්වාගෙන යාමට අවශ්‍ය අරමුදල් වර්ධනය කර ගැනීම මෙම බද්දේ අරමුණ විය.

මෙහි දී මෙතෙක් දිසාපතිවරුන් සතු ව තිබූ ගම්බද වාරිමාර්ග යටතේ කන්න රැස්වීම් පැවැත්වීමේ වගකීම ගොවිජන සේවා කොමසාරිස්වරයා වෙත පැවරීම සිදු වූ අතර කන්න රැස්වීම යනු ඉඩම් හිමි ගොවීන් ගේ සහ බුක්තිකරුවන් ගේ (අඳ ගොවීන්) රැස්වීමක් ලෙස අළුතින් නිර්වචනය කෙරිණි.

ඉන් අනතුරු ව, මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළ ව,

1972 අංක 02 දරණ කෘෂිකාර්මික ඵලදාවර්ධන පනත
1973 අංක 42 දරණ කෘෂිකාර්මික ඉඩම් පනත
1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත
1991 අංක 4 දරණ ගොවිජන සේවා (සංශෝධන) පනත
2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යන පනත් ඔස්සේ නෛතික විධි විධාන සම්මත කොට ක්‍රියාත්මක කරන ලදී.

මෙම සියලු පනත් අතරින් කුඹුරු පනතට පසු ව බිහි වූ වඩාත් සංවේදී පනත ලෙස හැඳින්විය හැක්කේ 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත ය. මෙම පනත යටතේ කුඹුරු ඉඩම් කාර්යක්ෂම ලෙස වගා කරවීමට සහ ගම්බද වාරිමාර්ග යටතේ වන මෙහෙයුම් සහ නඩත්තු කටයුතු විධිමත් ව පවත්වා ගෙන යාම සහ ආරක්ෂා කිරීම සඳහා වගා නිලධාරීන් පත් කරන ලද අතර, ගම්බද වාරිමාර්ග යටතේ කන්න රැස්වීම් පැවැත්වීමට අදාළ විධි විධාන රාශියක් පනවන ලදී. සුළු වාරිමාර්ග යන වචනය පැහැදිලි ව නිර්වචනය කිරීම ප්‍රථමයෙන් ම සිදු වුයේ මෙම පනත යටතේ වන අතර, අක්කර 200 දක්වා වූ කුඹුරු ඉඩම් සහිත වාරිමාර්ග සුළු වාරිමාර්ග ලෙස මේ යටතේ අර්ථ දක්වන ලදී.

මෙම වකවානුව තුළ ගම්බද වාරිමාර්ග විෂයයෙ හි වූ ප්‍රධාන වෙනස්කම් පහත සඳහන් වේ.

i. කුඹුරු පනතට අදාළ කුඹුරු ඉඩම් බුක්තිය පිළිබඳ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ දී ජල අයිතිය පිළිබඳ අධිකාරී බලයකින් තොර ව එය ඉටු කළ නො හැකි බව පැහැදිලි වන්නට විය. ශ්‍රී ලංකාවේ ගම්බද වාරිමාර්ග සම්බන්ධ ජල අයිතිය, ඒ යටතේ වන ඉඩම් අයිතිය සමග එකට බැඳී පැවතීම

මෙයට හේතුව යි. මේ අනු ව 1964 දී දිසාපතිවරුන් යටතේ ගම්බද වාරිමාර්ග කළමනාකරණ රාජකාරිවල යෙදී සිටි ගම් වගා නිලධාරීන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ගන්නා ලදී.

ii. වාරිමාර්ග යටතේ කන්න රැස්වීම් පැවැත්වීමේ නෛතික බලය ගොවිජන සේවා කොමසාරිස්වරයා වෙත පැවරීම. මෙම බලය සාර්ථක ලෙස ක්‍රියාත්මක වූයේ ගම්බද වාරිමාර්ග සම්බන්ධයෙන් පමණි.

iii. 1980 දී ලෝක බැංකු ආධාර ඇතිව ආරම්භ වූ ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (VIRP) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්මික නිලධාරීන් 478ක් සහ ළදිස්ත්‍රික් මට්ටමේ ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් අළුතින් බඳවා ගන්නා ලදී.

3.2 පළාත් සභා කාල පරිච්ඡේදය

1987 නොවැම්බර් මස 14 වැනි දින සම්මත වීමෙන් අනතුරු ව 1988 වසරේ දී ක්‍රියාත්මක වූ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු ව ගොවිජන සේවා දෙපාර්තමේන්තු කාර්ය භාරයේ තදබල වෙනස්කම් ඇති විය. සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය සහ නඩත්තුව පළාත් සභා සඳහා විමධ්‍යගත වූ විෂයයක් වීම ත් සමග ම, මෙම දෙපාර්තමේන්තුවේ සේවය කළ කාර්මික නිලධාරීන් 87 දෙනෙකු හැර අන් සියලු ම කාර්මික නිලධාරීන්, ප්‍රාදේශීය ඉංජිනේරුවන්, ඉංජිනේරුමය උපකරණ සහ ඉදි කිරීම් යන්ත්‍ර සූත්‍ර සියල්ල පළාත් සභා වෙත පැවරුණි. මෙම සම්පත් පැවරීමේ කටයුත්ත සංක්‍රාන්ති කාලයකින් (Transitional Period) තොර ව ඉතා ඉක්මණින් සිදු කිරීමට තිබූ අවශ්‍යතාව මෙම කටයුත්තේ සාර්ථකත්වයට බල පෑ ආකාරය පසු ව පැහැදිලි වූ අතර, වගකීම් පැවරීම සම්පත් පැවරීම තරම් සුමට සහ පහසු කාර්යයක් නො වන බව අවබෝධ කරගැනීමට පමා වූ සෙයක් පෙණිනි. එසේ ම ගම්බද වාරිමාර්ග සහ ගොවිජන නීතිය පිළිබඳ ව පැවති නෛතික ගැටලු විසඳා ගැනීමට තවත් වසර දෙකක් පමණ ගත වූ අතර 1991 අංක 4 දරණ ගොවිජන සේවා (සංශෝධන) පනතින් මෙම තත්ත්වය වෙනත් අතකට යොමු වූ බව පෙනේ.

ඉහත සංශෝධන පනත යටතේ ගම්බද වාරිමාර්ග ආශ්‍රිත කන්න රැස්වීම් (ඉඩම් හිමි ගොවීන් ගේ හා බුක්තිකරුවන් ගේ රැස්වීම්) පැවැත්වීමේ වගකීම නව ස්වරූපයකින් යුතු ව ගොවිජන සේවා කොමසාරිස්වරයා වෙත පැවරුණු අතර, ගම්බද වාරිමාර්ග යටතේ වන කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමට සහ ජල කළමනාකරණ කටයුතු සඳහා "යාය නියෝජිත" නමින් ගොවි නායකත්වයක් පත් කිරීමට ත්, පුරාණ වෙල් විදානේවරුන් සතු ව තිබූ වගකීම්වලින් බොහොමයක් ඉටු කිරීමට සහ ඒ වෙනුවෙන් ගොවි පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට ත් මෙම පනතින් යාය නියෝජිතයින්ට ඉඩ කඩ සැලසුණි.

එසේ ම ගම්බද වාරිමාර්ගවල මෙහෙයුම් සහ නඩත්තු පිළිබඳ වගකීම මෙම පනත යටතේ බිහි වන ගොවි සංවිධාන වෙත පැවරීමට ද මෙහි දී නෛතික විධි විධාන සැලසුණි. මේ අනු ව ඈත අතීතයේ දී පැවතුනාක් මෙන් ගම්බද වාරිමාර්ග යනු ගොවීන් විසින් ම නඩත්තු කර ගන්නා ස්වයං කළමනාකරණයක් සහිත ව්‍යාපාර ලෙස හැඳින්වීම සාධාරණ වන අතර, ඒ යටතේ අදාළ ගොවි සංවිධාන වෙත අනුග්‍රහය දැක්වීම රාජ්‍ය වගකීම වනු ඇත.

1989 පළාත් සභා සඳහා බලතල විමධ්‍යගත කරන වකවානුව වන විට ගොවිජන සේවා ගම්බද වාරිමාර්ග කාර්ය භාරය සැලකිය යුතු මට්ටමකට වැඩි දියුණු වී තිබුණි. නඩත්තුව, අළුත්වැඩියාව සහ ආරක්ෂාව යන ප්‍රධාන තේමාවන් යටතේ පුරාණ රජ දවස සිට අධිරාජ්‍යවාදී යුගය පසු කොට මේ දක්වා ගම්බද වාරිමාර්ග පැමිණි ගමනේ තීරණාත්මක මංසන්ධියක් ලෙස මෙම වකවානුව කැපී පෙනේ.

විශේෂයෙන් ම 1958 ශ්‍රී ලංකාවේ වියලි කලාපයට ඇද හැලුණු ධාරානිපාත වර්ෂාව ත් සමග කුඩා වැව් කැඩී බිඳී යාමෙන් මහ වැව් ද විනාශ වීමේ සිද්ධියෙන් පාඩම් ඉගෙන ගත් රාජ්‍ය ආයතන, ගම්බද වැව් අමුණු ආරක්ෂාව සහ නඩත්තුව සඳහා විශේෂ ක්‍රමෝපායයන් මේ වන විට ක්‍රියාත්මක කරමින් තිබුණි. ගම්බද වාරිමාර්ග බහුල සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකට ම, වාරිමාර්ග ආරක්ෂාව සහ නඩත්තුව පිළිබඳ මනා අත්දැකීම් සහ පුහුණුවක් ලත් කාර්මික නිලධාරීන් අනුයුක්ත කර තිබූ අතර, හදිසි අවස්ථාවක දී ක්‍රියාත්මක වීමට ඇවැසි උපදෙස් සහ සම්පත් සපයා දෙමින් ද, වැඩි ජලය බැස යාම සඳහා වූ වාන් ඇල මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීමට සහ වැ කන්ද ශක්තිමත් කිරීමට ගොවි මහතුන් ධෛර්යමත් කරමින් ද, නිරන්තරයෙන් කුඩා වැව් අමුණු පරීක්ෂාවට ලක් කරමින් සහ ගොවීන් ගේ වාරිමාර්ග ගැටලු විසඳීමට උර දෙමින් ඔවුන් ගත කළ කාලය මෙම වකවානුව ත් සමග ම සමාප්තියට පත් විය. මෙම ජාතික අවදානම සහ අවශ්‍යතාව මනා ලෙස හඳුනා ගැනීමට සහ එයට අනුගත වීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට වසර 20කට අධික කාලයක් ගත වූ අතර, එම තත්ත්වය අහෝසි වී යාමට ගත වූයේ දින කිහිපයක් පමණක්වීම මෙරට ගම්බද වාරිමාර්ග ඉතිහාසයේ සිදුවූ ශෝචනීය ත ම සිදුවීම ලෙස නම් කළ හැකි ය.

ගම්බද වාරිමාර්ග විද්‍යාත්මක පදනමක් මත ප්‍රධාන කොටස් හතරකට වර්ගීකරණය කර ගනිමින් සහ ඒවා වැඩි දියුණු කිරීම සඳහා විවිධ ප්‍රවේශ අනුගමනය කරමින් මෙම දෙපාර්තමේන්තුව තුළ වර්ධනය වෙමින් පැවති යාන්ත්‍රණ රටාව අතීතය තුළ බොඳ වී ගියේ "අප යමක් ආරම්භ කළ යුත්තේ යමෙකු එය අවසන් කරන ලද තැනින් ය" යන මතවාදය පිළිගැනීමට අප තුළ ඇති අකැමැත්ත නැවත වරක් ප්‍රදර්ශනය කරමිනි.

මෙසේ ගම්බද වාරිමාර්ග ආරක්ෂාව සහ නඩත්තුව පිළිබඳ පුහුණුව සහ අත්දැකීම් ලද කාර්මික නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සහ වෙනත් පළාත් සභා ආයතනවලට අනුයුක්ත කරන ලද අතර, ඔවුන් ගොඩනැගිලි, මාවත්, ග්‍රාමීය සංවර්ධන කටයුතු ආදී බහු විධ ඉදිකිරීම් ක්ෂේත්‍ර වෙත යොමු කරන ලදී.

ගම්බද වාරිමාර්ග අළුත්වැඩියාව සඳහා මෙතෙක් යොදා ගත් ඉදි කිරීම් යන්ත්‍ර සූත්‍ර, යන්ත්‍රෝපකරණ ඒකක මගින් කුළියට දීමට ත්, ඒවා වාරිමාර්ග නො වන කටයුතු සඳහා යෙදවීමට ත් කටයුතු සැලසුණු අතර, ගැමියන් තුරුළේ බිහි වුණු මෙම ගම්බද වාරි කර්මාන්ත ආරක්ෂා කර ගැනීමේ මූලික වගකීම නැවත වරක් ගැමියන් වෙත ම පැවරුණ අතර, ඒ සඳහා වූ රාජ්‍ය යාන්ත්‍රණය අවම මට්ටමකට පහත වැටුණි.

1989 වසර වන විට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් ගම්බද වාරිමාර්ග ක්ෂේත්‍රයේ වර්ධනය කරගෙන තිබූ සම්පත් හා රාජ්‍ය යාන්ත්‍රණයට හානි නො වන ලෙස ඒවා පළාත් සභා ව්‍යුහය තුළ ක්‍රියාත්මක කිරීමට එදා සමත් වුණි නම්, අද ගම්බද වාරිමාර්ග මුහුණ පා ඇති බොහොමයක් ගැටලු සහ අනාරක්ෂිත තත්ත්වය ඇති නො වීමට ඉඩ තිබුණු බැව් මේ අනුව පෙනී යයි.

2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත සම්මත වීමත් සමග ම වාරිමාර්ග ආශ්‍රිත ජල කළමනාකරණ විෂයයෙ හි ලා ගොවි සංවිධානවල වගකීම විස්තරාත්මක ව හඳුන්වා දුන් අතර, ගම්බද වාරිමාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශවයෙන් වන වගකීම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරන ලදී, එනමුත් ගිළිහී ගිය ගම්බද වාරිමාර්ග ආරක්ෂාව සහ වැඩි දියුණු කිරීම පිළිබඳ රාජ්‍ය යාන්ත්‍රණය නැවත බිහි කරලීම නම් කවරෙකුට වුව ද කිසිසේත් පහසු කටයුත්තක් නො වනු ඇත.

3.3 වර්තමාන තත්ත්වය

3.3.1 ගැටලු

වර්තමානයේ දී ගම්බද වාරිමාර්ග මුහුණ පා ඇති ප්‍රධාන ගැටලු සාරාංශ ගත කිරීමට පහතින් උත්සාහ දරා ඇත.

i. වාරි ජලය සැපයිය හැකි වගා බිම් ප්‍රමාණයට වඩා වැඩි බිම් ප්‍රමාණයක් ඒ යටතේ අස්වද්දා තිබීම

ii. සාම්ප්‍රදායික වගා නීති ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක නො වීම මෙන් ම වලංගු නො වීම

iii. ධාරා ප්‍රදේශවල වනාන්තර ප්‍රතිශතය අඩු වීම සහ අක්‍රමවත් සංවර්ධනය නිසා සිදු වී ඇති හානි.
මේ යටතේ ගම්බද වැව් පිටි ගොඩ වීම නිසා ඒවායේ භූගෝලීය හැඩය වෙනස් වීමෙන් අවාසිදායක ජල තුලනයක් ගම්බද වැව් ආශ්‍රිත ව වර්ධනය විය. එමෙන් ම තෙත් කලාපීය අමුණු ව්‍යාපාර බැදි ඇළ මාර්ග ගැඹුරු වීමෙන් කුඹුරුවල භූ ගත ජල මට්ටම පහළ යෑම නිසා ගැටලු මතු වී ඇත. එසේ ම මෙම ගම්බද වැව්, වාරි පරිසර පද්ධති ලෙස නොව ජල තටාක ලෙස සලකා කටයුතු කිරීම නිසා ඇති වී තිබෙන අවාසිදායක තත්ත්වය ද අමතක කළ නො හැකි ය.

iv. විෂම චක්‍රයකට ගොදුරු වීම නිසා වාරි නඩත්තු ව දුර්වල වී වාරි නිර්මිතවල භෞතික තත්ත්වය පහත වැටී ඇති අයුරු අංක 02 රූ සටහනින් දැක්වේ.

රූ සටහන් අංක 02: ගම්බද වාරිමාර්ග ආශ්‍රිත විෂම චක්‍රය



3.3.2 විසඳුම් සඳහා වන යෝජනා සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

මෙම ගැටලු සඳහා පහත සඳහන් විසඳුම් යෝජනා කිරීම ප්‍රායෝගික වේ.

i. ජල සංරක්ෂණ උපාය මාර්ග හඳුන්වා දීම

මේ යටතේ දිවයින පුරා විසිරී සිටින කෘෂිකාර්මික පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් 9100ක් පුහුණු කිරීමේ සහ එයට අදාළ අත්පොතක් බෙදා හැරීමේ කටයුතු 2006 වසරේ දී ආරම්භ කරන ලදී.

මේ මගින් නව තොරතුරු මාලාවක් ගොවීන් අතරට රැගෙන යාම අපේක්ෂා කරන අතර, ගොවි මහත්ම මහත්මීන් ගේ වාරි කර්මාන්ත ආශ්‍රිත තීරණ ගැනීමේ නිරවද්‍යතා ව ඉහළ නැංවීම අරමුණු කොට ඇත.

ii. ගැටලු විශ්ලේෂණය සහ සැලසුම්කරණය

ගම්බද වැව් මුහුණ පා ඇති ගැටලු විසඳීම සඳහා මෙන් ම ජල කළමනාකරණ ක්‍රමෝපායන් හඳුන්වා දීමේ දී ඒකාකාරී (Blue Print) ප්‍රවේශයක් අනුගමනය කිරීම සාර්ථක නො වන්නේ ඒවා ජල විද්‍යාත්මක, භෞතික, සමාජමය හා කාර්යක්ෂමතා දර්ශකවලින් විවිධ පරාසවල පිහිටා තිබීම නිසා ය. ඒ අනු ව මේ සඳහා ගැළපෙන විද්‍යාත්මක ප්‍රවේශයක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලට ලැබෙන වාර්ෂික වර්ෂාපතනයේ සාමාන්‍ය අගය ප්‍රයෝජනයට ගනිමින් 50 දශකයේ දී මෙරටේ වියළි, අන්තර් සහ තෙත් කලාප මායිම් හඳුනා ගන්නා ලදී. ඉහත දේශගුණික කලාපවල විසිර පවතින ගම්බද වාරිමාර්ග පිළිබඳ සංඛ්‍යා ලේඛන වගු සටහන් අංක 01 න් දැක්වේ.

වගු සටහන් අංක 01: ශ්‍රී ලංකාවේ ගම්බද වාරි මාර්ග

දේශගුණික කලාපය	වාර්ෂික වර්ෂාපතනයේ සාමාන්‍ය අගය	වැව් ව්‍යාපාර	අමුණු ව්‍යාපාර
වියළි කලාපය	<72”	5,974	277
අන්තර් කලාපය	72”-100”	4,427	7,734
තෙත් කලාපය	>100”	265	4,547
එකතුව	-	10,666	12,558

මූලාශ්‍ර: වාරිමාර්ග සමීක්ෂණය-2000, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

භූමියේ උස මට්ටම සහ බිම් බෑවුම, පාංශු සාධක මෙන් ම එක් එක් දේශගුණික කලාපය තුළ වර්ෂාපතන රටාව අධ්‍යයනය කිරීමෙන් පසු ව 1975 දී ශ්‍රී ලංකාව සඳහා කෘෂි පාරිසරික කලාප 24ක් හඳුන්වා දීමට ආචාර්ය සී.ආර්.පානබොක්කේ සහ කන්නන්ගර සමත් වූ අතර, 2003 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය මගින් තවත් උප කලාප 22ක් සහිත කලාප 46කින් යුත් කෘෂි පාරිසරික කලාප සිතියමක් නිර්මාණය කරන ලදී. ගම්බද වාරිමාර්ග සඳහා ජල කළමනාකරණ ක්‍රමෝපායන් හඳුන්වා දීමේ දී මෙම කෘෂි පාරිසරික කලාප ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින්, වාරිමාර්ග කටයුතු සඳහා යොදා ගත හැකි වන සේ එම සිතියම නවීකරණය කර, එක් එක් කලාපය ට අදාළ 75% සම්භාව්‍යතා වර්ෂාපතන දත්ත ඇතුළත් GIS ආකෘතියක් නිපදවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට කටයුතු කර ඇත..

iii. ගංගාද්‍රෝණි, උපද්‍රෝණි සහ එල්ලංගා පද්ධති ප්‍රවේශය

ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු, දම්වැලක් සේ එකක් යට එකක් පිහිටි ගම්බද වාරි පද්ධතියක් “එල්ලංගාවක්” ලෙස අර්ථ දැක්විය හැකි අතර, උතුරු මැද සහ වයඹ පළාත්වල පිහිටි මෙම එල්ලංගා, භූගත ජලාශ බිහි කළ හැකි “රිගොලිත්” නම් සුවිශේෂී භූ විද්‍යා හරස්කඩක ස්ථානගත කර තිබීම විශේෂ සිදුවීමකි. එල්ලංගා (Cascades) පිළිබඳ අප කථා කරන ත් එල්ලංගා සංඛ්‍යාව, හැඩය, වර්ගීකරණය, වැව් සංඛ්‍යාව සහ ජල තුලන දත්ත පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම නිසා මෙම වැදගත් ප්‍රවේශයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අපොහොසත් වී තිබේ. ගම්බද වැව් මෙන් ම අමුණු ව්‍යාපාර පදනම් කර ගනිමින් ජලද්‍රෝණි, උප ජලද්‍රෝණි සහ එල්ලංගා දැක්වෙන ශ්‍රී ලංකාවේ ප්‍රථම ජලපෝෂක සිතියම 2007 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එළි දක්වනු ඇත.

iv. සරල තාක්ෂණය සහ ක්‍රියාත්මක පර්යේෂණ

ගම්බද ගොවීන්ට ඔරොත්තු දෙන සරල තාක්ෂණය ඔවුන් වෙත සම්ප්‍රේෂණය කිරීමේ විවිධ උත්සාහ පිළිබඳ අත්හදා බැලීම් මෙම දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් සිදු කරමින් සිටී. මේ යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගෝනදෙණියේ උක්ඕවිට අමුණ සඳහා බිම හෙළිය හැකි යාන්ත්‍රික අමුණු දොරක් (Flap Gate) 2007 වසරේ දී හඳුන්වා දෙනු ඇත. ග්‍රහණය කර ගත නො හැකි සංකීර්ණ තාක්ෂණය වෙනුවට පහසුවෙන් නඩත්තු කළ හැකි සරල තාක්ෂණය හඳුන්වා දීමෙන් මෙම ගම්බද වාරි පද්ධතිවල පැවැත්ම තව දුරටත් ශක්තිමත් කිරීම කළ යුතු වේ.

v. ජල විද්‍යාත්මක දත්ත පාදම් බිහිකිරීම

වැරදි සහගත තොරතුරු මත සිදු කරන සැලසුම්කරණය නිසා ඉන් අනතුරු ව සිදු කරනු ලබන සියලු උත්සාහ ප්‍රතිඵල රහිත වනු ඇත. මෙරට ගම්බද වාරිමාර්ග ආශ්‍රිත ප්‍රථම පරිගණකගත දත්ත පාදම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් 2000 වසරේ දී බිහි කළ අතර, එම තොරතුරු යාවත්කාලීන කිරීම ද ඇතුළුව එක් වාරි පද්ධතියට අදාළ තොරතුරු 200කට ආසන්න ප්‍රමාණයකින් යුත් ප්‍රබල පාදමක් බිහි කිරීමේ කටයුතු 2006 වසරේ දී ආරම්භ කර 2007 වසරේ දී නිම කිරීමට නියමිත ය. ඇමුණුම් අංක 02 යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී ගම්බද වැව්වල පිහිටීම ඝනත්ව සිතියමකින් දැක් වේ.

මෙයට අමතර ව දිය උල්පත්, කෘෂි මාවත් සහ පොදු කමත් ආදිය ද මෙම සමීක්ෂණය යටතට ගැනෙණු ඇත. එසේ ම මෙරටේ පුරන් වු වැව් අමුණු මෙන් ම පුරන් කුඹුරු පිළිබඳ ව ද සවිස්තරාත්මක තොරතුරු ගවේෂණයක් මෙහි දී සිදු වේ. ඇමුණුම් අංක 03 හි ශ්‍රී ලංකාවේ පුරන් වූ ගම්බද වැව්වල පිහිටීම සිතියමකින් දැක් වේ.

ශ්‍රී ලංකාවේ අමුණු ව්‍යාපාර මෙතෙක් සිතියම් ගත කොට නොමැති බැවින්, ඒ සඳහා අවශ්‍ය ජාල ඛණ්ඩාංක GPS (Global Positionning System) යන්ත්‍ර යොදා ගනිමින් පරිගණක ගතකිරීම මේ වන විට සිදු වෙමින් පවතී (ඇමුණුම 04). ඉන් අනතුරු ව ඉදිරියේ දී නිපදවෙන පිළිගත් සිතියම්වල මෙම අමුණු ව්‍යාපාරවල පිහිටීම දර්ශනය වනු ඇත.

එසේ ම අගලේ සිතියම් භාවිතයෙන් ඉවත් වීමත් සමග ම දැනට ක්‍රියාත්මක වන වාරිමාර්ග ඛණ්ඩාංක ක්‍රමය නිෂ්ඵල වී ඇති බැවින්, නවීන සිතියම් සමග මෙන් ම GPS උපකරණ භාවිතයේ දී උපයෝගී කොට ගත හැකි නව ඛණ්ඩාංක සම්මුතියක් හඳුන්වා දෙන "Lakdiva" මෘදුකාංගය 2007 වසරේ සිට නොමිලේ ලබා ගැනීමට අවැසි පහසුකම් සැලසෙනු ඇත. මෙම මෘදුකාංගය මගින් මෙතෙක් පැවති වාරිමාර්ග ඛණ්ඩාංක, දේශීය සහ අන්තර් ජාතික ඛණ්ඩාංක ක්‍රමයනට පරිවර්තනය කිරීමේ පහසුකම සැලසෙනු ඇත.

ඉහත සඳහන් දත්ත පාදම් සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය වෙනුවෙන් 1992 සිට ගුවන් ඡායාරූප භාවිතය මෙම දෙපාර්තමේන්තුව තුළ සිදුවෙමින් පවතින අතර, චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණ ඒකකයක් මගින් කාලීන දත්ත උකහා ගැනීමේ ක්‍රමවේදයක් ඉදිරියේ දී හඳුන්වා දීමට අදහස් කොට ඇත.

vi. පරිසර සංවේදිතාව

අවට පරිසරය පෝෂණය කරන මෙම ගම්බද වාරි පද්ධති පාරිසරික ව සංවේදී වන අතර, ඒවා ආශ්‍රිත ව සිදුවන අවිධිමත් ක්‍රියාකාරකම් නිසා සමස්ත පරිසර පද්ධතියට ම හානි සිදු වීමේ අවධානමක් පවතී. උදාහරණයක් ලෙස රොන් මඩ පිරුණු වැව් පිටිවලින් පස් ඉවත් කිරීමේ උත්සාහය සැලකිය හැකි වේ.

මෙවන් උත්සාහයක් සඳහා ක්‍රියාත්මක විය යුත්තේ ඉතා ම ත් ගැඹුරු අධ්‍යයන ක්‍රියාදාමයකින් පසු ව පමණි. මේ සඳහා අවැසි අත්හදා බැලීම් 1996 වසරේ සිට ම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරමින් පවතින අතර, ඒ සඳහා අවශ්‍ය පරීක්ෂණ උපකරණවලින් සමන්විත මධ්‍යම පරීක්ෂණාගාරයක් ද පිහිටුවා ඇත. ගම්බද වැව් පිට්වලින් පස් ඉවත් කරගැනීමට පෞද්ගලික ආයතන ලවා අවසර ලබා දීමට ඇතැම් පළාත්වල ගනු ලැබූ තීරණය අනාගතයේ දී මෙරට පාලනය කළ නො හැකි අගාධයකට ඇද දැමීමට මූලික වන බව කිව යුතු ය.

vii . රාජ්‍ය වාරිමාර්ග ප්‍රතිපත්තිය

බිඳ වැටුණු සම්ප්‍රදායික නීති සහ චාරිත්‍ර මූල ධර්ම පියවීම සඳහා ව්‍යාපෘති, වැඩසටහන් පමණක් නො ව ඒ හා බැඳුණු රාජ්‍ය වාරිමාර්ග ප්‍රතිපත්තිය ද සැකසිය යුතු වේ. එසේ ම මේ සඳහා වන යෝජනා, අධ්‍යයන කටයුතු සහ ක්‍රියාත්මක පර්යේෂණ මගින් තහවුරු කර ගැනීම ද ඉතා වැදගත් වනු ඇත. උදාහරණයක් ලෙස වගා බිම් කුඩා කැබලිවලට විසිරී පැවතීම මග හැර වීම සඳහා ඉඩම් ඒකාබද්ධ කිරීමේ නියමු වැඩසටහන් දෙකක් අනුරාධපුර සහ ගාල්ල දිස්ත්‍රික්කවල සාර්ථක ව නිම කිරීමට මේ වන විට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

4.0 සමාප්තිය

විෂම චක්‍රයකට ගොදුරු වී ඇති බොහෝ ග්‍රාමීය වාරි පරිසර පද්ධති ඉන් මුදා ගැනීම සඳහා එක් යෝජනාවක් පමණක් නො ව විද්‍යාත්මක පදනමක් මත පිහිට වූ යෝජනා මාලාවක් අවශ්‍ය වේ.

ඉහළ සමානාත්මතාවක් සහිත පාලන මූලධර්ම මෙන් ම භූගත ජලය, පාංශු ජලය, මතුපිට ජලය සහ පස ආදී ලෙස ඒකාබද්ධ ස්වභාවික සම්පත් කළමනාකරණ ක්‍රමෝපායයන් හඳුන්වාදීම ඉතා වැදගත් වේ.

ඵලදායීතාවට වඩා ඉහළ පරිසර දායකත්වය සහ සමබර ස්වාභාවික සම්පත් කළමනාකරණය දිශාගත කොට ගත් මෙම ගම්බද වාරි පරිසර පද්ධති දෙස වර්තමාන සංවර්ධන කෝණයෙන් විසඳුම් සොයනවාට වඩා ඒවා ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකක ලෙස සලකා ආරක්ෂා කර ගැනීම වඩා ත් ප්‍රයෝජනවත් වනු ඇත.

මේ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිය සහ පාලන මූලධර්ම පෙළ ගැස්සවීම මෙන් ම ගම්බද වාරි පද්ධතිවල සත්‍ය උරුමක්කරුවන් වන ගොවි සංවිධාන එම වගකීම් ඉටු කිරීම සඳහා සූදානම් කිරීම සහ ගැළපෙන සරල තාක්ෂණය ගොවීන් වෙත මාරු කිරීම ඒවා ආරක්ෂා කිරීමේ දී ගත යුතු වැදගත් පියවරයන් වේ.

ඒ අනු ව ගැමි පරිසරයේ අත්‍යන්ත කොටස්කරුවෙකු වන ගම්බද වාරි පද්ධතිවල පාලනය ගැමියන් අතර ම තබා ගනිමින්, රාජ්‍ය ආයතන ඒවායේ ආරක්ෂාව තහවුරු කරන භාරකාරීත්වය සහ අනුග්‍රාහකත්වය පමණක් දැරීමෙන් මෙම වාරි පරිසර පද්ධති තව බොහෝ කලක් ආරක්ෂා කර ගැනීමට හැකි වනු ඇත. මෙම වගකීම එක් ආයතනයකට තනි ව සිදු කළ නො හැකි කරුණක් බැවින්, ඉහත පරමාර්ථ සඳහා අවංක ව කැප වීම තුළින් අපේ ඉපැරණි වාරි උරුමය ආරක්ෂා කිරීමට ඒකාබද්ධ ව දායක වීම, වර්තමානයේ ඒ පිළිබඳ වගකීම් දරණ අප සියලු දෙනා ගේ ම පරම යුතුකමක් වනු ඇත.

ඇමුණුම අංක 01: 1874 දී පැනවූ රාජ්‍ය රෙගුලාසි යටතේ බ්‍රිතාන්‍ය ජාතික දිසාපතිවරුන් විසින් කරන ලද නියෝගයක පිටපතක්

GOVERNMENT AGENT'S NOTIFICATION ON COMPULSORY MAINTENANCE IN 1909.

WHEREAS Kudakatukeligama tank in Galkadawela Tulana of Nuragam Korale in Nuragam Palata is a village tank upon which the paddy land below it is dependent for its water-supply, and whereas it is necessary to repair, protect and maintain the said tank, it is hereby notified that for each *panguwa* of land under it, 24 days' labour on the bund, equivalent to one *mulu katti* of earthwork, and such other labour as may be called out by the officers in charge in accordance with Rules Nos. 36, 37 & 38 dated 17th March 1874 should be performed annually within the time fixed by the officer in charge.

Anuradhapura Kachcheri,

12th May 1909

[signature]

G. A., N. C. P.

[stamp]

ඇමුණුම අංක 02: දේශගුණික කලාප ආශ්‍රිත ක්‍රියාකාරී ග්‍රාමීය වැව් ඝනත්ව සිතියම



පිළියෙල කිරීම : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
ජල කළමනාකරණ අංශය,
කොළඹ 07.

සිතියම් මූල ලක්ෂ්‍යය (200,000උ. 200,000නැ)
පිදුරුතලාගල

පරිමාණය : 1:2000000

පුස්තකාලය
LIBRARY
HARTI

ඇමුණුම අංක 03: දේශගුණික කලාප ආශ්‍රිත පුරන් වූ ග්‍රාමීය වැව් ඝනත්ව සිතියම



පිළියෙල කිරීම : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
ජල කළමනාකරණ අංශය,
කොළඹ 07.

සිතියම් මූල ලක්ෂ්‍යය (200,000උ. 200,000නැ)
පිදුරුතලාගල

පරිමාණය : 1:2000000

පුස්තකාලය
LIBRARY
HARTI

ඇමුණුම අංක 04: දේශගුණික කලාප ආශ්‍රිත ක්‍රියාකාරී ග්‍රාමීය අමුණු ඝනත්ව සිතියම



පිළියෙල කිරීම : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
ජල කළමනාකරණ අංශය,
කොළඹ 07.

සිතියම් මූල ලක්ෂ්‍යය (200,000උ. 200,000නැ)

පරිමාණය : 1:2000000

පුස්තකාලය
LIBRARY
[illegible]
HARTI

පළමු සැසියේ සාකච්ඡාව

මූලාසනය: ජයන්තා බුළුමුල්ල මිය
දිස්ත්‍රික් ලේකම්, කුරුණෑගල

එම්.වයි. සෙයිනුදීන් මයා: වාරිමාර්ග කටයුතු කළමනාකරණය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවා ඇති අතර, ඒ සඳහා බලය ලැබී ඇත්තේ 1924 දී වාරිමාර්ග ආඥා පනතිනි. මෙය නැවත සංශෝධනයට ලක් කර ඇත්තේ 1960 දී පමණය. මේ කාලය තුළ එනම්, 1948 න් පසු ව වාරිමාර්ග හා කෘෂි ක්ෂේත්‍රවලට අදාළ කරුණු විශාල ප්‍රමාණයක් මතු වී ඇත. එනම්, කලකට පෙර පනවා ඇති වාරිමාර්ග සම්බන්ධ අණ පනත් යාවත්කාලීන කළ යුතු තත්ත්වයක් මේ වන විට පැන නැගී ඇත.

භද්‍රා කමලදාස මිය: වාරිමාර්ග ආඥා පනත වරින්වර සංශෝධනයට ලක් වී ඇති අතර 1994 දී, සහ 2000 දී වාරිමාර්ග පනත සංශෝධනයට ලක් කරමින් වර්තමාන තත්ත්වයන්ට ගැලපෙන අයුරින් සකස් කිරීමට උත්සාහ දරා ඇත.

එම්.වයි. සෙයිනුදීන් මයා: පළාත් සභා පිහිටුවීමට පෙර, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ කටයුතු දිස්ත්‍රික් ලේකම් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ එක්ව සිදු කරන ලදී. පළාත් සභා පිහිටුවීමත් සමඟ මෙම කාර්යයන් සඳහා පිහිට වූ ආයතන ප්‍රමාණය වැඩි වී ඇති අතර, ඒවායේ කටයුතු නිසි පරිදි සම්බන්ධීකරණයකට ලක්වේ ද? යන ගැටලුව පවතී. ඒ සඳහා සලසා ඇති නීතිමය තත්ත්වයන් පිළිබඳ ගැටලු පවතී. මෙහි දී පැන නගින එක් ගැටලුවක් වන්නේ ජල සම්පත සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට ආයතන විසි ගණනක් පමණ පැවතීම ය. ඒවා සතු එම බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් ගැටලු මතු වන අතර ආයතන සම්බන්ධීකරණයේ ගැටලු ද නිරන්තරයෙන් මතු වේ.

ආයතනික කටයුතු සම්බන්ධයෙන් (ගොවි සංවිධාන සමග සම්බන්ධයෙන් ආදිය) ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. ගොවිජන සංවර්ධන පනතේ දී වැව් නඩත්තු ගොවි සංවිධානවලින් කළ යුතු ය යනුවෙන් සඳහන් වේ. නමුත් එය කෙරතම් ප්‍රායෝගික ද? යන්න ගැටලුවකි. අනෙක් අතට සුළු වාරිමාර්ග නඩත්තුව සහ ප්‍රතිසංස්කරණය සඳහා ආයතන විශාල සංඛ්‍යාවක් මැදිහත්වීම මගින් කටයුතු ද්විත්වකරණයකට සහ ඇතැම් අත්‍යවශ්‍ය කටයුතු නො සලකා හැරීමේ තත්ත්වයකට පත් වේ.

ඉංජිනේරුමය කටයුතු පිළිබඳ සලකා බලනවිට ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති බව පෙනේ. එහි වාරිමාර්ග කටයුතුවලට අදාළ ව අවුරුදු 100 ට වඩා වැඩි කාලයක් තිස්සේ එකතු කරන ලද දත්ත පද්ධතියක් පවතී. එමෙන් ම විශේෂඥ සේවාවන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු ව පවතී. මේ සියලු ආයතන අතර බලතල සහ වගකීම් බෙදී ඇති අතර පළාත් සභා ස්ථාපිත කිරීමත් සමග අළුතින් බිහි වූ ආයතනික රටාව සමග ඉහත කී ආයතන පද්ධතිය සහ බෙදී ගිය වගකීම් සම්බන්ධීකරණය කිරීමට තරම් ප්‍රමාණවත් නීති රීති හෝ ආයතනික පද්ධතියක් ස්ථාපිත නො කිරීම නිසා වාරිමාර්ග ක්ෂේත්‍රයේ ගැටලු රාශියක් මතු වී ඇත.

ජයන්තා බුළුමුල්ල මිය: සාමාන්‍යයෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහ එම නිලධාරීන් ගේ වගකීම ලෙස අප මතුපිටින් දකින්නේ ඉඩම් බෙදීම හා අදාළ කටයුතු ය. එයට අමතර ව විශාල කාර්ය භාරයක් රක්ෂිත සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පැවරී ඇතත් ඒවා ක්‍රියාත්මක වන බවක් දක්නට නො ලැබේ. මෙම තත්ත්වය වාරිමාර්ග ක්ෂේත්‍රය කෙරෙහි ඉතා අහිතකර අයුරුන් බලපානු ලබයි.

අනෙක් අතට රක්ෂිත වශයෙන් ඉඩම් ගැසට් කර නොමැති ස්ථානවල දී වාරිමාර්ගවලට හානිදායක වන අවස්ථාවක වුව ත් ඒ සම්බන්ධ ව කටයුතු කිරීමේ හැකියාවක් නීත්‍යනුකූල ව හිමි වී නොමැත. නැතහොත් ගංගා හෝ වාරිමාර්ග ඉවුරුවල පවතින වාරි රක්ෂිත ප්‍රදේශවලට අයත් නමුත් දිගු කාලයක්

තිස්සේ භුක්ති විඳගෙන ආ පෞද්ගලික ඉඩම්වල, අයිතිය පරවේණි ඔප්පු මගින් හිමිවන අවස්ථාවල දී ඒවා සම්බන්ධව කටයුතු කිරීමට හැකියාවක් නීත්‍යානුකූල ව රජයේ නිලධාරීන්ට නොමැත.

මෙයට මනා උදාහරණයක් මා ගේ අත්දැකීම් තුළින් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. මහනුවර නගරයේ, මහවැලි ගඟ දෙපස වටා ඉතා විශාල වශයෙන් අනවසර ඉදි කිරීම් සිදු වන නිසා රක්ෂිත වෙන් කර ගැනීමට එක් අවස්ථාවක දී අවශ්‍ය විය. නමුත් ඒ සඳහා නීතිමය පදනමක් නොමැති නිසා කිසිදු ආකාරයකින් නීත්‍යානුකූල ව කටයුතු කිරීමට නොහැකි විය. මන්ද යත් කඩිනම් මහවැලි ව්‍යාපාරය යටතේ ගංගා රක්ෂිතය ලෙස මීටර් 100ක ප්‍රමාණය ගැසට් කළ තැන් හැර අනෙක් ඉඩම්වල, ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුවක් පැන නැගීම සිදු වූ හෙයිනි.

ඩඩ්ලි සිල්වා මයා: විශේෂයෙන් ගංගා අද්දර ඉඩම් වෙන්දේසි කර මාර්ග සඳහා අපෙන් අනුමැතිය පතන අවස්ථා පවතී. ඒ අවස්ථාවල දී අදාළ චක්‍රලේඛය අනු ව ගඟේ මධ්‍ය රේඛාවේ සිට අදාළ ප්‍රමාණය අතහැර අනුමැතිය ලබා දෙනු ලැබුවත් මේ සඳහා වෙනත් අදාළ නීතියක් පවතී ද යන්න පිළිබඳ ව අප දැනුවත් කර නොමැත. අදාළ චක්‍රලේඛය මත පමණක් කටයුතු කරනු ලබයි.

ජයන්තා බුළුමුල්ල මිය: වාරිමාර්ග ආඥා පනත යටතේ පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කළ යුතු ය. ඒ අනු ව අනවසර ඉදිකිරීම් ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා වූ වහාම වාරිමාර්ග ආඥා පනතේ 65, 66 සහ 67 වගන්ති අනු ව ප්‍රාදේශීය ලේකම් විසින් නොපමාව අවශ්‍ය පියවර ගත යුතු ය.

දමයන්ති නානායක්කාර මිය: දැනට වාරිමාර්ග ආඥා පනතේ කාර්යයන් පැවරී ඇති නිලධාරීන් විසින් ඒවා ඉටු නො කිරීම නිසා බොහෝ ගැටලු මතු වී ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත විවිධ චක්‍රලේඛ මගින් පවරා ඇත. නමුත් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් සහ වාරිමාර්ග සම්බන්ධ ව ඔවුන් වෙත පැවරී ඇති බලතල නිසි පරිදි ක්‍රියාත්මක කරන බවක් නො පෙනේ. මෙයට හේතු වී ඇත්තේ ඉඩම් සම්බන්ධ බලතල සහ වගකීම් යම් ප්‍රමාණයකින් පළාත් සභා වෙත ලබා දී ඇති අතර ම ඒවා ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ප්‍රාදේශීය ලේකම්වරුන් පළාත් සභා යටතේ නො සිටීම ය.

ජයන්තා බුළුමුල්ල මිය: එම අදහසට එකඟ වීමට අපහසුයි. අවුරුදු ගණනාවක් ප්‍රාදේශීය ලේකම්වරුන් පළාත් සභා යටතේ සිටි අතර ඒ අවස්ථාවේ දී පවා එම බලතල නිසි ලෙස ක්‍රියාත්මක නො වූ බව මාගේ හැඟීමයි. බලතල බෙදීමේ ක්‍රියාවලිය තුළ ඉඩම් බෙදීම සම්බන්ධයෙන් බොහෝ දෙනෙකු කතා කරනු ලැබුව ත් ඉඩම් රැකීම පිළිබඳ කිසිවෙකු කතා නො කරන බව මාගේ අත්දැකීමයි. එමෙන් ම වැව් තාවුලුවල වගා කිරීම නිසා ද වාරිමාර්ග පද්ධතියට මෙන් ම කෘෂිකාර්මික අංශයට ද ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇත.

මේ වන විට සිදුවී ඇත්තේ බලතල පහළ මට්ටම දක්වා බෙදීමෙන් ඇතිවන දුර්වලතාවන් තුළ දේශපාලන බලපෑම් වැඩිවීම නිසා නීතිමය කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නො වීම බවට සභාවේ කිහිප දෙනෙකු විසින් අදහස් පළ කරනු ලැබිණි.

දමයන්ති නානායක්කාර මිය: ඉඩම් රැකීම සම්බන්ධ ව දකුණු පළාත තුළ අපි දැඩි උත්සාහයක් දරමින් සිටින්නෙමු. ඊයේ දිනයේ මෙම ආයතනයේ පැවති "පළාත් සභා ක්‍රමය තුළ ඉඩම් විෂයයේ ක්‍රියාකාරීත්වය" සම්බන්ධ වැඩමුළුවේ දී දකුණු පළාත් සහකාර ඉඩම් කොමසාරිස් පී.බී. රුවන්පතිරණ මහතා මේ සම්බන්ධ ව උදාහරණ රාශියක් සභාවට ඉදිරිපත් කරනු ලැබිණි. අප ගේ අත්දැකීම් අනු ව ඉඩම් රැකීම සම්බන්ධ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සහ එහි කාර්ය මණ්ඩලය ඉදිරිපත් වුව ද, ප්‍රාදේශීය ලේකම්වරුන් ගේ අවධානය ඒ සඳහා යොමු නො වීම නිසා බොහෝ ගැටලු පැන නගින බවත් එම රාජකාරී නිසි පරිදි ඉටු කර ගැනීමට නො ලැබෙන බවත් පැහැදිලි ය.

ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීමක් සිදු වුවහොත් සති 2 ක් ඇතුළත ග්‍රාම නිලධාරී විසින් වාර්තා කළ යුතු ය. අනවසර වාර්තා ආදිය ඉදිරිපත් කරමින් ඒවා ලේඛන කළ යුතු ය. ඉඩම් අල්ලා ගත් පිරිස් ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය. නමුත් අද ග්‍රාම නිලධාරීන් එම කටයුතු පැහැර හැරියහොත් ඒ සම්බන්ධ ව විනයානුකූල ව කටයුතු කිරීමේ බලයක් පළාත් සභාවට නොමැත. මෙය ගැටලුවක් වී ඇත.

ජයන්තා බුළුමුල්ල මිය: වයඹ පළාතේ වැලි මංකොල්ලය සමග තවත් ගැටලු රාශියක් මේ වන විට මතු වී ඇත. මේ වන විට කුඩා ඔයවල්, වැව් පවා මෙම අවධානමට මුහුණ දෙමින් සිටී. එමෙන් ම වැව් තාවුලුවල වගා කිරීම නිසා ද වාරි මාර්ග පද්ධතියට මෙන් ම කෘෂිකාර්මික අංශයට ද ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇත. එමෙන් ම ඉඩම් පරිහරණය සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම තුළින් වාරිමාර්ග සම්බන්ධ ව විශාල ගැටලු මතු වන අවස්ථා පවතී. මේ සම්බන්ධ ව සියළුදෙනා ගේ අවධානය යොමු කිරීම මෙන් ම නීති පද්ධතියේ යාවත්කාලීන කිරීම් ද සිදු කළ යුතු බව පෙන්වා දීමට කැමැත්තෙමි.

දෙ වැනි සැසිය

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

බලතල විමධ්‍යගතකරණය පළාත් වාරිමාර්ග ක්ෂේත්‍රය කෙරෙහි බලපාන ආකාරය: ඌව පළාත ඇසුරින්

ඩබ්.එම්.සී.බණ්ඩාර
ලේකම්
ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග සහ සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය

සංක්ෂේපය

නිදහස් ශ්‍රී ලංකාවේ අඩ සිය වසකට ආසන්න කාලයක් තිස්සේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ සියලු ම කටයුතු විවිධ අණ පනත් මගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැවරී තිබිණි. 1987 දී පළාත් සභා පිහිටු වීම ත් සමග මූලික නීතිය මගින් ම ගොවිජන සේවා සහ වාරිමාර්ග විෂයයන් විමධ්‍යගත කරනු ලැබිණි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (5) (ආ) වගන්තිය මගින් පෙන්වා දෙන පරිදි පළාත් සභා ලැයිස්තුවෙන් හෝ සමගාමී ලැයිස්තුවෙන් පළාත් සභා වෙත පැවරී ඇති විෂයයන්ට අදාළ කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා පළාත් සභා විසින් ප්‍රඥප්ති සම්මත කර නෛතික ප්‍රතිපාදන සපයා ගත යුතු වේ.

කෙසේ වුව ද වාරිමාර්ග විෂයය සම්බන්ධ ව ප්‍රඥප්ති සම්මත කර ගැනීමට 2006 වසර වන තුරු කිසිදු පළාත් සභාවක් උත්සාහ දරා නොමැත. එමෙන් ම ගොවිජන සේවා විෂයය සම්බන්ධයෙන් ද ප්‍රඥප්ති සකස් කර තමන්ට ක්‍රියාත්මක වීම සඳහා බලය සම්පාදනය කර ගැනීමට උතුරු මැද පළාත් හැර වෙනත් කිසිදු පළාත් සභාවක් උත්සාහ දරා නොමැත. මෙම තත්ත්වය මත වාරිමාර්ග විෂයය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ දී නීත්‍යානුකූල අධිකාරී බලයේ පවතින ගැටලු නිසා පළාත් සභා නොයෙක් ගැටලුවලට මුහුණ දෙමින් සිටී. එමතු ද නො ව ක්‍රියාත්මක වීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නො වීම නිසා තමන්ට පැවරී ඇති වගකීම් ඉටු කිරීමේ දී පළාත් සභා දුෂ්කරතාවන්ට මුහුණ දෙනු ලබයි.

මෙම ලිපිය තුළින් වාරිමාර්ග විෂයය සම්බන්ධයෙන් පවතින නෛතික බලය සහ එම බලයේ මූලාශ්‍ර පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරනු ලබයි. ලිපියේ විශේෂ අවධානයක් යොමු ව පවතින්නේ වාරිමාර්ග විෂයයට අදාළ ව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල සහ වගකීම් ඉටු කිරීමේ දී පළාත් සභා මුහුණ දෙන ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමට ය. එමෙන් ම එම ගැටලු නිරාකරණය සඳහා යම් යම් යෝජනාවන් ද ඉදිරිපත් කෙරේ.

1.0 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා පිහිටුවා, රජය විසින් එතෙක් ක්‍රියාත්මක කරන ලද ඇතැම් බලතල පළාත් සභා වෙත විමධ්‍යගතකරණය කරන ලදී. මෙම සංශෝධනය මගින් ප්‍රධාන වශයෙන් ම, වාරිමාර්ග ක්ෂේත්‍රයට සම්බන්ධ සිවු වැදෑරුම් බලතල පළාත් සභා වෙත පැවරිණි. එනම්,

i. නව වැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ 9.2 වගන්තිය අනු ව පැවරුණු සුළු වාරිමාර්ග වැඩ කටයුතු, පුනරුත්ථාපනය සහ නඩත්තුව.
ii. නව වැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ දහ නව වැනි වගන්තිය අනු ව පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියළු වාරිමාර්ග වැඩ සම්බන්ධ ක්‍රම සම්පාදනය, සැලසුම් සැකසීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම පිළිබඳ පූර්ණ බලය.

iii. නව වැනි උපලේඛනයේ තුන් වැනි ලැයිස්තුවේ 17.1 වගන්තිය අනු ව පැවරුණු ජලය රැස් කර තැබීම සහ පාලනය කිරීම, ජලාපවාහනය සහ වේලි, ගංවතුරින් ආරක්ෂාව, ජල සම්පත් සැලසුම් කිරීම.

iv. නව වැනි උපලේඛනයේ තුන් වැනි ලැයිස්තුවේ 17.2 වගන්තිය අනු ව පැවරුණු අන්තර් පළාත් වාරිමාර්ග යෝජනා ක්‍රමවලට සපයනු ලබන සේවාවන්. එනම්, ග්‍රාම සංවර්ධනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, සමුපකාර වැනි සේවාවන් සැපයීම වශයෙනි.

2.0 වාරිමාර්ග සම්බන්ධ ශෛතික බලය සහ අණ පනත්

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (1) වගන්තිය අනු ව නව වැනි උපලේඛනයෙන් පළාත් සභා වෙත පැවරී ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදීමේ බලය පළාත් සභාවලට හිමි වේ. නව වැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවට අයත් කරුණු සම්බන්ධයෙන් පළාත් සභාව විසින් ප්‍රඥප්තියක් සම්මත කර නො ගන්නේ නම්, පළාත් සභාව විසින් ප්‍රඥප්තිය සම්මත කර ගන්නා තුරු පවතින නීතිය බලාත්මක වන බව ව්‍යවස්ථාවේ 154 උ (8) වගන්තියෙන් සහ 1989 අංක 12 දරණ පළාත් සභා (අනුෂාංගික විධි විධාන) පනතින් කියැ වේ.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (5) (ආ) වගන්තිය අනු ව සමගාමී විෂයයන් සම්බන්ධ කරුණු පිළිබඳ ව සියලු ම පළාත් සභා විමසීමෙන් පසු ව නීති පැනවීමේ බලය පාර්ලිමේන්තුවට හිමි වේ. එමෙන් ම එක් එක් කාරණාවේ අවස්ථාගත කරුණු අනු ව උචිත යැයි පළාත් සභාව අදහස් කරන ආකාරයට, පාර්ලිමේන්තුව විමසීමෙන් පසු ව, එම පළාත් සභාව පිහිටු වනු ලැබූ පළාතට අදාළ වන සේ සමගාමී ලැයිස්තුවේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් පළාත් සභාවක් විසින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට යටත් ව ප්‍රඥප්තිය සෑදිය හැකි බව එම වගන්තියේ සඳහන් වේ.

උතුරු මැද පළාත් සභාව හැර අනිකුත් පළාත් සභා විසින් වාරිමාර්ග පිළිබඳ ප්‍රඥප්ති සම්මත කර ගෙන නොමැති හෙයින් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීති මේ වන විට ද පළාත් සභාවලට බලපවත්වනු ලබයි. මෙම පරිච්ඡේදය ආරම්භයේ සඳහන් කළ වාරිමාර්ග ක්ෂේත්‍රය සමග සම්බන්ධිත පනත් සහ ආඥා පනත් පහත සඳහන් පරිදි වේ.

i. වාරිමාර්ග ආඥා පනත
ii. ගොවිජන සේවා පනත
iii. මහවැලි අධිකාරී පනත
iv. ගංගා නිම්න සංවර්ධන පනත.

පළාත් සභා පිහිටු වීමට පෙර සියලු ම වාරිමාර්ග වැඩ කටයුතු ආයතන තුනකට පැවරී තිබිණි. එනම්,

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
- මහවැලි සංවර්ධන අධිකාරිය යන ආයතනවලට ය.

ප්‍රධාන වේලි, අමුණු සහ ජලාශ වැනි මූලික වාරිමාර්ග ඉදි කිරීම් හා පාලනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරී තිබිණි. සුළු වාරිමාර්ගවල කුඩා පරිමාණයේ අලුත්වැඩියා කිරීම් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැවරී තිබිණි. මේ අනු ව මෙම දෙපාර්තමේන්තු දෙක අතර පවා කාර්යයන් ඉතා පැහැදිලි ව බෙදා වෙන් කර තිබිණි. එය කාර්යයන් ඉටු කිරීමේ දී පහසුවක් විය.

පළාත් සභා ස්ථාපිත කිරීමත් සමග ගොවිජන සේවා සහ වාරිමාර්ග විෂයයන් විමධ්‍යගතකරණය කරනු ලැබිණි. ව්‍යවස්ථාවෙන් මෙම විෂයයන් සම්බන්ධ බලතල පළාත් සභා වෙත පවරා තිබුණ ද ගොවිජන සේවා සහ වාරිමාර්ග විෂයයන්ට අදාළ කරුණු සඳහා ප්‍රඥප්ති සම්මත කර ක්‍රියාත්මක කිරීමට සැලකිය යුතු උත්සාහයක් පළාත් සභා විසින් නො දැරිණි. පළාත් සභා ආරම්භයේ ම වයඹ පළාත් සභාව වැනි ඇතැම් පළාත් සභා ගොවිජන සේවා විෂයය පළාත් සභා යටතට ගෙන තිබූ නමුත් පසු ව එය රජයේ දෙපාර්තමේන්තුවක් වශයෙන් නැවත ස්ථාපිත කරන ලදී. එසේ ම, 2006 වසර වන තුරු ම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු පිහිටු වීමට පළාත් සභා විසින් උත්සාහ නො දැරී ය. උතුරු මැද පළාත් සභාව 2006 වසරේ දී පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කරනු ලැබූ අතර වාරිමාර්ග කළමනාකරණ ප්‍රඥප්තියක් සම්මත කර ගැනීමට වයඹ පළාත් සභාව උත්සාහ දරණු ලබයි. වාරිමාර්ග කළමනාකරණ ප්‍රඥප්තියක් ඉදිරිපත් කිරීමට ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය කටයුතු කරන අතර, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා කාර්ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

3.0 ගැටලු

3.1 නීත්‍යනුකූල අධිකාරී බලයේ ගැටලු

නීත්‍යනුකූල අධිකාරී බලයේ ගැටලු සහ යාන්ත්‍රණයක් නො වීම නිසා වාරිමාර්ග සහ ගොවිජන සේවා විෂයයන් පළාත් සභා තුළ ගැටලු රාශියක් ජනිත කර ඇත. එම ගැටලු පහත සඳහන් වේ.

i. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතේ පවතින අන්තර් පළාත් වාරිමාර්ග ව්‍යාපාර හැර අනෙක් වැව්, අමුණු සහ අදාළ වාරි මාර්ග අඛණ්ඩ ව නඩත්තු කිරීම සහ රැකබලා ගැනීම සඳහා පළාත් සභාව සතු නීතිමය අධිකාරිත්වය නිසි පරිදි ස්ථාපිත වී නො තිබීම.
ii. පළාත් සභාවේ අධිකාරී බලයට අයත් වන වාරි ක්‍රම සඳහා ක්‍රමානුකූල, කළමනාකරණ ක්‍රමයක් ස්ථාපිත වී නො තිබීම.
iii. කාර්ය මණ්ඩල හිඟය.
iv. සමස්ථයක් ලෙස ගත් කළ පළාත් සභා වාරිමාර්ග විෂයය සම්බන්ධයෙන් සංවර්ධන ඉලක්කයක් නොමැතිවීම.
v. ස්වකීය වූ සංවර්ධන සැලැස්මක් සඳහා අවශ්‍ය අරමුදල් පළාත් සභාව සතු නො වීම.
vi. වාරි ක්‍රම හා පෝෂිත ප්‍රදේශ පිළිබඳ දත්ත පද්ධතියක් නොමැතිකම.
vii. පළාත් සභාවේ පාලනය යටතේ පැවතිය යුතු වාරිමාර්ග පළාත් සභාව යටතට නො පැවරීම.
viii. නීතිමය අධිකාරිත්වයක් නො වීම සහ නිසි යාන්ත්‍රණයක් නොමැති වීම.

i. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතේ පවතින අන්තර් පළාත් වාරිමාර්ග ව්‍යාපාර හැර අනෙක් වැව්, අමුණු සහ අදාළ වාරිමාර්ග අඛණ්ඩ ව නඩත්තු කිරීම සහ රැකබලා ගැනීම සඳහා පළාත් සභාව සතු නීතිමය අධිකාරිත්වය නිසි පරිදි ස්ථාපිත වී නො තිබීම.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දහ තුන් වැනි සංශෝධනය අනු ව සුළු වාරිමාර්ග සම්බන්ධ බලතල පළාත් සභාවට පවරා ඇත. ඒ අනු ව ඉහත හැඳින්වීමේ දී දක්වා ඇති පරිදි පළමු උපලේඛනයේ 9.2 හා දහ නව වැනි වගන්තිවලින් ද, තුන් වැනි උපලේඛනයේ 17 හා 17.2 වගන්තිවලින් ද පැවරී ඇති වාරිමාර්ග විෂයය සම්බන්ධ ව ප්‍රඥප්තියක් මගින් පළාත් සභාවට අදාළ වන පරිදි නීති සම්පාදනය වී නොමැත. එහෙයින් එම ප්‍රඥප්ති සම්මත කර නීති සාදා ගත යුතු වේ.

ii. පළාත් සභාවේ අධිකාරී බලයට අයත් වන වාරි ක්‍රම සඳහා ක්‍රමානුකූල කළමනාකරණ ක්‍රමයක් ස්ථාපිත වී නො තිබීම.

සුළු වාරිමාර්ග නඩත්තුව සහ ප්‍රතිසංස්කරණය සඳහා වෙන ම දෙපාර්තමේන්තුවක් ස්ථාපිත වී නොමැති බැවින්, එම කටයුතු සඳහා තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ අනිකුත් කාර්ය මණ්ඩලය ස්ථිර ව හා ප්‍රමාණාත්මක ව නොමැති හෙයින් පළාතේ දිගු කාලීන වාරිමාර්ග සංවර්ධන ඉලක්ක නොමැත. දැනට සංවර්ධන වැඩසටහන සකස් කරනු ලබන්නේ ගරු මහජන නියෝජිතවරුන්/වරියන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා වාර්ෂික ව වෙන්වන ප්‍රතිපාදන සීමාව මත ක්‍රියාත්මක කිරීම ය. එහෙත්, පළාතේ වාරිමාර්ග සම්බන්ධව නව වැඩ ප්‍රතිසංස්කරණ හා කළමනාකරණ වැඩසටහනක් දීර්ඝ කාලීන ව සකසා ගත යුතු වේ. තව ද, මේ සම්බන්ධ ව පවත්නා අතුරු ගැටලුවක් වන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පළාත් සභා ව්‍යුහයෙන් පිටත ක්‍රියාත්මක වීම ය. ගොවිජන සේවා විෂයය නව වැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ නව වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම හා ගොවිජන සේවා පළාත් සභාවට පැවරුණ විෂයයක් වුව ද මෙතෙක් ක්‍රියාත්මක වන්නේ රජයේ දෙපාර්තමේන්තුවක් වශයෙනි. මෙම විෂයය නැවත උපලේඛනයේ තුන්වැනි ලැයිස්තුවේ අට වැනි වගන්තිය යටතේ සමගාමී විෂයයක් ලෙස ද දක්වා ඇත. මෙහි දී සැලකිය යුතු කරුණක් වන්නේ පළමු ලැයිස්තුවේ නව වැනි වගන්තිය යටතේ පළාත් සභාවට කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධන අධ්‍යාපන සහ කෘෂිකාර්මික සේවා ද ඇතුළු ව කෘෂිකර්මය පැවරී ඇති අතර, සමගාමී ලැයිස්තුවේ අට වැනි වගන්තිය යටතේ කෘෂිකර්මය සම්බන්ධ කර්මාන්ත පිහිටුවීම, වැඩිදියුණු කිරීම, ගොවිපලවල් පිහිටුවීම සහ නඩත්තු කිරීම, පෞද්ගලික තවාන් අධීක්ෂණය කිරීම, පස සංරක්ෂණය සහ ශාක පලිබෝධ පිළිබඳ විෂයයන් ද පැවරේ. මෙහි දී "කෘෂිකාර්මික සේවා" හා "ගොවිජන සේවා" යන යෙදුම් අර්ථ කථනය කරගත යුතු ය. ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවි සංවිධාන, වගා ආරක්ෂාව, ජල කළමනාකරණය වැනි පුළුල් බලතල ක්‍රියාත්මක වන බැවින් මේ හා සම්බන්ධ ව පළාත් සභා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බලතල පිළිබඳ පැහැදිලි නිගමනවලට එළඹිය යුතු ය. එය තහවුරු වීම පිණිස ප්‍රඥප්ති සම්මත විය යුතු වේ.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙන ම ක්‍රියාත්මක වීම හේතුවෙන්, ගොවීන් හා පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග අමාත්‍යාංශය අතර සම්බන්ධය යම් දුර්වල මට්ටමක පවතින බව පෙනී යයි. එයට හේතුව මෙම දෙපාර්ශවය සම්බන්ධ කරන පුරුකක් නොමැති වීමයි. ගොවීන් හා අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම වාරිමාර්ග කළමනාකරණයේ දී අත්‍යවශ්‍ය සාධකයකි.

iii. කාර්ය මණ්ඩල හිඟය

ඌව පළාත් සභාව සතු ව පවතින තාක්ෂණික කාර්ය මණ්ඩලය වගු සටහන් අංක 01න් දැක්වේ

වගු සටහන් අංක 01: පළාත් තාක්ෂණික කාර්ය මණ්ඩලය

තනතුර	අංශය							
	පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ	අධ්‍යාපන	ගොඩනැගිලි	මාර්ග	සෞඛ්‍ය	පළාත් පාලන	වාරිමාර්ග	එකතුව
ඉංජිනේරු	02	02	07	09	01	01	03	25
තාක්ෂණ නිලධාරී	01	36	24	35	01	58	02	157
සැලසුම් ශිල්පී	-	-	13	-	-	-	02	15
ප්‍රමාණ සමීක්ෂක	-	-	01	-	-	-	-	01
එකතුව	**03**	**38**	**45**	**45**	**02**	**59**	**07**	**198**

මූලාශ්‍රය: ප්‍රධාන ලේකම් කාර්යාලය, ඌව පළාත් සභාව

ඉහත සටහන අනු ව වාරිමාර්ග අංශය සඳහා පවතින්නේ කුඩා ඒකකයක් බව ත්, එහි කාර්ය මණ්ඩලය ඉතා ම අවම ප්‍රමාණයක් වන බව ත් පෙනේ. ඌව පළාත වර්ග කිලෝ මීටර 8,481 ක් තරම් විශාල භූමි භාගයක ව්‍යාප්ත වී ඇත. 1991 දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ඌව පළාතේ වැව් සහ අමුණු පිළිබඳ සිදුකරනු ලැබූ සංගණනයට අනු ව, පළාතේ දැනට අත්හැර දමා ඇති අමුණු 10,655 ක් ද, වැව් 21,806 ක් ද වේ. මෙම වාරි කර්මාන්තවලට අමතර ව 2000–2006 කාලය තුළ JICA ව්‍යාපෘතිය මගින් පළාතේ වැව් 26ක් අළුතින් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සිදු කර ඇත. 2003/2004 වර්ෂවල වැව් 11ක් ඉදි කර ඇත. මෙම ව්‍යාපාරයන් හි යටිතල සංවර්ධනය නිම කළ යුතු ව පවතී. මෙම වැව් සහ අමුණු යටතේ වාරි ජලය සැපයිය හැකි භූමි ප්‍රමාණය අක්:1700කට ආසන්න ය. මෙම වාරි ව්‍යාපාර මනා ලෙස කළමනාකරණය කළ යුතු ව ඇති බැවින්, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත.

මේ අනුව පළාත් සභාව වාරිමාර්ග සම්බන්ධ බලතල ක්‍රියාත්මක කිරීමෙ හි ලා කාර්ය මණ්ඩල හිඟයෙන් පීඩා විඳින අතර, රජයේ නිලධාරීන්ගෙන් නිසි වැඩ ප්‍රමාණයක් නො ගන්නා බව කිව හැකි ය. එයට හේතුව රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දැනට කරනුයේ ස්ථාපිත ව්‍යාපාර නඩත්තු කිරීම පමණක් වන හෙයිනි. එහෙයින් මෙම කාර්ය මණ්ඩලය පළාත් සභාවල කටයුතු සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් වහා ම ඇති කරගත යුතු වේ.

රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පළාත් සභා කාර්යයන් හි යෙදවීමට අවස්ථාව ලැබේ නම් කාර්මික නිලධාරී හිඟය පිළිබඳ බොහෝ ගැටලු විසඳාගත හැකි වේ. ඌව පළාත තුළ රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ස්ථාපිත වී ඇති අයුරු, කාර්ය මණ්ඩලය හා පාලිත වාරි කර්මාන්ත පිළිබඳ ව වගු සටහන් අංක 02න් දැක් වේ.

වගු සටහන් අංක 02: ඌව පළාත තුළ ක්‍රියාත්මක මධ්‍ය රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ පාලිත වාරි කර්මාන්ත

කාර්යාලය	කාර්ය මණ්ඩලය				පාලිත කර්මාන්ත	පෝෂිත ප්‍රදේශයන් (අක්කර)
	ඉංජිනේරු	කාර්මික නිලධාරි	සැලසුම් ශිල්පී	වෙනත්		
මොණරාගල	01	07	02	16	මුතුකණ්ඩිය ඇතිමලේ බුත්තල මොණරාගල	4250
කන්දකැටිය	01	03	02	08	බදුළුඔය බත්මැඩිල්ල	3000
බදුල්ල	01	06	02	09	උමාඇල මාතැටිල්ල කන්දෙඇල අඹේපොල	2800
මාපාකඩ	01	08	03	08	තල්දෙන දෙහිගම දම්ඇරාව සොරබොර මාපාකඩවැව නාගදීපය	8000
බණ්ඩාරවෙල නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය	02	-	05	16		

මූලාශ්‍රය : අදාළ ආයතනවලින් දුරකථනයෙන් ලබාගන්නා ලද දත්ත ඇසුරින්

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීම සඳහා පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රධාන ලේකම්වරයා හරහා කළමනාකරණ

සේවා දෙපාර්තමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කොට ඇතත්, මේ දක්වා ඒ සඳහා අනුමැතියක් ලැබී නොමැත.

iv. සමස්ථයක් ලෙස ගත් කළ පළාත් සභා වාරිමාර්ග විෂයය සම්බන්ධයෙන් සංවර්ධන ඉලක්කයක් නොමැතිවීම.

සමස්ථයක් ලෙස ගත් කළ පළාත් සභා වාරිමාර්ග විෂය සම්බන්ධයෙන් ද බලපාන ප්‍රධාන දුර්වලතාවක් වන්නේ සංවර්ධන ඉලක්කයක් නොමැතිකම ය. භූමිය පරිභෝජනය කරනු ලබන ආකාරය පිළිබඳ සමස්ථ ක්‍රම සම්පාදනයක් සැලසුම් කිරීමක් අවශ්‍ය ය. මෙහිදී ද පළාත් සභාවට හුදකලාව ක්‍රියා කිරීමට නො හැකි වනු ඇත.

ජාතික මට්ටමින් රටේ සමස්ථ සංවර්ධනය සලකා බලා ඒ ඒ පළාතෙන් ජනිත කළ යුතු ධාන්‍ය හෝ අනෙකුත් ආහාර භෝග පිළිබඳ ඉලක්කයන් ලැබිය යුතු අතර, එම ඉලක්ක සපුරාලීම පිණිස වූ ඒකාබද්ධ වැඩසටහනක් පළාත් සභා සතුවිය යුතු ය. පළාත් සභාවේ සංවර්ධන සැලැස්ම, ජාතික සංවර්ධන සැලැස්මේ කොටසක් විය යුතු වේ.

v. ස්වකීය වූ සංවර්ධන සැලැස්මක් සඳහා අවශ්‍ය අරමුදල් පළාත් සභාව සතු නො වීම.

පළාත් සභාවේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් රජය විසින් ලබාදිය යුතු ය. පළාත් සභාව අරමුදල් ලබාදීම සම්බන්ධ ව ප්‍රධාන මූලාශ්‍රයක් වන්නේ මුදල් කොමිෂන් සභාව ය. මුදල් ලබාදෙන බැවින් ම පළාත් සභාවේ සංවර්ධන සැලැස්ම උචිත ද? නැද්ද? යන්න නිරීක්ෂණය කිරීමේ සමාලෝචනයක් ද මුදල් කොමිෂන් සභාව විසින් කරනු ලැබේ. ඒ සඳහා අමාත්‍යාංශය විසින් තම සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු අතර, මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කළ යුතු ය. සංවර්ධන වැඩසටහන සාකච්ඡා කර අනුමත කිරීමේ සහ ඒ සඳහා ප්‍රතිපාදන ලබාදීම, අවශ්‍ය මුදල් නිදහස් කිරීම යන ක්‍රමවේදයන් හි දුර්වලතා රැසක් පවතී. වගු සටහන් අංක 03න් දැක්වෙන්නේ 2005, 2006 වසරවල මෙම ක්‍රියාදාමය ක්‍රියාත්මක වූ ආකාරයයි. වගු සටහන් අංක 04න් කාර්යයන් අවිච්ඡේද වීම් ද, වගු සටහන් අංක 05න් මුදල් අවිච්ඡේද වීම ද දැක් වේ.

වගු සටහන් අංක 03: සංවර්ධන වැඩ ක්‍රියාත්මක වීම – කාල පරිච්ඡේදය

ක්‍රියාමාර්ගය	වසර	
	2005	2006
මූලික සැලැස්ම සැකසීම	2004 ඔක්තෝම්බර්	2005 ඔක්තෝම්බර්
පළාත් සැලසුම් අංශයට ඉදිරිපත් කිරීම	2005 මාර්තු	2006 ජනවාරි
ප්‍රධාන ලේකම්, සැලසුම් අංශය, මුදල් කොමිෂමට ඉදිරිපත් කිරීම	2005 මාර්තු	2006 ජනවාරි
මුදල් කොමිෂම මගින් සාකච්ඡා කිරීම	2005 මාර්තු	2006 මාර්තු
මුදල් කොමිෂමේ අනුමැතිය ලබාදීම	2005 ජුනි	2006 අප්‍රේල්
වැඩ ඇස්තමේන්තු කිරීම	ජුනි	මැයි
කර්මාන්ත පිරිනැමීම	ජුනි/සැප්තැම්බර්	ජුනි/සැප්තැම්බර්

මූලාශ්‍රය: ඌව පළාත්, ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය

වගු සටහන් අංක 04: වැඩ අවිච්ඡේදවීම්

වසර	කර්මාන්ත සංඛ්‍යාව	වටිනාකම රු.මි.
2005	25	16
2006	16	3.71

මූලාශ්‍රය: ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය

මුදල් අවිච්ඡේද වීමට ප්‍රධාන ම හේතුව වන්නේ වසරේ වැඩ ආරම්භය සඳහා දීර්ඝ කාලයක් ගතවීම බව පෙනී යයි. මෙයට හේතුව සෑම වසරක් සඳහා ම නැවත, නැවත සංවර්ධන සැලසුම් සකස් කිරීමේ හාස්‍ය ජනක ක්‍රියා කලාපයයි.

විශේෂයෙන් ම වාරිමාර්ග විෂයයෙ හි ලා දීර්ඝ කාලීන සැලැස්මක් සකස් කිරීම ඉතා පහසු කාරණයකි. තව ද වසරක අවිච්ඡේද කර්මාන්තයක් ඊළඟ වර්ෂයේ දී නිම කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වීම ද අතිශයින් ම කණගාටුදායක තත්ත්වයකි.

මෙය පළාත් සභාවල කටයුතු සම්බන්ධ ව මුදල් කොමිෂන් සභාවේ ඇති දැඩි ග්‍රහණය පිළිබඳ ඉතා ම පැහැදිලි දර්ශකයක් වේ. මෙසේ දැඩි ග්‍රහණයක් පවත්වා ගැනීම මගින් සංවර්ධන කටයුතු අඩාල වීම නො වැළැක්විය හැකි ය

vi. වාරික්‍රම හා පෝෂිත ප්‍රදේශ පිළිබඳ දත්ත පද්ධතියක් නොමැතිකම.

පළාත් සභා බල සීමාව තුළ පිහිටි ලොකු කුඩා වාරි ක්‍රම පිළිබඳ ව දත්ත පද්ධතියක් ගොඩනගා ගැනීම අත්‍යවශ්‍ය කරුණක්ව පවතී. මේ සඳහා අවශ්‍ය දත්ත පද්ධති සැලසුම් කිරීමක් පළාත් අමාත්‍යාංශය මගින් දැනට කරගෙන යනු ලැබේ. මෙම දත්ත පද්ධතියට සාපේක්ෂ ව පළාතට ලැබෙන වර්ෂාපතනය පිළිබඳ දත්ත පද්ධතියක් ගොඩනැගීමට ද අත්‍යවශ්‍ය ව ඇත. වර්ෂාපතනය පිළිබඳ දත්ත පද්ධතියක් ඇති කරගැනීම විවිධ අංශයනට ප්‍රයෝජනවත් වනු ඇත. උදාහරණ ලෙස ආපදා කළමනාකරණය, මාර්ග නඩත්තුව, කෘෂිකර්මය, කෘෂි රක්ෂණය ආදී විවිධ ක්ෂේත්‍ර සඳහා මෙම දත්ත පද්ධතිය ප්‍රයෝජනවත් වේ. වාරිමාර්ග හා සමග ම ජල කළමනාකරණය ද ඉතා වැදගත් අංගයකි. මේ සඳහා ද වර්ෂාපතන දත්ත අවශ්‍ය වේ. මේ සඳහා කෘෂි උපදේශක කොට්ඨාස මට්ටමින් වර්ෂාපතන දත්ත එක් රැස් කිරීම සඳහා ව්‍යාපෘතියක් අමාත්‍යාංශය විසින් සැලසුම් කරනු ලැබේ. මෙවැනි දත්ත පද්ධතියක් නොමැතිකම හේතුවෙන් තීරණ ගැනීමේ දී ඇතිවන ව්‍යාකූල භාවය පහත දැක්වෙන සිද්ධියෙන් පෙනී යනු ඇත.

මොණරාගල බඩ ඉරිඟු ගොවීන්ට ද්‍රව්‍යාධාර ලබා දී එම නිෂ්පාදන මිල දී ගැනීමේ වැඩ පිළිවෙලක් වර්ෂ 2003 දී ක්‍රියාත්මක ව තිබිණ. මේ යටතේ දුන් ද්‍රව්‍යාධාරවල වටිනාකම නිෂ්පාදන අලෙවියේ දී අය කරගැනීම ඉලක්ක විය. එහෙත්, මේ වනවිට එසේ ණය පදනම මත ද්‍රව්‍යාධාර ලැබූ ගොවීන්ගෙන් වැඩි පිරිසක් එම ණය ආධාර ආපසු ගෙවීම පැහැර හැර ඇත. කරුණු විමසීමේ දී දැනගැනීමට ඇත්තේ වියළි කාලගුණ තත්ත්වය හේතුවෙන් අස්වනු විනාශ වු බව ය. එහෙත් යම් පිරිසක් ණය ආධාර ආපසු ගෙවා ඇත. ඇත්ත වශයෙන් ම වියළි කාලගුණයක් මෙම ප්‍රදේශයට පැවතියේ ද? යන්න ත්, එමගින් වගාවේ අස්වනු කොපමණ ප්‍රමාණයකින් පහත වැටුනේ ද? යන්න ත් පිළිබඳ නිල වාර්තා නොමැති වීම මෙම බඩ ඉරිඟු ගොවීන්ගේ ගැටලුව විසඳීමේ දී බාධක ව පවතී.

මෙවැනි අවස්ථා රාශියක් ඇතිවී තිබේ. එහෙයින්, මෙවැනි ව්‍යාකූල තත්ත්වයන් වළක්වා ගැනීමට ද සංවර්ධන කටයුතු පුරෝකථනයට ද මෙම දත්ත පද්ධතිය වැදගත් වනු ඇත.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දත්ත උපයෝගී කරගත නො හැක්කේ මන්දැයි මේ පිළිබඳ යමෙකු ප්‍රශ්න කළ හැකි ය. එහෙත් කුඩා පරිමාණයේ වැව් අමුණු සම්බන්ධ ව තීරණ ගැනීමේ දී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දත්තවලට වඩා විස්තරාත්මක හා ආසන්න ත ම දත්ත වඩා ප්‍රයෝජනවත් වනු ඇත.

දත්ත පද්ධතියක් ගොඩනැගීමට වඩා ගැටලුව වන්නේ එම දත්ත පද්ධතිය පවත්වාගෙන යාම ය. ඒ සඳහා මුදලක් දිගින් දිගට ම දැරීමට පළාත් සභාවට හැකි විය යුතු ය.

වගු සටහන් අංක 05: මුදල් අවිච්ඡේද වීම

වසර	ව්‍යාපෘතිය	වියදම් කිරීමට සැලසුම් කළ මුදල රු.මි.	මුදල් කොමිෂමෙන් අනුමත කළ මුදල රු.මි.	අත් මුදල් ලැබීම: 1 කාර්තුව ඉල්ලූ මුදල (රු.මි)	1 කාර්තුව ලැබුණු මුදල (රු.මි)	2 කාර්තුව ඉල්ලූ මුදල (රු.මි)	2 කාර්තුව ලැබුණු මුදල (රු.මි)	3 කාර්තුව ඉල්ලූ මුදල (රු.මි)	3 කාර්තුව ලැබුණු මුදල (රු.මි)	4 කාර්තුව ඉල්ලූ මුදල (රු.මි)	4 කාර්තුව ලැබුණු මුදල (රු.මි)	අවිච්ඡේද වූ මුදල රු.මි.
2006	සුළු වාරිමාර්ග ව්‍යාපෘතිය	30	20	1.0	1.0	12	6	6	3	16.4	5.6	3.71
	වේලිඔය ව්‍යාපෘතිය	30	25	1.0	1.0	2.0	5.5	11.0	6.0	16.5	7.0	

මූලාශ්‍රය: ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය

LIBRARY
HARTI

vii. පළාත් සභාවේ පාලනය යටතේ පැවතිය යුතු වාරිමාර්ග පළාත් සභාව යටතට නො පැවරීම.

අන්තර් පළාත් වාරිමාර්ග රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පාලනය වේ. එහෙත්, අන්තර් පළාත් ගණයට අයත් නො වන වාරිමාර්ග ද රජය යටතේ පාලනය වන අවස්ථා දැකගත හැකි වේ. උදාහරණ කීපයක් ලෙස බදුල්ල වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසයේ උමා ඇල, මාතැටිල්ල, කන්දෙඇල, මාපාකඩ වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසයේ දෙහිගම ඇල, කන්දකැටිය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසයේ බදුළුඔය සහ බත්මැඩිල්ල ව්‍යාපාරය ආදිය පෙන්වා දිය හැකි ය.

අන්තර් පළාත් මට්ටම අයත් නො වන වාරිමාර්ග නිශ්චිත ව ම පළාත් සභාවට නො පැවරීම හේතුවෙන් එම වාරිමාර්ගවල නඩත්තු කටයුතු හා පුනරුත්ථාපන කටයුතු සඳහා ආයතන කිහිපයක මැදිහත් වීමක් සිදු වේ. මේ සඳහා විශාල මානව සම්පත් හා භෞතික සම්පත් ප්‍රමාණයක් ලබා දී ඇති අතර, එම සම්පත් පළාත් සභාව වෙත ලබා දෙන්නේ නම් අන්තර් පළාත් මට්ටමට අයත් නො වන වාරිමාර්ග ද සාර්ථක ව පවත්වාගෙන යැමට හැකියාවක් පළාත් සභාව සතු වනු ඇත.

viii. නීතිමය අධිකාරිත්වයක් නො වීම හා නිසි යාන්ත්‍රණයක් නොමැති වීම.

දහ තුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, පළාත් සභා වෙත පැවරී ඇති අධිකාරී බලය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නො කිරීම දුර්වලතාවක් වේ. ඉහත හැඳින්වීමේ දී දක්වා ඇති බලය පැවරීම අනු ව පළාතට අවශ්‍ය කරන නව වාරිමාර්ග ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ නව ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම පළාත් සභා මගින් කළ යුතු ය.

පළාත් සභාව මගින් නව වාරිමාර්ග ක්‍රම ක්‍රියාත්මක කිරීමට යාමේ දී ඉඩම් පිළිබඳ ගැටලුව ඌව පළාත තුළ පැන නැගී ඇත. පහත දැක්වෙන සිද්ධි අධ්‍යයනය මෙම කරුණ අවබෝධ කරගැනීම සඳහා ප්‍රමාණවත් වනු ඇත.

2000/2005 වසරවල ක්‍රියාත්මක වූ ජයිකා ව්‍යාපෘතිය මගින් ඌව පළාත තුළ වැව් 21ක් සහ අමුණු හා ඇල මාර්ග 121ක් ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කර ඇත. එමගින් ඉඩම් අක්කර 10,706ට වැඩි පෝෂිත ප්‍රදේශ ඇති කර ඇති අතර, ගොවි පවුල් 12,494ක් ප්‍රතිලාභීන් වේ. මෙම ව්‍යාපාර අතරින් පහත වගු සටහන් අංක 06හි දැක්වෙන ව්‍යාපාරවල ප්‍රධාන වැඩ කොටස් අවසන් කර ඇත ත්, යටිගං සංවර්ධනයේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් නිදහස් කිරීම ප්‍රමාද ව ඇත. එහෙයින් එම ව්‍යාපාරවලින් අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට අපහසු ව ඇත.

වගු සටහන් අංක 06: වැඩ අවසන් කළ ව්‍යාපාර

	කර්මාන්තය	ආරම්භ කළ දිනය	අවසන් කළ දිනය	ඉඩම් නිදහස් කර ගැනීම ඉල්ලා ඇති දිනය
01	ඇත්ගාලේ කඳුර අමුණ	2001.12.27	2002.06.26	2003.09.04
02	කිවුලේගේ ආර අමුණ	2004.05.12	2004.10.08	2005.01.18
03	සීතලේ කඳුර අමුණ	2001.06.25	2001.12.31	2006.04.21

මූලාශ්‍රය: ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය

3.2 පළාත් සභාවේ තීරණ වෙනත් ආයතන මගින් ප්‍රශ්න කිරීම හා සම්බන්ධව මතුවී ඇති ගැටලු

ජයිකා ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කෙරුණු පහත දැක්වෙන ව්‍යාපෘති සම්බන්ධ ව Turnkey පදනම මත ලංකාවේ එවකට ක්‍රියාත්මක වූ පිළිගත් ඉදිකිරීම් ආයතන සමග ගිවිසුම්ගත ව තිබිණ. මෙම කර්මාන්ත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී එම කර්මාන්ත පිළිබඳ විමර්ශනයක් කරන ලද ජනාධිපති විශේෂ විමර්ශන ඒකකය විසින් එසේ Turnkey පදනම මත නො ව මිණුම් මත (Measure and Pay) ගෙවීමේ පදනම යටතේ කටයුතු කළ යුතු බව දැනුම් දෙන ලදී. මේ වන විට Turnkey පදනම මත

කටයුතු කර තිබු බැවින්, මිණුම් මත ගෙවීමේ ක්‍රමය සඳහා අවශ්‍ය මූලික දත්ත දෙපාර්තමේන්තුව සතු නො විණි. මෙම ගැටලුව හේතුවෙන් කරන ලද වැඩ කොටස්වලට ගෙවීමට නො හැකි තත්ත්වයක් මතුවීම නිසා කර්මාන්ත භාරගෙන තිබු ආයතන එම කර්මාන්තවල ඉදිරි වැඩ කොටස් නිම කිරීම අත්හැරදමා ඇත. මේ හේතුවෙන් අතිවිශාල මුදල් ප්‍රමාණයක් වැය කර අඩක් නිම කරන ලද කර්මාන්ත රාශියක් ඌව පළාත තුළ පවතී. මෙම කර්මාන්ත සම්බන්ධ ව ජනාධිපති විශේෂ විමර්ශන ඒකකය ත්, පළාත් සභා අමාත්‍යාංශයත්, පළාත් සභාව ත් ඒකාබද්ධ ව තීරණයක් ගත යුතු ව ඇත.

වගු සටහන් අංක 07: ජයිකා ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කර අතරමග නවතා ඇති කර්මාන්ත

	කර්මාන්තය	මෙතෙක් වැය කළ මුදල	වැඩ නිම කිරීමට තවදුරටත් වැය කළයුතු මුදල
01	පරළුකෙම වැව	21,672,837.45	4,000,000.00
02	මහකඩවර වැව	19,536,773.67	15,000,000.00
03	පුබුදු වැව	1,023,648.51	2,000,000.00
04	කරමැටිය වැව	9,185,672.03	20,000,000.00
05	පිදේණිආර වැව	1,864,204.96	1,213,836.57
06	කුකුල්කටුව වැව	3,118,623.33	3,000,000.00
07	බහිරාව සී-7 ඇල	11,622,912.99	18,344,314.82
08	කිරිඔරුව වැව	14,600,000.00	10,000,000.00

මූලාශ්‍රය: ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය

මේ පිළිබඳව පළාත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුවත් විය යුතු ආයතනය දැනුවත් කරනු ලැබ ඇතත්, මෙතෙක් ප්‍රතිචාරයක් ලැබී නැත.

4.0 සමාප්තිය

දහතුන් වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් පැවරුණ බලතල සම්බන්ධ ව පළාත් සභා විසින් නීති සම්පාදනය කිරීම ත්, පළාතේ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම පිණිස යාන්ත්‍රණයක් ඇති කර ගැනීම ත් පළාත් සභාව විසින් කළ යුතු බව ඉහත කරුණු අනු ව පෙනී යයි.

ශ්‍රී ලංකාවේ වාරි කෘෂි කර්මාන්තය
අතීත කාර්ය සාධනයන්, වර්තමාන තත්ත්වයන් සහ අනාගත අභියෝග

එම්.වයි. සෙයිනුදීන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
වයඹ පළාත් සභාව

සංක්ෂේපය

ක්‍රිස්තු පූර්ව යුගයේ සිට සිදු වෙමින් ආ ජල සම්පත් සංවර්ධනය, මෙරට වාරි කෘෂි කර්මාන්තයේ උන්නතියට ඉමහත් ලෙස දායක වී ඇත. තාක්ෂණයේ දියුණුව ත් සමග පසු ගිය ශත වර්ෂය තුළ විදුලි බල උත්පාදනය, ගෘහස්ත සහ කර්මාන්ත සඳහා ජල සැපයුම මෙන් ම ළිං ආශ්‍රිත ජල භාවිත ක්‍රම වැඩි දියුණු වීම මෙම ක්ෂේත්‍රය තව දුරටත් සංවර්ධනය වීම කෙරෙහි බලපානු ලැබිණි. බොහෝ විට වාරි කෘෂි කර්මාන්තය, විදුලි බලය සහ ගෘහස්ත අවශ්‍යතා සඳහා මතුපිට ජලය භාවිතයට ගනු ලබන අතර කර්මාන්ත සහ වාණිජ කෘෂිකර්මය සඳහා පුළුල් වශයෙන් භූගත ජලය භාවිතා කරනු ලබයි. වර්තමාන ඇස්තමේන්තු අනු ව වාරි කෘෂි කර්මාන්තය සඳහා ජලාශවල රැස් කර ගනු ලබන ජලයෙන් 85%-90% ආසන්න ප්‍රමාණයක් භාවිතා කරනු ලබයි. ශ්‍රී ලංකාවේ නාගරික ජනගහණයෙන් 70% පමණ ප්‍රමාණයකට ද, ග්‍රාමීය ජනගහණයෙන් 15% පමණ ප්‍රමාණයකට ද නල ජලය සපයා ඇති අතර ග්‍රාමීය අංශයෙන් ගෘහස්ත නල ජල සැපයුම සඳහා අති විශාල ඉල්ලුමක් පවතී. පසු ගිය දශක කිහිපය පුරා අත් පත් කර ගත් ප්‍රශංසාත්මක තත්ත්වයක් තිබිය දී වුව ද මෙම ක්ෂේත්‍රය නොයෙක් අර්බුදයන්ට මෙන් ම අනාගත අභියෝගයන් රාශියකට ද මුහුණ පා සිටී.

මෙම ලිපිය තුළින් වාරි කෘෂිකර්මාන්තයේ අතීතය, වර්තමාන තත්ත්වය සහ අනාගත ප්‍රවණතා පිළිබඳ සාකච්ඡා කෙරේ. වර්තමානයේ වාරිමාර්ග ක්ෂේත්‍රය මුහුණ දී ඇති ගැටලු සාකච්ඡා කරමින්, එම ක්ෂේත්‍රයේ අනාගත අභිවෘද්ධිය සලසා ගතහැක්කේ කෙසේ ද? යන්න පිළිබඳ ව වැඩිදුරටත් අවධානය යොමු කෙරේ. එමෙන් ම මෙම කටයුතු ඉටු කිරීමේ දී පළාත් සභා මුහුණ දෙන ගැටලු පිළිබඳ ව දීර්ඝ ව සාකච්ඡා කෙරෙන අතර, ඒවා මගහරවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව ද සාකච්ඡා කෙරේ.

1.0 හැඳින්වීම

ජලය සහ සරු පස ආදි ස්වභාවික සම්පත් මෙන් ම යහපත් කාලගුණය ද පසු ගිය සහස්‍රක කිහිපයක් තුළ ශ්‍රී ලංකාව ප්‍රමුඛ පෙළේ කෘෂිකාර්මික රටක් වීම සඳහා දායක වූ ප්‍රධාන සාධක විය. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයකට සහ වාරි කෘෂි කර්මාන්තයකට දීර්ඝ ඉතිහාසයක් පුරා හිමිකම් කියන ශ්‍රී ලංකාව, සහල් ප්‍රමුඛ අනෙකුත් ධාන්‍ය වර්ගවල පවත්වා ගත් අතිරික්තය නිසා "පෙරදිග ධාන්‍යාගාරය" යන නමින් ද හැඳින්විණි. පළමු සහ දෙ වැනි සහස්‍රකවල වියළි සහ අන්තර් කලාපවල ඉදි කෙරුණු විශාල වාරි කර්මාන්ත මෙරට ජීවනාලිය විය. මෙමගින් පාලකයින් අපේක්ෂා කළ රටේ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ දර්ශනය මල්ඵල ගැන්වීමට හැකි වූ අතර ජාතියේ ප්‍රධාන ආහාරය වන සහල්වලින් රට ස්වයං පෝෂිත කර අතිරික්තයක් ද පවත්වා ගැනීමට හැකි විය.

නිදහසින් පසු යුගයේ දී ද, මෙරට සශ්‍රීක භාවය ලබා ගැනීම සඳහා ස්වයං පෝෂිත වීම සහ ආර්ථික සංවර්ධනය පදනම් කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති තුළ කෘෂිකර්මයට ඉහළ මට්ටමේ ප්‍රමුඛතාවක් ලබා දුණි. පසු ගිය ශත වර්ෂය තුළ කෘෂිකර්මය සඳහා ජල සම්පත සංවර්ධනය කිරීමට අති විශාල ආයෝජනයක් සිදු කරමින් මෙම ප්‍රතිපත්තිය සාක්ෂාත් කර ගැනීමට උත්සාහ දරණු ලැබිණි. 1960 දශකයේ දී මෙරට වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 200,000 වූ අතර 2000 වසර වන විට එය හෙක්ටයාර 736,000 දක්වා වර්ධනය විණි. මෙයින් 75%ට ආසන්න ප්‍රමාණයක් යල, මහ දෙ කන්නයේ වාරි ජලයෙන් වගා

කෙරෙන බිම් වේ. ඉහත කී තත්ත්වයන් ගේ ප්‍රතිඵලයක් ලෙස, ආහාර නිෂ්පාදනය, රැකියා අවස්ථා සහ ජීවන තත්ත්වය වැඩි දියුණු වීම සිදු වූ අතර සීඝ්‍ර ආර්ථික වර්ධනයකට ද හේතු විය.

ජල සම්පත් සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසින් මෙවැනි ජයග්‍රහණ ලබා ගත්ත ද විශාල ජල ප්‍රමාණයක් භාවිතා කරමින් අඩු ඵලදායිතාවක් අත් කර ගැනීම තුළ ජලය භාවිතා කරන අනෙකුත් අංශවලට ජල හිඟයකට මුහුණ දීමට සිදුවීමේ වාතාවරණයක් නිර්මාණය වී ඇත. මෙම තත්ත්වය අනාගතයේ විශාල අර්බුදයකට මඟ පාදන්නක් බවට පත් වනු ඇත. ජලය යනු ප්‍රතිචක්‍රීයකරණය තුළින් නැවත නැවත ත් භාවිතා කළ හැකි සම්පතක් වන හෙයින් රට පුරා නිරන්තරයෙන් ඉහළ යන ජල සැපයුම සඳහා වූ ඉල්ලුම් සපුරාලීමට එමගින් අවස්ථාව සැලසෙන නමුත් එය ක්‍රියාත්මක කිරීම සඳහා සීමාවන් පවතී. පාරිසරික වශයෙන් තිරසාර සහ සමාජමය වශයෙන් පිළිගන්නා වූ රාමුවක් තුළ රටේ ජල සම්පත සංවර්ධනය සහ කළමනාකරණය සඳහා වර්තමානයේ පියවර ගැනීම කළ යුතු ව පවතී.

2.0 ශ්‍රී ලංකාවේ ජල සම්පත හි සංවර්ධනය

කඳුකරයෙන් ආරම්භ වී මුහුදට ගලා බසින, දිවයිනෙන් 90% ක් පමණ ආවරණය කරන ජලාපවාහන ද්‍රෝණි 103ක් පවතී. මෙයින් 16ක් තෙත් කලාපයේ වන අතර, ඒවා නිත්‍ය ජල ද්‍රෝණි වේ. වියළි කලාපයේ වන සෘතුමය ජල ද්‍රෝණි සහ මුහුදුකරයේ පිහිටි කුඩා ජල ද්‍රෝණිවලින් ඉතිරි කොටස සමන්විත වේ.

ඔක්තෝබර් සිට මාර්තු දක්වා වන ඊසාන දිග මෝසම් සහ අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා වන වියළි කාලයේ ලැබෙන නිරිත දිග මෝසම මගින් රටට වර්ෂාව ලැබේ. රටේ කාලගුණික තත්ත්වය පුළුල් පරාසයක පැතිර පවතී. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය, තෙත් කලාපයේ මිලි මීටර 2400ක් පමණ ද වියළි කලාපයේ මිලි මීටර 1400ක් පමණ ද, සමස්ත දිවයිනේ මිලි මීටර 2000ක් පමණ ද වේ. දිවයිනේ ඇස්තමේන්තුගත සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය කියුබික් මීටර මිලියන 127,000 පමණ වන අතර ගලා යන ජල ප්‍රමාණයේ වාර්ෂික සාමාන්‍යය කියුබික් මීටර මිලියන 51,300 පමණ වේ.

2.2 ජල සම්පත් සංවර්ධනය

2.2.1 පසුබිම

"වාරි කර්මාන්තය" යනු වගා කළ හැකි බිම්වලට වාරි සහ ජලාපවාහන පහසුකම් ලබා දීම සහ ගංවතුර වැළැක්වීම, පාලනය කිරීම සහ වගා බිම්වලට කරදිය පිවිසීම වැළැක්වීම සඳහා සංවර්ධනය කර, නඩත්තු කරමින් මෙහෙය වනු ලබන යටිතල පහසුකම් විශේෂයකි. ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් පුරා ජලාශ්‍රිත ශිෂ්ටාචාරයකට උරුමකම් කිව් රටකි. කෘෂිකාර්මික අරමුණු උදෙසා සිදු කරන ලද පුරාතන වාරි කර්මාන්තවලින් පැරණි රජ දරුවන් ගේ කලාත්මක සහ ඉංජිනේරුමය දක්ෂතාවන් අදට ත් විද්‍යමාන වේ. ආර්.එල්. බ්‍රෝහියර් තම "Ancient Irrigation Works in Ceylon" නම් ග්‍රන්ථයේ පෙන්වා දෙන අන්දමට, සාරවත් නො වූ ප්‍රදේශවල අති විශාල වුවමනාවන් සංතෘප්ත කර ගැනීම සඳහා ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ම ජල කළමනාකරණය පිළිබඳ හැකියාවක් ශ්‍රී ලාංකිකයින්ට විය.

යුරෝපය ප්‍රාථමික සහ මිලේච්ඡ අවධියේ පසු වන විට පවා අප්‍රමාණ වූ ශ්‍රමය, දක්ෂතා සහ තාක්ෂණය භාවිතා කරමින් සිදු කරන ලද වාරි කර්මාන්ත මගින් මෙරට ශුෂ්ක ප්‍රදේශ සශ්‍රීක, සමෘද්ධිමත් ප්‍රදේශ බවට පත් කිරීමේ හැකියාව ශ්‍රී ලාංකිකයින් සතු විය. කෙසේ වුව ද අභ්‍යන්තර යුද්ධ සහ විදේශීය ආක්‍රමණ, නියං ආදී සාධකවල බලපෑමෙන් මෙම තත්ත්වය කඩින් කඩ බිඳ වැටීම්වලට ලක් විණි. දොළොස් වැනි සිය වසේ පොළොන්නරු රාජධානියෙන් පසු ව විශාල වාරි කර්මාන්ත ඉදි නො කෙරුණු අතර, විසි වැනි සිය වසේ මුල් භාගය වන තුරු බොහොමයක් වාරි කර්මාන්ත නටබුන් ලෙස අත්හැර දමා තිබිණි.

2.2.2 ප්‍රතිපත්තිමය අරමුණු

1930 දශකයේ දී මෙරට නව කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් කරා ගමන් කළ අතර එහි දී වාරි කර්මාන්ත මූලික අංගෝපාංගයක් ලෙස සැලකිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජල සම්පතෙ හි සංවර්ධනාත්මක නව යුගයක් මෙම කාල පරිච්ඡේදයෙන් ආරම්භ විය. වැඩි වන ජනගහනයේ ඉල්ලුමට සරිලන පරිදි රටේ ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා නිදහසින් පසු යුගයේ දී රජය විසින් බොහෝ පියවර ගනු ලැබිණි. "ආහාරවලින් ස්වයං පෝෂිත වීම" පිළිබඳ ව මෙම යුගයේ දී ප්‍රතිපත්තිමය ලියවිලිවල සඳහන් විය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම සහ ගෝලීයකරණ ක්‍රියාදාමය සමඟ "ආහාර සුරක්ෂිතතාව" පිළිබඳ සාකච්ඡාවන් සාහිත්‍යයට එක් විණි. 1995 ප්‍රකාශයට පත්වූ කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් පිළිබඳ ව ජාතික ප්‍රතිපත්ති අඩංගු වූ වාර්තාව මගින් කෘෂිකාර්මික අංශයේ ප්‍රමුඛතාව මනා ව පැහැදිලි කරනු ලබයි. එම වාර්තාවේ සඳහන් වන අන්දමට ශ්‍රී ලාංකිකයින් ගේ කාබෝහයිඩ්‍රේට් අවශ්‍යතාව සපුරාලන ප්‍රධාන ආහාරය සහල් වන අතර සහල් ආනයනය සඳහා වන විදේශ විනිමය ඉතුරු කර ගැනීම සහ ග්‍රාමීය අංශයේ විශාල පිරිසක් සේවා නියුක්ත වන අංශයක් වශයෙන් මෙම අංශයේ සංවර්ධනය ආර්ථිකමය වශයෙන් ද වැදගත් වේ. මිලියන 1.8ට ආසන්න ගොවීන් නැතහොත් මුළු ජනගහනයෙන් 10% පිරිසක් මෙරට වී වගාවේ නිරතව සිටිති. ශ්‍රී ලාංකිකයින් ගේ ඒක පුද්ගල කැලරි ප්‍රමාණයෙන් 45% ද, ප්‍රෝටීන් ප්‍රමාණයෙන් 40% ද දායක වන්නේ සහල් ය. මේ නිසා ප්‍රධාන ආහාරය වන සහලින් ස්වයං පෝෂිත වීම මගින් ආහාර සුරක්ෂිතතාව කරා යෑම ප්‍රධාන අරමුණක් කර ගත් ප්‍රතිපත්තියක් කරා යොමු විය යුතු වේ.

මෑත කාලයේ දී කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරන බව පෙනේ. පරිසරය, ජෛව විවිධත්වය යටිතල පහසුකම් සංවර්ධනය, කෘෂිකාර්මික පර්යේෂණ, කෘෂිකාර්මික සහ අනෙකුත් තාක්ෂණික ක්‍රම ග්‍රාහකයා වෙත යොමු කරවීම, යෙදවුම් කළමනාකරණය, භෝග විවිධාංගීකරණය, දේශීය සහ ජාත්‍යන්තර වෙළඳාම ආදී අංශ රාශියක් නව කෘෂිකාර්මික ප්‍රතිපත්තිය විසින් ආවරණය කරනු ලබයි. වර්තමාන කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දී ඇති අතර, 2003 වසරේ අය වැයෙන් රුපියල් මිලියන 100 ක් ඒ සඳහා වෙන් කර තිබුණි. අනෙක් අතට, 1999 හඳුන්වා දුන් පෙර ගිවිසුම් වෙළඳ ක්‍රමය මගින් අලෙවිය සඳහා වූ යටිතල පහසුකම් වර්ධනය කිරීමට ක්‍රියා කර ඇත. මෙයට අමතර ව තෝරා ගත් ප්‍රදේශවල විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටු වීම මගින් ග්‍රාමීය ජනතාවට තම ප්‍රදේශයේ දී ම වඩා හොඳ මිලකට නිෂ්පාදන අලෙවි කර ගැනීමට අවස්ථාව සලසා ඇත.

කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කරනු ලැබූ "ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග" පිළිබඳ ලියවිල්ලෙ හි, කෘෂිකාර්මික ඵලදායිතාව කෙරෙහි දැඩි ව බලපානු ලබන ගැටලු රාශියක් පැහැදිලි ව හඳුනා ගෙන ඇත. ආහාර භෝග සහ පශු සම්පත් ක්ෂේත්‍රයේ වර්ධනීය විභවතා බල ගන්වමින් ආර්ථික සංවර්ධනය සඳහා එහි දායකත්වය උපරිම මට්ටමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය එම ලියවිල්ලෙ හි අරමුණ විය.

සමස්තයක් ලෙස වාරි කෘෂි කර්මාන්තයේ ජාතික අරමුණු සහ ඉලක්කයන් පිළිබඳ සලකා බැලීමේ දී, ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, අතිරේක රැකියා අවස්ථා බිහි කර දිළිඳු භාවය තුරන් කිරීම, ජනතාව ගේ ජීවන තත්ත්වය සහ සමාජ සුභ සාධනය ඉහළ මට්ටමකට ගෙන ඒම, අභ්‍යන්තර කලාප සංවර්ධනය තුළින් රටේ ආර්ථික සහ දේශපාලන ස්ථාවර භාවය ඇති කිරීම, නාගරික ශ්‍රම සංක්‍රමණය පාලනය කිරීම ප්‍රමුඛ වන බව පැහැදිලි ය.

2.3 මතුපිට ජලයෙන් සිදු කෙරෙන කෘෂිකර්මය සඳහා වූ වාරි සංවර්ධන ක්‍රම (Blue Water Agriculture)

මෑත කාලය දක්වා ම ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ වාරි කර්මාන්ත සහ ජනපද අති විශාල ප්‍රමාණයක් ගොඩ නැගුණි. මෙය එක් පාලන යුගයකින් පසු ව නැවත ජනතා සහාය ලබා ගැනීමට උදව් උපකාර වන ඉතා වැදගත් ආයෝජන අවස්ථාවක් වශයෙන් ද පෙනෙන්නට තිබේ. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මෙරටට හඳුන්වා දීමත් සමග ආර්ථික සංවර්ධනයේ දිශානතිය වැදගත් වෙනසකට භාජනය විය. මේ අවධිය වන විට ද ක්‍රියාත්මක වෙමින් පැවති "මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය" වාරි සහ ජල විදුලි උත්පාදනය අරමුණු කරගත් විශාල ජලාශ සංඛ්‍යාවක් ඉදි කරමින්, බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් බවට පත් වූ අතර "එය කඩිනම් සංවර්ධන වැඩසටහනක්" වශයෙන් ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. මෙම ව්‍යාපාරවල මූලික අරමුණ වූයේ ස්වයං පෝෂිත තත්ත්වය දක්වා ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම, රැකියා උත්පාදනය සහ තෙත් කලාපයේ ජන පීඩනය අවම කිරීම ය. 1930 සිට 2000 දක්වා සංවර්ධනය කරනු ලැබූ මහා වාරි ව්‍යාපාර 98ක්, මධ්‍ය පරිමාණ ව්‍යාපාර 282 සහ සුළු පරිමාණ වාරි කර්මාන්ත 25,000 ආසන්න සංඛ්‍යාවෙන් හෙක්ටයාර් 536,000ට වැඩි බිම් ප්‍රමාණයක් වගා බිම් සඳහා එකතු කර ඇත. 1960 මුල් භාගයේ සිට 2000 දක්වා මහා වාරි කර්මාන්ත යටතේ වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 200,000 සිට 480,000 දක්වා වර්ධනය වී ඇතත්, සුළු වාරිමාර්ගවලින් වගා කෙරෙන බිම් ප්‍රමාණයේ වෙනසක් සිදු වී නොමැත. කෙසේ වුව ද මෙම කාලය තුළ වර්ෂා පෝෂිත වගා බිම් ප්‍රමාණයේ අඩු වීමක් වාර්තා වේ. (ප්‍රස්තාර අංක 01)

ප්‍රස්තාර අංක 01: විවිධ වාරි ජල සැපයුම් යටතේ වගා කරන ලද බිම් ප්‍රමාණය සහ අස්වැන්න නෙලන ලද බිම් ප්‍රමාණය



මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මෙයට අමතර ව වාණිජමය වශයෙන් ඉහළ වටිනාකමක් සහිත භෝග වගාව සඳහා බොහෝ වාරි ව්‍යාපෘතිවල නල මාර්ගික වාරි ක්‍රමය (Pumped Irrigation Systems) සංවර්ධනය කර ඇත. විශේෂයෙන් ම යල කන්නයේ දී සුළු වාරිමාර්ග ක්‍රමවල මතුපිට ජලයට ආදේශකයක් ලෙසින් භූගත ජලය භාවිතා කරනු ලබයි.

2.4 වර්ෂා පෝෂිත කෘෂිකර්මය (Green Water Agriculture)

සිය වස් ගණනාවක් තිස්සේ තෙත් සහ අතරමැදි කලාපවාසීන් ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ වැසි දියෙන් සිදු කෙරෙන කෘෂිකාර්මික කටයුතු ය. මෙම ප්‍රදේශවල ජනතාව ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා අවශ්‍ය වන සහල් මෙන් ම අල වර්ග, පළතුරු, කුළු බඩු ආදී බොහෝ භෝග වර්ග මෙම ප්‍රදේශවල වගා කෙරිණි. දිවයිනට බලපැවැත්වෙන මෝසම් දෙක ආශ්‍රිත ව, කිසිදු ගැටලුවකින් තොර ව පහත් බිම්වල වී වගාව සිදු කෙරිණි. මේ අනු ව සිය වස් ගණනාවක් තිස්සේ මෙම ප්‍රදේශවල ග්‍රාමීය ප්‍රජාවේ ප්‍රධාන ආහාරය සැපයීම සඳහා වර්ෂා පෝෂිත කෘෂිකර්මය විශාල භූමිකාවක් නිරූපණය කර ඇත.

පසු ගිය කාලය තුළ වාරි කර්මාන්ත යටතේ වගා කෙරෙන බිම් ප්‍රමාණය වැඩි වී ඇතත් වර්ෂා පෝෂිත වගා බිම් ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් අඩු වී ඇත. නාගරීකරණයට ලක් වූ තෙත් සහ අන්තර් කලාපවල නිවාස සහ අනෙකුත් වාණිජ අවශ්‍යතා සඳහා ඉඩම්වලට වන සපුරාලිය නො හැකි මට්ටමේ ඉල්ලුම මේ ආකාරයට වගා බිම් අඩු වීම කෙරෙහි බලපා ඇති මූලික ම සාධකය වේ. කෙසේ වුව ද මේ ආකාරයට වගා බිම් ප්‍රමාණය අඩු වීම වී නිෂ්පාදනය සඳහා දැඩි ව බලපා නොමැත. ඉඩම් බෙදීයාමේ ප්‍රතිඵලයක් ලෙස පසු ගිය දශක දෙක තුළ කෘෂිකාර්මික ඉඩම් හිමියන් ගේ සංඛ්‍යාව 1982 දී මිලියන 1.8 සිට 2002 වර්ෂය වන විට මිලියන 3.3 දක්වා වර්ධනය වී ඇත.

3.0 වාරිමාර්ග කටයුතු කළමනාකරණය සහ ඒ සඳහා පනවා ඇති අණ පනත්

වාරි අංශය, ජල කළමනාකරණය, භාවිතය ආදී බොහෝ කරුණු සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පනත්, ආඥා පනත් සහ විධි විධාන පනවා ඇත. මේවායින් බොහොමයක් වර්තමාන සන්දර්භය තුළ ජල භාවිත අංශයන් හි පවතින ප්‍රශ්න සහ ගැටලු ආමන්ත්‍රණය නො කරන, යල් පැන ගිය ඒවා වේ. වාරි කෘෂිකර්මාන්තය පිළිබඳ සැලකීමේ දී වාරිමාර්ග ආඥා පනත (1900, 1946), මහවැලි අධිකාරී පනත (1978) ගොවිජන සේවා පනත් (1978, 1991, 2000) බෙහෙවින් වැදගත් වේ. වාරිමාර්ග ආඥා පනත යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ දිස්ත්‍රික් ලේකම්ට ද, මහවැලි අධිකාරී පනත යටතේ මහවැලි සංවර්ධන අධිකාරියට ද, ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ද වගකීම් පවරා ඇත. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට 1987 දී සිදු කරන ලද දහ තුන් වැනි සංශෝධනය මඟින් සුළු වාරිමාර්ග සම්බන්ධ වගකීම් සහ බලතල පළාත් සභාවන්ට පැවරීමෙන් මෙම තත්ත්වය වෙනසකට භාජනය විය.

සාම්ප්‍රදායික ව වාරි කර්මාන්තවල මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ කටයුතු ගොවීන් ගේ වගකීමක් වූ අතර වෙල් විදානේ විසින් ජලය බෙදා හැරීම, අධීක්ෂණය, නඩත්තු කටයුතු සහ සුළු ප්‍රතිසංස්කරණ කටයුතු පැවරීම, ගැටලු සමතයකට පත් කිරීම සිදු කරන ලදී. ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ වාරි ජලය සම්බන්ධයෙන් වන විශේෂත්වය වන්නේ එය ගාස්තුවකින් තොර ව සැපයීමයි. වාරි කළමනාකරණය සඳහා ප්‍රතිලාභීන් ගේ සහභාගීත්වයේ වැදගත්කම පිළිගැනීමෙන් පසු ව 1980 දශකයේ මුල් භාගයේ සිට වාරි ව්‍යාපාර සැලසුම්කරණය, ප්‍රතිසංස්කරණය, මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ කටයුතු ආදී සියලු ම කාර්යයන් හි දී ප්‍රතිලාභීන් ගේ සහභාගීත්වය ලබා ගැනීමට රජය කටයුතු කරනු ලැබිණි. "සහභාගීත්ව කළමනාකරණය" ප්‍රතිපත්තියක් ලෙස 1989 දී රජය විසින් පිළිගැනීමෙන් පසු ව ගොවිජන සේවා පනතට 1991 දී සිදු කරන ලද සංශෝධනය අනු ව ගොවි සංවිධානවලට නිල පිළිගැනීමක් ලැබිණි. මෙය නිවැරදි දිශාවට සිදු කරන ලද වැදගත් ආරම්භයක් වුව ද පිහිටු වනු ලැබූ ගොවි සංවිධාන සඳහා අනුගමනය කළ යුතු උපක්‍රමයක් හෝ මාර්ගෝපදේශයක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට සපයා නො තිබිණි. 1996

දී ආසියානු සංවර්ධන බැංකුව, ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ නෙදර්ලන්ත රජයේ තාක්ෂණික සහාය සහිත ව ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය (National Water Resources Secretariat) පිහිටු වන ලදී. ජලය භාවිතා කරන සියලු ම අංශ පිළිබඳ එම ආයතනය විසින් සිදු කරන ලද අධ්‍යයනයකින් පසු ව ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සකස් කර අනුමැතිය සඳහා රජයට ඉදිරිපත් කරන ලදී.

4.0 අතීත කාර්ය සාධන

4.1 ශ්‍රී ලංකාවේ වී (සහල්) නිෂ්පාදනය.

නියඟය නිසා මෙරට වගා කළ බිම් ප්‍රමාණය අඩු වීමෙන් සිදු වු කෙටි කාලීන අඩු වීම් කිහිපයක් හැරුණු කොට 1952 සිට නො කඩවා වී නිෂ්පාදනය ස්ථායි වර්ධනයක් පෙන්නුම් කරයි. වසරින් වසර වී අස්වැන්න වැඩි වු අතර 2004 යල කන්නයේ දී ප්‍රථම වරට මෙට්‍රික් ටොන් 4.2 ක වාර්තාගත අස්වැන්නක් ලැබිණි. ගුණාත්මක තත්ත්වයේ බීජ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත තාක්ෂණ පොදිය ආදේශ කිරීම මේ ආකාරයට අස්වැන්න වර්ධනය කිරීමට දායක විය. වාරි ජල හිඟය නිසා ආන්තික ඉඩම් කන්න දෙකෙ හි ම වගා කිරීමට නො හැකි වීම ද මෙම තත්ත්වය කෙරෙහි වාසිදායක අයුරින් බලපානු ලැබු සාධකයක් විය.

බීජ, පොහොර සහ තාක්ෂණය සමග බැඳුණු වාරි කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ දී ඉතා වැදගත් උපක්‍රමයක් බව ඉහත තොරතුරුවලින් අනාවරණය වේ. වාරිමාර්ග සංවර්ධනය මෙරට වී නිෂ්පාදනය නො කඩවා ඉහළ යාම කෙරෙහි බලපානු ලැබු අතර මෙය සහල් ආනයනය සැලකිය යුතු අන්දමකින් අඩු වීමටත්, 1950 දී 30%ක් වු සහල්වලින් ස්වයං පෝෂිත තත්ත්වය, 1995 දී 100% දක්වා ද, 2003 දී 98% දක්වා ද වැඩි වීමට බලපා ඇත(ප්‍රස්ථාර අංක 02). නමුත්, දැඩි නියං තත්ත්වය හමුවේ වගා කළ බිම් ප්‍රමාණය 21% න් පහළ වැටීම නිසා 2004 වසරේ දී වී නිෂ්පාදනය 2003 වර්ෂයට වඩා 14.4% කින් පහළ වැටිණි.

ප්‍රස්තාර අංක 02: ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයල සහල් ආනයනය සහ ස්වයංපෝෂිත භාවය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව 2002-2004,
කිකුචි සහ තවත් අය, 2002

පසු ගිය දශක හතරක කාලය තුළ මෙම ක්ෂේත්‍රයේ කාර්ය සාධනය වරින් වර උච්චාවචනයට ලක් වුව ද ස්ථායි වර්ධනයක් පවත්වා ගැනීමට හැකි විය. මෙවැනි ජයග්‍රහණ මධ්‍යයේ වුව ද, ස්වාභාවික උපද්‍රව, තාක්ෂණය ලබා දීමේ පරතරයන්, අවම ආයෝජනය, ගුණාත්මක තත්ත්වයේ යෙදවුම්වල හිඟය, මූල්‍ය හිඟය, ප්‍රවාහන සහ අලෙවි ගැටලු, වෙළඳ සහ ආනයන, අපනයන ප්‍රතිපත්තිවල පවතින අඩුපාඩු නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ගැටලු මතු වී ඇත. පසු අස්වනු නාස්තිය, අඩු ශ්‍රම ඵලදායිතාව, නිෂ්පාදකයින් ගේ අසහනය, ශ්‍රමය පිටතට ගලා යෑම, දුර්වල කෙත් බිම් කළමනාකරණය, අස්වැන්න සඳහා වෙළඳපොළේ පවතින අඩු මිල ගණන් නිසා ආයෝජනවලට සරිලන ප්‍රතිලාභ හීන වීම, ජලය භාවිතා කරන්නන් තුළ ඔවුන් වටිනා වැදගත් සහ ක්ෂය වන සම්පතක් භාවිතා කරන බවට තිබිය යුතු අවබෝධය හීන වීම මෙම ක්ෂේත්‍රයේ ගැටලු මතු කරවනු ලබයි. වර්තමානයේ මෙරට ගෘහ ඒකක මිලියන 4.5 ක් පමණ පවතින අතර මිලියන දහ නවයකට ආසන්න ජනගහනයක් වෙසේ. ජනගහන වර්ධනය 1.1% ක් වන අතර 2020 වන විට මිලියන විසි තුනකට ආසන්න ජනගහනයක් අපේක්ෂිත ය. ජනගහන වර්ධනය ත්, ආහාර පරිභෝජන රටාව ත් මේ ආකාරයට දිගට ම පැවතියහොත් වාර්ෂික ව මෙට්‍රික් ටොන් මිලියන 2.3 ට ආසන්න සහල් ප්‍රමාණයක් (වී මෙට්‍රික් ටොන් මිලියන 3.5) මෙරට ආහාර අවශ්‍යතා සඳහා අවශ්‍ය වනු ඇත. මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා අවශ්‍ය සම්පත් සහ විභවයන් රට තුළ පවතී. සහල්, ගෘහස්ත මට්ටමේ ආහාර සුරක්ෂිතතාවයේ ප්‍රධාන අංගයක් ලෙස ඉදිරි අනාගතය තුළ පවතින බව නිසැක ය.

4.2 වාරි කෘෂිකර්මාන්තයෙන් පාරිසරික පද්ධතියට වන අහිතකර බලපෑම්

වාරිමාර්ග සංවර්ධනයේ මූලික අපේක්ෂාව ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම වුව ද අතීතයේ දී එය පාරිසරික පද්ධතිය සමග මනා සබැඳියාවකින් පවත්වා ගෙන එනු ලැබිණි. පසු ගිය දශක කිහිපයක් තුළ දරිද්‍රතාව ඉහළ යෑම, ස්වභාවික සම්පත් අනිසි කළමනාකරණයට ලක් වීම, අසංවිධිත සංවර්ධන ක්‍රියාදාමයන් විසින් එම තත්ත්වය වෙනසකට භාජනය කර ඇත. තාක්ෂණයේ සහ දැනුමේ පවතින අඩු ලුහුඬුකම්, දේශපාලන හේතු, මූල්‍ය සම්පත් හිඟය හෝ නො සලකා හැරීම ආදී බොහෝ සාධක මෙම තත්ත්වයට බලපානු ලැබිය හැකි අතර දීර්ඝ කාලීන ව පාරිසරික පද්ධතිය සහ සංවර්ධනය බිඳ වැටීමට මෙය හේතු වේ.

වාරි කෘෂිකර්මාන්තයට කෙරෙන ආයෝජනයක් තුළින් ලැබෙන ප්‍රතිලාභ වර්ධනය වුව ද, නිශ්චල ජලය කෙත් බිම්වල රැඳීම සහ පසෙ හි ලවණතාව වැඩි වීම, අඩු අස්වැන්න, අවම මිල සහ වෙළෙඳපොළ පහසුකම්වල පවතින දුර්වලතා වාරිමාර්ග ව්‍යාපාරවල තිරසාරත්වය සහ ඵලදායීතාව කෙරෙහි බාධා මතු කරනු ලබයි. ගොවි බිම්වලින් මුදා හරිනු ලබන අධික සල්ෆේට් සහ පොස්ෆේට් ද, කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරනු ලබන කෘෂි රසායනික සහ පොහොර හේතුවෙන් ජෛව විවිධත්වය සහ පස සැලකිය යුතු වෙනස්කම්වලට ලක් වීම ත්, ජලය දූෂණය වීම ත් සිදු වේ. මෙයට අමතර ව පාංශු ඛාදනය, අධික ලෙස භූ ගත ජලය පොම්ප කිරීම නිසා භූ ගත ජල මට්ටම පහළ වැටීම, භූ ගත ජලයේ ගුණාත්මකභාවය පිරිහීම ආදී අහිතකර බලපෑම් රාශියකට පරිසරය මුහුණ දෙනු ලබයි. මෙම වාතාවරණය හමුවේ වර්තමාන යැපුම් කෘෂිකර්මාන්තය, පාරිසරික වශයෙන් තිරසාර, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් සාධනීය කෘෂිකර්මයක් කරා පරිවර්තනය විය යුතු ය.

4.3 ජල කළමනාකරණයේ වර්තමාන තත්ත්වය

සාම්ප්‍රදායික ව ජල ඉල්ලුම සඳහා වන විකල්ප කෙරෙහි හෝ ජල භාවිතයේ කාර්යක්ෂමතාව වර්ධනය කෙරෙහි හෝ ප්‍රමාණවත් අවධානයකින් තොර ව සියලු දෙනා ම සංතෘප්ත කිරීම උදෙසා සැපයුම ඉලක්ක කරගනිමින් ජල කළමනාකරණය කෙරිණි. ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම, රැකියා උත්පාදනය, දුප්පත්කම තුරන් කිරීම, ආර්ථික වර්ධනය ආදී කාර්යයන් රාශියක් හරහා මෙය ක්‍රියාවට නංවන ලදී. මෙම අරමුණු යම් පමණකින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ බව සත්‍යයක් වන නමුදු ජල භාවිතයේ කාර්යක්ෂමතාව සහ නොයෙකුත් ප්‍රතිෂේධාත්මක බලපෑම් ද ඇති විය. මේ තුළින් ජල කළමනාකරණයේ

නියුතු වෘත්තිකයන්ට මෙන් ම සමාජයට ද, මුල් කාලීනයන් මුහුණ නො දුන් ආකාරයේ අභියෝග සහ ගැටලුවලට මුහුණ දීමට සිදු වී තිබේ.

වාරි සහ ජල කළමනාකරණය සම්බන්ධ ආයතන රාශියක් පැවතීම නිසා වගකීම් අතිපිහිත වීම (Overlapping) සහ ඛණ්ඩනය වීම සිදු වේ. මෙය කාර්යක්ෂ ම ජල කළමනාකරණයක් සඳහා අහිතකර ලෙස බලපෑම් කරනු ලබයි. ජල කළමනාකරණයෙන් අපේක්ෂිත උසස් ප්‍රතිඵල ලබා ගැනීමට නම්, අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන අතර සමීප සහයෝගීතාවක් සහ කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට සිදු වනු ඇත.

5.0 වාරි කෘෂිකර්මාන්තයේ අනාගතය

5.1 නව වාරි ව්‍යාපාර සඳහා වන ප්‍රවණතාව

නව වාරි මාර්ග සංවර්ධනය යනු අති විශාල ආයෝජනයක් සහ පුනරාවර්තන වියදම් දැරීමට සිදු වන කාර්යයක් වන අතර ඉදි කිරීම්වල දී, වන සත්ත්ව සම්පත් ඇතුළු විශාල භූමි ප්‍රමාණයක් අහිමි වීම ත් සිදු වන්නකි. එමෙන් ම පාරිසරික පරිහානීන් සහ යටිගම් ප්‍රදේශවල ජලයේ ගුණාත්මක භාවයට සහ ජෛව විවිධත්වයට ද මෙවැනි නිර්මිත හරහා තර්ජන මතු වේ. මෙවැනි කරුණු සේ ම 1980 දශකයේ මැද භාගයේ සිට වෙළෙඳපොළේ සහල් සඳහා ලැබෙන මිල අඩු වීම ද නව වාරි කර්මාන්ත ඉදි කිරීම් කෙරෙහි රජය මෙන් ම අන්තර් ජාතික ආධාර ආයතන ද අධෛර්යමත් කර ඇත.

නව වාරි ව්‍යාපාර බිහි කරන්නේ නම් ඒවායේ ඵලදායිතාව අත්පත් කර ගැනීම සඳහා ජලය වඩා පිරිමැසුම්දායක ව භාවිතා කරන කෘෂිකාර්මික භාවිතාවන්ට යොමු විය යුතු අතර ජලය බෙදා හැරීම සඳහා පවතින යටිතල පහසුකම් නවීකරණය කිරීම කළ යුතු ය. ජල කළමනාකරණය සේවා අරමුණු කරගත් සහ භාවිතා කරන්නන් ගේ සහභාගීත්වය සහිත ව පිරිවැය ඵලදායිතාව (Cost Effective) ඉහළ නැංවෙන ආකාරයේ වැඩ පිළිවෙළක් තුළින් වාරි තාක්ෂණය ඉහළ නැංවීම කළ යුතු වේ.

5.2 වාරි කෘෂිකර්මාන්තයේ අනාගතය

ආහාර ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම නිරන්තරයෙන් ඉහළ යන අතර එය සෑම විට ම දේශපාලන න්‍යාය පත්‍රයේ ප්‍රමුඛස්ථානය ගන්නා අංශය ලෙසින් ඉස්මතු වනු ඇත. මෙම අංශය මෙරට ග්‍රාමීය ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරන අතර විශාල ත ම ජල පරිභෝජකයා ද වනු ඇත. මේ නිසා ම මෙම අංශයට අනෙකුත් අංශ සමග දැඩි තරගයකට මුහුණ දීමට සිදු වේ. තව ද, අඩු ශ්‍රම ඵලදායිතාව, රසායනික පොහොර සහ කෘෂි රසායනික සඳහා වන සාපේක්ෂ ඉහළ පිරිවැය සහල් නිෂ්පාදනයේ පිරිවැය පහළ නො යෑම කෙරෙහි බලපානු ඇත. මෙම අංශයේ ඵලදායිතාවට වඩා වැඩි වේගයෙන් ශ්‍රමය සඳහා වූ ගෙවීම් වර්ධනය වීම ත්, කර්මාන්ත සහ සේවා අංශයට වඩා මෙම අංශයේ ඵලදායිතාව බොහෝ සෙයින් අඩු වීම ත් සිදු වනු ඇත. මෙවැනි තත්ත්වයක් හමුවේ දේශීය කෘෂිකාර්මික අංශය, විශේෂයෙන් ම වර්ෂා පෝෂිත කෘෂිකර්මාන්තයේ වගා බිම් ප්‍රමාණය මෙන් ම අස්වැන්න ද අඩු වීමකට මේ වන විට ද මුහුණ දී ඇත. ජල පරිභෝජනයේ ඵලදායිතාව, ශ්‍රම ඵලදායිතාව, භෝග තාක්ෂණය සහ පාරිසරික ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීමට ක්‍රියා කිරීම අනාගත වාරි කෘෂිකර්මාන්තයේ යහ පැවැත්ම සඳහා හේතු වනු ඇත.

මේ සඳහා, පවතින වාරි යටිතල පහසුකම් නවීකරණය, නව තාක්ෂණය හඳුන්වා දීම, නඩත්තු සහ මෙහෙයුම් වැඩි දියුණු කිරීම ආදී අංශ සඳහා ලිබරල්කරණය වූ ආර්ථික කොන්දේසි යටතේ ආයෝජන සිදු කළ යුතු වේ. මෙම අභියෝගයට මුහුණ දීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන යොදවා ගැනීම වඩාත් යෝග්‍ය සහ ශක්‍යතාවෙන් යුක්ත වනු ඇත. එමෙන් ම මෙම අංශයේ ඵලදායිතාව වර්ධනය අරමුණු කර ගත් පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන් ක්‍රියාත්මක කිරීමට සිදු වනු ඇත.

පුස්තකාලය
LIBRARY
ගො.කෘ.ප.ආ.ආ., ප.පු.ආ.
HARTI

දුර්වල මෙහෙයුම් සහ නඩත්තු නිසා පරිහානියට පත්වන වාරි පද්ධති ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපනය කිරීම සඳහා විශාල ආයෝජන අවශ්‍ය වන අතර අවිධිමත් ආයෝජනය සහ දූෂණයට වන මං ඇහිරීම මෙම ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ඉවහල් වනු ඇත. එමෙන් ම ස්ථාවර කෘෂිකාර්මික සහ වෙළඳ ප්‍රතිපත්තිවල ආශිර්වාදය සහිත ව සහනාධාර ගොවිතැනින් වාණිජමය ගොවිතැන දක්වා මෙම අංශය අනාගතයේ දී විතැන් විය යුතු ය.

6.0 ප්‍රධාන අභියෝග

වසර 2020 වන විට මෙරට ජනගහනය මිලියන 23 ට ආසන්න වන බවට ඇස්තමේන්තු කර ඇත. වැඩි වන ජනගහනයට සාපේක්ෂ ව නාගරීකකරණය සහ කාර්මිකකරණය ද වර්ධනය වනු ඇත. එවන් වර්ධනයක් තුළ සියලු ම අංශවලට පිරිසිදු ජලය සඳහා වන ඉල්ලුම සපුරාලිය නො හැකි තරම් ඉහළ යනු ඇත. මෙය ජාතික මට්ටමේ දී මෙන් ම පළාත් මට්ටමේ දී අදාළ අංශවලට මුහුණ දීමට සිදුවන ප්‍රධාන අභියෝගයක් වනු ඇත. මෙයට අමතර ව, ජාතික තලයේ දී සහ පළාත් මට්ටමින් පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දීමට සිදු වනු ඇත.

6.1 ජාතික මට්ටම

- ජලය භාවිතා කරන අනෙකුත් අංශයන්ට අවස්ථාවක් ලබා දී අඩු ජල ප්‍රමාණයක් භාවිතා කිරීම සහ ඔවුන් සමග ඒකාබද්ධ වීම
- භෞතික පද්ධති සහ මානව පද්ධති ඒකාබද්ධ කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සම්පාදනය කිරීම
- වාරි කළමනාකරණ කටයුතුවල සහ වාරි සේවාවන්වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම
- ජලයේ ඵලදායිතාව නංවාලීම උදෙසා වාරි ජල භාවිතයේ කාර්යක්ෂමතාව සහ භෝග කළමනාකරණය වැඩි දියුණු කිරීම
- පාරිසරික හානිය අවම කිරීම
- ආයෝජනය සඳහා සම්පත් සපයා ගැනීම

6.2 පළාත් සහ දිස්ත්‍රික් මට්ටම

6.2.1 සංවර්ධන සැලසුම් සම්පාදනයේ දී මතු වන ගැටලු

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රමුඛතා පෙළ ගැස්වීම සහ ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් ගැටලු මතු වේ. එනම්, පළාත් වාරිමාර්ග සඳහා ලැබෙන ඉතා සීමිත මුදල් ප්‍රමාණය පළාතේ සංවර්ධනය සහ ජන ජීවිතය සමග එක හා සමාන වැදගත්කමක් උසුලන විශාල වාරි පද්ධතියක, උවමනාවන් සංතෘප්ත කිරීම උදෙසා කෙසේ බෙදා හරින්නේ ද? යන ගැටලුව මතු වේ.

6.2.2 ග්‍රාමීය (සුළු) වාරිමාර්ග පද්ධති කළමනාකරණය සම්බන්ධයෙන් පැන නගින ගැටලු

සුළු වාරිමාර්ග සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන රාශියක් පවතින අතර, ප්‍රායෝගික මට්ටමේ දී, ගම්බද ජනතාව ගේ ජීවනාලිය වන මෙම වාරි පද්ධතිවල නීත්‍යනුකූල භාරකාර ආයතනය කුමක් ද? යන්න පිළිබඳ ව නිරවුල් බවක් දැකිය නො හැක. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දහ තුන් වැනි සංශෝධනයෙන් සුළු වාරිමාර්ග සම්බන්ධ බලතල පළාත් සභා වෙත පවරා ඇති අතර, 2000 ගොවිජන සංවර්ධන පනත අනු ව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ද මෙයට අමතර ව සමෘද්ධි අධිකාරිය, රාජ්‍ය නො වන සංවිධාන, වාරි මාර්ග දෙපාර්තමේන්තුව ආදී වෙනත් රාජ්‍ය ආයතන ද මෙම ක්ෂේත්‍රයට මැදිහත් වීම් සිදු කරනු ලබයි. මේ නිසා ප්‍රධාන වශයෙන් ගැටලු දෙකක් පැන නැගී ඇත. එනම් අත්‍යවශ්‍යයෙන් ප්‍රතිසංස්කරණය හෝ නඩත්තු කළ යුතු ව්‍යාපාර අත්හැරීම සහ කිසිවෙකු ගේ අවධානයට යොමු නො වීම ත්, ඇතැම් ව්‍යාපාරවල කටයුතු නැවත නැවත ත් අතිපිහිත වන පරිදි (Overlapping) ඉටු කිරීම ත් ය.

සංවර්ධන වැඩසටහන් සම්පාදනයේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය නො කිරීම නිසා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ සහ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ගැටලුවලට මුහුණ දීමට පළාත් සභාවන්ට සිදු වී ඇත. පවතින සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගනිමින් අවශ්‍යතා සහ ගැටලු හඳුනාගෙන නිවැරදි මිණුම් දඬු භාවිතා කරමින් ප්‍රමුඛතා පෙළ ගැස්විය යුතු ය. එවැනි ක්‍රමවේදයක් තුළින් මෙම ගැටලුව මගහරවා ගැනීමට හැකි වනු ඇත.

සැලසුම් සම්පාදනයේ දී පළාත් සභා මුහුණ දෙන තවත් ගැටලුවක් වන්නේ වැඩ විෂයයන් කාල රාමුවකට යොමු නො කර සියල්ල කඩිනම් සංවර්ධන වැඩසටහන් ලෙස නම් කිරීම ය. මේ නිසා මානව සහ භෞතික සම්පත් යොදවා ගැනීම සහ කාර්යයන් නිසි කාලසීමාව තුළ ඉටු කිරීමට නො හැකිවීම යන ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. අනික් අතට සංවර්ධන වැඩසටහන්වල නිතර නිතර සිදුවන වෙනස්වීම් නිසා සැලසුම් සම්පාදකයින් ඉමහත් දුෂ්කරතාවන්ට මුහුණදෙනු ලබයි. සැලසුම් සම්පාදනය ආශ්‍රිත ව පැන නගින අනික් ගැටලුව වන්නේ තාක්ෂණික ඇගයීම් සිදු නො කර සැලසුම් සම්පාදනය කිරීමට සිදු වීම ය. කාර්යය මණ්ඩල, ප්‍රවාහන සහ මූල්‍ය සම්පත්වල පවතින හිඟකමත්, සියලු ම කාර්යයන් පාහේ කඩිනම් සංවර්ධන වැඩසටහන් ලෙස නම් කිරීමත් මත මෙවැනි ගැටලු පැන නගී. මේ අනු ව සමීක්ෂණ මෙන් ම මැණුම් කටයුතු නිසි පරිදි ඉටු කිරීමට නො හැකි වීම සිදු වේ. මෙම තත්ත්වය යටතේ සම්මත ක්‍රමවේද සහ උපදෙස්වලින් බැහැර ව ඉතා කෙටි කාලයක් තුළ වැඩසටහන් විශාල සංඛ්‍යාවකට යෝජනා සහ ඇස්තමේන්තු සකස් කිරීමට පළාත් කාර්යය මණ්ඩලයට සිදු වේ.

6.2.3 සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන ගැටලු

සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ප්‍රධාන ගැටලුව වන්නේ අවශ්‍ය වේලාවට මූල්‍ය ප්‍රතිපාදන නො ලැබීම ය. වර්ෂයේ යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලැබීමට බොහෝ විට මාස හතරක් පමණ ගත වේ. ඉන් පසු ව එළඹෙන මාස හතරක පමණ කාලය මූලික විමර්ශන වාර්තා, ඇස්තමේන්තු සකස් කිරීම ආදිය සඳහා වැය කිරීමට සිදු වේ. තවත් මාස 1-2 අතර කාලයක් ටෙන්ඩර් කැඳවීම සහ ඇගයීම් කටයුතු සඳහා වැය කිරීමට සිදු වේ. මේ අනු ව සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි වන්නේ ඉතා ම සීමිත කාලයකි. ඉදිකිරීම් කටයුතුවල ආරම්භය ම ප්‍රමාද වන හෙයින්, වර්ෂය තුළ නියමිත වැඩ කටයුතු නිසි පරිදි ඉටු කිරීමට නො හැකි වේ.

ඉදිකිරීම් කටයුතු සඳහා පවතින කාල සීමාව ප්‍රමාණවත් නො වන හෙයින්, සුදුසුකම් සහිත ආයතන ඉදිකිරීම් සඳහා ඉදිරිපත් නො වේ. අනෙක් අතට ඉදිරිපත් වන ආයතන පවා ප්‍රමාණවත් සහයෝගයක් ලබා නො දීම සහ කැපවීමක් නො වීම නිසා නියමිත කාලය තුළ වැඩසටහන් යොමු කිරීමට නො හැකි වේ.

සුපරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩල, වාහන වැනි භෞතික සම්පත්වල හිඟය ඉදිකිරීම සඳහා වන සීමිත කාලය සුදුසුකම් සහිත ආයතන ඉදිරිපත් නො වීම ආදී සාධක ගණනාවක බලපෑම නිසා ඉදිකිරීම් කටයුතු නියමිත ගුණාත්මක තත්ත්වයෙන් සිදු කිරීමට නො හැකි වීම ද මෙම ක්ෂේත්‍රයේ දී පළාත් සභා මුහුණ දෙන ගැටලුවකි. මෙම ගැටලුව නිසා ජනතාව අතර පළාත් සභා කෙරෙහි වන විශ්වාසය පළුදු වීම සහ නැවත නැවත ත් ඉල්ලීම් ඉදිරිපත් වීම සිදු වේ.

6.2.4 ආයතනික සංවර්ධනය සහ ප්‍රතිලාභී සහභාගීත්වය

වාරි කර්මාන්තවල සැබෑ උරුමකරුවා වන්නේ ජනතාව ය. මේ නිසා ඒවා ප්‍රතිසංස්කරණ සහ නඩත්තු කටයුතුවල දී එම පාර්ශවයේ සහභාගීත්වය එය සාර්ථක කරගැනීමට බොහෝ සෙයින් ඉවහල් වේ. එම සහභාගීත්වය ලබාගැනීමට හැකි වන්නේ අදාළ ගොවි සංවිධාන මගිනි. එසේ වුව ද ප්‍රායෝගික මට්ටමේ

බොහෝ ගොවි සංවිධාන අක්‍රීය වූ, අවශ්‍ය සහයෝගය ලබා දීමට නො හැකි තත්ත්වයක පසු වේ. අනෙක් අතට ගොවි සංවිධාන පිළිබඳ නීත්‍යනුකූල බලය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට හිමි වේ. මේ නිසා පළාත් සභාවලට ගොවි සංවිධානවල සහයෝගය ලබාගැනීමේ දී ද විවිධ ගැටලු සහ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වේ.

ප්‍රතිලාභී ජනතාව අතර වාරිමාර්ග සම්බන්ධ සියලු කටයුතු රජයෙන් ඉටුවිය යුතු ය යනුවෙන් පවතින ආකල්පය ද මෙම ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතුවල දී අහිතකර අන්දමින් බලපා ඇත. මේ හේතුවෙන් ගොවි සංවිධාන මට්ටමින් ඉටු කළ හැකි සුළු නඩත්තු කටයුතු පවා ඒවායින් ඉටු නො වන අතර අවසාන වශයෙන් එය සැලකිය යුතු අන්දමේ ප්‍රතිසංස්කරණ කාර්යයක් බවට පත් වේ.

වැව් රක්ෂිත සහ ජල මූලාශ්‍ර ආරක්ෂා කරගැනීමේ වැදගත්කම පිළිබඳ බොහෝ විට ජනතාව තුළ පවතින්නේ අඩු සැලකිල්ලකි. මෙම ක්ෂේත්‍රයේ ගැටලු මතු කිරීමට එය ද එක් හේතුවක් වී ඇත. එවැනි අවස්ථාවල ගොවි සංවිධාන සක්‍රීය මැදිහත්වීමක් සිදු කරන්නේ නම් වැව් ගොඩවීම සහ ඒ ආශ්‍රිත මතුවන ගැටලුවලින් බොහොමයක් පාලනය කිරීමේ හැකියාව පවතී.

වාරිමාර්ග ඉදිකිරීම් සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ව ගොවි සංවිධානවලට ප්‍රමාණවත් දැනුමක් සහ අත්දැකීම් නො වීම ද මෙම ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල දී පළාත් සභා මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. මෙම ගැටලුවලට අමතර ව සංවර්ධන කටයුතුවල දී සිදු වන දේශපාලන ඇඟිලි ගැසීම් නිසා විවිධ ගැටලු මතු වේ. එම ගැටලු නිරාකරණය කිරීම පළාත් සභා නිලධාරීන් මුහුණ දෙන අමතර අභියෝගයක් වී ඇත.

7.0 සමාප්තිය

සියවස් ගණනාවක් තිස්සේ අද්විතීය වාරි ශිෂ්ටාචාරයකට උරුමකම් කියන මෙරටේ, ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම උදෙසා වාරි කෘෂිකර්මාන්තය විශාල කාර්ය භාරයක් ඉටු කොට ඇත. නිදහසින් පසු යුගයේ දී වාරි කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා සුවිශාල ආයෝජනයක් මෙන් ම ප්‍රයත්නයක් ද දරනු ලැබිණි. කෙසේ වුව ද 1980 දශකයේ මැද භාගයේ සිට විවිධ හේතු සාධක නිසා නව වාරි කර්මාන්ත ඉදිකිරීම් කෙරෙහි රජය මෙන් ම ආධාර ලබා දෙන අන්තර් ජාතික ආයතන ද යොමු වීමට එතරම් උද්යෝගයක් නො දක්වන බව පෙනේ.

ජනගහන වර්ධනයත් සමග ආහාර සඳහා වන ඉල්ලුම ද ඉහළ යන හෙයින් එම අවශ්‍යතා සපුරාලීම සඳහා වාරි ජල අංශයේ සංවර්ධනය අත්‍යවශ්‍ය සාධකයක් වේ. එමෙන් ම වාරි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ජල පරිභෝජනයේ ඵලදායිතාව, ශ්‍රම ඵලදායිතාව, භෝග තාක්ෂණය සහ පාරිසරික ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීමට සිදු වනු ඇත.

සුළු වාරිමාර්ග නැතහොත් ගම්බද වාරිමාර්ග ප්‍රතිසංස්කරණ සහ නඩත්තු කටයුතු පිළිබඳ සලකා බැලීමේ දී ආයතන ගණනාවකට එහි වගකීම පැවරී ඇති බව නො රහසකි. මේ නිසා ම ඒවායේ භාරකාරත්වය සහ වගකීම පිළිබඳ ගැටලු පැන නැගී ඇත. අනෙක් අතට මෙම ආයතන අතර, සම්බන්ධීකරණයක් නො වීම නිසා ද විවිධ ගැටලු මතු වේ.

වාරිමාර්ග කටයුතු ඉටු කිරීමේ දී ඒ සඳහා මුල්‍ය ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදය කාර්යය මණ්ඩල සහ වෙනත් භෞතික පහසුකම්වල හිඟය එම කාර්යයන් නිසි පරිදි ඉටු කිරීමට බාධාකාරී සාධක ලෙස බලපා ඇත. එමෙන් ම ප්‍රතිලාභීන් ගේ සහභාගීත්වයේ පවතින අඩුලුහුඬුකම් ද මෙම ක්ෂේත්‍රයේ කාර්යයන් ඉටු කිරීමේ දී බාධාකාරී සාධක වේ.

ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමෙන් සහ සම්පත් නිසි වේලාවට ප්‍රමාණවත් පරිදි ලබාදීමෙන් වාරිමාර්ග ක්ෂේත්‍රයේ කාර්යයන් ඉටු කිරීමේ දී පළාත් සභා මුහුණ දෙන ගැටලු බොහොමයක් නිරාකරණය කරගැනීමට හැකි වනු ඇත.

දිවයිනේ ග්‍රාමීය සහ නාගරික ජනතාව ගේ ආහාර අවශ්‍යතා සපුරාලිය යුතු හෙයින් ද ග්‍රාමීය ජනතාව යෙදවිය හැකි වෙනත් සුදුසු ජීවනෝපායක් නොමැති හෙයින් ද කෘෂිකර්මාන්තය තවදුරටත් මෙරට ග්‍රාමීය ජනතාව ගේ ප්‍රධාන ත ම ජීවනෝපාය වශයෙන් අඛණ්ඩ ව පවතී. තව ද දැකිය හැකි අනාගතයක් තුළ, මෙරට ග්‍රාමීය ජනතාව ගේ ප්‍රධාන ත ම ආහාරය සහල් වනු ඇත. වර්තමාන ලාංකීය ජනගහනයටත් අනාගත (අවම වශයෙන් මීළඟ දශක දෙකක) ජනගහනයටත් අවශ්‍ය ආහාර නිෂ්පාදනය කිරීම සඳහා වන සියලු සම්පත් සහ අවශ්‍ය යටිතල පහසුකම් මෙරට තුළ ඇත. එම නිසා දැනට ජාතිය සතු ව ඇති වාරි කෘෂිකර්මාන්තයට අදාළ සම්පත් සහ යටිතල පහසුකම් මනාව නඩත්තු කර පවත්වා ගැනීමත් ඒවා කළමණාකරණය කිරීමේ දී භෞතික සහ මානව සම්පත් ඒකාබද්ධ කර යහපාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීමත් අත්‍යවශ්‍ය වනු ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ වාරි කර්මාන්ත ඉදි කිරීම් සහ නඩත්තු කාර්යයන් හි දී පළාත් සභා මුහුණ දෙන ගැටලු සහ දුෂ්කරතා

ජානක විජේකෝන්
ඉංජිනේරු
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය
ඌව පළාත් සභාව

සංක්ෂේපය

1987 පළාත් සභා ස්ථාපිත කිරීමත් සමග සුළු වාරිමාර්ග සම්බන්ධ බලතල පළාත් සභා වෙත පැවරිණි. එසේ වුව ද එම බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභා බොහෝ ගැටලුවලට මුහුණ දෙනු ලබයි. මෙම ලිපිය තුළින් වාරිමාර්ග ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් මූලික විමර්ශන අවස්ථාවේ සිට ඉදි කිරීම් අවසන් වීම දක්වා වූ ක්‍රියාදාමය තුළ පළාත් සභා මුහුණ දෙන ගැටලු සහ දුෂ්කරතා පිළිබඳ සාකච්ඡා කෙරේ. එහි දී මූල්‍ය, මානව සහ භෞතික සම්පත් හිඟය මෙන් ම ගොවීන් ගේ අඩු සහභාගීත්වය, ජල කළමනාකරණය පිළිබඳ පවතින අඩු දැනුම ආදිය පිළිබඳ ව ද අවධානය යොමු කෙරේ.

1.0 හැඳින්වීම

මෙරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සිදු කරනු ලැබූ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් සුළු වාරිමාර්ග සම්බන්ධ ව බලතල පළාත් සභාවට පවරා ඇත. ඒ අනු ව නව වැනි උපලේඛනයේ II වැනි ලැයිස්තුවේ 9.2 වගන්තිය අනු ව සුළු වාරිමාර්ග නඩත්තුව සහ ප්‍රතිසංස්කරණ පළාත් සභා වෙත පැවරී ඇත. මෙයට අමතර ව නව වැනි උපලේඛනයේ තෙවැනි ලැයිස්තුවේ 17.1 වගන්තිය අනු ව ජලය රැස් කර තබා ගැනීම සහ පාලනය, ජල ප්‍රවාහනය සහ වේලි, ගංවතුරින් ආරක්ෂා කර ගැනීමේ සැලසුම් සකස් කිරීමේ අයිතිය පළාත් සභා වෙත හිමි වේ.

වසර විස්සක පමණ කාලයක් තිස්සේ පළාත් සභා විසින් ඉහත සඳහන් බලතල සෙමින් නමුත් ක්‍රියාවට නංවා ඇත. පළාත් සභාවලට අමතර ව සුලු වාරිමාර්ග සම්බන්ධයෙන් තවත් ආයතන රාශියක් මැදිහත් වීම් සිදු කරන අතර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඉන් ප්‍රධාන වේ. මෙයට අමතර ව සමෘද්ධි අධිකාරිය, රාජ්‍ය නො වන සංවිධාන, ජාතිය ගොඩ නැගීමේ අමාත්‍යාංශ වැනි ආයතන සුලු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා බොහෝ විට මැදිහත් වේ.

2.0 ඉදිකිරීමේ අනුගමනය කරන ක්‍රමවේදය සහ ගැටලු

2.1 මූලික විමර්ශන

වාරිමාර්ග ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කෘෂිකර්ම කමිටු, ගොවි සංවිධාන ආදී සංවිධාන හරහා මෙන් ම දේශපාලන අධිකාරිය හරහා ද පළාත් අමාත්‍යාංශය වෙත ඉල්ලීම් යොමු වේ. වාරිමාර්ග ඉදි කිරීමක දී ප්‍රථමයෙන් ම මූලික විමර්ශනයක් සිදු කොට අවශ්‍යතා හඳුනා ගැනීම කළ යුතු වේ. මෙහි දී අදාළ ගොවි සංවිධාන සමග මූලික සාකච්ඡා පවත්වා, කළ යුතු ඉදි කිරීම් හෝ ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීම සිදු කෙරේ. මෙම අදියරේ දී ගැටලු කිහිපයකට මුහුණ දීමට අදාළ අංශවලට සිදු වේ. එනම්,

i. පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ගොවි සංවිධාන අතර පැහැදිලි සහ සෘජු සම්බන්ධතාවක් නො වීම.

ගොවි සංවිධාන ස්ථාපිත කිරීම, ඒවායේ අධීක්ෂණය ආදී සියලු කටයුතු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතී. මෙම ආයතන දෙක පරිපාලන ව්‍යුහයන් දෙකක් යටතේ පවතින අතර ඒවා අතර සම්බන්ධීකරණය සඳහා නිලධාරීන් ගේ පෞද්ගලික සබඳතා සහ මැදිහත් වීම් හැරෙන්නට නිසි ක්‍රියාමාර්ගයක් හෝ ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැත. මෙම තත්ත්වය යටතේ ගොවි සංවිධාන සමඟ නිරන්තර ව පවත්වා ගෙන යන නිරවුල් සම්බන්ධතාවක් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට නොමැත. එවැනි තත්ත්වයක් හමුවේ මූලික විමර්ශන කටයුතුවල දී ගොවි සංවිධාන සම්බන්ධ කර ගැනීමේ දුෂ්කරතාවන්ට පළාත් අමාත්‍යාංශය මුහුණ දෙනු ලබයි.

ii. මූලික විමර්ශන සඳහා අරමුදල් වෙන් කිරීමේ ගැටලුව.

රජයේ මුල්‍ය නීතිවලට අනු ව මූලික විමර්ශන සඳහා වැය කරන මුදල එම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා වැය කළ මුදලින් නියමිත වූ ප්‍රතිශතය නො ඉක්මවිය යුතු ය. මේ අනු ව කිසියම් ව්‍යාපෘතියක මූලික විමර්ශනයක් සිදු කොට අතරමග පැන නගින ගැටලුකාරී තත්ත්වයක් හමුවේ එම ව්‍යාපෘතිය අත්හැර දැමුවහොත් හෝ අසාර්ථක වුවහොත් එහි මූලික විමර්ශන සඳහා වැය කළ මුදල පිළිබඳ විගණන ගැටලු පැන නගී. මෙම තත්ත්වය මූලික විමර්ශන කටයුතු සඳහා බාධාකාරී සාධකයක් වී ඇත.

iii. ප්‍රවාහන සහ ගමනාගමන දුෂ්කරතා

ඌව පළාත වර්ග කිලෝ මීටර 8,481 ක භූමි ප්‍රමාණයක පැතිරී පවතින බොහෝ විට කඳු සහ බෑවුම් ප්‍රදේශවලින් සමන්විත වූවකි. 1991 දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද වාරි කර්මාන්ත සංගණනයට අනු ව පළාතේ අත්හැර දමන ලද වැව් සංඛ්‍යාව 21,806 ක් වන අතර අත්හැර දැමූ අමුණු සංඛ්‍යාව 10,6555 කි. මෙම වාරි කර්මාන්තවලට අමතර ව දැනට භාවිතා කරන මට්ටමේ පවතින වැව් සහ අමුණුවල ද ප්‍රතිසංස්කරණ සහ යම් යම් ඉදි කිරීම් සඳහා වාර්ෂික ව ඉල්ලීම් ඉදිරිපත් වේ. මේ සියලු අවශ්‍යතා සඳහා මූලික විමර්ශන කටයුතු අනිවාර්යයෙන් ම සිදු කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය නිලධාරීන් ගේ හිඟයට සේ ම ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාවට ද පළාත් අමාත්‍යාංශය මුහුණ පා ඇත. එමෙන් ම ප්‍රදේශයේ පවතින කඳු, බෑවුම් සහිත භූ ලක්ෂණ ත්, දුෂ්කර බව ත් නිසා ගමනාගමන කටයුතු සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වේ. අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂ ව වැඩි කාලයක් වැය කිරීමට සිදුවීම ත් ප්‍රවාහන සහ යැපුම් දීමනා සඳහා වෙන් කළ හැකි මුදල් ප්‍රමාණය ඉතා ම ත් සීමිත වීම ත්, මේ සම්බන්ධ ව පැන නැගී ඇති ගැටලු තව දුරටත් තීව්‍ර කිරීමට සමත් වී ඇත.

2.2 සැලසුම් සම්පාදනය

දීර්ඝ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු වීම නිසා සැලසුම් සම්පාදනයේ දී ද තව දුරටත් ගැටලු පැන නගී. ඒවා පහත සඳහන් පරිදි වේ.

i. නව ව්‍යාපෘති ඉදි කිරීම් සඳහා යෝග්‍ය ගොවි සංවිධාන හෝ පුද්ගලයන් තෝරා ගැනීමට විශාල කාලයක් ගතවීම.

බොහෝ විට මෙවැනි ඉදි කිරීමේ ගොවි සංවිධාන හරහා සිදු කෙරේ. එහි දී සුදුසුකම්. සහ අත්දැකීම් සහිත ගොවි සංවිධාන තෝරා ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වේ.

ii. ඇස්තමේන්තුගත වියදම, උද්ධමනය හේතුවෙන් ඉහළ යාම.

iii. අවිච්ඡේද කර්මාන්ත

කර්මාන්ත සඳහා අනුමැතිය සහ මුදල් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වන හෙයින් බොහෝ විට කර්මාන්ත ආරම්භ කිරීම සිදු වන්නේ තුන් වැනි කාර්තුව අවසානයේ හෝ සිවු වැනි කාර්තුව මුල් භාගයේ ය. මේ හේතුවෙන් කර්මාන්තයේ වැඩ කටයුතු නියමිත කාලය තුළ නිම කිරීමට නො හැකි වන අතර සැලකිය යුතු ප්‍රමාණයක් ඉදිරි වර්ෂය සඳහා ඉතිරි වේ. එවන් අවිච්ඡේද කර්මාන්ත සඳහා මුදල් වියදම් කිරීම සඳහා නැවත අනුමැතිය ලබා ගැනීමට සිදු වන හෙයින් අනුමැතිය ලැබෙන තෙක් ඉදි කිරීම් කටයුතු නතර කිරීමට සිදු වේ. බොහෝ විට අනුමැතිය ලැබෙන විට අප්‍රේල් මස පමණ වේ. අනුමැතිය ලැබී වැඩ කටයුතු ආරම්භ කිරීමේ දී උද්ධමනය නිසා මුල් අවස්ථාවේ අනුමැතිය ලබා ගත් අය වැය තුළින් එම කාර්යයන් ඉටු කිරීමට නො හැකි තත්ත්වයක් උද්ගත වේ.

2.3 ඇස්තමේන්තු සකස් කිරීම.

සැලසුම් සම්පාදනයේ දී පැන නගින ගැටලුවලට අමතර ව කර්මාන්තය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී ද ගැටලු රාශියකට මුහුණ දීමට පළාත් අමාත්‍යාංශයට සිදු වී ඇත. එනම්,

i. පූර්ව විමර්ශන, සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු ව ඉතා සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයකින් කර්මාන්තවල වැඩ කටයුතු සිදු කිරීමට සිදු වේ. ඉල්ලීම් රාශියක් සඳහා ප්‍රතිචාර දැක්වීමට සිදු වන හෙයින් ලැබෙන ප්‍රතිපාදනවලින් බොහෝ විට කළ හැකි වන්නේ කර්මාන්තයකින් සුළු කොටසක් පමණි. මේ නිසා වාරි කර්මාන්ත සම්බන්ධ ව ලැබෙන ඉල්ලීම් දිනෙන් දින ඉහළ යන අතර ම ඒවා නිසි පරිදි ඉටු කර ගැනීමට නො හැකි වීමකට ද පළාත් සභාව මුහුණ දෙනු ලබයි.

ii. ගොවීන් ගේ සහභාගීත්වය අවම වීම.
ගොවි සංවිධානවලට මෙම කර්මාන්ත ක්‍රියාත්මක කිරීම සඳහා භාර දුන්න ද සත්‍ය වශයෙන් ම ගොවීන් ගේ සහභාගීත්වය අවම මට්ටමක පවතී. මේ නිසා කර්මාන්තයේ කටයුතු නිසි පරිදි අධීක්ෂණය වීමක් ප්‍රතිලාභීන් ගේ පාර්ශවයෙන් ද ඉටු නො වේ.

iii. අවශ්‍ය දත්ත නොමැති වීම.
වාරි කර්මාන්ත සඳහා අවශ්‍ය දිගු කාලීන දත්ත පද්ධතියක් නො වීම මෙම ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටලුවකි. මෙවැනි දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට ක්‍රමවේදයක් ද සකසා නොමැත.

iv ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු ව ප්‍රතිපාදන අනු ව සිදු කළ යුතු කාර්යයන් කප්පාදු කිරීම.
මූලික විමර්ශන අනු ව හඳුනාගත් අවශ්‍යතා සඳහා සැලසුම් පිළියෙල කොට ඒ සඳහා ඇස්තමේන්තු පිළියෙල කළ ද අවසානයේ ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් කර්මාන්තයේ යම් යම් කාර්ය කොටස් කප්පාදු කිරීමට සිදු වේ. මේ හේතුවෙන් හඳුනා ගත් අවශ්‍යතා අනු ව ව්‍යාපෘති නිම කිරීමට ඉඩ ප්‍රස්ථාව නො ලැබේ.

v වසර පුරා සිදු වන මිල වෙනස් වීම්
ඇස්තමේන්තු පිළියෙල කොට අනුමැතිය ලැබෙන කාල සීමාව වන විට, සැලකිය යුතු කාලයක් ගත වේ. මෙම කාල සීමාව තුළ භාණ්ඩ හා සේවාවන්හි මිල වෙනස් වීම් අදාළ ව්‍යාපෘතියට ද බලපාන අතර, ඇස්තමේන්තු කළ මුදලින් අදාළ කාර්යය ඉටු කිරීමට නොහැකි තත්ත්වයක් බොහෝ විට උද්ගත වේ.

2.4 සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම

සැලසුම් කළ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේ දී මෙන් ම නඩත්තු කිරීමේ දී ද තවදුරටත් විවිධ ගැටලුවලට මුහුණදීමට පළාත් සභාවට සිදු වේ. එනම්,

i. මැනවින් ස්ථාපිත නො වූ ගොවි සංවිධානවලට කර්මාන්ත භාර දීමට සිදු වීම.
   මෙයට ඉහත ද සඳහන් කළ පරිදි බොහෝ විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එම වාරි කර්මාන්තයට අදාළ ගොවි සංවිධානයට භාර දීම සිදු වේ. එසේ වුව ද බොහෝ විට එම සංවිධාන මැනවින් ස්ථාපිත නො වූ ඒවා වන අතර, අදාළ කාර්යය ඉටු කිරීමට තරම් ශක්තිමත් නො වන ඒවා ද වේ.

ii. ජල කළමනාකරණය පිළිබඳ ගොවීන් තුළ පවතින අඩු දැනුම.
   විධිමත් ජල කළමනාකරණ විධි පිළිබඳ ගොවීන් තුළ පවතින අඩු දැනුම හෝ දැනුමක් නො වීම වාරි ජලයේ ඵලදායීතාව හීන වීම කෙරෙහි බලපා ඇත. එමෙන් ම මේ සම්බන්ධව පුහුණු පන්ති පැවැත්වීම මගින් මෙම ගැටලුව නිරාකරණය කිරීමේ හැකියාව පැවතිය ද ඒ සඳහා ම වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන නො වීම නිසා එම කාර්යය ඉටු කිරීමට නො හැකි වී ඇත.

iii. හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මුදල් නොමැති වීම.
   සුළු වාරිමාර්ග සම්බන්ධයෙන් වගකීම පළාත් සභා වෙත පැවරී තිබුණ ද හදිසි ප්‍රතිසංස්කරණ කටයුත්තක් සිදු කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පළාත් සභා කෘෂිකර්ම සහ වාරිමාර්ග අමාත්‍යාංශයට වෙන් කර නොමැත. හදිසි ආපදා තත්ත්වයක දී පළාත් අමාත්‍යාංශය මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් බවට මෙය පත් ව ඇත.

3.0 සමාප්තිය

පළාත් සභා පිහිටු වීමේ දී සුළු වාරිමාර්ග සම්බන්ධ බලතල පළාත් සභා වෙත පවරා දී ඇත. එම බලතල ක්‍රියාත්මක කිරීමේ දී නෛතික, පරිපාලන, මූල්‍ය සහ මානව සම්පත් හිඟය ආදී ගැටලු රාශියකට පළාත් සභා මුහුණදෙනු ලබයි. එසේ ම වාරිමාර්ග සම්බන්ධ ව්‍යාපෘති ඉදි කිරීමේ දී මූලික විමර්ශන අවස්ථාවේ සිට බොහෝ ගැටලු සහ දුෂ්කරතාවලට මුහුණ දෙනු ලබයි. මෙහි දී මූල්‍ය සම්පත් සම්බන්ධ ව පවතින ගැටලු සහ අවහිරතා ප්‍රධාන බාධාවන් වන අතර, ගොවි සංවිධාන සහ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය අතර සෘජු සම්බන්ධතාවක් නො වීම, ව්‍යාපෘති පැවරීම සඳහා අදාළ සුදුසුකම් සහිත මැනවින් ස්ථාපිත වූ ගොවි සංවිධාන තෝරා ගැනීමේ අපහසුතාව, ව්‍යාපෘති සැලසුම් කිරීම සඳහා අවශ්‍ය දිගු කාලීන දත්ත සහිත දත්ත පද්ධතියක් නො වීම ආදී ගැටලු රාශියක් මැද ව්‍යාපෘති ඉදි කිරීම් සහ නඩත්තු කිරීම් ඉටු කිරීමට පළාත් සභාවලට සිදු වී ඇත. ගොවි සංවිධාන සහ පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය අතර මනා සම්බන්ධතාවක් ගොඩනංවා ගැනීම තුළින් මෙම ගැටලු යම් පමණකට නිරාකරණය කරගැනීමට හැකි වුව ද පරිපාලන, මූල්‍ය, මානව සහ භෞතික සම්පත් සම්බන්ධව පැන නැගී ඇති ගැටලු නිරාකරණය කරන තෙක් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට පළාත් සභා අපොහොසත් වනු ඇත.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සහ ක්‍රියාකාරිත්වය: දකුණු පළාත් අත්දැකීම්

ඩබ්ලි සිල්වා
දිස්ත්‍රික් වාරි ඉංජිනේරු (මාතර)
දකුණු පළාත් සභාව

සංක්ෂේපය

මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය අංගයක් වූ වාරි කර්මාන්ත සම්බන්ධයෙන් මැදිහත් වන ආයතන අතරට 1987 දී 'පළාත් සභා' නමින් තවත් ආයතනයක් එකතු වුණි. ඒ අනු ව පළාතේ සුළු වාරිමාර්ග නඩත්තුව සහ ප්‍රතිසංස්කරණය පිළිබඳ බලය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභා වෙත පවරා ඇත. වගාවන් සඳහා භූමියේ යෝග්‍යතාව ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන අතර, දකුණු පළාතේ මුහුදු තීරයේ වී වගාව සඳහා පවතින හැකියාව අනෙක් ප්‍රදේශවලට වඩා වෙනස් වේ. වාරිමාර්ග නඩත්තු සහ ඉදි කිරීම්වල දී මේ සම්බන්ධ අවධානය යොමු කළ යුතු වේ.

මෙම ලිපිය තුළින් දකුණු පළාතේ පොදු පහසුකම්, වාරි පහසුකම් සහ කෘෂිකාර්මික තත්ත්වය පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කරන අතර, පළාත් සභාවට වාරිමාර්ග සම්බන්ධයෙන් පැවරී ඇති කාර්ය භාරය පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. එමෙන්ම ක්‍රියාකාරිත්වයේ දී පළාත් සභා මෙන් ම ගොවීන් මුහුණ දෙනු ලබන ගැටලු පිළිබඳ දීර්ඝ ව සාකච්ඡා කරනු ලබයි. එයට අමතර ව එම ගැටලු විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කෙරේ.

1.0 හැඳින්වීම

ගාල්ල, මාතර, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කවලින් සමන්විත වූ දකුණු පළාත වර්ග කි.මී. 5544ක් පුරා පැතිරී පවතී. මෙම භූමි ප්‍රමාණය ගොඩබිම වර්ග කි.මී. 5,383ක් ද ජලාශ වර්ග කි.මී. 161න් ද සමන්විත වේ. 2006 වසරේ පළාතේ ඇස්තමේන්තුගත මුළු ජනගහනය 2,387,489 කි. ජන ඝනත්වය ගාල්ල දිස්ත්‍රික්කයේ ව.කි.මී. 01 ට 613 ද, මාතර 599 ද, හම්බන්තොට 210 වේ. පළාතේ පරිපාලන සහ පොදු පහසුකම් පිළිබඳ සාමාන්‍ය විස්තර වගු සටහන් අංක 01 න් දැක්වේ.

වගු සටහන් අංක 01 : දකුණු පළාතේ පරිපාලන පොදු පහසුකම් කෘෂිකාර්මික දත්ත (දිස්ත්‍රික් මට්ටමින්)

	සංඛ්‍යාව			එකතුව
	ගාල්ල	මාතර	හම්බන්තොට	
පරිපාලන			-	
මහ නගර සභා	01	01	02	02
නගර සභා	02	01	10	05
ප්‍රාදේශීය සභා	17	15	12	42
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස	19	16	576	47
ග්‍රාම නිලධාරී කොට්ඨාස	896	650	1,319	2,122
ගම්	2,311	1,598	15	5,228
ගොවිජන සේවා මධ්‍යස්ථාන	33	22		70
කෘෂිකාර්මික				
තේ (හෙක්ටයාර්)	24,920	23,436	397	48,753
රබර් (හෙක්ටයාර්)	6,518	3,614	41	10,173
පොල් (හෙක්ටයාර්)	13,213	14,039	21,464	48,716
කුරුඳු (හෙක්ටයාර්)	10,253	7,757	1,425	19,435
වී (හෙක්ටයාර්)	14,498	14,863	19,066	48,427

දකුණු පළාතේ ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අමුණු 1,361, වැව් 472 ද වන අතර, ඒ යටතේ ගොවි පවුල් 60,903 ක් විසින් වගා කටයුතු සිදු කරනු ලබයි. මෙය දිස්ත්‍රික් වශයෙන් විසිරී ඇති ආකාරය වගු සටහන් අංක 02 න් දැක්වේ.

වගු සටහන් අංක 02: දකුණු පළාතේ වාරිමාර්ග සහ ඒ ආශ්‍රිත ගොවි පවුල් සංඛ්‍යාව (2000 වසර)

දිස්ත්‍රික්කය	ක්‍රියාත්මක තත්ත්වයේ පවතින				අත්හැර දැමූ	
	වැව්	අමුණු	ගොවි පවුල් සංඛ්‍යාව		වැව්	අමුණු
			වැව් යටතේ	අමුණු යටතේ		
ගාල්ල	0*	504	0**	171,555	0***	26
මාතර	24	825	2,967	32,808	03***	93
හම්බන්තොට	446	32	7,081	892	23	01
එකතුව	470	1,361	10,048	205,255	26	120

* දීගොඩ වැව – ඉමදුව (1971 සිට), මෙයට අමතර ව 1990 දශකයේ මුල් භාගයේ ගාලු දිස්ත්‍රික්කයේ තවත් වැවක් තනා ඇත. පළාත් සභාව විසින් හඳුනාගත් වැව් 28 ක් මාතර දිස්ත්‍රික්කයේ වේ.

** පළාත් සභා මූලාශ්‍ර අනු ව ගාලු දිස්ත්‍රික්කයේ වැව් යටතේ වගා කරන ගොවි පවුල් සංඛ්‍යාව 70 කි.

*** 2007 වර්ෂය වන විට ගාලු දිස්ත්‍රික්කයේ අත්හැර දැමූ වැව් 01 කි. මාතර දිස්ත්‍රික්කයේ 12 කි.

මූලාශ්‍රය: Dept.of Agrarian Services, 2000

ඉහත තොරතුරු අනු ව, දකුණු පළාතේ වාරි කෘෂිකර්මාන්තයෙන් ජීවනෝපාය මාර්ගය සලසා ගන්නා විශාල සංඛ්‍යාවක් සිටින බව තහවුරු වේ. එම ගොවි පවුල්වල ආදායම් උත්පාදනය සුරක්ෂිත කිරීම සඳහා මෙන් ම ගංවතුර පාලනය සඳහා ද මෙම වාරිමාර්ග පද්ධති නිසි ලෙස නඩත්තු කර පවත්වා ගෙන යාම අනිවාර්යයෙන් ම සිදු කළ යුතු කාර්යයක් බවට පත්ව ඇත.

එසේ වාරිමාර්ග සහ ඒවායේ වෙනත් ආදාළ කටයුතු සඳහා මැදිහත්වීමේ වගකීම පැවරුණු ආයතන කිහිපයක් වේ. එනම්,

i. පළාත් සභාව
ii. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
iii. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
iv. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙනි.

මෙම ආයතනවලට අමතර ව සමෘද්ධි සංවර්ධන අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය, ජාතික ගොඩ නැගීමේ අමාත්‍යාංශය, රජයේ වෙනත් දෙපාර්තමේන්තු, අධිකාරි මෙන් ම දේශීය හා විදේශීය රාජ්‍ය නො වන සංවිධාන ද වාරිමාර්ග ඉදි කිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතුවලට මැදිහත් වේ. විශේෂයෙන් ම හම්බන්තොට දිස්ත්‍රික්කය මුහුණ දෙනු ලබන දැඩි නියං තත්ත්වය හේතුවෙන් එම දිස්ත්‍රික්කය සඳහා මෙවන් මැදිහත් වීම් වැඩි වශයෙන් සිදු වේ.

2.0 පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ ක්‍රියාකාරීත්වය

2.1 නෛතික බලය සහ පරිපාලන කටයුතු

1987 පළාත් සභා පිහිටු වීමත් සමග ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දහ තුන් වැනි සංශෝධනයේ නව වැනි උප ලේඛනයේ පළාත් සභා ලැයිස්තුවෙන් පළාතේ සුළු වාරිමාර්ග සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය පළාත් සභා වෙත පැවරිණි. එමෙන් ම එම ලේඛනයේ සමගාමී ලැයිස්තුව මගින් පළාතේ වාරිමාර්ග කටයුතු සහ ගංවතුර වැළැක්වීමේ කටයුතු ඉටු කිරීමට පළාත් සභාවලට මැදිහත් වීමට අවස්ථාව සලසා ඇත. මේ අනු ව දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ස්ථාපිත කොට ඇත.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පළාත් කෘෂිකර්ම, ඉඩම්, සත්ත්ව නිෂ්පාදන සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතී. මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) මගින් මෙහෙය වනු ලබයි. පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයෙකු යටතේ පළාත් වාරිමාර්ග

දෙපාර්තමේන්තුවට ක්‍රියාත්මක වන අතර ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල කටයුතු එම දිස්ත්‍රික්කවලට අදාළ දිස්ත්‍රික් කාර්යාල මගින් ඉටු කරනු ලබයි.

පළාතේ වාරිමාර්ග නිසි පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මිණුම් කටයුතු ඇස්තමේන්තු සහ ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ඉදිකිරීම් සහ අධීක්ෂණය ආදි කාර්යයන් රාශියක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරී ඇත. එමෙන් ම පළාත් ඇතුළත ගංවතුර ආරක්ෂණ වැඩ කටයුතු ඉටු කිරීමේ වගකීම ද, කුඹුරුවලට කරදිය ගැලීම වැළැක්වීම ද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

2.2 පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය

1999-2004 කාලය තුළ සුළු වාරිමාර්ග සඳහා සියලු ම පළාත් සභා විසින් වියදම් කරනු ලැබූ මුදලත්, දකුණු පළාත් සභාව විසින් වියදම් කරනු ලැබූ මුදලත් වගු සටහන් අංක 03 න් දැක් වේ.

වගු සටහන් අංක 03: සුළු වාරිමාර්ග සඳහා සියලු පළාත් සභා විසින් වියදම් කළ මුදල සහ දකුණු පළාතේ වියදම (1999-2004) රු. දහස්වලිනි.

වසර	සියලු පළාත් සභා වියදම රු. දහස්	දකුණු පළාත් සභාව රු. දහස්	මුළු මුදලින් දකුණු පළාත් සභාවේ කොටස (%)
1999	50,626	6,845	13.52
2000	119,113	9,608	8.06
2001	153,455	11,579	7.54
2002	167,396	15,808	9.44
2003	153,964	16,485	10.70
2004	69,402	22,913	33.01
එකතුව	713,956	83,238	11.65

මූලාශ්‍රය: **The Finance Commission, Annual Report, 2004**

මෙම වගුවෙහි සඳහන් වන්නේ සුළු වාරිමාර්ග සඳහා අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වෙන් කරන මුදලකි. මෙම ප්‍රතිපාදනවලින් සිදු කෙරෙන්නේ අතීතයේ දී ගොවීන් විසින් ම සිදු කරනු ලැබූ ඇලවල් (පිටවාන්) ශුද්ධ කිරීම වැනි සුළු කර්මාන්තයන් ය. මෙම අරමුදල්වලින් අමුණක් ඉදිකිරීම, අමුණු ගේට්ටු තැනීම වැනි කටයුත්තක් කෙරෙන්නේ ඉතා ම කලාතුරකිනි. ප්‍රතිසංස්කරණය කරන පිටවාන් ඊළඟ කන්නය වන විට නැවතත් වල් බිහි වන අතර, නැවත මුදල් වැය කර ප්‍රතිසංස්කරණය කරනු ලබයි. මෙ මගින් වී අස්වැන්න වැඩි කිරීමට කිසිදු පිටිවහලක් නො ලැබේ. තව ද ප්‍රාදේශීය ලේකම් කර්යාලවල කිසිම ඉංජිනේරුවරයෙකු නොමැති බැවින්, ඵලදායිතාව ද පරීක්ෂා නො කර, ගොවි සංවිධානයේ ඉල්ලීම පරිදි වගාව දියුණු කිරීමට වඩා වෙනත් අරමුණු ඉටු කරගැනීමට මෙම මුදල වැය කිරීම බොහෝ විට සිදු වේ. එබැවින් මෙම ප්‍රතිපාදාන පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් වඩාත් ඵලදායක ව්‍යාපෘති සඳහා යෙදවීම කාලෝචිත වේ.

ඉහත වගු සටහන් අංක 03 අනු ව පැහැදිලි වන්නේ සුළු වාරිමාර්ග සම්බන්ධයෙන් දකුණු පළාත් සභාව විසින් සිදු කරනු ලැබූ වියදම වසරින් වසර ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී ඇති බව ය. මෙයට අමතර ව ප්‍රාග්ධන වියදම් වශයෙන් ද පළාත් සභාව විසින් වාරිමාර්ග සම්බන්ධයෙන් සැලකිය යුතු මුදලක් පසු ගිය කාලය තුළ වැය කර ඇත.

මෙම මුදල් වියදම් කොට අත්හැර දමා තිබූ වැව් සැලකිය යුතු සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කිරීමට පසුගිය කාලය තුළ පළාත් සභාවට හැකියාව ලැබිණි. උදාහරණ වශයෙන් මාතර දිස්ත්‍රික්කයේ හඳුනාගත් වැව් සියල්ල පසුගිය වර්ෂ හතර තුළ නිම කරන ලදී. මේ ආකාරයට ප්‍රතිසංස්කරණය කරනු ලැබූ

බොරාල නම් වැවේ ප්‍රමාණය අක්කර 100 ක් වන අතර, මෙය වසර විසි පහක් තිස්සේ සම්පූර්ණයෙන් ම කෙටලවලින් වැසී තිබූ වැවකි. වර්ෂයක් තුළ මෙම වැව භාවිතයට ගැනීමට හැකි ආකාරයෙන්, සම්පූර්ණයෙන් සකස් කර නිම කිරීමට පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හැකි වුණි. මෙවැනි තවත් විශාල වැව් 03 ක් ඇතුලු ව මාතර දිස්ත්‍රික්කයේ වැව් දහයක් පමණ පසු ගිය වසර හතරක කාලය තුළ නිම කිරීමට හැකි විය. මේ ආකාරයෙන් මාතර දිස්ත්‍රික්කයේ දීර්ඝ කාලයක් තිස්සේ පුරන් ව පවතින කුඹුරු යායවල් රාශියක් අස්වැද්දවීම සඳහා අවශ්‍ය ජල සම්පාදනය කිරීමට දකුණු පළාත් සභාවට හැකියාව ලැබිණි.

මෙයට අමතර ව අත්හැර දමා තිබූ අමුණු 20 ක් පමණ ප්‍රතිසංස්කරණය කරන ලදී. වැව් 5 ක වාන් මට්ටම එසවීමෙන් වැව්වල ජල ධාරිතාව වැඩි කරන ලදී.

3.0 ගැටලු සහ දුෂ්කරතා

වාරිමාර්ග සම්බන්ධ කටයුතුවල දී පළාත් සභාව මුහුණ දෙන ගැටලු මෙන් ම ගොවීන් මුහුණ දෙන ගැටලු ද රාශියකි.

3.1 පළාත් සභාව මුහුණ දෙන ගැටලු

(i) නිසි පරිදි මූලික විමර්ශන සහ අධීක්ෂණ කටයුතු සිදු කිරීමට පවතින බාධා.
කාර්ය මණ්ඩල හිඟය, ප්‍රවාහන සහ මූල්‍ය පහසුකම්වල පවතින අපහසුතා මූලික විමර්ශන කටයුතු සම්බන්ධයෙන් පැන නගින ප්‍රධාන බාධාවන් වේ. එමෙන් ම නිපුණතා සහ දැඩි පුහුණුවීම් සහිත නිලධාරීන් ගේ හිඟය ද මේ කෙරෙහි බලපානු ලබයි. මේ වන විට ද දකුණු පළාතේ සියලු ම කාර්මික නිලධාරීන් ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාසය ආයතනයේ මසක් පමණ පුහුණු කර ඇත. මෙය වර්ෂ දෙකකට වරක් හෝ කළ යුතු ය.

(ii) පසු විපරම් කටයුතු සිදු නො කිරීම.
ඉදිකර අවසන් වූ ව්‍යාපෘතිවල පසු විපරම් සිදු නො කිරීම මෙම ක්ෂේත්‍රයේ පවතින විශාල අඩුපාඩුවක් ලෙස පෙන්වා දිය හැක. පසු විපරම් කටයුතු සිදු නො කිරීම නිසා නැවත නැවත ඉක්මණින් ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට සිදු වීමත් ජලය එලදායි අන්දමින් නො යෙදීමත් වැනි ගැටලු පැන නගී.

(iii) දිගින් දිගට නඩත්තු කටයුතු ඉටු කිරීමට ඇති බාධා.
ව්‍යාපෘතියක් නිම කිරීමෙන් පසු ව එය ගොවි සංවිධානයට භාර වන අතර ගොවි සංවිධාන විසින් වාරිමාර්ග නඩත්තු කිරීම් නිසි පරිදි ඉටු නො කිරීම ගැටලුවක් වී ඇත. පළාත් සභාව සහ ගොවි සංවිධාන අතර සෘජු සම්බන්ධතා නො මැති වීම ද මෙම ගැටලුව තව දුරටත් සංකීර්ණ වීම කෙරෙහි බලපා ඇත.

(iv) මුහුදු මට්ටමින් පහළ කුඹුරුවල ඵලදායිතාව සහ දරිද්‍රතාව.
දකුණු පළාතේ බෙන්තර සිට තංගල්ල දක්වා වූ කරදියට ලක්වන කුඹුරු ප්‍රමාණය අක්කර විසි දහසක් පමණ වේ. 1965 සිට මේ දක්වා මේ සඳහා වියදම් කරනු ලැබූ මුදල් ප්‍රමාණය මහවැලි යෝජනා ක්‍රමයට වියදම් කළ මුදල් ප්‍රමාණයට සාපේක්ෂ ව ඉහළ මට්ටමක පවතිනු ඇත. මේ සා විශාල මුදලක් වියදම් කරනු ලැබුව ද මෙම කුඹුරු යායේ ඵලදායිතාව ඉහළ නැංවීමට මේ දක්වා හැකි වී නොමැත. මෙම කුඹුරුවලින් ලබන අස්වැන්න උපරිම වශයෙන් අක්කරයට බුසල් හතලිහකට වඩා අඩු වේ.

නීතිමය වශයෙන් කුඹුරු ඉඩම්වල වෙනත් වගාවක් හෝ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැනි කර්මාන්තයක් සිදු කිරීමට ඉඩ ප්‍රස්ථාවක් නොමැති හෙයින් අනිවාර්යයෙන් ම වී වගාවේ නියැලීමට එම ගොවීන්ට සිදු වී ඇත. මෙම වී වගාව ලාභදායක නො වන හෙයින් දිනෙන් දින ම මෙම ගොවීන් දිළිඳුභාවය කරා පැමිණීම

සිදු වේ. අනෙක් අතට ඵලදායීතාව අඩු මට්ටමක පවතින කුඹුරු ඉඩම් සඳහා ජලය සැපයීම සඳහා එම ප්‍රදේශවල වැව් අමුණු සඳහා විශාල මුදලක් නිරර්ථක ව වියදම් කිරීමට පළාත් සභාවට සිදු වී ඇත. මේ සඳහා වියදම් කරන මුදල් වෙනත් අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා වියදම් කිරීමේ හැකියාව පැවතිය ද ගොවීන් වෙනත් භෝගයක් කරා යොමු නො කිරීම නිසා එම වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු කෙරෙහි ඔවුන් වෙතින් ඉදිරිපත් වන ඉල්ලීම් නො සලකා හැරිය නො හැකි මට්ටමකට පත් ව ඇත. මෙයට මනා උදාහරණයක් නිල්වලා ව්‍යාපාරය ඇසුරින් පෙන්වා දිය හැක. නිල්වලා ව්‍යාපෘතිය යටතේ වන කුඹුරු අක්කර 5,000 ක් පමණ වර්තමානයේ පවා දියුණු කළ නොහැකි මට්ටමක පවතී. මෙම කුඹුරු වී වගාව හැර වෙනත් විකල්ප හඳුන්වා දීම කළ යුතු වේ.

(v) ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

ග්‍රාමීය මට්ටමේ දී කෘෂිකර්ම සහ වාරිමාර්ග ක්ෂේත්‍රයේ කටයුතු කරන සියලු ම නිලධාරීන් (කෘ.ප.නි.ස.) වගකියනු ලබන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට බැවින් පළාත් වාරිමාර්ගයට එය බලවත් බාධාවකි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ඉදිකිරීමේ ක්ෂේත්‍රයට පිවිසියේ 1985 වර්ෂයේ දී පමණ ය. එම දෙපාර්තමේන්තුව මගින් ද වාරි කර්මාන්තය සඳහා විශාල මුදලක් වැය කරයි. මෙම හේතුව නිසා කර්මාන්ත අතිපිහිත වීම (Overlapping) නිතර ම සිදු වේ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඉදිකිරීම්වලින් නිදහස් ව, ගොවීන්ට අවශ්‍ය අනිකුත් සේවාවන් සැපයීමේ නිරත වීම වඩාත් යෝග්‍ය වනු ඇත.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මධ්‍යම රජයට අයත්වීම වාරිමාර්ග කටයුතුවල දී විශාල බාධාවක් ව පවතී. සුප්‍රසිද්ධ ආණ්ඩු ක්‍රම නීති සම්පාදකයකු වූ අධි නීතිඥ ජයම්පති වික්‍රමරත්න මහතා ඉතා මෑතක දී පවසන ලද්දේ ගොවිජන සේවා විෂයය පළාත් සභාවට අයත් විෂයයක් වුවත්, එය පළාත් සභාව වෙත රඳවා ගැනීම සඳහා බලධාරීන් කිසිදු පියවරක් ගෙන නොමැති බව ය.

3.2 ගොවීන් මුහුණ දෙන ගැටලු

(i) පළාත් සභා සහ ගොවි සංවිධාන අතර සෘජු සම්බන්ධයක් නො වීම නිසා පැන නගින ගැටලු.

වාරිමාර්ග නඩත්තුව සම්බන්ධයෙන් වගකීම අදාළ ගොවි සංවිධානයට පැවරෙන අතර ගොවි සංවිධාන පිහිටු වීම, ඒවායේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ බලතල ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැවරී ඇත. සුළු වාරිමාර්ග නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් පළාත් සභා වෙත ලබා දී ඇත. මේ අනු ව වාරිමාර්ගවල ප්‍රතිලාභීන් සහ වගකිව යුතු නිලධාරීන් අතර සෘජු සහ මනා සම්බන්ධතාවක් නොමැති හෙයින් ගොවීන් ගේ ඉල්ලීම් අදාළ අංශ වෙත නො පමාව සහ සෘජු ව ඉදිරිපත් වීමක් සිදු නොවේ. අනෙක් අතට නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ද මෙම ගැටලුව ම පැන නගී. මෙය ගොවීන් ගේ පාර්ශවයෙන් ගත් කළ ඔවුන්ට අවාසිදායක තත්ත්වයක් නිර්මාණය කර ඇත.

(ii) ආර්ථිකමය වශයෙන් ඵලදායී වගාවකට යොමු වීමේ ඉඩකඩ ඇහිරීම.

කුඹුරු ඉඩම්වල වී වගාව හැර වෙනත් භෝගයක් හෝ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැනි පාරිසරික වශයෙන් හානි කර නො වන කර්මාන්තයක් කිරීමේ ඉඩකඩ නීතිමය බාධාවන් හේතුවෙන් ඇහිරී ඇත. අනෙක් අතට කුඹුරු ඉඩම් වී වගාව සඳහා ම යෙදවීමට ගතානුගතික පෙළඹවීමක් පවතී. ආර්ථිකමය වශයෙන් ලාභදායී සහ ඵලදායක වෙනත් භෝගයක් හෝ කර්මාන්තයක් කරා ගොවීන් යොමු කර ඔවුන් ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ හැකියාව පැවතිය ද පවතින බාධාවන් හමුවේ එම කාර්යය ඉටු නො වන අතර ඵලදායීතාවෙන් හීන වී වගාවේ ම ගොවීන් සිරකර තැබීම තුළින් ඔවුන් ගේ දරිද්‍රතාව දිනෙන් දින වර්ධනය වීම සිදු වේ. මෙය ගොවීන් ගේ ආර්ථික මෙන් ම සමාජයීය ගැටලු ද මතු කරවීමට සමත් සාධකයක් බවට පත් ව ඇත.

පුස්තකාලය
LIBRARY
HARTI

(iii) අත්‍යවශ්‍යයෙන් කළ යුතු ඇතැම් ව්‍යාපෘති මගහැරී යාම.

වාරිමාර්ග සම්බන්ධයෙන් වගකීම් දරණ ආයතන රාශියක් වන අතර නිලධාරීන් ගේ පෞද්ගලික හිතවත්කම් හැරුණු කොට ආයතන අතර සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් නො වීම නිසා ඇතැම් අවස්ථාවල කාර්යයන් අතිපිහිත වීම සිදු වේ. එමෙන් ම අත්‍යවශ්‍යයෙන් ම සිදු කළ යුතු ව්‍යාපෘති කිසිවෙකු ගේ අවධානයට යොමු නො වී අත්හැරීම ද සිදු වේ. අනෙක් අතට වාරිමාර්ග ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ආයතන රාශියක් කටයුතු කරන නමුත් ඒවායේ අවසාන වගකීම දරන්නා පිළිබඳ ඇතැම් අවස්ථාවල දී ගැටලු පැන නගී. මෙ වැනි අවස්ථාවල අවශ්‍ය කටයුතු සඳහා කුමන ආයතනයක් වෙත යොමු විය යුතු ද? යන ගැටලුව පැන නගින අතර මෙම ව්‍යාකූලතා හමුවේ ගොවීන් වඩාත් අසරණ තත්ත්වයට පත් වේ.

4.0 සමාප්තිය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් සභා සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යන ආයතන මෙරට වාරිමාර්ග සම්බන්ධ වගකීම පැවරුණු ආයතන වේ. මෙයට අමතර ව තවත් රාජ්‍ය සහ රාජ්‍ය නො වන සංවිධාන රාශියක් මෙම ක්ෂේත්‍රයේ කටයුතුවලට මැදිහත් වේ. ආයතන රාශියක මැදිහත් වීම සිදු වුව ද නිසි සම්බන්ධීකරණයක් නො වීම නිසා එක ම කාර්යය දෙතුන් වතාවක් සිදු වීම, අත්‍යවශ්‍යයෙන් ම කළ යුතු කාර්යයන් ඇතැම් අවස්ථාවල දී මග හැරී යාම, ආදී ගැටලු මතු වේ. මුහුදු මට්ටමෙන් පහළ පවතින කුඹුරු ඉඩම් සඳහා වාරි ජලය සැපයීම වෙනුවෙන් තව දුරටත් මුදල් වියදම් කිරීම නිරර්ථක කාර්යයක් වන හෙයින් එම කුඹුරු ඉඩම් ආර්ථිකමය වශයෙන් ඵලදායි කටයුත්තක් සඳහා යෙදවීමට පියවර ගන්නා අතර ම වාරි ජලය සැපයිය යුතු ඵලදායිතාව ඉහළ නැංවිය හැකි, වී වගාවට යෝග්‍ය කුඹුරු ඉඩම් සඳහා වාරි ජලය සැපයීම වෙනුවෙන් එම මුදල් වියදම් කිරීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. වාරිමාර්ග සඳහා වියදම් කරන මුදලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට විවිධ බාධා මතු වී ඇත. ඉටු කරනු ලබන කර්මාන්තයන් හි ඵලදායිතාව සහ පසුවිපරම් කටයුතු මුදල් කොමිසමට අනුයුක්ත ස්වාධීන නිලධාරීන් පිරිසක් මගින් සිදු කිරීම.

ආශ්‍රිත ග්‍රන්ථ

1. Dept. of Agrarian Service (2000) – Data Book for village Irrigation Schemes of Sri Lanka-Galle, Ministry of Agriculture and Lands, Dept. of Agrarian Services, Colombo 7
2. Dept. of Agrarian Service (2000) – Data Book for village Irrigation Schemes of Sri Lanka-Matara, Ministry of Agriculture and Lands, Dept. of Agrarian Services, Colombo 7
3. Dept. of Agrarian Service (2000) – Data Book for village Irrigation Schemes of Sri Lanka-Hambantota, Ministry of Agriculture and Lands, Dept. of Agrarian Services, Colombo 7
4. The Finance Commission (2005) – Annual Report – 2004, The Finance Commission, Kithulwatta Road, Colombo

දෙ වැනි සැසියේ සාකච්ඡාව

මූලාසනය: ඩබ්.එම්.සී. බණ්ඩාර මයා
ලේකම්, ඌව පළාත් කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඩඩ්ලි සිල්වා මයා: වාරිමාර්ග සම්බන්ධයෙන් පළාත් වාරිමාර්ග, ගොවිජන සේවා, රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සෘජු ව ම කටයුතු කරනු ලබයි. වැඩ කටයුතු කරගෙන යාමේ දී දකුණු පළාත තුළ, පළාත් සභා ආයතනවලට මධ්‍ය රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග කටයුතු කිරීමේ අපහසුතාවන් පැන නොනගී. එනමුත් සමහර කුඩා වැව්වල සියලු ම දේවල් පළාත් සභා යටතේ සිදු කෙරෙන නමුත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ඇල මාර්ග, පැති බැම් සැකසීම වැනි දේවල් සිදු කරනු ලබයි. ඇතැම් අවස්ථාවල දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන එවැනි කාර්යයන් පිළිබඳ පළාත් සභාව දැනුවත් නො කිරීම නිසා ගැටලු පැන නගී.

පී.එච්. ජයවර්ධන මයා: පළාත් සභාව විසින් වාරිමාර්ග සම්බන්ධව කොපමණ වැඩ ප්‍රමාණයක් ඉටු කළත් නඩත්තුව සහ ගොවීන් අතර සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසිනි. අතීතයේ, වාරි කර්මාන්ත සම්බන්ධ ව වෙල් විදානේ ක්‍රමයක් පැවතිණි. එයට පසු ව ගොවි කාරක සභා ක්‍රමයක් ඉතා ම සාර්ථකව ක්‍රියාත්මක විය. එම ක්‍රම පැවතියේ කොන්ත්‍රාත් ක්‍රමයට වැඩ කටයුතු සිදු කිරීමට නො වේ. මෙම ක්‍රමයට පසු වගා නිලධාරී ක්‍රමය ක්‍රියාත්මක විය. ඉන් අනතුරු ව සියලු ම නඩත්තු කටයුතු නිලධාරීන් විසින් භාර ගැනීම සිදු විය. අතීතයේ ගොවීන් විසින් සිදු කරනු ලැබූ දේ අද රජය විසින් භාරගෙන තිබීම වර්තමානයේ පවතින අර්බුදයන්ට මූලික හේතුව වී තිබෙන බව පැහැදිලි ය.

අතීතයේ දී ගොවීන් විසින් කරනු ලැබූ කාර්යය සඳහා වර්තමානයේ මිලියන ගණනක් වියදම් කරන අතර මෙය නිරපරාද වියදමක් බව මාගේ වැටහීමයි.

ජයන්තා බුළුමුල්ල මිය : රාජ්‍ය පරිපාලන, පළාත් පාලන ලේකම් නිකුත් කළ චක්‍රලේඛයක් මගින් සුළු වාරිමාර්ගවල නඩත්තු කටයුතු පැවරී ඇත්තේ පළාත් සභාවට බව පැහැදිලි කර තිබේ, මේ සම්බන්ධ අර්ථ නිරූපණය පැහැදිලි කර ගැනීමේ අවශ්‍යතාවක් පවතින බව පෙනේ. මෙහි ඉතිහාසය විමසා බැලීමේ දී පෙනී යන්නේ රජය සහ පළාත් සභා දේශපාලන පක්ෂ දෙකක් විසින් පාලනය කරන විට මේ අර්ථ නිරූපණය එක් පාර්ශවයකට වාසිදායක වන අන්දමින් භාවිතා කරනු ලබන බව යි. රජය සහ පළාත් සභා යන ආයතන දෙකෙ හි ම බලය එක් දේශපාලන පක්ෂයක් විසින් දරණ අවස්ථාවක වුවත් අර්ථ නිරූපණය වෙනස් අන්දමින් භාවිතා කරනු ලබන බව පෙනේ. මෙහිදී පෙනී යන වැදගත් කරුණ වන්නේ බොහෝ දෙනෙකු වරදවා භාවිතා කරනු ලබන්නේ ගොවිජන සේවා විෂයය සම්බන්ධයෙන් ලබාදී ඇති නඩු තීන්දුව නො ව එය අර්ථකථනය කරගෙන ඇති වැරදි ආකාරය යි.

එම අධිකරණ නියෝගය අනු ව ගොවිජන සේවා විෂයය අයත් වන්නේ පළාත් සභාවට ය. එම නඩු තීන්දුව නිවැරදියි. නමුත් එය ප්‍රායෝගික ව අර්ථකථනය කරගෙන තිබෙන ආකාරය වැරදි බව මාගේ අදහස යි.

ඩඩ්ලි සිල්වා මයා: එම වැරදි අර්ථකථනය මතයි අද වැඩ කටයුතු ක්‍රියාත්මක වන්නේ. ඒ මගින් මහජන මුදල් විශාල ප්‍රමාණයක් නිරපරාදේ වියදම් වන බව ප්‍රායෝගික අත්දැකීම් අනු ව තහවුරු කළ හැක.

ඒ.යූ. ද සිල්වා මයා: සුළු හා පළාත් වාරිමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට, පළාත් සභාවට එහි කටයුතු ඉටු කළ හැකියි. නමුත් සැලකිය යුතු වැඩ කොටසක් හා ව්‍යාපෘතින් ක්‍රියාත්මක වන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා ය. රටේ අවශ්‍යතාව සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එක ම කාර්යයට ආයතන ගණනාවක් පවතී. එක් ආයතනයක් කාර්යය කිරීමට සැරසෙන විට වෙනත් ආයතනයක්

විසින් එය ඉටු කර අවසන් ය. මෙහි දී විෂයයට මෙන් ම නිලධාරීන්ට ද අසාධාරණයක් සිදු වේ. මෙම තත්ත්වය නිරාකරණය කරගැනීම සඳහා බොහෝ අවස්ථාවල සාකච්ඡා කර ඇති නමුත් කිසිදු අවස්ථාවක එය නිරාකරණය වී නොමැත. මෙයට හේතුව වී ඇත්තේ රජයේ මෙන් ම පළාත් සභාවන් හි බලයට පැමිණෙන දේශපාලන නායකත්වයන් තුළ මේ සම්බන්ධව ස්ථාවර මතයක් නො පැවතීම ය. එනම්, විපක්ෂයේ සිටින විට දරණ අදහස ආණ්ඩු පක්ෂයට පැමිණි පසු වෙනස්වීම නිසා මෙම ප්‍රශ්නය තවදුරටත් නිරාකරණය නො වුණු ගැටලුවක් වශයෙන් පවතී. සුළු වාරිමාර්ග පද්ධතියෙන් රටට ඵලදායක දෙයක් කිරීමට නම් එය එක් ආයතනයක් තුළ පැවතිය යුතු ය. එය එක්කෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තිබෙන ඉංජිනේරු අංශය යටතේ ක්‍රියාත්මක විය යුතු ය. නැතිනම් පළාත් සභාව යටතට පවරා නීත්‍යනුකූල ව පිහිට වූ ආයතනයකට පැවරිය යුතු ය. එසේ නොමැති නම් විශාල ව්‍යාපෘති සඳහා වියදම් කරන, අති විශාල මුදල් සම්භාරය නිරපරාදේ වියදම් වීමක් සිදු වේ. මේ මුදල්වල ප්‍රතිලාභය පිළිබඳ පසු විපරමක් සිදුකර බැලුවහොත්, මෙම තත්ත්වය මැනවින් අනාවරණය වනු ඇත.

ඩබ්ලි සිල්වා මයා: මේ සම්බන්ධව දකුණු පළාත් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දී කරුණු ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධ ව පසු විපරමක් සිදු කළහොත් එම මුදල්වලින් ඉලක්ක ගත ප්‍රතිලාභ නො ලැබෙන බව පැහැදිළි කරුණකි.

ඩබ්.එම්.සී බණ්ඩාර මයා: පළාත් සභාව මෙම විෂයයන් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධ ව ප්‍රඥප්ති සම්මත කරගත යුතුයි. එසේ ප්‍රඥප්ති සම්මත කර නො ගෙන බලතල ක්‍රියාත්මක කිරීමට යාමේ දී බොහෝ විට ගැටලුවලට මුහුණදීමට සිදු වේ. පළාත් සභාවලට මේ සම්බන්ධ ව අත්දැකීම් කිහිපයක් මේ වන විට ද පවතී. එනම් උතුරු සහ වයඹ පළාත්වල ඉදිරිපත් කරනු ලැබූ පළාත් වාරිමාර්ග ප්‍රඥප්ති පළාත් සභාවේ විෂයය පථය ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව බලතල සම්පාදනය කර ගැනීමට දරණ උත්සාහයට උදාහරණ වේ. ප්‍රඥප්තියන් සම්මත කර නීති පද්ධතියක් සහ අවශ්‍ය බලතල සම්පාදනය කරගත හොත් පමණි පළාත් සභාවට සුළු වාරිමාර්ග සම්බන්ධ බලතල ක්‍රියාත්මක කළ හැක්කේ. නැතහොත් දැනට ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ නැවැත්වීමේ හැකියාවක් පළාත් සභාවලට නොමැත. එසේ නම් පළාත් සභාව මෙම බලතල තමන් අතට ගෙන ක්‍රියාත්මක කළ යුතු ය. පළාත් සභා එසේ ක්‍රියාත්මක නො වීම මෙහි පවතින මූලික ගැටලුව වේ. එමෙන් ම දේශපාලන වශයෙන් යම් යම් මැදිහත්වීම් මෙවැනි තත්ත්වයන් සඳහා බලපා ඇත.

කේ.ඒ.යු.බී. ඉඹුලාන මයා: සුළු වාරිමාර්ගවල මෙහෙයුම් නඩත්තු කටයුතු සඳහා ගොවි සංවිධාන මැදිහත් විය යුතු බව රජය තීරණය කළේ 1980 දශකයේ සිට ය. 1992 සිට ම ප්‍රතිලාභීන් ගේ සහභාගීත්වය මෙම කටයුතු සඳහා ලබාගැනීමට අවශ්‍ය අණ පනත් රජය විසින් සම්මත කර ඇත. ඌව පළාත් ලේකම්තුමා පෙන්වා දුන් පරිදි පළාත් සභා ද ප්‍රඥප්තියක් සම්මත කර ගෙන තම බලතල ක්‍රියාත්මක කළ හැක. එහි දී රජයේ අණ පනත් අනනුකූල විය යුතු ය. එය කෙසේ වුව ද, මේ සඳහා වැය කරනු ලබන්නේ මහජනයා වෙතින් එකතු කරනු ලබන දඩ හෝ බදු මුදල් බව, මහජන මුදල් බව අප අමතක නො කළ යුතු ය.

මේ තරම් විද්වතුන් සිටින රටක, මෙවැනි ව්‍යාකූලත්වයක් සහිත නීති රාමුවක් තුළ, තවදුරටත් මෙම කටයුතු ඒ ව්‍යාකූලත්වයෙන් ම ඉදිරියට ගෙන යන්නේ මන්ද? යන ගැටලුව පැන නගී. අවු. දශකවය ක් තුළ පළාත් සභා ක්‍රමය මෙම ව්‍යාකූලතාව මත මෙරට ක්‍රියාත්මක බව සියලු දෙනා ම පිළිගන්නා නමුත් තව කෙතරම් කාලයක් මෙම ගැටලුවලට මුහුණ දෙමින් අප ක්‍රියාත්මක විය යුතු ද? යන ගැටලුව සඳහා මේ වන විට ද විසඳුමක් සොයා නො ගැනීම ඉතා අවාසනාවන්ත තත්ත්වයකි.

ඩබ්ලි සිල්වා මයා: පළාත් සභාවක් ප්‍රඥප්තියත් සම්මත කර තම බලතල ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගනු ලැබුවත්, ඒ මගින් රජය පළාත් විෂයයන් සඳහා සිදු කරන අනවශ්‍ය මැදිහත්වීම් වළක්වා ගැනීමට ක්‍රියා කළත්, ඒවා ප්‍රායෝගික නො වේ. මන්ද යත්, පළාත් සභාවේ දේශපාලන අධිකාරියේ ඊළඟ පියවර මධ්‍යම රජය වන හෙයින් එම දෙපාර්ශවය අතර පවතින, සම්බන්ධතා සහ බලාපොරොත්තු මත දේශපාලන

දේශපාලන අධිකාරිය නිශ්ශබ්ද ව සිටීම දැකිය හැකි ය. මේ නිසා එම ක්‍රමවේදයට වඩා ඔබ්බෙන් යන ජාතික මට්ටමේ ක්‍රමවේදයන් අනුගමනය කිරීමට සිදු වේ.

ජයන්තා බුළුමුල්ල මිය: මෙම සභාවේ සාකච්ඡා කළ කරුණු අනු ව, මෙම වැඩමුළුවෙන් හෝ කිසියම් දෙයක් ඉටු කිරීමට හැකියාව ලැබේ ද? මෙය අදාළ තීරණ ගන්නා මට්ටමේ ආයතන වෙත යොමු වන්නේද?

වී.කේ. නානායක්කාර මයා: වැඩමුළුවෙන් ඉස්මතු වන කරුණු හැකි ඉක්මණින් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම ආයතනයේ අපේක්ෂාව වේ.

ඩබ්.එම්.සී. බණ්ඩාර මයා: මෙහි දී අවධානයට යොමු විය යුතු වැදගත් කරුණක් නම් පළාත් සභා පනත ගෙන ආවේ මන්ද යන්නයි. මෙහි මූලික අරමුණක් වුයේ පළාතේ සංවර්ධනය තුළින් ජනතාවට සේවය කිරීම ය. එම මූලික පරමාර්ථයට පටහැනි ව යම්කිසි දෙයක් සිදු වේ නම් එය අප නිරවුල් කරගත යුතු ය. එය සාකච්ඡා මාර්ගයෙන් නිරවුල් කර ගැනීමට හැකි වේ. පළාත් සභා විෂයයන් බෙදීමේ දී සමගාමී ලැයිස්තුවක් ඇතුළත් කර ඇත්තේ පළාත් සභා විසින් සංවර්ධන කටයුතු සිදු කරගෙන යනවිට පළාත් සභාවලට ඉටු කළ නොහැකි විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති. ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින්, රටේ සංවර්ධනය සඳහා මැදිහත් වීමට ය. එසේ නොමැති ව පළාත තුළ පළාත් සභාව ඉටු කරන කාර්යයන්ට මැදිහත්වීමට නො වේ. නමුත් මෙය වැරදි ආකාරයෙන් අර්ථ නිරූපණය කරගනිමින් රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන ක්‍රියාත්මක වන බව පෙනේ. සමගාමී ලැයිස්තුව යටතේ පළාත තුළ ඕනෑ ම මට්ටමේ, ඕනෑ ම කාර්යයක් ඉටු කිරීමට තමන්ට හැකියාව තිබෙන බවට වැරදි අර්ථ නිරූපණයක සිටිමින් ඇතැම්විට මධ්‍ය රජයේ ආයතන විසින් පළාත් සභාව විසින් ඉටු කරන කාර්යයන් නැවත වතාවක් ඉටු කිරීම දැකිය හැකි ය. පළමු වශයෙන් ම මෙම තත්ත්වය නිරවුල් කරගත යුතු ය.

ජානක විජේකෝන් මයා: වාරිමාර්ග කටයුතුවලදී ගැටලු කිහිපයකට මුහුණදීමට පළාත් සභාවට සිදුවේ. එනම්,

i. සකස් කරන ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබාදීම ප්‍රමාද වන හෙයින් ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි වියදමක් දැරීමට සිදු වේ. එමෙන් ම කර්මාන්ත අවිච්ඡේද වීම සිදු වේ.
ii. ඇස්තමේන්තුව කප්පාදු කර මුදල් ලැබෙන හෙයින් සැලසුම් කළ ආකාරයට වැඩ කටයුතු නිම කිරීමට අවස්ථාව නො ලැබීම.
iii. ගොවි සංවිධාන සමග සෘජු සම්බන්ධතා නොමැති නිසා අනිවාර්යයෙන් සිදු කළ යුතු නඩත්තු කටයුතු සිදු කිරීමට ඇති අපහසුතා.

මෙම ගැටලුවලට අමතර ව පළාත් සභා කාර්ය මණ්ඩලයට මුහුණදීමට සිදු වන තවත් ප්‍රධාන ගැටලුවක් වන්නේ මූලික වැඩකටයුතු සඳහා මුදල් වියදම් කිරීමේ දී පවතින බාධාවන් ය. කිසියම් කර්මාන්තයක මූලික කටයුතු සඳහා මුදල් වියදම් කර අවසානයේ මුදල් නොමැතිවීම හෝ වෙනත් හේතුවක් නිසා කර්මාන්තය අත් හැරියහොත් එම මුදල් වියදම් කිරීම පිළිබඳ විගණන වාර්තාවල දී ගැටලු පැන නඟී. මේ නිසා කර්මාන්තවල මූලික කටයුතු සඳහා මුදල් වියදම් කිරීම ගැටලුවක් බවට පත් වේ. අනෙක් අතට කර්මාන්තයක මූලික කටයුතු සඳහා වියදම් කළ හැකි මුදල වන 3% එම කටයුතු සඳහා ප්‍රමාණවත් නො වේ.

ඩබ්ලි සිල්වා මයා: ඌව පළාතේ ගැටලුව අනෙක් පළාත්වලටත් අදාළ නමුත්, ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමෙන් එම ගැටලුව නිරාකරණය කර ගැනීමට හැකි ය. අප, වැඩ ලැයිස්තුවේ විමර්ශන සඳහා මුදල් කොටසක් වෙන් කරන නමුත් මේ සඳහා මුදල් වෙන් කරනු ලබන්නේ විමර්ශන සහ මූලික වැඩ කටයුතු යනුවෙන් සඳහන් කරමිනි. එසේ නොමැති ව මූලික වැඩ කටයුතු කළ නො හැකි යි. උදාහරණ වශයෙන් ලංකාවේ තෙල් ගවේෂණය කිරීම සඳහා මුදල් යොදවන නමුත් හදිසියේ තෙල් නො

ලැබුනහොත් තෙල් ගවේෂණය සඳහා කටයුතු කළ නිලධාරීන් විසින් එම මුදල් ගෙවිය යුතු ද? එය නිලධාරීන් ගේ වරදක් ද? යන්න සිතා බැලිය යුතු ය.

ඩබ්.එම්.යූ බණ්ඩාර මයා: පළාත් ලැයිස්තුවට අනු ව සුළු වාරිමාර්ග පළාත් සභා විෂයයක් වන අතර, ඒවායේ නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට සිදු වන්නේ ගොවි සංවිධාන හරහා ය. එහි දී මතුවන ගැටලුව වන්නේ පළාත් අමාත්‍යාංශයට සෘජු ව ම ගොවි සංවිධාන සමඟ සම්බන්ධවීමට නො හැකි වීම යි. මන්ද යත් ගොවි සංවිධාන සම්බන්ධතා පවත්වා ගනු ලබන්නේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් සමඟ වන අතර, ගොවි ජන සංවර්ධන සහකාර කොමසාරිස් ගේ සබඳතා සහ වගකීම් ගොවි ජන සංවර්ධන කොමසාරිස් ජනරාල් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ මිස පළාත් සභා සමඟ නො වන හෙයිනි.

වී.කේ. නානායක්කාර මයා: බොහෝ පනත් අනු ව සුළු වාරිමාර්ග යනු අක්කර 200 ට අඩු වගා වපසරියක් සහිත වාරි කර්මාන්තයක් වේ. එක් විෂයයක් හෝ විෂයය කරුණක් සම්බන්ධයෙන් පැවතිය හැක්කේ එක් අර්ථ කථනයක් පමණි. නමුත්, නව පනත් සම්මත කිරීමේ දී මේ පිළිබඳ සැලකිලිමත් වී නොමැති බව පෙනී යයි. මෙය නීති කෙටුම්පත් සම්පාදනයේ අඩුපාඩුවක් වන අතර, මේ නිසා "සුළු වාරිමාර්ග" සහ "වාරිමාර්ග වැඩ" සම්බන්ධ නීතිමය අර්ථ නිරූපණ සම්බන්ධයෙන් අනාගතයේ දී ගැටලු මතු වීමේ හැකියාවක් පවතී.

ඩබ්ලි සිල්වා මයා: දකුණු පළාතේ බෙන්තර සිට හම්බන්තොට දක්වා වූ අක්කර 20,000 ක පමණ කුඹුරු යායට කරදිය ගලා ඒම වැළැක්වීම සඳහා නිදහස ලැබූ දා මේ වන විට අති විශාල මුදල් සම්භාරයක් වියදම් කොට ඇත. නමුත් වර්තමානයේ පවා මෙම කුඹුරුවලින් ලබාගත හැකි අස්වැන්න උපරිම වශයෙන් අක්කරයකට බුසල් 30-40 පමණ වේ. නිල්වලා යෝජනා ක්‍රමය යටතේ වන කුඹුරු විශාල ප්‍රමාණයක් මේ තත්ත්වයට මුහුණ දී ඇත. කෙසේ වුව ද මෙම කුඹුරු ලාභ ලැබිය හැකි වෙනත් වගාවක් සඳහා යොදා ගැනීමට පවතින නීති රීති හරස් වී ඇත. අනෙක් අතට ගතානුගතික ගොවීන් ද කුඹුරුවල වී වගාව හැර වෙනත් වගාවට යොමුවීමට පවතින අකමැත්තක් ද වේ. මෙය තවදුරටත් දකුණු පළාතේ ගොවීන් දිළිඳු කමේ රඳවා තැබීමට බලපානු ලබන හේතු සාධකයක් වේ.

ජයන්තා බුළුමුල්ල මිය: මෙවැනි තත්ත්වයක් කෑගල්ල ප්‍රදේශයේ කුඹුරුවල ද දැකිය හැකි ය. මා කෑගල්ල දිස්ත්‍රික්කයේ සේවය කරන අවස්ථාවේ දී දිගින් දිගටම ආර්ථිකමය වශයෙන් ඵලදායක වෙනත් වගාවක් මෙම කුඹුරුවල කිරීමට ඉල්ලා සිටි නමුත් ඒ සඳහා අනුමැතිය නො ලැබිණි.

අනෙකුත් දෙපාර්තමේන්තුවලට සාපේක්ෂ ව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා අරමුදල් ලැබීමේ ප්‍රමාදයන් පවතින බව මගේ නිරීක්ෂණයයි. රටේ යල මහ කන්න අනු ව සලකා බලන විට වාරි මාර්ගවල යම් යම් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නිලධාරීන්ට හිමිවන්නේ ඉතා සුළු කාල පරාසයක් පමණි. මේ නිසා අරමුදල් නිසි වේලාවට ලැබෙන්නේ නම් එම කටයුතු ඉටු කිරීමට පහසුවක් වනු ඇත.

අක්කර 100-200 අතර වැව් සඳහා යොදවන මුදල් ප්‍රමාණය අඩුය. මේ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වේ. කුඩා වැව් සඳහා මුදල් යෙදවීම නිසා මෙම මට්ටමේ වාරි කර්මාන්තවල නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු දිගින් දිගටම කල්යාම සිදු වේ.

යූ.බී. අලහකෝන් මයා: මහා වාරි ව්‍යාපාර කෘෂිකාර්මික මාර්ග මේ වනවිට ඉතා අබලන් තත්ත්වයේ පවතී. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කෘෂි මාර්ග අලුත්වැඩියා නඩත්තුව සඳහා මුදල් වෙන් නො වීම මෙයට හේතු වී ඇත.

භද්‍රා කමලදාස මිය: වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ව්‍යාපාරයකට ඉහළින් පවතින කුඩා වාරි මාර්ගයක් නිසි පරිදි නඩත්තු නො කිරීම නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින ව්‍යාපාරයකට

හානියක් පැමිණේ යයි වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැගේ නම් ඒ සම්බන්ධ ව කටයුතු කිරීමට රජයේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය පැවරී ඇත.

පළාත් සභා ක්‍රියාකාරීත්වයට වඩා වෙනත් හේතුන්ට ද වාරිමාර්ග සම්බන්ධයෙන් මුහුණදීමට දෙපාර්තමේන්තුවට සිදුවී ඇත. උදාහරණ වශයෙන් කවුඩුල්ල වැව, දැක්විය හැකි ය. වනජීවී දෙපාර්තමේන්තුවෙන් කවුඩුල්ල බැම්ම ද ඇතුළත් වන ප්‍රදේශයක් වනජීවී දෙපාර්තමේන්තුවේ බල ප්‍රදේශය ලෙස සලකුණු කර ගැසට් කොට ඇත. මෙම තත්ත්වය පිළිබඳ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද දැනුවත් වී ඇත්තේ පසුව ය. මෙවැනි හේතුන් ද වාරිමාර්ග කටයුතු කෙරෙහි අහිතකර ව බලපා ඇත.

නිගමන සහ යෝජනා

පුස්තකාලය
LIBRARY
HARTI

නිගමන සහ යෝජනා

සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම පළාත් සභාව වෙත පැවරුණු විෂයයක් බවට දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනයේ නව වැනි උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුව මගින් පැහැදිලි ව දක්වා ඇත. එයට අමතර ව අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලු ම වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම ද පළාත් සභා ලැයිස්තුවට ඇතුළත් කරුණු වේ. කෙසේ වුව ද අන්තර් පළාත් ඉඩම් හා වාරිමාර්ග යෝජනා ක්‍රමවලට සපයනු ලබන ග්‍රාම සංවර්ධන, සෞඛ්‍ය, අධ්‍යාපන, සමුපකාර වැනි සේවා සහ පහසුකම් සඳහා වන වගකීම් පළාත් සභා සහ රජය යන දෙපාර්ශවයට ම පැවරී ඇත. එමෙන් ම ජලය රැස් කර තැබීම සහ පාලනය කිරීම, ජලාපවාහනය සහ වේලි, ජල සම්පත් සැලසුම් කිරීම සහ ගංවතුරින් ආරක්ෂාව යන කරුණු පළාත් සභා සේ ම මධ්‍ය රජයට ද පැවරුණු කාර්යයන් වේ.

පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමෙන් පසු ව වාරිමාර්ග සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු, අභියෝග සහ සංකීර්ණ තත්ත්වයන් කිහිපයක් මෙම වැඩමුළුව තුළින් හඳුනා ගැණිනි. මෙම සංකීර්ණතා පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමෙන් පැන නැගුණු ඒවාට වඩා රජයේ ම ආයතන අතර, එහි ම නීතිරීති මූලික කොටගෙන පැන නැගුණු ඒවා බව පෙනේ.

වැඩමුළුව තුළින් හඳුනාගත් ගැටලු, අභියෝග සහ සංකීර්ණතා මෙන් ම ඒ සඳහා යෝජනා වූ විසඳුම්, ක්‍රියාමාර්ග පහත සඳහන් පරිදි ගොනු කර දැක්විය හැක.

1.0 නෛතික ගැටලු

1.1 දහ තුන් වැනි සංශෝධනයේ නව වැනි උපලේඛනයේ I (පළාත් සභා) සහ III (සමගාමී) ලැයිස්තුවලින් පළාත් සභා වෙත වාරිමාර්ග සම්බන්ධ ව සැලකිය යුතු මට්ටමේ වගකීම් පවරා ඇතත් පළාත් සභා විසින් එම වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය නෛතික අධිකාරි බලය උත්පාදනය කරගෙන නොමැත. මෙම අධිකාරි බලය පළාත් සභා විසින් ඇති කරගැනීම සඳහා අදාළ විෂයයන් සම්බන්ධ ව ප්‍රඥප්ති සම්මත කරගත යුතු වේ. දැනට පළාත් සභා මුහුණ දෙමින් පවතින ගැටලු බොහොමයකට හේතු පාදක වී ඇත්තේ වාරිමාර්ග සම්බන්ධ ව එවැනි ප්‍රඥප්ති සම්මත කර නො ගැනීම ය. එහෙයින් පළාත් සභා විසින් දහතුන් වැනි සංශෝධනයෙන් පැවරී ඇති වාරිමාර්ග සම්බන්ධ ව වූ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රඥප්ති සම්මත කර ගත යුතු ය.

1.2 දහ තුන් වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා වෙත සුළු වාරිමාර්ග සම්බන්ධ බලතල පැවරී ඇත්තේ කෘෂිකර්ම සහ ගොවිජන සේවා විෂයය යටතේ ය. කෙසේ වුව ද "ගොවිජන සේවා" විෂයය සමගාමී ලැයිස්තුවේ විෂයයක් වශයෙන් ද සඳහන් කර ඇත. කෘෂිකර්මයට සම්බන්ධ කිසිදු පනතක් තුළ "ගොවිජන සේවා" යන්න අර්ථ නිරූපණය කර නොමැති අතර, එම නිසා විවිධ ගැටලුවලට මුහුණදීමට පළාත් සභාවන්ට සිදු වී ඇත. මේ නිසා "ගොවිජන සේවා" යන්න කෘෂිකර්ම සහ ගොවිජන සේවා සම්බන්ධ පනත් තුළ පැහැදිලි ව අර්ථ නිරූපණය කිරීම කළ යුතු ය.

1.3 රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තු යටතේ පවතින මහා වාරි ව්‍යාපාරවල ව්‍යාපාර කළමනාකරණ කමිටු තුළ පළාත් සභා නියෝජනයක් සිදු නො වේ. එහෙයින් පළාත් සභා ප්‍රදේශවල නව වාරි ව්‍යාපාර ඉදි කිරීමේ දී හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේ කටයුතු ඇතැම් විට මහා වාරි ව්‍යාපාරවලට බලපෑම් ඇති වන පරිදි සිදු වේ. එවැනි කටයුතු නිසා ඇතැම් විට මහා වාරි ව්‍යාපාර යටතේ වගා කරන මුල් ගොවීන්ට ජලය ලබාදීමේ දී ගැටලුවලට මුහුණදීමට රජයේ

වාරිමාර්ග දෙපාර්තමේන්තුව ට සිදු වේ. මේ නිසා මහා වාරි ව්‍යාපාරවල, ව්‍යාපාර කළමනාකරණ කමිටු සඳහා පළාත් සභා නියෝජනයක් සිදු කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැකසිය යුතු ය.

1.4 දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා මහා වාරි ව්‍යාපාර හැර අනිකුත් ගොවි සංවිධානවල නියෝජනයක් හෝ ධීවර නියෝජනයක් සිදු නො වේ. මේ නිසා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව තුළ මහා වාරි ව්‍යාපාර නො වන ගොවි සංවිධානවල සහ ධීවර නියෝජනයක් සිදු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැකසිය යුතු ය.

1.5 ගංගා සහ අනෙකුත් ජලාශවල රක්ෂිත මායිම් සලකුණු කොට ගැසට් පත්‍රයේ පළ නො කිරීම නිසා වාරි අදාළ නිලධාරීන්ට රක්ෂිත ආරක්ෂා කර ගැනීම පිළිබඳ ගැටලුවකට මුහුණ දීමට සිදු වී ඇති අතර ගංගා රක්ෂිතවල නොයෙකුත් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සහ වෙනත් අවභාවිතයන් හේතුවෙන් වාරිමාර්ග පද්ධතියට හානි සිදු වේ. එම නිසා ජලාශ රක්ෂිත මැන, මායිම් සලකුණු කොට ඒවා ගැසට් පත්‍රයේ පළ කිරීම කළ යුතු අතර පවතින නීති රීති පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කිරීම කළ යුතු ය.

2.0 පරිපාලන

2.1 සම්බන්ධීකරණ ගැටලු

2.1.1 දැනට රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන රාශියක් වාරිමාර්ග වැඩ කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වේ. මේ අතුරින් රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් සභා යන ආයතන තුන වෙත නීතියෙන් ම ඒ සඳහා වූ වගකීම් සහ බලතල පැවරී ඇත. කාර්යයන් ඉටු කිරීමේදී මෙම ආයතන අතර පවා සම්බන්ධීකරණයක් නො වීමෙන් යම් යම් කාර්යයන් ද්විත්වකරණයක් වීම හෝ ඇතැම්විට අනිවාර්යයෙන් ඉටු විය යුතු කාර්යයක් ඉටු නො වී මග හැරීම සිදු වේ. එම නිසා වාරිමාර්ග වැඩ කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ගොඩ නැංවීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

2.1.2 සුළු වාරිමාර්ග නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු පළාත් සභා වෙත පැවරී ඇතත්, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අනුව සුළු වාරිමාර්ග සම්බන්ධ කටයුතුවල දී අදාළ ගොවි සංවිධානයේ මැදිහත් වීම අවශ්‍ය ය. නමුත් ගොවි සංවිධානවල සම්බන්ධතා ගොවිජන සංවර්ධන නිලධාරී හරහා ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරයා සමග පවතී. පළාත් සභා සමග ගොවි සංවිධානවල සෘජු සම්බන්ධතා නොමැති අතර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා පවතින්නේ ද නිලධාරීන් අතර වන පෞද්ගලික මට්ටමේ සම්බන්ධතා පමණි. මේ නිසා එවැනි සම්බන්ධතා දුරස්ත මට්ටමේ පවතින අවස්ථාවල දී වාරිමාර්ග සම්බන්ධ කටයුතු සම්බන්ධයෙන් ගැටලු පැන නගී.

මෙම හේතු මත පළාත් සභා සහ ගොවි සංවිධාන අතරත්, පළාත් සභා සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව අතරත් සම්බන්ධීකරණයක් ගොඩ නැංවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතු වේ.

2.1.3 වාරිමාර්ගවල යහ පැවැත්ම සඳහා පෝෂක ප්‍රදේශ, රක්ෂිත මැනවින් ආරක්ෂා කර ගැනීම කළ යුතු අතර මෙම වගකීම මූලික වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන් සහ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පැවරේ. ඉඩම් සම්බන්ධ බලතල සහ වගකීම් රාශියක් පැවරී ඇති ප්‍රාදේශීය ලේකම්වරුන් රජයට අයත් නිලධාරීන් වන අතර, එම නිලධාරීන් සහ පළාත් සභා අතර මනා සම්බන්ධීකරණයක් නො වීම නිසා රක්ෂිත ආරක්ෂා කර ගැනීම පිළිබඳ විවිධ ගැටලු පැන නගී. මේ නිසා ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව අතර මනා සම්බන්ධීකරණයක් ගොඩ නැංවීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

2.2 පරිපාලන ඒකක පිළිබඳ ගැටලු

ගංගා ද්‍රෝණි දැනට පවතින දිස්ත්‍රික්, පළාත් සභා වැනි පරිපාලන මායිම් ඉක්මවා යන හෙයින්, නව ජල සම්පත් සංවර්ධන සැලසුම් ක්‍රියාවට නැංවීමේ දී හා පවත්නා ව්‍යාපෘති නඩත්තු කිරීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. මූලික ජල විද්‍යා හා පරිසර සිද්ධාන්තවලට අනුකූල වන ක්‍රමවේදය වන. ගංගා ද්‍රෝණිය ජල කළමනාකරණ ඒකකය වශයෙන් භාවිතා කිරීමෙන් මෙම ගැටලුව මග හරවා ගැනීමට හැකි වේ.

3.0 සැලසුම් සහ සංවර්ධන

3.1 වාරිමාර්ග සම්බන්ධ සියලු කටයුතු "රජය විසින් ඉටු කළ යුතු" යනුවෙන් ප්‍රතිලාභී ජනතාව අතර පවතින ආකල්පය ද වාරි ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතුවල දී අහිතකර අන්දමින් බලපා ඇත. මේ නිසා ගොවි සංවිධාන මට්ටමින් ඉටු කළ හැකි සුළු නඩත්තු කටයුතු පවා ඒවායින් ඉටු නො වන අතර අවසාන වශයෙන් එය සැලකිය යුතු අන්දමේ ප්‍රතිසංස්කරණ කාර්යයක් බවට පත් වේ. වාරිමාර්ග සම්බන්ධයෙන් ප්‍රතිලාභී ජනතාවට පැවරී ඇති වගකීම් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම තුළින් මෙම ගැටලුව මඟ හරවා ගැනීමට හැකි වනු ඇත.

3.2 පළාත් සභා හෝ පළාත් පාලන ආයතන විසින් සිදු කරනු ලබන නව ඉඩම් හා ජල සම්පත් සංවර්ධන සැලසුම්වල දී බොහෝ විට පවත්නා ගංවතුර පාලන ව්‍යාපාර පිළිබඳ සැලකිල්ලක් නො දැක්වීම නිසා දැනට පවතින ගංවතුර පාලන ව්‍යාපාරවල මූලික පරමාර්ථය ඉටු නො වේ. පළාත් සභා සහ පළාත් පාලන ආයතන මගින් සැලසුම් කරනු ලබන නව ව්‍යාපාර රජයේ අදාළ ආයතන දැනුවත් කොට සිදු කිරීමෙන් මෙම ගැටලුව මග හරවා ගැනීමට හැකිවනු ඇත.

3.3 ඇතැම් අවස්ථාවල දී සිදු කෙරෙන මෙහෙයුම් සහ නඩත්තු කටයුතු ප්‍රමිතියකින් තොරවීම නිසා ගැටලු පැන නගී. මේ නිසා ජලාශවල ආරක්ෂාව සම්බන්ධ දේශීය ප්‍රමිතීන් සැකසීම කළ යුතු අතර, ජලාශ නඩත්තු සහ මෙයුම් සිදු කරන සියලු ආයතනවල කළමනාකරණ සහ තාක්ෂණික ප්‍රවේශයන් පිළිගත් තාක්ෂණික ප්‍රමිතියකට අනු ව සිදු කිරීමෙන් මෙම ගැටලුව මග හරවා ගැනීමට හැකි වනු ඇත.

3.4 විවිධ ආයතන මැදිහත් වී වාරිමාර්ග නඩත්තු සහ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබුව ද බොහෝ විට එම කර්මාන්ත පිළිබඳ පසු විපරමක් නො කිරීම නිසා නැවත නැවත ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට සිදුවීම වැනි ගැටලු පැන නගී. ඉටු කරන ලද කර්මාන්ත පිළිබඳ පසු විපරම් කිරීම මගින් මෙම ගැටලුව විසඳා ගැනීමට හැකි වනු ඇත.

3.5 සංවර්ධන කටයුතුවල දී සිදු ව අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම් නිසා ප්‍රමුඛතාව ලබා දිය යුතු කර්මාන්ත මග හැරී, එම මුදල් වෙනත් කර්මාන්ත සඳහා යෙදවීම සිදු වන අවස්ථා දැකිය හැකි ය. මෙය නිලධාරීන් මෙන් ම ප්‍රතිලාභී ජනතාව ද අපහසුතාවට පත් කරන්නක් බැවින් හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු හැර අනෙක් කර්මාන්ත ප්‍රමුඛතා ලැයිස්තුවක් මත පෙළ ගස්වා ක්‍රියාත්මක කිරීම වඩා යෝග්‍ය වේ.

4.0 සම්පත්

4.1 අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවලට සාපේක්ෂ ව වාරි කර්මාන්තවල නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පවතින්නේ ඉතා සීමිත කාල පරාසයකි. එනම් කන්නයක් අවසාන වී ඊළඟ කන්නය ආරම්භවීමට පෙර කාලය තුළ වාරි නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු නිම කළ යුතු වේ. පළාත්සභාවල වර්ෂයේ සංවර්ධන සැලැස්ම මුදල් කොමිෂන් සභාවෙන් අනුමත වීම ප්‍රමාද වීම නිසා පළාත් සභාවල වාරි කර්මාන්ත සම්බන්ධ කටයුතු නිසි පරිදි ඉටු කිරීමට නො හැකි වන අවස්ථා පවතී. මේ නිසා පළාත් සංවර්ධන සැලැස්ම සඳහා මුදල් කොමිෂන් සභාවෙන් ලැබිය යුතු අනුමැතිය ප්‍රමාදයකින් තොරව ලබා දිය හැකි නම් එයි අපහසුතා පැන නො නඟී.

4.2 පැරණි වාරි ව්‍යාපාරල කෘෂිකාර්මික මාර්ග නඩත්තුව සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් මුදලක් වෙන් නො වන හෙයින් එම ව්‍යාපාරවල කෘෂිකාර්මික මාර්ග අබලන් තත්ත්වයේ පවතින අතර කෘෂි නිෂ්පාදන සඳහා ලැබෙන මිල තීරණය වීම කෙරෙහි මෙන් ම එම නිෂ්පාදන අලෙවි කරගැනීම සම්බන්ධයෙන් ද ගැටලු පැන නඟී. මේ සම්බන්ධ ව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමු කර, ක්‍රියාත්මක වීමෙන් එම ගැටලුව නිරාකරණය කර ගැනීමට හැකි වනු ඇත.

4.3 වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සඳහා පළාත්සභා සතු ව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නො වීම නිසා අදාළ කාර්යයන් නිසි පරිදි ඉටු කිරීමට නො හැකි වී ඇත. මේ නිසා අදාළ දිස්ත්‍රික්කයන් හි මධ්‍ය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය හෝ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමග පළාත් සභාව ඒකාබද්ධ වී කටයුතු කිරීමෙන් එම ගැටලුව යම්තාක් දුරකට නිරාකරණය කර ගැනීමට හැකි වනු ඇත.

වැඩමුළුවට සහභාගී වූවන් ගේ නාමලේඛනය

නම	තනතුර	ආයතනය
1. ඩබ්.එම්. ජයතිලක මයා	අතිරේක ලේකම්	කෘෂිකර්ම සහ ගොවිජන සේවා අමාත්‍යාංශය
2. ඩබ්.එම්.සී. බණ්ඩාර මයා	ලේකම්	ඌව පළාත් ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග සහ සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය
3. එම්.වයි. සෙයිනුදීන් මයා	නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)	වයඹ පළාත් සභාව
4. කේ.ඒ.යූ.අයි. ඉඹුලාන මයා	අධ්‍යක්ෂ (ජල සම්පත්)	වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
5. භද්‍ර කමලදාස මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (භෞතික සම්පත් හා ජල කළමනාකරණ)	වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
6. ජයන්තා බුළුමුල්ල මිය	දිස්ත්‍රික් ලේකම් (කුරුණෑගල)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල
7. ඩබ්.එම්. ජයසේන මයා	පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ	උතුරු මැද පළාත් සභාව
8. පී.එච්. ජයවර්ධන මයා	පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ	බස්නාහිර පළාත් සභාව
9. ඒ.යූ. ද සිල්වා මයා	පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ	දකුණු පළාත් සභාව
10. කේ.ඩී.එච්.ඒ. නානායක්කාර මිය	පළාත් ඉඩම් කොමසාරිස්	දකුණු පළාත් සභාව
11. ඒ.අයි.එම්.එම්. නිස්තාර් මයා	පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ	මධ්‍යම පළාත් සභාව
12. පී.පී. නූර්දීන් මයා	අධ්‍යක්ෂ	පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
13. යූ.බී. අලහකෝන් මයා	කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ (පොළොන්නරුව)	වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
14. ද.දි. ප්‍රභාත් විතාරණ මයා	ඉංජිනේරු	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
15. ජානක විජේකෝන් මයා	පළාත් වාරිමාර්ග ඉංජිනේරු	ඌව පළාත් සභාව
16. ඩඩ්ලි සිල්වා මයා	පළාත් වාරිමාර්ග ඉංජිනේරු (මාතර)	දකුණු පළාත් සභාව
17. එල්.එස්. ප්‍රනාන්දු මයා	ඉංජිනේරු	වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
18. එල්.ටී. විජේසූරිය මයා	උපදේශක	වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යාංශය
19. වී.කේ. නානායක්කාර මයා	අධ්‍යක්ෂ	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
20. ආචාර්ය ඩබ්.ජී. ජයසේන මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
21. ආචාර්ය ධනවර්ධන ගමගේ මයා	අධි පර්යේෂක	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

පුස්තකාලය
LIBRARY

නම	තනතුර	ආයතනය
22. ආචාර්ය එල්.පී. රූපසේන මයා	අධි පර්යේෂක	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
23. ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මයා	අංශ ප්‍රධාන/කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ඇගයීම් අංශය	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
24. ආචාර්ය ජී.බී. ගිරාගම මයා	අංශ ප්‍රධාන/වාරි ජල කළමනාකරණ හා ගොවිජන සම්බන්ධතා අංශය	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
25. ආර්.එම්.ආර්. බණ්ඩාර මයා	අංශ ප්‍රධාන/මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
26. සී.පී. හතුරුසිංහ මිය	අංශ ප්‍රධාන/අලෙවි, ආහාර හා කෘෂි ව්‍යාපාර අංශය	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
27. ටී.ජේ. ධර්මරත්න මයා	අධි පර්යේෂක	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
28. සුසිලා ලූර්දු මිය	පර්යේෂණ නිලධාරිණී	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
29. එම්.කේ. නදීකා දමයන්ති මෙනෙවිය	පර්යේෂණ නිලධාරිණී	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

21608